***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2019 සහ 2020 වර්ෂ සඳහා ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තා.

මෙම වාර්තා අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2019, 2020 සහ 2021 වර්ෂ සඳහා හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තා;

(ii) 2020 වර්ෂය සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2021 වර්ෂය සඳහා සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා නාගරික සංවර්ධන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, **වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන්** මම 2020/2021 වර්ෂය සඳහා සීමාසහිත ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව වරාය, නාවික හා ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் வெகுசன ஊடக அமைச்சரும்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Transport and Highways and Minister of Mass Media)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2020 වර්ෂය සඳහා සැලසිනෙ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව;

(ii) 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය; සහ

(iii) 2021 වර්ෂය සඳහා සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තාව සහ නියෝග ඉදිරිපත් කරමි.

(i) 2021 වර්ෂය සඳහා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

(ii) (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 44, 123, 124, 125, 126, 126ආ, 128, 132, 132අ සහ 231 වගන්ති සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ඔක්තෝබර් 10 දිනැති අංක 2301/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග.

මෙම වාර්තාව සහ නියෝග ප්‍රවාහන හා මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2019 සහ 2020 වර්ෂ සඳහා හෝමියෝපති වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තා;

(ii) 2020 වර්ෂය සඳහා දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මම 2019 වර්ෂය සඳහා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2021 වර්ෂය සඳහා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.- [**සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා වෙනුවට ගරු ප්‍රසන්න රණතුංග මහතා**]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, **වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන්** මම 2019 වර්ෂය සඳහා උක් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2020 වර්ෂය සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.- [**වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවට ගරු ප්‍රසන්න රණතුංග මහතා**]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු විදුර වික්‍රමනායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. Vidura Wickramanayaka - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, 2020 වර්ෂය සඳහා ටවර් හෝල් රඟහල පදනමේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශය මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2021 වර්ෂය සඳහා සූර්ය බල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.- [ගරු කංචන විජේසේකර මහතා]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු නසීර් අහමඩ් මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு நஸீர் அஹமட் - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Naseer Ahamed - Minister of Environment)

Hon. Speaker, I present the Annual Report of the Geological Survey and Mines Bureau for the year 2020.

I move that this Report be referred to the Ministerial Consultative Committee on Environment.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආර්ථිකය ස්ථායීකරණයට අදාළ කෙටි සහ මධ්‍ය කාලීන වැඩසටහන් හඳුනා ගැනීම සඳහා වූ ජාතික සභා අනුකාරක සභාවේ දෙවන වාර්තාව
## பொருளாதார ஸ்திரத்தன்மை தொடர்பிலான குறுகிய மற்றும் நடுத்தர கால நிகழ்ச்சித்திட்டங்களை அடையாளங்காணல் பற்றிய தேசியப் பேரவை உபகுழுவின் இரண்டாவது அறிக்கை
SECOND REPORT OF THE SUBCOMMITTEE OF THE NATIONAL COUNCIL TO IDENTIFY SHORT AND MEDIUM-TERM PROGRAMMES RELATED TO ECONOMIC STABILIZATION

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ගරු කථානායකතුමනි, නවවැනි පාර්ලිමේන්තුවේ ආර්ථිකය ස්ථායීකරණයට අදාළ කෙටි සහ මධ්‍ය කාලීන වැඩසටහන් හඳුනා ගැනීම සඳහා වූ ජාතික සභාවේ අනුකාරක සභාව විසින් ජාතික සභාවට ඉදිරිපත් කරන ලද එහි දෙවැනි වාර්තාව මම ඉදිරිපත් කරමි.

ගරු කථානායකතුමනි, එම වාර්තා දෙකම මේ සභාවේ විවාදයකට යොමු කරලා ඒ හා සම්බන්ධ අදහස් ලබා ගැනීමට කටයුතු කරන ලෙස වැඩිමනත් වශයෙන් මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, "එම වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

වරප්‍රසාද ප්‍රශ්නය, ගරු නිමල් පියතිස්ස මන්ත්‍රීතුමා.

## වරප්‍රසාද: 2023.02.07 දින "ලංකාදීප" වාර්තාව
## சிறப்புரிமை: 2023.02.07ஆந் திகதிய "லங்காதீப" அறிக்கை
PRIVILEGE: "LANKADEEPA" REPORT OF 07.02.2023

**ගරු නිමල් පියතිස්ස මහතා**
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)

ගරු කථානායකතුමනි, වරප්රසාද පිළිබඳව මතු වුණු ප්රශ්නයකට අදාළ ලිපියක් මම ඔබතුමාට යොමු කළා. ඒ අනුව මෙම වරප්රසාද ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට මා ස්තුතිවන්ත වෙනවා.

2023 පෙබරවාරි මස 07වන අඟහරුවාදා "ලංකාදීප" පුවත් පතේ මුල් පිටුවේම, "නුවරඑළිය සෙන්පති මැදුරේ මන්ත්රී සාදයේ වෙඩි ශබ්දයක්. හිස් උණ්ඩ දෙකක් පොලිස් බාරයට" යන සිරස්තලය යටතේ පළ වුණු පුවත පිළිබඳවයි මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්නේ, ගරු කථානායකතුමනි. මම 2023.01.28වන දා රාත්රි 8.00ට පමණ සෙන්පති මැදුරට ගිය බව ඇත්ත. මම එදින රාත්රි 8.00ට විතර සෙන්පති මැදුරට ගිහිල්ලා එළියටවත් ආවේ නැහැ. එළියේ සිදු වෙන කිසිම දෙයක් මම දැන සිටියේත් නැහැ.

ඒ වාගේම රාත්‍රී ආහාර සූදානම් කර තිබෙන බවට රෑ 10ට පමණ මට පණිවුඩය ලැබුණා. ඒ අවස්ථාවට සහභාගි වෙලා කෑම ගත් වහාම මට වෙන් වෙලා තිබුණු කාමරයට නැවතත් මම ගියා. මම කාමරයට ගිහිල්ලා ඊට පසු දින තිබෙන රැස්වීම් කටයුත්තකට අදාළ ලියකියවිලි අධ්‍යයනය කරමිනුයි සිටියේ. මම නින්දට යන විට රාත්‍රි දොළහමාර පමණ වුණා. නින්දට යනකල් මට කිසිදු වෙඩි ශබ්දයක් ඇහුණේත් නැහැ, කිසිදු සාදයක ශබ්දයක් ඇහුණේත් නැහැ, එළියේ එවැනි සාදයක් පැවැත්වුණාද කියා මම දන්නේත් නැහැ. ඒ වාගේම එවැනි සාදයකට මම කිසිම විටෙක සම්බන්ධ වුණේත් නැහැ.

ගරු කථානායකතුමනි, මේ පුවතේ සඳහන් වෙලා තිබෙනවා, "ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරු දෙපළකුත්, ජාතික නිදහස් පෙරමුණේ මන්ත්‍රීවරයෙකුත් පවත්වනු ලැබූ සාදයකදී උඩට වෙඩි තබා තිබෙන අතර, ඊට පසු දින එහි සේවකයන් පිරිසිදු කිරීම් කරන විට පතරොම් කොපු දෙකකුත් ලැබුණා" කියලා. මම දන්නේ නැති මෙම කරුණ පිළිබඳව මම නැවත සෙන්පති මැදුරේ සේවකයන්ගෙන් විමසීමක් කළා, මොකක්ද මේ යන ප්‍රවෘත්තිය කියලා. එදා මා සමඟ දිගින් දිගටම සම්බන්ධීකරණ කටයුතු කළ වමින්ද යාපා කියන එහි වැඩ කරන සේවකයාගෙන් විමසද්දී ඔහු කිව්වා, "සෙන්පති මැදුරේ වැඩ කරන සේවකයන් 26දෙනෙක් ඉන්නවා, ඒ කිසිවෙකුටත් එවැනි ශබ්දයක් ඇහිලාත් නැහැ, එවැනි ගැටලුවක් මතු වෙලා තිබුණේත් නැහැ. විශේෂයෙන් ඔබතුමා ආපු වෙලාවේ ඉඳලා සිටියේ කාමරය ඇතුළේ, ඔබතුමා එළියට ආවේ රාත්‍රි ආහාර ගැනීමටත්, උදේ ආහාර ගැනීමටත් පමණයි. එතැනින් පස්සේ ඔබතුමා සෙන්පති මැදුරෙන් සමුගත්තා, ඔබතුමා පිළිබඳව මතුවෙලා තිබෙන මෙම කරුණ පිළිබඳව සෙන්පති මැදුරේ සේවකයෝ හැටියට අපි බලවත් කනගාටුව ප්‍රකාශ කරනවා" කියලා. ගරු කථානායකතුමනි, ඊට අදාළව ඕනෑම ක්‍රියාමාර්ගයක් ගන්න. එසේ ගනු ලබන ඕනෑම ක්‍රියාමාර්ගයකදී එදින සෙන්පති මැදුරේ සේවය කළ හැම කෙනෙක්ම ඇවිල්ලා සාක්ෂි දෙනවා කියලා ඔවුන් පැහැදිලිව කිව්වා.

[ගරු නිමල් පියතිස්ස මහතා]

ගරු කථානායකතුමනි, "ලංකාදීප" පුවත් පතේ වාර්තාකරුවන් මේ වෙලාවේ සමහර විට පාර්ලිමේන්තුවේ පුවත් පත් වාර්තාකරුවන් සඳහා වන ගැලරියේ ඇති. ශ්‍රීනාත් ප්‍රසන්න ජයසූරිය මහත්මයා තමයි මෙම වාර්තාව පළ කර තිබෙන්නේ.

මම ඔහුගෙන් ඉල්ලා සිටිනවා මේ පුවත නැවත නිවැරැදි කරන්න කියලා. ඒ විතරක් නොවෙයි, එදින රාජකාරියේ නොයෙදී සිටි 'සෙන්පති මැදුරේ භාරකරුවා' යැයි කියා ගන්නා පුද්ගලයෙක් තමයි පොලීසියට මේ පැමිණිල්ල කර තිබෙන්නේ. එතකොට මේ වාර්තාව, මේ පැමිණිල්ල සම්පූර්ණයෙන් ප්‍රබන්ධයක්. එළියේ යමක් සිදුවුණාද කියලා මම දන්නේත් නැහැ. ඒකට මම හවුල් නැහැ. එදා ඇවිල්ලා හිටපු ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරු කවුද, ඒ කිසිම දෙයක් මම දන්නේත් නැහැ. ඒ අය මට මුණ ගැහුණේත් නැහැ. මම ඒ අයට මුණ ගැහුණේත් නැහැ.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මේ ප්‍රබන්ධය, මේ මඩ ගැසීම පිටුපස මාව අපකීර්තියට පත් කිරීමක් සහ මගේ පක්ෂය අපකීර්තියට පත් කිරීමක් තිබෙනවා. "ලංකාදීප" පුවත් පතේ පළ වූ ඒ පුවත දැකලා විදෙස් මිතුරන් මගෙන් විමසීම් කළා. ඒ වාගේම ලංකාවේ මගේ හිතවතුන් බොහෝ දෙනෙක් -ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරු, විපක්ෂයේ මන්ත්‍රීවරු පවා- මගෙන් විමසුවා මොකක්ද මේ කාරණය කියලා. ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ඔබතුමාත් ඊයේ කිව්වා මම එහෙම හැසිරෙන කෙනෙක් නොවෙයි කියලා. ඒ ගැන ඔබතුමාත් දන්නවා; බොහෝ අය දන්නවා. මම ගැටුම් හදා ගෙන, ප්‍රචණ්ඩ ක්‍රියාවල නිරත වන කෙනෙක් නොවෙයි. ඒ විතරක් නොවෙයි, මම කිසිදු මැතිවරණයකදී සාද පවත්වන්නේ නැහැ. කන්න-බොන්න, ඉඳුල් දේවල් දෙන්නේ නැතුවයි මම ඡන්ද ගන්නේ. මම බොහොම සාමකාමී පුද්ගලයෙක්. දිස්ත්‍රික්කයේ ඡන්ද දායකයෝ විතරක් නොවෙයි, විශේෂයෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්කයේම ජනතාව දන්නවා, මට එරෙහිව ඉන්න අය පවා දන්නවා, මම සාදවලට යන්නේ නැති, බීමත්කමින් හැසිරෙන්නේ නැති, ප්‍රචණ්ඩකාරීත්වයට යොමු වන්නේ නැති කෙනෙක් බව.

ගරු කථානායකතුමනි, සෙන්පති මැදුර සම්බන්ධයෙන් මේ ප්‍රබන්ධය ගොතලා, මාව බරපතළ ලෙස අපහසුතාවට පත් වන විධියට, මගේ චරිතය කෙලෙසන විධියට, මගේ කීර්ති නාමයට හානියක් වෙන විධියට පොලීසියට පැමිණිල්ලක් කරලා තිබෙනවා සෙන්පති මැදුරේ 'භාරකරුවා' යැයි කියන පුද්ගලයා. නමුත්, එදින ඔහු සේවයේ රැඳී සිටියේ නැහැ. සේවයේ රැඳී සිටි අයගෙන් ඒ ගැන විමසද්දී සාක්ෂි සහිතව මේ කාරණය පිළිබඳව සනාථ කර ගන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, මගේ ඉල්ලීම මෙයයි. මේ පැමිණිල්ල කරපු පුද්ගලයා පාර්ලිමේන්තුවේ ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට කැඳවලා, ඔහුගෙන් ප්‍රශ්න කරන්න. ඕනෑ නම් සෙන්පති මැදුරේ සේවය කරන අනිකුත් සියලුදෙනාගෙන්ම ඒ පිළිබඳව විමසීමක් කරලා සාක්ෂි සහිතව ඒ කාරණය ඔප්පු කර ගන්න.

මේ කාරණය මොකක්ද කියලා සාක්ෂි සහිතව ඔප්පු කරගෙන මේ කටයුත්තට සම්බන්ධ නොවුණු මුළු පාර්ලිමේන්තුවටත්, අපටත් ඇති වුණු හානිකර තත්ත්වය නිවැරදි කරන්න. මොකද, අපි දන්නවා මේ දවස්වල මේ වාගේ කාරණයක් දැක්කාම මාධ්‍ය ආයතන තලු මර මරා රටට කියන බව. අපි එවැනි තත්ත්වයකට පත් වෙලා නැතිව සිටියදී මේ ආකාරයේ සාහසික ක්‍රියා කළ පුද්ගලයාට විරුද්ධව උපරිම විනය ක්‍රියාමාර්ගයක් ගන්න, ගරු කථානායකතුමනි . මම මේ කියන කාරණය සත්‍ය නම් ඔහුට විරුද්ධව විනය ක්‍රියාමාර්ගයක් ගන්න. ගරු කථානායකතුමනි, විෂම ලෙස හැසිරෙමින්, එවන් මඩ ප්‍රබන්ධ ගොඩ නඟලා පොලීසියට පැමිණිලි කළ ඒ පුද්ගලයා සෙන්පති මැදුරෙන් ඉවත් කරන්න කියන කාරණයත් විශේෂයෙන් මම ඔබතුමාට මතක් කරනවා.

ගරු කථානායකතුමනි, මේ කරුණට අදාළව විවිධ අය මගෙන් විමසද්දී මම සිත් පීඩාවට පත් වුණා. මම බීමත්ව හැසිරෙන අයෙකු නොවෙයි; බීමත්ව සාද පවත්වන කෙනෙකු නොවෙයි. නුවරඑළිය දිස්ත්‍රික්කයේ හිටියාට මම තමයි මේ සෙන්පති මැදුර අඩුම වශයෙන් පාවිච්චි කරන කෙනා. මම එහි යන්නේ අත්‍යවශ්‍යම ඕනෑකමක් වුණොත් විතරයි, ගරු කථානායකතුමනි. ඒ විතරක් නොවෙයි, මම මගේ නමින් වෙන වෙන අයට අවස්ථාව හදලා දෙන්නෙත් නැහැ. මට එතැන ප්‍රමිතිය රැක ගන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ ගෞරවයත්, පාර්ලිමේන්තුවට යටත්ව තිබෙන සෙන්පති මැදුරේ ගෞරවයත් කෙලෙසන්න කිසිවිටෙක සම්බන්ධ වන කෙනෙකු නොවෙයි මම. සාමකාමීව, ප්‍රචණ්ඩත්වයකින් තොරව දේශපාලනය කරලා, බොහොම අමාරුවෙන් පාර්ලිමේන්තුවට ආව කෙනෙක් මම. මම වැනි කෙනෙකු ඉලක්ක කරලා මේ පිටපත මෙහෙයවන කවුරු හරි කෙනෙකු ඇති. ඒ සියලු දේවල් පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වලා, ඒ පුද්ගලයා වරප්‍රසාද කමිටුවට ගෙන්වලා උපරිම විනය ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 5.00 දක්වා විය යුතු ය. පූ.භා. 10.00ට ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 1 සිට 67 දක්වා විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## තේරීම් කාරක සභාව
### தெரிவுக் குழு
### COMMITTEE OF SELECTION

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 114හි විධිවිධාන ප්‍රකාරව, නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරයේ සේවය කිරීම සඳහා තේරීම් කාරක සභාව, කථානායකවරයාගේ සභාපතීත්වයෙන් සහ දේශපාලන පක්ෂවල නායකයන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ද ඇතුළත්ව පාර්ලිමේන්තුව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුගෙන් (12) සමන්විත විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, මතු සඳහන් සාමාජික මන්ත්‍රීවරයන් නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරයේ තේරීම් කාරක සභාවේ සේවය කළ යුතු ය."

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
ගරු ප්‍රසන්න රණතුංග මහතා
ගරු නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා
ගරු ඩග්ලස් දේවානන්දා මහතා
ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
ගරු ගාමිණී ලොකුගේ මහතා
ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## තේරීම් කාරක සභා රැස්වීම
### தெரிவுக் குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE OF SELECTION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

තේරීම් කාරක සභාවේ ප්‍රථම රැස්වීම 2023 පෙබරවාරි 09වැනි බ්‍රහස්පතින්දා, එනම් අද දින මධ්‍යාහ්න 12.00ට කාරක සභා කාමර අංක 07හිදී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරුන් සියලු දෙනාටම මෙයින් කාරුණිකව දැනුම්දීමට කැමැත්තෙමි.

මීළඟට, න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 52 දක්වා අනුමත කිරීම.

## සුබසාධක ප්‍රතිලාභ පනත: නියෝග
### நலன்புரி அனுகூலங்கள் சட்டம்: ஒழுங்குவிதிகள்
### WELFARE BENEFITS ACT: REGULATIONS

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 7(3), 8, 10, 11 හා 12 වගන්ති සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 27 වගන්තිය යටතේ සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2022 ඔක්තෝබර් 20 දිනැති අංක 2302/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.12.13 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය: වාර්ෂික වාර්තාව (2017)
### இலங்கை அபிவிருத்தி நிர்வாக நிறுவனம்: வருடாந்த அறிக்கை (2017)
### SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION: ANNUAL REPORT (2017)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2019.10.23 දින ඉදිරිපත් කරන ලද 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.03.25 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.12.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය: වාර්ෂික වාර්තාව (2018)
## இலங்கை அபிவிருத்தி நிர்வாக நிறுவனம்: வருடாந்த அறிக்கை (2018)
## SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION: ANNUAL REPORT (2018)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2022.11.10 දින ඉදිරිපත් කරන ලද 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.
>
> (රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.11.24 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.12.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය: වාර්ෂික වාර්තාව (2019)
## இலங்கை அபிவிருத்தி நிர்வாக நிறுவனம்: வருடாந்த அறிக்கை (2019)
## SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION: ANNUAL REPORT (2019)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2021.07.19 දින ඉදිරිපත් කරන ලද 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.
>
> (රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.12.02 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.12.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය: වාර්ෂික වාර්තාව (2017)
## தேசிய மொழிக் கல்வி மற்றும் பயிற்சி நிறுவனம்: வருடாந்த அறிக்கை (2017)
## NATIONAL INSTITUTE OF LANGUAGE EDUCATION AND TRAINING: ANNUAL REPORT (2017)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතන පනතේ IV වන කොටස පොදු විධාන අංක 23 වගන්තිය යටතේ 2022.04.05 දින ඉදිරිපත් කරන ලද, 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.
>
> (රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.11.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.12.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව: වාර්ෂික වාර්තාව (2018)
## மனித வள அபிவிருத்திக்கான இலங்கை தேசிய சபை: வருடாந்த அறிக்கை (2018)
## NATIONAL HUMAN RESOURCES DEVELOPMENT COUNCIL OF SRI LANKA: ANNUAL REPORT (2018)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2022.02.10 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.
>
> (රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.03.25 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.12.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව: වාර්ෂික වාර්තාව (2019)

## மனித வள அபிவிருத்திக்கான இலங்கை தேசிய சபை: வருடாந்த அறிக்கை (2019)

## NATIONAL HUMAN RESOURCES DEVELOPMENT COUNCIL OF SRI LANKA: ANNUAL REPORT (2019)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2022.08.29 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.11.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.12.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රාජ්‍ය භාෂා කොමිෂන් සභාව: වාර්ෂික වාර්තාව (2017)

## அரசகரும மொழிகள் ஆணைக்குழு: வருடாந்த அறிக்கை (2017)

## OFFICIAL LANGUAGES COMMISSION: ANNUAL REPORT (2017)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ IV වන කොටසේ අංක 32 වගන්තිය යටතේ 2021.04.06 දින ඉදිරිපත් කරන ලද, 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.12.02 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.12.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රාජ්‍ය භාෂා කොමිෂන් සභාව: වාර්ෂික වාර්තාව (2018)

## அரசகரும மொழிகள் ஆணைக்குழு: வருடாந்த அறிக்கை (2018)

## OFFICIAL LANGUAGES COMMISSION: ANNUAL REPORT (2018)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ IV වන කොටසේ අංක 32 වගන්තිය යටතේ 2022.08.31 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.11.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.12.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රාජ්‍ය භාෂා කොමිෂන් සභාව: වාර්ෂික වාර්තාව (2019)

## அரசகரும மொழிகள் ஆணைக்குழு: வருடாந்த அறிக்கை (2019)

## OFFICIAL LANGUAGES COMMISSION: ANNUAL REPORT (2019)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ IV වන කොටසේ අංක 32 වගන්තිය යටතේ 2022.03.08 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.03.25 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.12.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය: වාර්ෂික වාර්තාව (2018)
## தொலைக் கல்வி நிலையம்: வருடாந்த அறிக்கை (2018)
## DISTANCE LEARNING CENTRE: ANNUAL REPORT (2018)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2022.08.31 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.
>
> (රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.11.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තා 2022.12.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## දේශීය ණය සහ සංවර්ධන අරමුදල: වාර්ෂික වාර්තාව සහ ගිණුම් (2014)
## உள்ளக கடன் மற்றும் அபிவிருத்தி நிதியம்: வருடாந்த அறிக்கையும் கணக்குகளும் (2014)
## LOCAL LOANS AND DEVELOPMENT FUND: ANNUAL REPORT AND ACCOUNTS (2014)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2019.08.22 දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2014 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් අනුමත කළ යුතු ය.
>
> (රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.11.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.12.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## දේශීය ණය සහ සංවර්ධන අරමුදල: වාර්ෂික වාර්තා සහ ගිණුම් (2015 සහ 2016)
## உள்ளக கடன் மற்றும் அபிவிருத்தி நிதியம்: வருடாந்த அறிக்கைகளும் கணக்குகளும் (2015 மற்றும் 2016)
## LOCAL LOANS AND DEVELOPMENT FUND: ANNUAL REPORTS AND ACCOUNTS (2015 AND 2016)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2019.11.07 දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් සහ 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂ සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2015 සහ 2016 වර්ෂවල වාර්ෂික වාර්තා සහ ගිණුම් අනුමත කළ යුතු ය.
>
> (රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.11.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.12.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## දේශීය ණය සහ සංවර්ධන අරමුදල: වාර්ෂික වාර්තාව සහ ගිණුම් (2017)
## உள்ளக கடன் மற்றும் அபிவிருத்தி நிதியம்: வருடாந்த அறிக்கையும் கணக்குகளும் (2017)
## LOCAL LOANS AND DEVELOPMENT FUND: ANNUAL REPORT AND ACCOUNTS (2017)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2021.04.20 දින ඉදිරිපත් කරන ලද, 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් අනුමත කළ යුතු ය.
>
> (රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.11.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.12.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## දේශීය ණය සහ සංවර්ධන අරමුදල: වාර්ෂික වාර්තාව සහ ගිණුම් (2019)
## உள்ளக கடன் மற்றும் அபிவிருத்தி நிதியம்: வருடாந்த அறிக்கையும் கணக்குகளும் (2019)
## LOCAL LOANS AND DEVELOPMENT FUND: ANNUAL REPORT AND ACCOUNTS (2019)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2021.11.08 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් අනුමත කළ යුතු ය.
>
> (රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.11.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.12.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය: වාර්ෂික වාර්තාව (2016)
## உள்ளூர் ஆளுகை தொடர்பான இலங்கை நிறுவனம்: வருடாந்த அறிக்கை (2016)
## SRI LANKA INSTITUTE OF LOCAL GOVERNANCE: ANNUAL REPORT (2016)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පනතේ 17 සහ 18 වගන්ති යටතේ 2019.07.10 දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.
>
> (රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.11.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.12.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය: වාර්ෂික වාර්තාව (2018)
## உள்ளூர் ஆளுகை தொடர்பான இலங்கை நிறுவனம்: வருடாந்த அறிக்கை (2018)
## SRI LANKA INSTITUTE OF LOCAL GOVERNANCE: ANNUAL REPORT (2018)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පනතේ 17 සහ 18 වගන්ති යටතේ 2021.11.17 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.
>
> (රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.12.02 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.12.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය: වාර්ෂික වාර්තාව (2020)
## கொழும்பு பல்கலைக்கழகத்தின் சுதேச மருத்துவ நிறுவனம்: வருடாந்த அறிக்கை (2020)
## INSTITUTE OF INDIGENOUS MEDICINE OF THE UNIVERSITY OF COLOMBO: ANNUAL REPORT (2020)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය යටතේ 2022.08.29 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.
>
> (අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.11.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.11.29 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය: වාර්ෂික වාර්තාව (2020)

## பேராதனைப் பல்கலைக்கழகத்தின் விவசாய விஞ்ஞான பட்டப்பின் படிப்பு நிறுவகம்: வருடாந்த அறிக்கை (2020)

## POSTGRADUATE INSTITUTE OF AGRICULTURE OF THE UNIVERSITY OF PERADENIYA: ANNUAL REPORT (2020)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වගන්තිය යටතේ 2022.08.29 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.11.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.11.29 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය: වාර්ෂික වාර්තාව (2019)

## ஸ்ரீ ஜயவர்தனபுர பல்கலைக்கழகம்: வருடாந்த அறிக்கை (2019)

## UNIVERSITY OF SRI JAYEWARDENEPURA: ANNUAL REPORT (2019)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය යටතේ 2021.12.09 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.11.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.11.29 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය: වාර්ෂික වාර්තාව සහ ගිණුම් (2019)

## இலங்கை சப்ரகமுவ பல்கலைக்கழகம்: வருடாந்த அறிக்கையும் கணக்குகளும் (2019)

## SABARAGAMUWA UNIVERSITY OF SRI LANKA: ANNUAL REPORT AND ACCOUNTS (2019)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ XIII කොටසේ 110 සහ 111 වගන්ති යටතේ 2021.12.10 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.11.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.11.29 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කොළඹ විශ්වවිද්‍යාලයේ, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය: වාර්ෂික වාර්තාව (2020)

## கொழும்பு பல்கலைக்கழகத்தின் நூலக மற்றும் தகவல் விஞ்ஞாபனங்களுக்கான தேசிய நிறுவனம்: வருடாந்த அறிக்கை (2020)

## NATIONAL INSTITUTE OF LIBRARY AND INFORMATION SCIENCES OF THE UNIVERSITY OF COLOMBO: ANNUAL REPORT (2020)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ XIII වන පරිච්ඡේදයේ 110 වන වගන්තිය යටතේ 2022.10.04 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කොළඹ විශ්වවිද්‍යාලයේ, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.11.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.11.29 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනය: වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම් (2020)

## மொரட்டுவ பல்கலைக்கழகத்தின் தொழில்நுட்ப நிறுவனம்: வருடாந்த அறிக்கையும் வருடாந்த கணக்குகளும் (2020)

INSTITUTE OF TECHNOLOGY OF THE UNIVERSITY OF MORATUWA: ANNUAL REPORT AND ANNUAL ACCOUNTS (2020)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24(අ) වගන්තිය යටතේ 2022.07.04 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.11.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.11.29 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## මොරටුව විශ්වවිද්‍යාලය: වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය (2020)

## மொரட்டுவ பல்கலைக்கழகம்: வருடாந்த அறிக்கையும் கணக்குக் கூற்றும் (2020)

UNIVERSITY OF MORATUWA: ANNUAL REPORT AND STATEMENT OF ACCOUNTS (2020)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 106(1) වගන්තිය යටතේ 2022.09.09 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මොරටුව විශ්වවිද්‍යාලයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.11.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.11.29 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ශ්‍රී ලංකා වරාය අධිකාරිය: වාර්ෂික වාර්තාව (2019)

## இலங்கை துறைமுக அதிகாரசபை: வருடாந்த அறிக்கை (2019)

SRI LANKA PORTS AUTHORITY: ANNUAL REPORT (2019)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරි පනතේ 33 වගන්තිය යටතේ 2021.06.23 දින ඉදිරිපත් කරන ලද 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රීලංකා වරාය අධිකාරියේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වරාය නාවික හා ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.09.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.09.22 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## සීමාසහිත ලංකා නැව් සංස්ථාව: වාර්ෂික වාර්තාව (2017/2018)

## வரையறுக்கப்பட்ட இலங்கை கப்பற் கூட்டுத்தாபனம்: வருடாந்த அறிக்கை (2017/2018)

CEYLON SHIPPING CORPORATION LIMITED: ANNUAL REPORT (2017/2018)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 07 දරන සමාගම් පනතේ 153 වගන්තිය යටතේ 2021.08.03 දින ඉදිරිපත් කරන ලද 2018.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සීමාසහිත ලංකා නැව් සංස්ථාවේ 2017/2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වරාය නාවික හා ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.09.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.09.22 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව: වාර්ෂික වාර්තාව (2013)
## இலங்கை கடற்றொழில் துறைமுகங்கள் கூட்டுத்தாபனம்: வருடாந்த அறிக்கை (2013)
## CEYLON FISHERY HARBOURS CORPORATION: ANNUAL REPORT (2013)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ධීවර අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තිය යටතේ 2017.06.21 දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ 2013 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.09.21 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.10.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව: වාර්ෂික වාර්තාව (2014)
## இலங்கை கடற்றொழில் துறைமுகங்கள் கூட்டுத்தாபனம்: வருடாந்த அறிக்கை (2014)
## CEYLON FISHERY HARBOURS CORPORATION: ANNUAL REPORT (2014)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ධීවර අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තිය යටතේ 2019.10.23 දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ 2014 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.09.21 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.10.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව: වාර්ෂික වාර්තාව (2015)
## இலங்கை கடற்றொழில் துறைமுகங்கள் கூட்டுத்தாபனம்: வருடாந்த அறிக்கை (2015)
## CEYLON FISHERY HARBOURS CORPORATION: ANNUAL REPORT (2015)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ධීවර අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තිය යටතේ 2019.10.23 දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.09.21 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.10.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව: වාර්ෂික වාර්තාව (2016)
## இலங்கை கடற்றொழில் துறைமுகங்கள் கூட்டுத்தாபனம்: வருடாந்த அறிக்கை (2016)
## CEYLON FISHERY HARBOURS CORPORATION: ANNUAL REPORT (2016)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ධීවර අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තිය යටතේ 2019.10.23 දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.09.21 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.10.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## සීමාසහිත සීනෝර් පදනම: වාර්ෂික වාර්තාව (2016)
## வரையறுக்கப்பட்ட சீநோர் நிறுவனம்: வருடாந்த அறிக்கை (2016)
## CEY-NOR FOUNDATION LIMITED: ANNUAL REPORT (2016)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ධීවර අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 07 දරන සමාගම් පනතේ 131 වගන්තිය යටතේ 2022.01.21 දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සීමාසහිත සීනෝර් පදනමේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.09.21 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.10.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය: වාර්ෂික වාර්තාව හා ගිණුම් (2019)
## தேசிய நீர்வளங்கள் ஆய்வு மற்றும் அபிவிருத்தி முகவர் நிறுவனம்: வருடாந்த அறிக்கையும் கணக்குகளும் (2019)
## NATIONAL AQUATIC RESOURCES RESEARCH AND DEVELOPMENT AGENCY: ANNUAL REPORT AND ACCOUNTS (2019)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ධීවර අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතන පනතේ 32 වගන්තිය යටතේ 2022.02.10 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.09.21 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.10.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය: වාර්ෂික වාර්තාව හා ගිණුම් (2020)
## தேசிய நீர்வளங்கள் ஆய்வு மற்றும் அபிவிருத்தி முகவர் நிறுவனம்: வருடாந்த அறிக்கையும் கணக்குகளும் (2020)
## NATIONAL AQUATIC RESOURCES RESEARCH AND DEVELOPMENT AGENCY: ANNUAL REPORT AND ACCOUNTS (2020)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ධීවර අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතන පනතේ 32 වගන්තිය යටතේ 2022.09.20 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.09.21 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.10.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව: වාර්ෂික වාර්තාව (2018)
## இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபனம்: வருடாந்த அறிக்கை (2018)
## SRI LANKA BROADCASTING CORPORATION: ANNUAL REPORT (2018)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2022.01.21 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.09.16 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.09.22 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය: වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය (2019)
## இலங்கை பத்திரிகைப் பேரவை: வருடாந்த அறிக்கையும் கணக்குக் கூற்றும் (2019)
## SRI LANKA PRESS COUNCIL: ANNUAL REPORT AND STATEMENT OF ACCOUNTS (2019)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2022.02.22 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

(ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.09.16 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.09.22 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය: වාර්ෂික වාර්තාව (2017)
## இலங்கை நீதிபதிகள் நிறுவனம்: வருடாந்த அறிக்கை (2017)
## SRI LANKA JUDGES' INSTITUTE: ANNUAL REPORT (2017)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2022.08.09 දින ඉදිරිපත් කරන ලද, 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.09.22 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.10.19 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය: වාර්ෂික වාර්තාව (2020)
## குற்றத்தால் பலியானவர்களையும் மற்றும் சாட்சியாளர்களையும் பாதுகாப்பதற்கான தேசிய அதிகாரசபை: வருடாந்த அறிக்கை (2020)
## NATIONAL AUTHORITY FOR PROTECTION OF VICTIMS OF CRIME AND WITNESSES: ANNUAL REPORT (2020)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2022.08.29 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.09.22 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.10.19 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ජාතික මෝස්තර මධ්‍යස්ථානය: වාර්ෂික වාර්තාව (2019)
## தேசிய வடிவமைப்பு நிலையம்: வருடாந்த அறிக்கை (2019)
## NATIONAL DESIGN CENTRE: ANNUAL REPORT (2019)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1982 අංක 35 දරන ජාතික ශිල්ප සභාව සහ අනුබද්ධ ආයතන පනතේ 84 වගන්තිය යටතේ 2022.02.10 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.11.16 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.11.30 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය: වාර්ෂික වාර්තාව (2018)
## இலங்கை புடைவை மற்றும் ஆடை நிறுவகம்: வருடாந்த அறிக்கை (2018)
## SRI LANKA INSTITUTE OF TEXTILE AND APPAREL: ANNUAL REPORT (2018)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2009 අංක 12 දරන ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතන පනතේ 16 වගන්තිය යටතේ 2022.01.20 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රීලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.11.16 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.11.30 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ටවර් හෝල් රඟහල පදනම: වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන (2017)
## டவர் மண்டப அரங்க மன்றம்: வருடாந்த அறிக்கையும் நிதிக்கூற்றுக்களும் (2017)
## TOWER HALL THEATRE FOUNDATION: ANNUAL REPORT AND FINANCIAL STATEMENTS (2017)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1978 අංක 1 දරන ටවර් හෝල් පදනම පනතේ 12(5) වගන්තිය යටතේ 2021.04.06 දින ඉදිරිපත් කරන ලද, 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ටවර් හෝල් රඟහල පදනම 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.10.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.12.01 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ටවර් හෝල් රඟහල පදනම: වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන (2018)
## டவர் மண்டப அரங்க மன்றம்: வருடாந்த அறிக்கையும் நிதிக்கூற்றுக்களும் (2018)
## TOWER HALL THEATRE FOUNDATION: ANNUAL REPORT AND FINANCIAL STATEMENTS (2018)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1978 අංක 1 දරන ටවර් හෝල් පදනම පනතේ 12(5) වගන්තිය යටතේ 2022.05.04 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ටවර් හෝල් රඟහල පදනම 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් අනුමත කළ යුතු ය.

(බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.10.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.12.01 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ටවර් හෝල් රඟහල පදනම: වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන (2019)
## டவர் மண்டப அரங்க மன்றம்: வருடாந்த அறிக்கையும் நிதிக்கூற்றுக்களும் (2019)
## TOWER HALL THEATRE FOUNDATION: ANNUAL REPORT AND FINANCIAL STATEMENTS (2019)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1978 අංක 1 දරන ටවර් හෝල් පදනම පනතේ 12(5) වගන්තිය යටතේ 2022.07.04 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ටවර් හෝල් රඟහල පදනම 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.10.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.12.01 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## මධ්‍යම සංස්කෘතික අරමුදල: වාර්ෂික වාර්තාව (2012)
## மத்திய கலாசார நிதியம்: வருடாந்த அறிக்கை (2012)
## CENTRAL CULTURAL FUND: ANNUAL REPORT (2012)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9(4) වගන්තිය යටතේ 2019.10.23 දින ඉදිරිපත් කරන ලද, 2012.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.10.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.12.01 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## මධ්‍යම සංස්කෘතික අරමුදල: වාර්ෂික වාර්තාව (2013)
## மத்திய கலாசார நிதியம்: வருடாந்த அறிக்கை (2013)
## CENTRAL CULTURAL FUND: ANNUAL REPORT (2013)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9(4) වගන්තිය යටතේ 2019.10.23 දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2013 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.10.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.12.01 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## මධ්‍යම සංස්කෘතික අරමුදල: වාර්ෂික වාර්තාව (2014)
## மத்திய கலாசார நிதியம்: வருடாந்த அறிக்கை (2014)
## CENTRAL CULTURAL FUND: ANNUAL REPORT (2014)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9(4) වගන්තිය යටතේ 2019.10.23 දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2014 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.10.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.12.01 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## මධ්‍යම සංස්කෘතික අරමුදල: වාර්ෂික වාර්තාව (2015)
## மத்திய கலாசார நிதியம்: வருடாந்த அறிக்கை (2015)
## CENTRAL CULTURAL FUND: ANNUAL REPORT (2015)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9(4) වගන්තිය යටතේ 2019.10.23 දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.10.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.12.01 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය: වාර්ෂික වාර්තාව (2019)
## மத்திய பொறியியல் சேவைகள் தனியார் நிறுவனம்: வருடாந்த அறிக்கை (2019)
## CENTRAL ENGINEERING SERVICES (PVT.) LIMITED: ANNUAL REPORT (2019)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 07 දරන සමාගම් පනතේ 166 වගන්තිය යටතේ 2022.09.09 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.11.23 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.11.26 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය: වාර්ෂික වාර්තාව (2018)
## மத்திய பொறியியல் சேவைகள் தனியார் நிறுவனம்: வருடாந்த அறிக்கை (2018)
## CENTRAL ENGINEERING SERVICES (PVT.) LIMITED: ANNUAL REPORT (2018)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 07 දරන සමාගම් පනතේ 166 වගන්තිය යටතේ 2022.09.09 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.11.23 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.11.26 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය: වාර්ෂික වාර්තාව (2018)
## மத்திய பொறியியல் உசாத்துணைப் பணியகம்: வருடாந்த அறிக்கை (2018)
## CENTRAL ENGINEERING CONSULTANCY BUREAU: ANNUAL REPORT (2018)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 30 වගන්තිය යටතේ 2021.10.22 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.11.23 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.11.26 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය: වාර්ෂික වාර්තාව (2015)
## மத்திய பொறியியல் உசாத்துணைப் பணியகம்: வருடாந்த அறிக்கை (2015)
## CENTRAL ENGINEERING CONSULTANCY BUREAU: ANNUAL REPORT (2015)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 30 වගන්තිය යටතේ 2019.02.20 දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.03.24 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.11.23 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය: වාර්ෂික වාර්තාව (2013)

## மத்திய பொறியியல் உசாத்துணைப் பணியகம்: வருடாந்த அறிக்கை (2013)

## CENTRAL ENGINEERING CONSULTANCY BUREAU: ANNUAL REPORT (2013)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 30 වගන්තිය යටතේ 2017.07.28 දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ 2013 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.
>
> (වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.03.24 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.11.23 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ජාතික තරුණ සේවා සභාව: වාර්ෂික වාර්තාව (2019)

## தேசிய இளைஞர் சேவைகள் மன்றம்: வருடாந்த அறிக்கை (2019)

## NATIONAL YOUTH SERVICES COUNCIL: ANNUAL REPORT (2019)

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1979 අංක 69 දරන තරුණ සේවා සභා පනතේ 2022.10.07 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික තරුණ සේවා සභාවේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.
>
> (ක්‍රීඩා හා යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.11.22 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.11.26 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාව කල් තැබීම, ගරු සභානායකතුමා.

## කල්තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු සංජීව එදිරිමාන්න මන්ත්‍රීතුමා.

## නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සැසිවාරය විවෘත කරමින් අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනය

## ஒன்பதாவது பாராளுமன்றத்தின் நான்காவது கூட்டத்தொடரை ஆரம்பித்துவைத்து மாண்புமிகு சனாதிபதி அவர்கள் முன்வைத்த கொள்கைப் பிரகடனம்

## POLICY STATEMENT MADE BY THE HON. PRESIDENT AT THE INAUGURATION OF FOURTH SESSION OF NINTH PARLIAMENT

[පූ.භා. 9.57]

**ගරු සංජීව එදිරිමාන්න මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன)
(The Hon. Sanjeeva Edirimanna)

ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "නවවැනි පාර්ලිමේන්තුවේ හතරවන සැසිවාරය ආරම්භ කරමින් ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් ඊයේ දින එනම් 2023.02.08වන දින ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය මෙම උත්තරීතර සභාවට ඉදිරිපත් කරන ලදී.
>
> නව ජනාධිපතිවරයා ලෙස ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා පත්වීමත් සමඟ රට අරාජිකත්වයට පත්වීමෙන් වළකා ජනතාවට ඇති ප්‍රශ්න විසඳීමට සියලු පක්ෂ එක්වන ලෙස යෝජනා කළේ ය. තවදුරටත් එතුමා 2023.02.08 දින නවවැනි පාර්ලිමේන්තුවේ හතරවැනි සැසිවාරය ආරම්භ කරමින්, 'අතීතයේ සිරකරුවන් නොවී අපි අනාගතය ගැන සිතමු. අපි එකට එක්වෙමු. පොදු එකඟත්වයක් ඇති කර ගනිමු. ප්‍රජාතන්ත්‍රවාදී අදහස්වලින් පෝෂිතව ඉදිරියට යමු. රට වැටී ඇති අසාධ්‍ය තත්ත්වයෙන් ගොඩ ගැනීමට උපරිම සහාය දෙමු. දේශපාලන අරමුණු ගැන සිතන්නට අවශ්‍ය නම්, රට මේ අර්බුදයෙන් මුදා ගත් පසු ඒ ගැන සිතමු' යි යෝජනා කළේ ය.
>
> අද වන විට ගරු ජනාධිපතිතුමා ධුරයට පත් වන අවස්ථාවේ තිබූ ප්‍රශ්න රැසක් අවසන් නමුත්, ආර්ථික ගැටලුවේ අප තවමත් පැමිණ ඇත්තේ භාගයක් දුර පමණි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් ලබා ගැනීමේ සාකච්ඡා මේ වන විට සාර්ථක මට්ටමකට පැමිණ තිබේ. ජනතාව විසින් ඉල්ලූ ක්‍රම වෙනස සඳහා අවශ්‍ය නීති සම්පාදනය සඳහා මූලික වගකීම ඇත්තේ ද මෙම සභාවටය. එපමණක් නොව, උතුරු

සහ නැඟෙනහිර ජීවත්වන ජනතාවගේ මෙන්ම අනෙකුත් ප්‍රදේශවල ජනතාවගේ ප්‍රශ්න නිරාකරණය සඳහා අවශ්‍ය බලය බෙදීමේ යන්ත්‍රණය ඒකීය රටක් තුළ, ක්‍රියාත්මක කරමින් තිබෙන ගැටලු විසඳා වේගවත් සංවර්ධනයකට මඟ සකස් කිරීමත් මෙම සභාවේ වගකීමකි.

එබැවින් රට පත්ව ඇති තත්ත්වයෙන් ගොඩ ගැනීමට ගරු ජනාධිපතිතුමා ඇතුළු රජය ගෙන යන වැඩ පිළිවෙළට නවවැනි පාර්ලිමේන්තුව ලෙස ව්‍යවස්ථාදායකයේ වගකීම ඉටු කරමින්, ජනතාවගේ ගැටලු විසඳමින්, දියුණු රටක් නිර්මාණය කිරීමට අවශ්‍ය දායකත්වය ලබා දිය යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කරමි."

ගරු කථානායකතුමනි, මගේ කථාව ආරම්භයේදී, ඊයේ ගරු ජනාධිපතිතුමා විසින් සිදු කළ කථාවේ සුවිශේෂී තැන් කිහිපයක් පිළිබඳව කරුණු දැක්වීමට අපේක්ෂා කරනවා.

එතුමාගේ කථාවේ එක තැනකදී සඳහන් කළා, "අනතුරුදායක වැල් පාලමේ ශ්‍රී ලංකා මාතාව සැහෙන දුරක් සුරක්ෂිතව රැගෙන එන්න අපට පුළුවන් වුණා. අපි ආවේ ලෙහෙසි පහසු ගමනක් නොවෙයි. හැබැයි, ගමන තවම ඉවර නැහැ" කියලා. ගරු ජනාධිපතිතුමා ඒ කථාව කියද්දී, හැමෝටම මතක් වෙන්න ඇති, "හුණුවටයේ කථාව" කියන වේදිකා නාට්‍යයේ තිබෙන "වැල් පාලමේ" ගීතය. එතුමා අග්‍රාමාත්‍ය ධුරයට පත් වුණු වෙලාවේත් ඒ පිළිබඳව සඳහනක් කළා මට මතකයි. හුණුවටයේ කථාව වේදිකා නාට්‍යයේ සඳහන් "වැල් පාලමේ" ගීතයේ සඳහන් වෙනවා, "හෙල ගැඹුරුයි පුත නොබලන් - හෙලවෙන කොට වැල් පාලම... අපට පුතේ මගක් නැතේ - මේ මග මිස යමන් පුතේ" කියලා.

ගරු කථානායකතුමනි, ඊයේ ගරු ජනාධිපතිතුමාගේ කථාවේදී "වැල් පාලම්" උදාහරණය ගෙන හැර දක්වනකොට, හැමෝටම "වැල් පාලමේ" ගීතය මතක් වුණාට, ඒ කථාව අහගෙන ඉන්නකොට මට නම් මතක් වුණේ, හුණුවටයේ කථාවේම ගෲෂා ගයන වෙනත් ගීතයක්. ඒ ගීතය ආරම්භ වෙන්නේ මෙන්න මෙහෙමයි:

"ගන්නෙ නැති නිසා කවුරුත් පුතු උඹ මම අර ගන්නවා උඹට නැති නිසා කවුරුත් මම අම්මයි හිතන් පුතේ" හිටපු ජනාධිපති ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති ධුරය අතහැර යන්න තීන්දු කළ වෙලාවේ, මේ රටේ අනාගතය ගොඩනැඟීම පිළිබඳව විවිධ අදහස් දැක්වූ, පුරසාරම් දොඩපු සියලු දෙනාට රට භාර ගැනීම සඳහා ආරාධනා කළා. ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාට ආරාධනා කළා. ඒ වාගේම, ජාතික ජන බලවේගයේ නායක ගරු අනුර දිසානායක මැතිතුමාට එතුමා ආරාධනා කළා. මම දන්නා විධියට, ගරු සරත් ෆොන්සේකා මැතිතුමාටත් එතුමා ආරාධනා කළා.

ඒත් ඒ කවුරුවත් මේ අභියෝගාත්මක මොහොතේ ඒ වගකීම භාරගන්නට ඉදිරිපත් වුණේ නැහැ. හුණුවටයේ කතාවේ, මාළිගාවේ තනි වෙච්ච මයිකල් කුමාරයා දෝතට ගත්තු ගෲෂාට වාගේ රනිල් වික්‍රමසිංහට කොන්දක් තිබුණා, මේ වගකීම භාරගන්න. ඒ අභියෝගාත්මක වගකීම භාරගැනීම සඳහා එතුමාට තිබුණු දේශපාලන පෞරුෂයට මම ගරු කරනවා. ඊයේ රාජාසන කතාවේ දී එතුමා පළ කළ වටිනා අදහස් කිහිපයටත්, විශේෂයෙන් මේ දුෂ්කර මොහොත තරණය කිරීම වෙනුවෙන් සියලු පාර්ශ්වයන්ගේ සහාය අවංකව අපේක්ෂා කරමින් එතුමා කළ යෝජනාවටත් ගරු කරන්න මා කැමැතියි.

ගරු කථානායකතුමනි, ඊයේ ගරු ජනාධිපතිතුමාගේ කතාවේ එක් තැනක කියනවා, "මතක තබා ගන්න. මට අවශ්‍ය ජනප්‍රිය වෙන්න නෙවෙයි. මට අවශ්‍ය මේ රට වැටී ඇති අර්බුදකාරී තත්ත්වයෙන් යළි ගොඩනංවන්නයි. ඔව්, මම රට වෙනුවෙන් ජනප්‍රිය නොවන තීරණ ගන්නවා. ඒ තීරණවල වැදගත්කම තව අවුරුදු දෙක තුනකින් බොහෝ දෙනෙකුට අවබෝධ වේවි." කියලා. ඊයේ ගරු ජනාධිපතිවරයාගේ රාජාසන කතාවේ මට දැනුණු වැදගත්ම තැන මෙතැනයි. මේ අදහස මේ මොහොතේ, මේ සමාජයේ ජනප්‍රිය වන්නේ නැහැ. එය හුදු ප්‍රසිද්ධ ප්‍රකාශයක් බවට පත් වනවා විතරයි. ඒ වාගේම ගරු කථානායකතුමනි, මේ අදහස ගැන කතා කරන මා, අද රාත්‍රි ප්‍රවෘත්තිවල ජනප්‍රිය මිනිහෙකු නොවන බවත් මම දන්නවා. නමුත්, මේ කටුක, අම්හිරි යථාර්ථය කවුරුන් විසින් හෝ මේ සමාජය තුළ කතා කළ යුතුව තිබෙනවා.

මානව ශිෂ්ටාචාරය මේ නූතන දියුණුව කරා පැමිණ තිබෙන්නේ මේ ලෝකය කරවපු නායකයන් විසින් ගන්නා ලද තීන්දු නිසා. අමාරුම වෙලාවක ගන්නා කිසිම තීරණයක් ලෝක ඉතිහාසයේ කවම කවරදාකවත් ජනප්‍රිය වෙලා නැහැ. හැබැයි, ඒ තීන්දුවල ප්‍රතිඵල ලෝක ඉතිහාසය පුරා ජනප්‍රිය වෙලා තිබෙනවා. ඒක තමයි අප දැකපු යථාර්ථය.

දෙවන ලෝක යුද්ධය වෙලාවේ බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍ය වින්ස්ටන් චර්චිල් ඒ යුද ගැටුමට මැදිහත් වෙන්න ගත් තීන්දුව සම්බන්ධයෙන්, චර්චිල් සම්බන්ධයෙන්, එදා බ්‍රිතාන්‍ය සමාජය තුළ හෝ ඒ ඒකාබද්ධ ප්‍රහාරයට සම්බන්ධිත කිසිදු රාජ්‍යයක ජන මනස තුළ ජනප්‍රියත්වයක් තිබෙන්නට නැතිව ඇති. ඒ නිසා වෙන්න ඕනෑ, චර්චිල් බීබීසී ගුවන් විදුලියට ගිහිල්ලා, බ්‍රිතාන්‍ය ප්‍රමුඛ ලෝ වැසියන් අමතා එකමොහොතක කිව්වේ, මේ මොහොතේ මට ඔබට දිය හැක්කේ ලේ සහ කඳුළු විතරයි කියලා. එවැනි තීන්දුවක් ගන්නා වෙලාවේ ජනප්‍රියභාවයට පත් වෙන්න බැහැ. නමුත්, ඒ තීරණය විසින් උදා කළ දෙවන ලෝක යුද්ධයේ අවසානය පිළිබඳව අදටත් ලෝක ඉතිහාසයේ ජනප්‍රියම ප්‍රවෘත්තියක් විධියට අපි කථා කරනවා. ඒ වාගේම ලෝක දේශපාලනයේ සම්භාවනීය මනුෂ්‍යයෙකු විධියට අදටත් අපි චර්චිල්ට ගරු කරමින් කථා කරනවා.

මට මේ අවස්ථාවේ මතක් වෙනවා අපේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ට පහර දෙන්න ගත්තු තීන්දුව. ඒ තීන්දුව ජනප්‍රිය නැහැ. ජනප්‍රිය වුණේ ඒ තීන්දුව විසින් උදා කරන ලද සාමය බව අපට අමතක කරන්නට බැහැ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය හදන්න ගත් තීන්දුව ජනප්‍රිය නැහැ. නමුත් එහි ප්‍රතිඵලය මේ සමාජයේ ජනප්‍රියයි. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා මේ රටේ බලශක්ති උත්පාදනය සම්බන්ධව ඉහළ කොත්මලේ බලාගාරය හදන්න ගත් තීරණය ජනප්‍රිය වුණේ නැහැ. නමුත් එහි ප්‍රතිඵලය ඉතා බලසම්පන්න ලෙස මේ සමාජය තුළ ජනප්‍රිය වුණා. මෙහිදීත් තීන්දු කරන්න වෙන්නේ, තේරුම්ගන්න වෙන්නේ, ජනප්‍රිය වන්නේ තීරණ නොව, ඒ තීරණවල ප්‍රතිඵල බවයි. 2015 ආණ්ඩුව සාම්පූර් බලාගාරය අත් හරින්න ගත්තු තීරණය ජනප්‍රියයි. නමුත්, එහි ප්‍රතිඵලය ජනප්‍රිය නැහැ.

ගරු කථානායකතුමනි, මම මේ කියන්න උත්සාහ කළේ, නිවැරැදි තීරණ ජනප්‍රිය නැති නමුත් ඒවායේ ප්‍රතිඵල ජනප්‍රිය බව සහ වැරැදි තීරණ ජනප්‍රිය නමුත් ඒවායේ ප්‍රතිඵල ජනප්‍රිය වන්නේ නැති බවයි. ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා ඊයේ රාජාසන කථාවේදී කිව්වේ, රට වෙනුවෙන් ජනප්‍රිය නොවන තීන්දු ගන්න එතුමා සූදානම් කියලායි. ගරු කථානායකතුමනි, ඒ දේශපාලන පෞරුෂයට මා ගරු කරන්නට කැමැතියි. ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රටේ අනුප්‍රාප්තික ජනාධිපති ධුරයට පත් කිරීම සඳහා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ -පොහොට්ටුව- විධියට අප තීන්දුවක් ගත් වෙලාවේ මේ රටේ සහෘද මාධ්‍යවේදීන් විසින් ඉතා තාර්කිකව අපගේ එම තීන්දුව ප්‍රශ්න කරනු ලැබුවා. ගරු කථානායකතුමනි, එක්තරා ප්‍රවෘත්ති සාකච්ඡාවකදී මාධ්‍ය සහෘදයෙකු ඒ පිළිබඳව ප්‍රශ්න කළ වෙලාවේ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති ධුරයට පත් කිරීම සම්බන්ධව ගත් තීන්දුව පිළිබඳව පක්ෂයේ හේතු දැක්වීමේදී මම ප්‍රධාන හේතු දෙකක් ඉදිරිපත් කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு அஜித் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. AJITH RAJAPAKSE] took the Chair.*

**ගරු සංජීව එදිරිමාන්න මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன)
(The Hon. Sanjeeva Edirimanna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇයි රනිල් වික්‍රමසිංහ මහත්මයා ජනාධිපති කරන්න තීන්දු කළේ කියලා ඒ ප්‍රවෘත්ති සාකච්ඡාවේදී ප්‍රශ්න කළාම මම හේතු දෙකක් කිව්වා. එකක් තමයි, Bermuda Triangle එක ළඟදී නැවක් ආධුනික නැවියෙකුට පවරන්න බැහැ කියන එක. මෙවැනි අභියෝගාත්මක මොහොතක එතුමා සතුව තිබෙන දේශපාලන පරිණතභාවය පිළිබඳව පක්ෂයක් විධියට අපි බරපතළ ලෙස කල්පනා කළා. දෙවන හේතුවයි අද මගේ මේ කථාවට අදාළ වන්නේ. මම එදා කිව්වා, පක්ෂ දේශපාලනය සම්බන්ධයෙන් මේ මොහොතේ අඩුම බැඳීම් -අවම බැඳීම්- තිබෙන්නේ රනිල් වික්‍රමසිංහ මහත්මයාට, ඒ නිසා මේ මොහොතට ගැළපෙන වඩා ගැඹුරු, බරපතළ, යහපත් දේශපාලන තීන්දු ගැනීමට නම් පක්ෂ දේශපාලනය සම්බන්ධ අවම බැඳීම් සහිත පුද්ගලයෙකු මේ මොහොතේ රටට වැදගත් වෙනවා කියලා. එදා අප විසින් මතු කරන ලද ඒ තර්කය අද ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා විසින් පසක් කර තිබෙනවා කියා මා විශ්වාස කරනවා. මම මෙහෙම කිව්වාට ජනාධිපතිවරයා අමනාප වන එකක් නැහැ. මේ ගරු සභාවේ UNP එක නියෝජනය කරමින් ගරු මන්ත්‍රීතුමන්ලා 50ක්, 60ක් සිටියා නම්, එතුමාට මේ රටේ මේ මොහොතට අදාළ ගැඹුරු ප්‍රායෝගික තීන්දු ගන්න, නිරවුල් මනසකින් කටයුතු කරන්න අවස්ථාවක් නොලැබෙන්නට ඉඩ තිබුණා. මොකද, එතුමා නායකයා විධියට තීන්දු ගන්න හදන වෙලාවේ එතුමාගේ ස්වාභාවික දේශපාලන සිතුවිලි මා අර කියපු බාහිර සාධක විසින් පාලනය කරන්න ඉඩ තිබුණා. මේ මොහොතේ රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා කටයුතු කරමින් ඉන්නේ ඉතාම නිවැරැදි ලෙස රාජ්‍යයේ නායකයා විධියට මිස වෙනත් දේශපාලන පක්ෂයක නායකයෙකු විධියට නොවෙයි. ගරු ජනාධිපතිතුමාට මම මේ මොහොතේ කියන්නේ, ඔබතුමා ජනාධිපතිකම කරද්දී UNP එකේ නායකත්වය අපි ඔබතුමාගෙන් දැක්කේ නැහැ. ඒක තවදුරටත් continue කරගෙන යමු කියලායි. ගමේ ඉන්න එක්සත් ජාතික පක්ෂයේ පාක්ෂිකයන් බලාගන්න වජිර අබේවර්ධනලා, සාගල රත්නායකලා, රුවන් විජේවර්ධනලා, පාලිත රංගෙ බණ්ඩාරලා, අකිල විරාජ්ලා කටයුතු කරයි. ඒ නිසා මම ගරු ජනාධිපතිතුමාට යෝජනා කරනවා, මේ දක්වා කටයුතු කළා සේම ඉදිරියටත් කටයුතු කරන්න, මේ වගකීම්සහගත මොහොතේ ඔබතුමා රටේ නායකයා විධියට තවදුරටත් ඒ ප්‍රතිපත්ති අනුගමය කරන්න කියලා.

අවසාන මිනිත්තු කිහිපයේ මම කියන්න සූදානම්, ඊයේ අපේ ආණ්ඩු පක්ෂ මන්ත්‍රී කණ්ඩායම මුණගැහිච්ච වෙලාවේදීත් ජනාධිපතිතුමා සඳහන් කළ කාරණාවක් ගැන. ඒ තමයි, අපි මේ කථා කරන පද්ධති වෙනස - system change එක - මේ සමාජය තුළ අනවබෝධයෙන් සංවාදයට ලක් වෙමින් තිබෙනවාය කියන කාරණය. කිසියම් සමාජයක පද්ධති වෙනසක් අපේක්ෂා කරන්නේ නම්, ඒ සඳහා ප්‍රජා කේන්ද්‍රීය ආකල්ප වුවමනායි. පුද්ගල කේන්ද්‍රීය ආකල්ප සහිත කණ්ඩායම් හදාගත්තු දේශපාලන බල කඳවුරුවලට එවැනි ප්‍රජා කේන්ද්‍රීය ආකල්ප එතුළින් උත්පාදනය වන බවක් අපි දැක නැහැ. ප්‍රජා කේන්ද්‍රීය ආකල්පයකින් කටයුතු කරනවා කියන්නේ, සමස්තය දකිමින් සමස්තය පිළිබඳ අවබෝධයක් ඇතිව සමස්තයට අදාළ වන ලෙස යහපත් ආකල්පවලින් කටයුතු කරන එකයි.

කොවිඩ් උවදුර ආ වෙලාවේ චීනය එක්තරා වැදගත් slogan එකක් අතට ගත්තා. ඔවුන්ගේ සටන් පාඨයේ නැත්නම් තේමා පාඨයේ අදහස වුණේ, "මට හැදෙන්නේ නැහැ නොවෙයි, මගෙන් කාටවත් හැදෙන්නේ නැහැ" කියන පොදු ප්‍රජා කේන්ද්‍රීය ආකල්පයයි. පුද්ගල කේන්ද්‍රීය ආකල්පවලින් බැහැරව පොදු යහපත් ප්‍රජා කේන්ද්‍රීය ආකල්ප සමඟ මේ පවතින සමාජ තත්ත්ව වෙනස් කරගෙන ඉදිරියට යන්න අපට පුළුවන් නම්, එය තමයි වඩා වැදගත් වන්නේ. සමාජයක් තුළ ප්‍රජා කේන්ද්‍රීය ආකල්ප බිහි වන්නට නම්, ඒ සඳහා දේශපාලන පරමාදර්ශ අත්‍යවශ්‍යයි. මම මේ උත්තරීතර සභාවට කියා සිටිනවා, ඒ දේශපාලන පරමාදර්ශ බවට පත් වීමේ වගකීම ඔබට සහ මට තිබෙන බව.

වරක් ස්විට්සර්ලන්තයේ අගමැතිවරයා එරට පොදු ප්‍රවාහන සේවයේ -දුම්රියක- තුන්වන පන්තියේ ටිකට් එකක් අරගෙන යනකොට ඔහුගෙන් මිත්‍රයෙක් අහනවා, ඇයි, රටේ අගමැති විධියට ඔබ තුන්වෙනි පන්තියේ යන්නේ කියලා. ස්විට්සර්ලන්ත අගමැති ඔහුට ප්‍රතිචාර දක්වමින් කියනවා, ස්විට්සර්ලන්තයේ කෝච්චියේ හතරවැනි පන්තියක් නැති නිසායි මම තුන්වෙනි පන්තියේ යන්නේ කියලා. අපට දේශපාලන පරමාදර්ශ වුවමනායි. ඉතිහාසය විසින් අපට එවැනි අවස්ථාවක් නිර්මාණය කර දීලා තිබෙනවා.

ඊයේ මේ උත්තරීතර සභාව නියෝජනය කරන්නත්, මේ සංවාදයේ පාර්ශ්වකරුවන් බවට පත් වන්නත් සජිත් ප්‍රේමදාස මහත්මයා ප්‍රමුඛ සජබයට යුතුකමක් තිබුණා. රාජ්‍යයේ ව්‍යවස්ථාවට අනුගතව රටේ ජනාධිපතිවරයා රාජාසන කථාවට පැමිණෙන වෙලාවේ ඒ සඳහා වන අවම විනයවත් පවත්වාගෙන යන්න තරම් මේ උත්තරීතර සභාව නියෝජනය කරන විපක්ෂයේ කණ්ඩායමක් අපොහොසත් වූ බව ඔබ මා පමණක් නොවෙයි, ගැලරියේ සිටි විදේශ තානාපතිවරුන් පවා දුටුවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා මම යළි යළි යෝජනා කරනවා, මේ මොහොතේ සිට අපි මේ සමාජයේ දේශපාලන පරමාදර්ශ බවට පත් වෙමු කියලා. ගරු ජනාධිපතිතුමන් ඊයේ රාජාසන කථාව තුළින් කළ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ අදහස් යහපත් ලෙස ක්‍රියාත්මක කරමින්, ඒ වාගේම මහජන මතවාදවලට සංවේදී වෙලා අවශ්‍ය තැන්වලදී යහපත් වෙනස්කම් සිදු කරමින් අපි ඉදිරියට යා යුතුව තිබෙනවා.

ආසන්නම උදාහරණය වන PAYE Tax සම්බන්ධයෙන් සමාජයේ මතු වුණු මතයට සංවේදීව යම් යහපත් ප්‍රතිචාරයක් දක්වන්නට ආණ්ඩුව ඉදිරිපත් වෙලා තිබෙනවා. මොකද, අපි ගන්නා ඇතැම් තීන්දුවල අප නොදකින පැත්තක් සමාජය විසින් දැකීමට ඉඩ තිබෙනවා. ආණ්ඩුවක නායකයෝ සමාජය කියන හැම දේම කළ යුතුයි කියා මම කියනවා නොවෙයි. නමුත්, සමාජය තුළින් මතු වන ප්‍රායෝගික, යහපත්, පොදු යහපත අපේක්ෂා කරන යෝජනා සම්බන්ධව අපි අඛණ්ඩව සංවේදී විය යුතුයි කියා මා යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව එක කාරණයක් කියන්න අවස්ථාව දෙන්න. ලංකා දේශපාලනයේ ජ්‍යෙෂ්ඨතම සම්භාවනීය චරිතයක් අද මේ උත්තරීතර සභාවට සභිකයකු ලෙස අභිනවයෙන් නැවත තේරී පත්ව පැමිණියා. අපි ඉස්කෝලේ යන කාලේ එතුමා දාපු පුංචි "බඩී" බස් එකේ ඉස්කෝලේ ගිය

මිනිහෙක් මම. ගරු ෆවුසි මැතිතුමනි, මම ඔබතුමාට බොහොම ආදරයෙන් සුබ පතනවා. ඉස්සර, අපි ඉස්කෝලේ යන කාලයේ පුංචි කොලු ගැටව් විධියට "එල, ෆවුසි" කියලා තමයි ඒ බස් එකට නැග්ගේ.

අදින් පටන් ගන්නා අලුත් දේශපාලන ගමනට මම ඔබතුමාට සුබ පතනවා. ඒ වගේම මේ යන යහපත් වැඩපිළිවෙළට ඔබතුමාගේ ජ්‍යෙෂ්ඨත්වයෙන් ලබාදිය හැකි යමක් තිබේ නම්, නොපිරිහෙළා එය ලබා දෙන්න කියලාත් මා ඔබතුමාට ආදරයෙන් යෝජනා කරනවා.

ගරු ජනාධිපතිතුමන් ඊයේ මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කළ රාජාසන කථාව සම්බන්ධයෙන් සභාව කල් තබන අවස්ථාවේ මෙම යෝජනාව ඉදිරිපත් කරමින් මා නිහඬ වෙනවා. ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
යෝජනාව ස්ථිර කිරීම, ගරු ඩී. වීරසිංහ මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 15ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.15]

**ගරු ඩී. වීරසිංහ මහතා**
(மாண்புமிகு டீ. வீரசிங்க)
(The Hon. D. Weerasingha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා නව වන පාර්ලිමේන්තුවේ හතරවන සැසිවාරය විවෘත කරමින් ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශනය සම්බන්ධයෙන් ගරු සංජීව එදිරිමාන්න මැතිතුමා විසින් අද සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිර කරමින්, ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අදාළ යම් කරුණු ප්‍රමාණයක් සාකච්ඡා කිරීමට මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

අද විපක්ෂය මෙතැන නොසිටීම ගැන මා කනගාටු වෙනවා. මම මුලින්ම ගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඉතාම බැරෑරුම් තත්ත්වයකට රට පත්ව තිබුණු වෙලාවක, ත්‍රස්තවාදී කණ්ඩායමක් විසින් මේ රට අල්ලා ගන්න උත්සාහ කරපු වෙලාවක, එදා විපක්ෂයේ හිටපු නායකයන් වගකීම භාර ගන්න බැහැ කියලා ඒ වගකීම මඟ හැරලා ගිය වෙලාවක, තමන්ගේ ගෙදරට ගිනි තියලා, තමන්ට දේශපාලනයට එන්න එපා කියලා තර්ජනය කරපු වෙලාවක, මේ රට වෙනුවෙන්, රටේ අනාගතය වෙනුවෙන් ජනාධිපතිතුමා නිර්භීත තීන්දුවක් ගත්තා. මේ රට තිබුණු තැනින් යහපත් තැනකට අරගෙන එන්න නායකත්වය දුන් ගරු ජනාධිපතිතුමාට මම තරුණයකු විධියට ස්තුතිවන්ත වෙනවා. එදා මේ රට වැටෙන්න ගිය ප්‍රපාතයෙන් ගලවා ගැනීම සඳහා එතුමා දුන් ඒ නායකත්වය වෙනුවෙන් මා එතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විධියට එතුමාට සහයෝගය ලබා දීමෙන් අපි බලාපොරොත්තු වුණේ, විශේෂයෙන්ම අපට පසුගිය මැතිවරණයේ දී ඡන්දය ලබාදුන් 69 ලක්ෂයක ජන වරම ආරක්ෂා කර ගැනීමයි. ඒ වාගේම රටේ සමස්ත ජනතාවගේ අනාගතය වෙනුවෙන් මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරලා, මේ රටේ ආරක්ෂාව සුරක්ෂිත කරන්න පුළුවන් නායකයා විධියට අභියෝගය භාරගත් නායකයාට අපේ සහයෝගය ලබා දෙනවා. අපි එදා එතුමාගෙන් බලාපොරොත්තු වෙච්ච ඒ දේ අද එතුමා ඉෂ්ට කරමින් සිටිනවාය කියලා අපි හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද රටේ පෝලිම් ටික අවසන් වෙලා තියෙනවා. අද ගොවියාට කෘෂිකර්මාන්තය කර ගන්න අවශ්‍ය සම්පත් ටික ලබා දීලා ඒ තුළින් ගොවියා දිරිමත් කරලා තිබෙනවා. ඒ වගේම රටේ කඩා වැටුණු ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ඉතාම අමාරු තීන්දු අරගෙන, රටේ ජනතාවටත් යම් බරක් දරන්න වෙන තීන්දු අරගෙන එතුමා රටේ ආර්ථිකය ශක්තිමත් කරමින් ඉන්නවා. එතුමා රට භාර ගන්නකොට අපේ ඩොලර් සංචිතය බිංදුවට වැටිලා තිබුණා. හැබැයි, අද ඒක ඩොලර් මිලියන 500ක් දක්වා වර්ධනය කර ගන්න හැකි වෙලා තිබෙනවා. එතුමා මේ රට භාර ගන්නකොට සියයට 70ට නැඟලා තිබුණු උද්ධමනය අද සියයට 54කට අඩු කර ගන්නත්, ඒ වාගේම, රට යම් විධියකට ස්ථාවර කර ගන්නත් අද එතුමාට හැකි වෙලා තිබෙනවා.

එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඉතාම වැදගත් කරුණු ගණනාවක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම ඒවා එකින් එක කියන්න යන්නේ නැහැ. එතුමා මේ රට භාර ගන්නකොට මුලින්ම මේ පාර්ලිමේන්තුවේ සිටින සියලු දේශපාලන පක්ෂවලට, දේශපාලන නායකයන්ට, මේ රටේ සිවිල් සංවිධානවලට ගෞරවයෙන් යුතුව ආරාධනා කළා, දේශපාලනය මඳකට නවතා මේ රට ගොඩ නඟන්නට, මේ රටේ අනාගතය සුරක්ෂිත කරගන්නට එකතු වෙන්න කියලා. හැබැයි, පටු දේශපාලන අරමුණු තිබුණු, නැවතත් මේ රටේ බලය ලබා ගන්නට ඕනෑය කියන විශ්වාසයෙන් හිටපු, ඒ වෙනුවෙන් වැඩ කටයුතු කරපු විපක්ෂයේ දේශපාලන කණ්ඩායම් එතුමා සද්භාවයෙන් කළ එම ආරාධනය එදා ප්‍රතික්ෂේප කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපට මීට වඩා වේගයෙන් මේ රට ඉස්සරහට අරගෙන යන්න තිබුණු අවස්ථාව අද විපක්ෂයේ පටු දේශපාලන අරමුණු වෙනුවෙන් නැති කරලා තිබෙනවා. තමන්ට බලය ලබා ගන්නේ කොහොමද කියන කාරණය වෙනුවෙන් මේ රටේ මිනිස්සු නැවත පාරට ඇද දමලා, යම්තාක් දුරකට මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරගෙන යන ගමන අඩාළ කරන්න ඔවුන් උත්සාහ කරමින් ඉන්නවා.

අපේ රටේ සංචාරක ව්‍යාපාරය බින්දුවට වැටිලා තිබුණා. මේ රටට සංචාරකයන්ට එන්න දුන්නේ නැහැ. සංචාරකයන් රටවලින් බස්වලා පයින් අවිද්දුවා. එවැනි අවස්ථා අපි පසුගිය කාලයේ දැක්කා. හැබැයි, අද වන විට සංචාරය කරන්න පුළුවන් හොඳම රටවල් දහය අතරට අපේ රට තේරෙනකොට, පසුගිය ජනවාරි මාසයේ විතරක් සංචාරකයන් ලක්ෂයක් මේ රටට පැමිණ තිබෙනවා. මේ රටට සල්ලි එවන්න එපා, ඒවා හොරකම් කරනවා කියලා විදේශ රටවල ඉන්න අපේ ශ්‍රමිකයන්ට ප්‍රචාරය කරලා, මේ රටට විදේශ විනිමය එවීම අඩාළ කරන්න කටයුතු කළ අයට මරු පහරක් එල්ල කරමින් අද අපේ විදේශ ශ්‍රමිකයන් ඩොලර් බිලියන හතරක පමණ මුදලක් අපේ රටට එවන්න කටයුතු කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අවසාන වශයෙන් මේ කාරණයත් මා කියන්න ඕනෑ. අපේ ගරු ජනාධිපතිතුමා කිව්වා, අප යන ගමන් මග විවේචනය කරන දේශපලන පක්ෂවලින් මම ඉල්ලා සිටින්නේ, වෙනත් විකල්ප මාර්ගයක් ඇත්නම් එය මේ සභාවට ඉදිරිපත් කරන්න කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ පාර්ලිමේන්තුවේ සිටින දේශපාලන පක්ෂවලට මේ රට ගොඩ නඟන්න එහෙම දැක්මක් තිබෙනවාය කියලා කොතැනකවත් කියලා තිබෙනවාද කියලා අපි අහන්න කැමැතියි. අද විපක්ෂයේ වගකීම ඉෂ්ට කරනවාද කියලා අපි අහන්න ඕනෑ. මේ රටේ ජනතාව තුළ ඒ ගැන අවබෝධයෙන් තිබෙන්න ඕනෑ. සංජීව එදිරිමාන්න මන්ත්‍රීතුමාත් කිව්වා වාගේ, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා එදා විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමාට, අනුර කුමාර දිසානායක මැතිතුමාට, ඒ වාගේම අනෙකුත් කණ්ඩායම්වලට මේ රට භාර ගන්න කියලා

[ගරු ඩී. වීරසිංහ මහතා]

ආරාධනා කළා. හැබැයි, එතුමන්ලා කවුරුත් ඒ වගකීමෙන් පැනලා ගියා. රටේ ජනතාව වෙනුවෙන් එතුමන්ලා ඒ අභියෝගය භාර ගත්තේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමාන ජනාධිපතිතුමා ඒ අභියෝගය භාර ගෙන මේ රට ගොඩ නඟන්නට කටයුතු කර තිබෙනවා.

ඉදිරි කාලය තුළදී මේ රට ගොඩ  නඟන්නේ කොහොමද, ආර්ථිකය ශක්තිමත් කරන්නේ කොහොමද කියලා ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කරමින් ගරු ජනාධිපතිතුමා කතා කළ වෙලාවේ විපක්ෂ නායකතුමා, ඒ වාගේම අනුර කුමාර දිසානායක මැතිතුමා පාර්ලිමේන්තුව මඟ හැර ගියා. මේ රටේ සමස්ත ජනතාව වැටිලා තිබෙන තැනින් ගොඩ ගන්න, පවතින ආර්ථික අර්බුදයෙන් මේ රට ගොඩගන්න අප සියලුදෙනාම එකතුවෙලා වැඩ කරන්න ඕනෑ. මේ රටේ සමස්ත ජනතාව ඡන්දය දීලා අපි මේ පාර්ලිමේන්තුවට එවා තිබෙන්නේ පවතින ආණ්ඩුවත් එක්ක රටේ තිබෙන ප්‍රශ්න  සාකච්ඡා කරලා මෙෙතක් වැරැදි මාර්ගයක ගියා නම්, දැන් හෝ නිවැරැදි මාර්ගයට යොමු කරලා, ආණ්ඩුව ඉස්සරහට ගෙන යන්නයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි ඊයේ විපක්ෂය හැසිරුණේ කොහොමද? වගකීම් විරහිත විපක්ෂයක් විධියටයි ඔවුන් වැඩ කටයුතු කළේ. එහෙම විපක්ෂයකට පුළුවන්ද මේ රට භාර ගන්න? ඔවුන්ට රට භාර දෙන්න කියලා ඔවුන් කියනවා. අඩුම ගණනේ ඇතිවෙලා තිබෙන ප්‍රශ්නයෙන් ගොඩ යන්නේ කොහොමද කියලා සාකච්ඡා කරන්න විපක්ෂය ඊයේ පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ. විදේශ තානාපතිවරු, විදේශ නියෝජිතවරු, රාජ්‍ය තාන්ත්‍රික නියෝජිත මහත්ම මහත්මීන් ඊයේ මේ ගැලරියේ සිටියා. හැබැයි, උගත්තු කියා ගන්නා, වියත්තු කියා ගන්නා පිරිස ඒ වෙලාවේ හූ කියලා මේ පාර්ලිමේන්තුවෙන් එළියට ගියා. පාර්ලිමේන්තු සම්ප්‍රදාය තුළ ඉතිහාසයේ කවදාවත් අපි එවැනි දෙයක් දැකලා නැහැ. ඒ පිළිබඳව අපි කනගාටු වෙනවා. ඒ පිරිස මුළු රටක් අපකීර්තියට පත් කරන්න කටයුතු කළා කියා මා විශ්වාස කරනවා. අද මේ සභාවේ අනුර කුමාර දිසානායක මැතිතුමා නැහැ. හැබැයි, එතුමන්ලා අද බලය ලබා ගන්න උත්සාහ කරනවා. ඒ අයට රටේ ආර්ථිකයට හෙණ ගහලා ගියාට කමක් නැහැ, රටේ මිනිස්සුන්ට කන්න නැති වුණාට කමක් නැහැ, රටේ අධ්‍යාපනය කඩා වැටුණාට කමක් නැහැ, රටේ විදුලි බලය නැති වුණාට කමක් නැහැ, රටට සංචාරකයෝ ආවේ නැති වුණාට කමක් නැහැ. පිට රට ඉන්න මිනිසුන්ට මේ රටට සල්ලි එවන්න එපා කියා එතුමන්ලා කියනවා. මේ රටේ ආර්ථිකය ගොඩ නඟන්න අද එතුමන්ලා කථා කරන්නේ මොනවාද? හැම වෙලාවේම ජාතිවාදය අවුස්සනවා. නමුත් අපි සතුටු වෙනවා, ඊයේ අපේ දෙමළ පක්ෂවල මන්ත්‍රීවරුන්, මුස්ලිම් පක්ෂවල මන්ත්‍රීවරුන් ජනාධිපතිතුමාගේ මේ වැඩ පිළිවෙළට සහයෝගය ලබා දෙන්න පාර්ලිමේන්තුව තුළ සිටීම පිළිබඳව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු 30ක් තිස්සේ අපේ රටේ යුද්ධයක් තිබුණා. ඒ කාලයේ අඩු වැඩි වශයෙන් සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවගේ සිත් රිදවීම් වෙන්න ඇති. යුද්ධයක් කරන කොට මිනිස්සු මැරෙනවා. හැබැයි, ඒ යුද්ධය අවසන් වුණා. මේ අවස්ථාවේ අපේ දෙමළ සහෝදරයන්ගෙන්, මුස්ලිම් සහෝදරයන්ගෙන් මම ඉතාම ගෞරවයෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. දැන් යුද්ධය ඉවරයි. දැන් තව පිරිසක් දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අල්ලාගෙන නැවත ලේ වැගිරීමක් කරන්න හදනවා. නමුත් ගරු ජනාධිපතිතුමා ඉතාම පැහැදිලිව කිව්වා,  මේක සිංහල, දෙමළ, මුස්ලිම් අපි හැමෝගේම රට. මේ රට තුළ බලය බෙදන්න පුළුවන් උපරිම විධියට බලය බෙදනවා. හැබැයි, පොලිස් බලතල දෙන්න, ඉඩම් බලතල දෙන්න අවශ්‍යතාවක් නැහැ. මේක අපි හැමෝගේම රට. අපි හැමෝටම පොලිස් බලතල තිබෙනවා. අපි හැමෝටම ඉඩම් බලතල තිබෙනවා. ඒවායේ ගැටලු තිබෙනවා නම් සාකච්ඡා කරලා විසඳා ගනිමු කියලා. ගරු ජනාධිපතිතුමා එහෙම කියද්දීත්, බංකොලොත් වෙච්ච දේශපාලන පක්ෂ නැවතත් ඒ සටන ඉස්සරහට අරන් යන්න ලෑස්ති වෙලා තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු එළියේ ඉඳගෙන මගේ කතාව අහගෙන ඉන්නවා නම්, මම එතුමන්ලාගෙන් අහන්න කැමැතියි, අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යනවා  ඒ පිළිබඳව ඔබේ ප්‍රතිපත්තිය මොකක්ද කියලා. අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන්න ඕනෑද, නැද්ද? ඒක රටට කියන්න. ආර්ථිකය ගොඩනඟන්නේ කොහොමද, මේ රට ඉස්සරහට අරගෙන යන්නේ කොහොමද කියලා අපට කියන්න.

අපි දන්නවා, ජනතා විමුක්ති පෙරමුණේ ආර්ථික ප්‍රතිපත්තිය මොකක්ද කියලා. එතුමන්ලා කථා කළොත් මොකක්ද කියන්නේ? තිබෙන මිනිහාගෙන් අරගෙන නැති මිනිහාට දෙනවා කියනවා. අපි දැන් බදු ප්‍රතිපත්තියක් ගෙනාවා. එය සාධාරණ බදු ප්‍රතිපත්තියක් වෙයි කියා අපිත් විශ්වාස කළා. නමුත්, එහි යම් යම් සංශෝධන කරන්න තිබුණා. අපේ ආණ්ඩුව එයට ඇහුම්කන් දුන්නා. ඇත්තටම ආර්ථික වශයෙන් අමාරු වෙලාවේ ජනතාවට පනවපු බදුවල යම් අසාධාරණකම් තිබුණා. ගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ අපේ ආණ්ඩුව තීන්දු අරගෙන, ඒ බදු ප්‍රතිපත්තිය සංශෝධනය කරන්න ඉදිරිපත්වෙලා තිබෙනවා. අපි ඒ පිළිබඳව රජයට ස්තුතිවන්ත වෙනවා. අපි අහනවා, එතුමන්ලා කොහොමද මේ රට ඉස්සරහට අරගෙන යන්නේ කියලා. බදු බර වැඩි නම්, බදු පනවන්නේත් නැත්නම්, බදු ප්‍රතිශතය අඩු කළාමත් කෑ ගහපු අය කොහොමද රට ඉස්සරහට අරගෙන යන්නේ? එතුමන්ලාට ඒ ගැන දැක්මක් නැහැ. ඒ වාගේම ප්‍රතිපත්තියක් නැහැ. රටට කියන්න, එතුමන්ලා රට කරන්නේ කොහොමද කියලා.

රට පාලනය කරන ආකාරය ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ කොහොමද? අඩුම ගණනේ එතුමන්ලාගේ අවශ්‍යතාවත් ඉටු කර ගන්න බැහැ, අනුන්ගෙන් ජීවත් වෙන්නේ. කොහේ හරි යන්න ඕනෑ වුණාම කලිසම දෙන්නේ යාළුවෙක්, බෙල්ට් එක දෙන්නේ යාළුවෙක්, යට ඇඳුම දෙන්නේ යාළුවෙක්, මළ ගෙදරක යන්න වුණාම වාහනයට තෙල් ටික ගහ ගන්න සල්ලි දෙන්නේ යාළුවෙක්. අනුන්ගෙන් යැපෙන පක්ෂයක් කොහොමද මේ රටේ ඉන්න ලක්ෂ 220ක් වන ජනතාවට සේවය කරන්නේ? හැම දාම අනුන්ගෙන් යැපෙන පක්ෂයකට ජනතාවට සේවය කරන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමන්ලාට ආර්ථික ප්‍රතිපත්තියක් නැහැ. අපි ඒ කාරණය විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමන්ලා දැන් කියන්නේ මොකක්ද? අවුරුදු 75ක් තිස්සේ අන්ත බංකොලොත් කරපු අපේ රට ඒ ශාපයෙන් ගලවා ගන්න එතුමන්ලාට ආණ්ඩු බලය දෙන්න කියනවා. මොකක්ද, අවුරුදු 75ක දේශපාලන ශාපය? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අවුරුදු 75ක දේශපාලන ගමන් මඟ තුළ හිටපු ඇමතිවරු විධියට අනුර කුමාර දිසානායක මැතිතුමා, විජිත හේරත් මැතිතුමා ඇතුළු කණ්ඩායම අද කථා කරන්නේ බබාලා වාගේ; මොකුත් කළේ නැහැ වාගේ; නැවුම් දේශපාලන පක්ෂයක සාමාජිකයෝ වාගේ. එතුමන්ලාත් අවුරුදු 55ක් පරණ පක්ෂයක සාමාජිකයෝ. එතුමන්ලා මේ රටේ ඇමතිකම් කළා. අනුර කුමාර දිසානායක, බිමල් රත්නායක, විජිත හේරත්, සමන්ත විද්‍යාරත්න, ලාල්කාන්ත, සුනිල් හඳුන්නෙත්ති, නිහාල් ගලප්පත්ති කියන්නේ මේ රටේ ඇමතිකම්, නියෝජ්‍ය ඇමතිකම් දරපු අය. මේ අවුරුදු 75ක දේශපාලන ගමන් මඟ ඇතුළේ ඒ අය හිටියා. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ, කාලයේ එතුමන්ලා ඇමතිකම් දැරුවා. අපේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ, අපේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සහ රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ජනාධිපතිත්වය යටතේ, එවක තිබුණු හැම පාර්ලිමේන්තුවකම එතුමන්ලා මන්ත්‍රීවරුන් හැටියට

හිටියා. දැන් කියනවා, අවුරුදු 75ක දේශපාලන ශාපය නවත්වන්න එතුමන්ලාට ජනතා වරමක් දෙන්න කියලා. මොකක්ද, මේ අවුරුදු 75ක දේශපාලන ශාපය?

අපි පසුගිය දිනක නිදහස් උත්සවය සැමරුවා. අපට ලැබුණු නිදහස ඉතා අවම වියදමකින් සමරනකොටත් ඊට විරුද්ධ වුණු කණ්ඩායමක් තමයි, ඒ. හොඳ වැඩක් කළත්, නරක වැඩක් කළත්, හැම එකකටම එතුමන්ලා විරුද්ධ වෙනවා. මම අහන්න කැමැතියි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ඇතුළු එම පක්ෂයට සහයෝගය දැක්වූ අනෙක් පක්ෂ, ඒවායේ සිටි ඇමතිවරු, නායකයෝ අවුරුදු 75ක් දේශපාලනය කරලා මේ රටට මොකුත්ම කරලා නැද්ද කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරලා තිබෙනවා. මම ඒ එකක්, දෙකක් කියලා මගේ කථාව අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා.

1948දී පුද්ගලයන් 16,314කට සිටියේ එක වෛද්‍යවරයෙක්. අද පුද්ගලයන් 1,117කට එක වෛද්‍යවරයෙක් ඉන්නවා. ඒ කාලයේ තිබුණේ රෝහල් 267යි. අද රෝහල් 629ක් තිබෙනවා. ඒ කාලයේ රෝහල්වල තිබුණු ඇඳන් සංඛ්‍යාව 18,949යි. අද එම ප්‍රමාණය 78,000ක් දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ කාලයේ සිටියේ වෛද්‍යවරු 701දෙනායි. අද වන විට වෛද්‍යවරු 29,615දෙනෙක් ඉන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ කාලයේ තිබුණේ රජයේ පාසල් 3,091යි. අද රජයේ පාසල් සංඛ්‍යාව 10,335ක් දක්වා වැඩි කරලා තිබෙනවා. කවුද ඒවා කළේ?ඒවා කළේ අවුරුදු 75ක් මේ රට පාලනය කරපු නායකයෝ. සමහර වැරැදි දේවල් වෙන්න පුළුවන්; වැරැදි දේවල් අඩු වැඩි වශයෙන් වෙන්නත් ඇති. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි ඒ කාලයේ -1948 නිදහස ලබනකොට- එක විශ්වවිද්‍යාලයයි තිබුණේ. අද විශ්වවිද්‍යාල 18ක් තිබෙනවා.

එහෙම නම්, අවුරුදු 75ක ශාපය ගැන කියන එතුමන්ලා දන්නේ නැද්ද, මේ රටේ මේ තරම් සංවර්ධනයක් ඇති කළේ මේ රට පාලනය කරපු නායකයෝ කියලා? අධිවේගී මාර්ග හැදුවේ, වරායවල් හැදුවේ, ගුවන් තොටුපොළවල් හැදුවේ, වී ගබඩා, පොහොර ගබඩා හැදුවේ, මාර්ග සංවර්ධනය කළේ, මේ රටේ තිබුණු යුද්ධය අවසන් කළේ මේ රට පාලනය කරපු නායකයෝ. එහෙම නම්, අවුරුදු 75ක දේශපාලනය අවසන් කරන්න බලය දෙන්න කියන කාරණය ගැන රටේ ජනතාවට නැවත වරක් සිතා බලන්න කියන ඉල්ලීම කරමින්, ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉතා වැදගත් කොටස පිළිබඳව මම අවසාන වශයෙන් කථා කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු ජනාධිපතිතුමා කිව්වා, අපි අවුරුදු 25ක් සඳහා වන ප්‍රතිපත්තියක් හදන්න ඕනෑ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවට ආපු දවසේ ඉඳලා අපි කරපු කථා අහලා බලන්න. අපි හැමදාම කිව්වේ, මේ රටේ පත් වන හැම නායකයෙකුටම ඕනෑ විධියට රට අරගෙන ගිහින් හරියන්නේ නැහැ, පත් වන ඇමතිවරයාට ඕනෑ විධියට අමාත්‍යාංශය අරගෙන ගිහින් හරියන්නේ නැහැ, අඩුම ගණනේ මේ රටට අවුරුදු 25කට, 50කට සරිලන ප්‍රතිපත්තියක් හදමු, පත් වන කුමන නායකයා වුණත්, අමාත්‍යාංශවලට පත් වන කුමන ඇමතිවරයා වුණත්, අවුරුදු 25ක්, 50ක් සඳහා වන එම ප්‍රතිපත්තියට අනුව ක්‍රියාත්මක විය යුතුයි, එහෙම වුණොත් මේ රට වැටෙන්නේ නැහැ කියන එකයි.

අවුරුදු 25ක් සඳහා වන සැලැස්ම හදන්න කියලා ගරු ජනාධිපතිතුමා දැන් යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම ඒ සඳහා පක්ෂ විපක්ෂ සියලුදෙනාගේම සහයෝගය ඉල්ලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් එතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. රටට ආදරෙයි නම්, මේ රටේ මිනිසුන්ට ආදරෙයි නම්, ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කර තිබෙන මෙම යෝජනාවට සහයෝගය දෙන්න කියලා මම පක්ෂ විපක්ෂ හැමෝටම ආරාධනා කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ප්‍රතිපත්තියක් හදමු. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පක්ෂවලට අනුව, නායකයන්ට අනුව, ජාතීන්ට අනුව බෙදී නොයන ප්‍රතිපත්තියක් හදලා ශ්‍රී ලංකා මාතාව ඉස්සරහට අරගෙන යන්න සහයෝගය දෙන්න කියන ඉල්ලීම කරමින්, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, ඒ වාගේම සභාව කල් තබන අවස්ථාවේ ගරු සංජීව එදිරිමාන්න මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව ස්ථිර කරමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[பு.ப. 10.29]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! நேற்றைய தினம் மாண்புமிகு சனாதிபதி அவர்கள் ஆற்றிய அக்கிராசன உரை தொடர்பாக கௌரவ சஞ்ஜீவ எதிரிமான்ன அவர்களால் இன்று கொண்டுவரப்பட்டிருக்கின்ற ஒத்திவைப்புவேளைப் பிரேரணைமீதான விவாதத்தில் எனக்கும் உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

ஓரிரு நாட்களுக்கு முன்னர் உலகப் பந்தில் ஏற்பட்ட நில நடுக்கம் காரணமாக துருக்கி, சிரியா போன்ற நாடுகளிலுள்ள மக்கள் பெருமளவில் பாதிக்கப்பட்டிருக்கிறார்கள். குறிப்பாக, துருக்கி நாட்டில் 20,000க்கும் மேற்பட்டவர்கள் பூமித் தாயின் மடிக்குள் உள்வாங்கப்பட்டு இறந்திருக்கிறார்கள். இந்நிகழ்வு துருக்கி நாட்டை உலுக்கிப் போட்டிருக்கிறது. அங்கே வாழுகின்ற மக்கள் கண்ணீரோடு அடுத்த நேர உணவுக் காகவும் உயிரைக் காப்பாற்றிக்கொள்ளவும் ஓடிக்கொண்டிருக் கிறார்கள். சிரியாவிலும் இதேமாதிரியான சில நில நடுக்கங்கள் ஏற்பட்டிருக்கின்றன. துருக்கி நாட்டில் இறந்துபோன மக்களின் உறவுகளுக்கும் கண்ணீரோடு வாழுகின்ற மக்களுக்கும் எங்களுடைய ஆழ்ந்த கவலையை இந்த உயர்ந்த சபையினூ டாகத் தெரிவித்துக்கொள்கிறோம். இவ்வாறு உலகத்தில் பல்வேறுபட்ட சம்பவங்கள் நடைபெற்றுக்கொண்டிருந்தாலும், இன்றைய நாட்கள் இலங்கையினுடைய மிக முக்கிய காலகட்ட மாகப் பார்க்கப்படுகின்றது.

நேற்றைய தினம் ஒன்பதாவது பாராளுமன்றத்தின் நான் காவது கூட்டத்தொடரை ஆரம்பித்துவைத்து உரையாற் றிய மாண்புமிகு சனாதிபதி அவர்கள் சில வார்த்தைகளைப் பிரயோகித்திருந்தார். இலங்கை - இந்திய ஒப்பந்தம் கைச்சாத் திடப்பட்டு, 35 ஆண்டுகள் கடந்துவிட்டன. அந்த ஒப்பந்தத்தி னூடாகப் பிரசவிக்கப்பட்ட 'பதின்மூன்றாவது திருத்தம்' என்ற குழந்தைக்கு இன்று 35 வயதாகிவிட்டது. அந்தக் குழந்தை இருக்கிறதா? அல்லது செத்துப்போய்விட்டதா? அல்லது அது எரிக்கப்பட்டு, அதனுடைய சாம்பல் கரைக்கப்பட்டுவிட்டதா? போன்ற கேள்விகளைக் கேட்கக்கூடிய அளவிற்கு இன்றைய நாட்கள் நகர்ந்து கொண்டிருக்கின்றன. இந்த நாட்டில் இருக்கின்ற சிங்களத் தலைவர்கள் தொடர்ந்தும் 'ஒற்றை யாட்சி! ஒற்றையாட்சி!' என்றே கூறிக்கொண்டிருக்கிறார்கள்.

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

மீண்டும் இந்த நாடு ஓர் இருண்ட யுகத்தை நோக்கிப் போய்க் கொண்டிருக்கிறது என்பதை உங்களில் யாராவது உணரத் தலைப்படுவதாக எனக்குத் தெரியவில்லை.

எஸ். டபிள்யூ. ஆர். டி. பண்டாரநாயக்கா அவர்கள்தான் இந்த நாட்டில் முதன்முதலாக சமஷ்டி பற்றிய யோசனையை முன்வைத்தார். கரையோரச் சிங்களவர், மலைநாட்டுச் சிங்களவர், வடக்கு, கிழக்கு இணைந்த வகையில் யாழ்ப் பாணத் தமிழர் போன்ற சமூகப்பிரிவினரைக் கொண்ட மூன்று பிராந்தியங்களாக இந்த நாட்டை சமஷ்டி அடிப்படையில் ஆள்வது தொடர்பில் 1926ஆம் ஆண்டில் அவர் தன்னுடைய கருத்துக்களைக் கோரிக்கையாக முன்வைத்திருந்தார். அந்தக் காலத்தில் அவர் பத்திரிகைகளில் இது தொடர்பான கட்டுரைகளையும் எழுதியிருந்தார். அவரை ஒரு சிங்கள பௌத்த பிக்கு ஊடாகச் சுட்டுக்கொன்றார்கள். ஜே. ஆர். ஜயவர்தன அவர்கள் இந்த நாட்டின் சனாதிபதியாக இருந்தபோது, மக்கள் சாதாரணமாக அறவழியில் போராடிக் கொண்டிருந்த சந்தர்ப்பத்தில், " போர் என்றால், போர்! சமாதானம் என்றால், சமாதானம்! " என்று போரைப் பிரகடனம் செய்தார். இவருடைய கடந்த காலச் செயற்பாடு களும் பௌத்த பிக்குமாரின் இனவாத ரீதியான போராட்டங் களும் இந்த நாட்டைப் பாரிய யுத்தத்துக்குள் தள்ளியது. அந்த யுத்தம்தான் இன்று எமது நாட்டின் பொருளாதாரத்தை அதலபாதாளத்துக்குள் கொண்டுசென்று, அதிலிருந்து மீளமுடியாத ஒரு நாடாக இலங்கையை மாற்றியிருக்கிறது. "நாங்கள் 2048ஆம் ஆண்டில் இலங்கையை அபிவிருத்தி அடைந்த நாடாக மாற்றுவோம்" என மாண்புமிகு சனாதிபதி அவர்கள் சொல்லியிருக்கிறார். ஆனால், 1948ஆம் ஆண்டில் இலங்கை சுதந்திரம் பெறுவதாக அறிவிக்கப்பட்ட காலத்தில், தமிழர்களின் சுதந்திரம் பறிக்கப்பட்ட காலத்தில், சிங்கக் கொடிக்குள் தமிழர்கள் அரவணைக்கப்படாத காலத் தில், சுதந்திரக் காற்றைத் தமிழர்கள் சுவாசிக்க முடியாதிருந்த காலத்தில், சிங்கப்பூரினதும் யப்பானினதும் தனிநபர் வருமானம் இலங்கையின் தனிநபர் வருமானத்தைவிட, மிகக் குறைவாகவே இருந்தது. அவ்வாறிருந்த இலங்கையை வளர்க்க முடியாத எமது நாட்டின் தலைவர்கள், நூறு வருடங்களுக்குப் பிறகு வளர்க்க நினைப்பது முட்டாள் தனமானது. நீங்கள் மீண்டும் மீண்டும் ஒற்றையாட்சிக்குள் தான் தீர்வு என்று சொன்னால், இந்த நாடு ஒரு காலத்திலும் உருப்பட வாய்ப்பில்லை.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! இந்த நாட்டின் இனப் பிரச்சினைக்கு ஓர் அரசியல் தீர்வு வர வேண்டு மென்றால், உங்களோடு சேர்ந்து வாழுகின்ற, இந்த நாட்டுக்கே உரித்தான சகோதர தமிழ்த் தேசிய இனம் இந்த நாட்டில் தனது உரிமைகளோடும் உரித்துக்களோடும் வாழ வேண்டு மென்றால், இந்த நாடு பிளவுபடாத - பிரிக்கப்படாத - ஒரு நாடாக இருக்க வேண்டுமென்றால், இன்று உலக நாடுகளில் இருக்கின்ற சமஷ்டி ஆட்சி முறைகளைப் பார்த்து, அதன் அடிப்படையிலான ஓர் அரசியல் தீர்வை முன்வையுங்கள்! அவ்வாறான ஓர் அரசியல் தீர்வை முன்வைப்பதன்மூலமே இந்த நாட்டில் நீதியையும் நியாயத் தையும் நிலைநாட்ட முடியும்.

இந்த மண்ணிலே கிட்டத்தட்ட மூன்று இலட்சம் தமிழர்கள் கொல்லப்பட்டார்கள். 60,000இற்கும் மேற்பட்ட போராளி களை எங்களுடைய மண் இழந்திருக்கிறது. முள்ளிவாய்க் காலில் இடம்பெற்ற இறுதி யுத்தத்தின்பொழுது, ஏறத்தாழ 147,000 மக்கள் காணாமற்போயும் கொல்லப்பட்டும் இருக்கிறார்கள். இவற்றைப் பல்வேறுபட்ட ஆவணங்களும் ஆதாரங்களும் குறிப்பிடுகின்றன. மறைந்த மன்னார் மாவட்ட பேராயர் இராயப்பு ஜோசப் அவர்கள் நல்லிணக்க ஆணைக்குழுவுக்கு முன்னால் சொன்ன விடயங்களைத் திரும்பிப் பாருங்கள்! எல்லாம் நடந்து முடிந்திருக்கின்றன. அவற்றுக்கெல்லாம் ஆதாரங்கள் இருக்கின்றன. இந்த மண்ணில் மிகப் பெரிய இனவழிப்புச் செயற்பாடு நடைபெற்று முடிந்திருக்கிறது. தமிழர்களாகிய நாங்கள் இந்த மண்ணில் இழக்க முடியாத அளவுக்கு இழப்புக்களைச் சந்தித் திருக்கிறோம். இழப்புக்களுக்குப் பிற்பாடுகூட, இந்த நாட்டில் தமிழர்களும் சிங்களவர்களும் இரண்டு தேசிய இனங்களாக வாழக்கூடிய, தமிழர்களும் சிங்களவர்களும் ஏற்றுக் கொள்ளக் கூடிய ஓர் அரசியல் உரிமை பற்றித்தான் நாங்கள் பேசுகிறோம். சமஷ்டி அடிப்படையிலான அதியுச்ச அதிகாரப் பகிர்வாக, மீளப்பெற முடியாத அதிகாரப் பகிர்வாக அது இருக்க வேண்டும். இதனை நாங்கள் கடந்த கால அனுபவத்தை வைத்துக் குறிப்பிடுகின்றோம்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கடந்த 35 ஆண்டுகளில் சுற்றறிக்கைகள்மூலமாகவும் 28க்கும் மேற்பட்ட நீதிமன்றத் தீர்ப்புக்கள்மூலமாகவும் 13ஆவது திருத்தத்தி னூடாக வழங்கப்பட்ட பல விடயங்கள் பறிக்கப்பட்டிருக் கின்றன. அவ்வாறிருக்கையில், எவ்வாறு இந்தப் 13ஆவது திருத்தம் இந்த நாட்டிலுள்ள இனப் பிரச்சினைக்கு சரியானதொரு தீர்வாக அமைய முடியும்? நேற்றும்கூட, இந்த மண்ணில் பௌத்த பிக்குமார் பாரிய போராட்டத்தை நடாத்தி, 13ஆவது திருத்தத்தை எரித்தார்கள். மாண்புமிகு சனாதிபதி அவர்களுடைய ஆதரவு இல்லாமல், அவர்களால் அவ்வாறு செய்ய முடியாது என்றே நான் நினைக்கின்றேன். "பிள்ளையையும் கிள்ளி, தொட்டிலையும் ஆட்டுவது" என்று தமிழில் ஒரு பழமொழி உண்டு. அது போன்ற ஒரு செயற்பாட்டைத்தான் மாண்புமிகு சனாதிபதி அவர்கள் செய்கிறார். அதாவது, தான் இனப் பிரச்சினைக்குத் தீர்வொன்றைக் கொடுக்கப்போவதாக சர்வதேச சமூகத்திற்குத் தெரிவிக்கின்ற அதேவேளை, சிங்கள இனவாதிகளிடமும் மதவாதிகளிடமும் பௌத்த பேரினவாதிகளிடமும் சமாதானத் திற்குப் போகவேண்டாமெனக் கூறுகிறார். மாண்புமிகு சனாதிபதி அவர்களுடைய அக்கிராசன உரையானது, இந்த நாட்டின் அமைதிக்கான, சமாதானத்திற்கான, நீடித்து நிலைக்கக்கூடிய கௌரவமான ஓர் அரசியல் தீர்வுக்கான, பொருளாதாரத் தீர்வுக்கான உரையாக அமைந்திருக்கவில்லை என்பதை நான் இங்கு ஆணித்தரமாகப் பதிவுசெய்ய விரும்புகின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கடந்த 4ஆம் திகதி தொடக்கம் 7ஆம் திகதி வரை யாழ்ப்பாணப் பல்கலைக்கழக மாணவர்கள், கிழக்குப் பல்கலைக்கழக மாணவர்கள், சிவில் சமூகத்தினர், மதத் தலைவர்கள் எனப் பலர் ஓர் அணியாகத் திரண்டு, யாழ்ப்பாணத்திலிருந்து மட்டக்களப்புவரை ஒரு நீண்ட பயணத்தை மேற்கொண்டார்கள். அவர்கள் தங்களு டைய கருத்துக்களை அறவழியில் முன்வைத்தார்கள்; நியாயமான முறையில் தங்களுடைய கோரிக்கைகளை முன்வைத்தார்கள். வடக்கு, கிழக்கு என்பது, மரபு வழியாக, வரலாற்று ரீதியாக நாங்கள் பிறந்து வளர்ந்த மண்! அந்த மண்ணில் எங்களுக்கான ஓர் அரசியல் தீர்வை முன்வையுங் களென்றுதான் அவர்கள் கேட்கிறார்கள். இவ்வாறான ஒரு பெரும் போராட்டத்தில் ஈடுபட்டதற்காக மதத் தலைவர் களுக்கும் அரசியல்வாதியான எனக்கும் 20ஆந் திகதி நீதிமன்றத்தில் ஆஜராகுமாறு அழைப்பாணை வந்திருக்கிறது. இதுதான் இந்த நாட்டினுடைய நியதி; இதுதான் இந்த நாட்டினுடைய நீதி; இதுதான் இந்த நாட்டினுடைய கரிசனை

என்றால், அறவழிப் போராட்டத்தில் ஈடுபடுபவர்களுக்கான அரசியல் தீர்வை அல்லது நீண்ட நெடுங்காலமாக - 100 ஆண்டுகளுக்கும் மேலாக - இந்த மண்ணிலே போராடிக் கொண்டிருக்கின்ற தமிழினத்துக்கான ஒரு தீர்வை எவ்வாறு உங்களால் கொடுக்கமுடியும்? என்பதைச் சற்று சிந்தித்துப் பாருங்கள்!

கௌரவ சஞ்ஜீவ எதிரிமான்ன அவர்கள் சொன்னதுபோல, நீங்கள் யுத்தம் முடிந்தபொழுது சிங்களப் பகுதிகளிலும் தமிழர்கள் வாழும் பகுதிகளிலும் சிங்கக் கொடிகளை ஏற்றி, "ஜய வேவா! ஜய வேவா!" எனக் கோஷமிட்டு, வெற்றியைக் கொண்டாடினீர்கள். இந்த நாட்டின் ஓர் இனமாகிய தமிழ் இனத்தை அழித்ததையிட்டு, அந்த நேரம் ராஜபக்ஷ குடும்பம் மமதையோடு வெற்றிக்களிப்படைந்தது. அதே ராஜபக்ஷ குடும்பத்தைச் சேர்ந்த கோட்டாபய ராஜபக்ஷவை எவ்வாறு சிங்கள மக்கள் பதவி விலக வைத்தார்கள்? வரலாறு எப்படித் திரும்பியிருக்கிறது? என்று பாருங்கள்! எனினும், இன்று நாங்கள் அந்தக் கோஷங்களை எழுப்ப விரும்பவில்லை. இந்த மண்ணில் எங்களுக்கு உரித்தான உரிமைகளோடு, நியாயமான, கௌரவமான அரசியல் தீர்வோடு வாழத்தான் நாங்கள் விரும்புகின்றோம். மாண்புமிகு சனாதிபதி அவர்கள் நேற்றைய தினம் ஆற்றிய அக்கிராசன உரையானது, இந்த நாட்டுக்கு உகந்ததாக, நீடித்த சமாதானத்தை அல்லது நிலையான அமைதியை ஏற்படுத்தக்கூடியதாக அமைந்திருக்க வில்லை. மாறாக, மீண்டும் இலங்கையை ஓர் இருண்ட யுகத்திற்குள் கொண்டுசெல்லக்கூடிய, யுத்தம் நோக்கிய, அழிவு நோக்கிய பாதையில் கொண்டுசெல்லக்கூடிய ஓர் உரை யாகவே அமைந்திருக்கிறது. கௌரவ பிரதமர் அவர்களும் இங்கே இருக்கின்றார். அவர்கூட, கம்யூனிஸ - சமத்துவ - கொள்கையின் அடிப்படையில் வந்த ஒருவர். சமஷ்டி, சமத்துவம் பற்றி அவருக்குத் தெரியும். இந்த மக்களுடைய வாழ்க்கை எவ்வாறு அமையப்போகிறது, ஏன் இன்னோர் இனத்தை அடக்கக்கூடாது என்பதுகூட, அவருக்கு நன்கு தெரியும்!

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இலங்கை - இந்திய ஒப்பந்தம் கைச்சாத்திடப்பட்டு 35 வருடங்கள் கடந்துள்ள நிலையில், அரசியலமைப்புக்கான 13ஆவது திருத்தத்தை ஒருவர் எரிக்கிறார்; இன்னொருவர் கிழிக்கிறார். 13ஆவது திருத்தத்திலே பொலிஸ் அதிகாரம் இருக்கக் கூடாதென்று இன்னொருவர் சொல்கிறார். இந்த ஒத்திவைப்புப் பிரேரணையை வழிமொழிந்தவர், "மாகாண சபைகளுக்கு காணி அதிகாரமும் பொலிஸ் அதிகாரமும் தேவையில்லை" எனச் சொல்கிறார். நீங்கள் எங்களுடைய இடங்களிலுள்ள காணிகளை அடாத்தாகப் பிடித்து, அவற்றை விகாரைகள் அமைப்பதற்கும் இராணுவத்தினருக்கும் சிங்கள மக்களுக்கும் வழங்கியிருக்கிறீர்கள். இன்று நீங்கள் வடக்கு மாகாண ஆளுநரையும் கிழக்கு மாகாண ஆளுநரையும் வைத்து மேற்கொள்கின்ற காணிப் பிடிப்புக்களால் இந்த மண்ணில் தமிழர்களால் வாழ முடியாமல் இருக்கிறது. அவர்கள் குமுறிக்கொண்டிருக்கிறார்கள்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த நாடு நீதியானதும் அமைதியானதுமான ஒரு நாடாக இருக்க வேண்டுமென்றால், யுத்தமில்லாத ஒரு நாடாக இந்த நாடு இருக்கவேண்டுமென்றால், இந்த நாட்டில் ஒற்றுமையுள்ள ஒரு சமூகம் உருவாக்கப்பட வேண்டுமென்றால் சமஷ்டி அடிப் படையில் மீளப்பெற முடியாத, பறிக்க முடியாத அதிகாரங்களோடு, மக்கள் அனைவரும் ஒற்றுமையாக வாழ்வதற்கான வழியை உடனடியாக ஏற்படுத்த வேண்டும். இல்லையேல், இந்த நாடு மீண்டும் ஓர் இருண்ட யுகத்திற்குள் செல்லும் என்பதை நான் இந்த இடத்தில் பதிவுசெய்து விடைபெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු කංචන විජේසේකර ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.40]

**ගරු කංචන විජේසේකර මහතා (විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - Minister of Power and Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා නවවැනි පාර්ලිමේන්තුවේ, හතරවැනි සැසිවාරය විවෘත කරමින් ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශය පිළිබඳව අද ගරු සංජීව එදිරිමාන්න මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව පිළිබඳව අදහස් පළ කරන්න මට අවස්ථාව ලබාදීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේදී ඉතාම පැහැදිලිව සඳහන් කළා, අපේ රටේ ඉදිරිය වෙනුවෙන් අප ගත යුතු පියවර පිළිබඳව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොතරම් අමිහිරි වුණත් අපි පිළිගත යුතු කාරණාව තමයි, මොන දේශපාලන පක්ෂය බලයේ සිටියත්, කුමන නායකයා බලයේ සිටියත් රටේ තිබෙන මේ වර්තමාන අර්බුදයෙන් එළියට ඒම සඳහා අපට ගමන් කරන්න තිබෙන්නේ එක මාර්ගයක් ඔස්සේ පමණයි කියන එක. ඒ ගමන් මාර්ගය මේ රටේ බහුතර ජනතාව හොඳින් අවබෝධ කරගෙනයි ඉන්නේ. මම විශ්වාස කරන විධියට ජනතාව පමණක් නොවෙයි, මේ පාර්ලිමේන්තුවේ ඉන්න සියලුදෙනාත් ඒක අවබෝධ කරගෙන ඉන්නේ. අපේ දේශපාලන මතය කුමක් වුණත්, දේශපාලන ප්‍රතිපත්තිය කුමක් වුණත් මේ රටේ ඉදිරිය වෙනුවෙන් ගමන් කළ යුතු මාර්ගය පිළිබඳව මේ සියලුදෙනාට හොඳ අවබෝධයක් තිබෙනවා. නමුත් ඒ පිළිබඳව කොතරම් අවබෝධය තිබුණත් අපි දේශපාලන වශයෙන් බෙදිලා ඉන්න නිසා අපි ඒක පිළිගන්න කැමැති නැහැ, මේ අමිහිරි මාර්ගයේ තමයි අපට යන්න තිබෙන්නේ කියන එක. අපි විපක්ෂයේ ඉන්න විට අපිත් ඒ දේ කරලා තිබෙනවා. විපක්ෂයේ දැන් ඉන්න පිරිසත් ඒ වාගේම කටයුතු කරනවා. ඒ නිසා තමයි මේ තත්ත්වය දිගින් දිගටම ඇති වෙලා තිබෙන්නේ.

අපේ රටේ පළමු වතාවට අවාසනාවන්තම සිද්ධියකට මුහුණ දෙන්න අපට සිද්ධ වුණා. අපි පළමු වතාවට අපේ රටට ණය ගෙවීමට නොහැකියි කියලා බංකොලොත්භාවය ප්‍රකාශයට පත් කළා. එය සිදු වුණේ අපේ රටේ පළමු වතාවට. හැබැයි, මේ තත්ත්වය ඇති වුණේ පසුගිය මාස 18ක, 24ක කාලය තුළ සිදු වෙච්ච ක්‍රියාවලිය නිසා නොවෙයි. මේ රටේ ඉතිහාසය පුරාම ගත්ත සහ නොගත්ත දේශපාලන තීන්දු නිසා, ක්‍රියාත්මක කළ සහ නොකළ ප්‍රතිපත්ති නිසා අපට මේ තත්ත්වය ඇති වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කළ අවස්ථාවේ විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු පිරිසක් සභාව වර්ජනය කර එළියට ගිය බව මම දැක්කා. මට මතක් වුණේ දින 52 ආණ්ඩුව පැවැති වෙලාවේ මේ පාර්ලිමේන්තුවේ ඇති වුණු අර්බුදය. ඒ අර්බුදය වෙලාවේ මේ පාර්ලිමේන්තුවේ පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරු ගහගත්තා. ඒ අය ගහ ගත්තාම, එළියේ හිටපු වෘත්තිකයෝ -ආචාර්යවරු, මහාචාර්යවරු- ටික දෙනකු කිව්වා මේ අය නොවෙයි පාර්ලිමේන්තුවේ ඉන්න

[ගරු කංචන විජේසේකර මහතා]

ඕනෑ. අපි වාගේ ආචාර්යවරු, මහාචාර්යවරු තමයි පාර්ලිමේන්තුවට එන්න ඕනෑ කියලා. හැබැයි අවාසනාවට ඒ ආචාර්යවරු, මහාචාර්යවරුත් ඊයේ පාර්ලිමේන්තුවේදී හැසිරුණේ ඒ හා සමානම ආකාරයට. "වියත්මග" නමින් අපේ දිස්ත්‍රික්කවලින් ඉහළම ඡන්ද ප්‍රතිශත අරගෙන මේ පාර්ලිමේන්තුවට පිරිසක් ආවා. හැබැයි ඊයේ ඔප්පු කර පෙන්නුවා ඒ අයත් අනෙක් අය අතරත් කිසිම වෙනසක් නැහැ කියන එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රට මේ මොහොතේ මැතිවරණ ක්‍රියාවලියකට එළැඹී තිබෙන බව අපි දන්නවා. පළාත් පාලන මැතිවරණය පැවැත්වීමට මාර්තු මාසයේ 09 වැනි දාට දින වෙන් කර තිබෙනවා. අපේ කණ්ඩායමට, ආණ්ඩුව නියෝජනය කරන අපේක්ෂකයන්ට කරන්න පුළුවන් බරපතළම අසාධාරණය තමයි ජනාධිපතිවරයා හැටියට, රජය හැටියට අපි මේ කර තිබෙන්නේ. ඇයි ඒ? මේ මොහොත වනවිට පවතින අමාරු තත්ත්වය ගැන අපි තවදුරටත් කියනවා. කරන්න තිබෙන තවත් අමාරු ක්‍රියාවලි ගැන අපි කථා කරනවා. අපි කියනවා, ඉන්ධන මිල වැඩි කරන්න වෙනවා, විදුලි බිල වැඩි කරන්න වෙනවා. වෙන විකල්පයක් අපට නැහැ කියලා. සමහර අය හිතනවා මේ දේවල් අපි කැමැත්තෙන් කරන දේවල් කියලා. මාත් අකැමැතියි විදුලි බිල වැඩි කරනවාට. මාත් අකැමැතියි ඉන්ධන මිල වැඩි කරනවාට. මේ රටේ ජීවන වියදම වැඩි වන විට, බදු වැඩි වෙනකොට අපිත් අකැමැතියි. හැබැයි, අපට වෙනත් විකල්පයක් නැත්නම්, ඒ ගැනත් අපි කල්පනා කර බලන්න ඕනෑ. මේ මිල වැඩි කරන්න ඕනෑ හින්දා අපට තිබෙන පළවෙනි යෝජනාව හැටියට, අපට තිබෙන පළමුවන විකල්පය හැටියට නොවෙයි අපි මේවා කරන්නේ. අපි සොයා බලා තිබෙනවා, මේ සඳහා තිබෙන වෙනත් විකල්ප මොනවාද කියලා. මේ තිබෙන ආදායම් වියදම් පරතරය අවම කර ගන්න අපට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? ඒ හැම එකක් පිළිබඳවම අවධානය යොමු කර අවසානයේ ගන්න පුළුවන් විකල්පය හැටියටයි මිල වැඩි කිරීම, බදු වැඩි කිරීම් කරන්න රජයක් හැටියට කටයුතු කර තිබෙන්නේ. අපි මේ යථාර්ථය තේරුම් ගන්න ඕනෑ.

විපක්ෂ නායකතුමා පසුගිය දවස්වල කිව්වා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එක්ක ගනුදෙනු කරන විධිය එතුමා දන්නවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඉන්න කණ්ඩායම හිනා වෙනවා ඇති, විපක්ෂ නායකතුමාට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ රාජ්‍ය පාලනය සම්බන්ධව තිබෙන අවබෝධය පිළිබඳව. ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණේ නායකයෝ කියනවා, අපි මෙන්න මෙහෙමයි කරන්නේ, මෙහෙම නොවෙයි කරන්නේ කියලා. මේක තමයි අපි පසුගිය කාලවලත් කර ගත්ත වැරැද්ද. අපි යම් යම් කාරණාවලට එකඟ වුණාට පස්සේ ඒ එකඟතාවලින් මිදිලා වැඩ කරන්න ගියොත්, ඊට වඩා අර්බුදවලට අපට මුහුණ දෙන්න වෙනවා. අද බලශක්ති අර්බුදයකට අපි මුහුණ දෙන්නෙත් එවැනි සිද්ධියක් නිසායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට මතක ඇති මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා නොරොච්චෝලේ බලාගාරය ඉදි කරනකොට මේ රටේ ඇති වෙච්ච විරෝධය.

කවුද ඒ විරෝධය ඇති කළේ? ඒ ඉතාම කුඩා දේශපාලන කණ්ඩායම් කිහිපයක්. ඒ දේශපාලන කණ්ඩායම් කිහිපය එදා නොරොච්චෝලේ බලාගාරයට විරුද්ධව කටයුතු කළා. අපේ විදුලිබල මණ්ඩලයේ සේවක සංගමයක නායකයෙක් ඉන්නවා රන්ජන් ජයලාල් කියලා. ඒ කාලයේ නොරොච්චෝලේ බලාගාරය හදනවාට ඔහු විරුද්ධ වුණා. ඔහු කිව්වා නොරොච්චෝලේ බලාගාරය අපට ණය බරක් වෙලා තිබෙන්නේ, ණය කන්දක් වෙලා තිබෙන්නේ කියලා. හැබැයි පසුගිය මාසය වෙනකොට එතුමාට සිද්ධ වුණා, නොරොච්චෝලේ බලාගාරය කියන්නේ අපේ ජාතික සම්පතක්, මේ ජාතික සම්පත ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් අපි පෙළ ගැහෙනවා කියලා ඒ වෙනුවෙන් හිට ගන්න. අවුරුදු 9කට පස්සේ හරි ඒක ජාතික සම්පතක් කියලා පිළිගත්ත එක ලොකු දෙයක් ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා රන්ජන් ජයලාල් පිළිගත්ත විධියටම අනුර දිසානායක මන්ත්‍රීතුමා ඇතුළු කණ්ඩායමටත් ඒ දේ පිළිගන්න සිද්ධ වෙනවා. ජාතික ජන බලවේගය කියන්නේ අමුතු එකක් නොවෙයි, ජනතා විමුක්ති පෙරමුණම තමයි. ඒ අය සීනුව වෙනුවට මාලිමාවෙන් එනවා. වෙන මොනවත් වුණා නොවෙයි. තව පිරිසක් එනවා හෙලිකොප්ටරයෙන්. ඒ එන ඔක්කෝම එකම කණ්ඩායමේ අය. ඒ කණ්ඩායමට සිද්ධ වෙනවා රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගත්ත තීන්දු ක්‍රියාත්මක කළා නම් හොඳයි කියන්න හෝ ඒ ගත්ත තීන්දුව හින්දා අපේ රට අද මේ තත්ත්වයට, එහෙම නැත්නම් නැවත වතාවක් යථා තත්ත්වයට පත් වුණාය කියන එක පිළිගන්න, අවුරුදු ගණනාවකට පස්සේ.

අපි ගන්න ඕනෑ තීන්දුව තමයි, මේ යන මාර්ගයේ කඩිනමින් ගිහිල්ලා අපි මේ අර්බුදය ඉක්මනින් අවසන් කර ගන්නවාද, එහෙම නැත්නම් මේ යන මාර්ගය අවහිර කරගෙන, බාධා මැද්දේ ඉතාම මන්දගාමී ගමනක් ගිහිල්ලා අපි යථා තත්ත්වයට පත්වීම අඩාළ කර ගන්නවාද කියන එක. ඒකයි තේරුම් කර ගන්න ඕනෑ. පළාත් පාලන මැතිවරණය ඇතුළේත් අපි ගිහිල්ලා කියන්නේ ඒ යථාර්ථය. වෙන මොනවත් නොවෙයි.

සමහරු කියනවා පළාත් පාලන මැතිවරණය කියන්නේ ආණ්ඩු පෙරළන, පාර්ලිමේන්තුවේ බලය පෙරළන, බලය වෙනස් වෙන, ජනාධිපති වෙනස් වෙන මැතිවරණය කියලා. ඒක අපිත් කිව්වා 2018දී. අපිත් 2018 පළාත් පාලන මැතිවරණයේදී එහෙම කියලා, 2020 වෙනකම් අවුරුදු දෙකක් හිටියා බලය ගන්න. ඒ නිසා අපේ වගකීම වෙන්නේ පළාත් පාලන මැතිවරණය හෝ ඊළඟ මැතිවරණය දිහා බලලා තීන්දු-තීරණ ගන්න එක නොවෙයි, මේ රටේ අනාගතය දිහා බලලා තීන්දු-තීරණ ගන්න එකයි. ඒ නිසා තමයි අපට අසීරු තීන්දු ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දිනවල වඩාත්ම කථා බහට ලක් වෙන කාරණය වන්නේ බලශක්ති අර්බුදයයි. බලශක්ති අර්බුදය පිළිබඳව අපි දිගින් දිගටම කථා කරනවා. හැබැයි, අපි කථා කරන්නේ නැහැ මෙහෙම තත්ත්වයකට පත් වෙන්න හේතුව මොකක්ද කියලා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා 2014දී නොරොච්චෝලේ බලාගාරය ඉදි කළාට පසු, පසුගිය කාලය තුළ තිබුණු ආණ්ඩු, හිටපු පාලකයෝ මේ රටේ ජනන සැලසුමක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් කටයුතු කළේ නැහැ. මේක තමයි යථාර්ථය. මහජන උපයෝගිතා කොමිසම තමයි මේවා නියාමනය කරන ආයතනය. මහජන උපයෝගිතා කොමිසම කියන්නේ,අද පැය දෙකක් විදුලිය කපනවා, හෙට පැය දෙකක් කපන්නේ නැහැ කියලා ප්‍රකාශ කරන ආයතනය නොවෙයි. නියාමනය කියන්නේ, විදුලිබල මණ්ඩලයේ ජනන සැලසුම ක්‍රියාත්මක වෙනවා ද කියලා බලන එකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාම්පූර් බලාගාරය ඉදිකරන්න මූලික එකඟතාව එන්නේ, ඒක හදන්න ඕනෑය කියලා තීරණය කරන්නේ 2006 අවුරුද්දේ. ජාතික විදුලිය අවශ්‍යතාවට මෙගාවොට් 500ක් එකතු කරන්න ඕනෑය කියලායි 2006දී මේ බලාගාරය හදන්න තීරණය කළේ. ඒ බලාගාරය ඉදිකරන්න 2013දී අපි ඉන්දියාවත් එක්ක ගිවිසුම්ගත වෙනවා. හැබැයි, ඒ වෙලාවේ අපි රජයක් හැටියට එකඟ වෙනවා, සාම්පූර් බලාගාරයේ මෙගාවොට් 500 ජාතික පද්ධතියට එකතු කළාට පස්සේ ආයේත් අපි ගල් අඟුරු බලාගාර මේ රටේ ඉදිකරන්නේ නැහැ කියලා. මේක තමයි අපේ තිබුණු සැලසුම. හැබැයි මොකක්ද වුණේ? ඒ

බලාගාරයට 2013දී අනුමැතිය ලැබෙනවා. ඒ බලාගාරය සඳහා පාරිසරික අධ්‍යයන වාර්තාව ගන්නවා. පාරිසරික අධ්‍යයන වාර්තාවෙනුත් කියනවා ඒක කරන්න පුළුවන් කියලා. හැබැයි, 2016දී ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ පාරිසරික සංවිධානයි, දේශපාලන පක්ෂයි ගිහිල්ලා ඒකට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් දානවා. ඒ අය ඇවිල්ලා කියනවා, ඒක නවත්වන්න ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් ගත්තා කියලා. නමුත්, ඒක නවත්වන්න ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් ගත්තේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වෙලාවේ තිබුණු ආණ්ඩුව ශ්‍රේෂ්ඨාධිකරණය දැනුවත් කරනවා, අපි මේ බලාගාරය තවදුරටත් ඉදි කරන්නේ නැහැ කියලා. අපි මේ බලාගාරය ඉදිකරන්නේ නැහැ කියා එවකට ආණ්ඩුව කියා සිටියා. ඒ හින්දා ශ්‍රේෂ්ඨාධිකරණය ඒ නඩුව අවසන් කරනවා. හැබැයි, රටට අද දීලා තිබෙන මතය තමයි, ගල් අඟුරු බලාගාරය නැවැත්තුවේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කියන එක. ගල් අඟුරු බලාගාරය හදන එක නැවැත්තුවේ ශ්‍රේෂ්ඨාධිකරණය නොවෙයි. ඒ වෙලාවේ ජනතා විමුක්ති පෙරමුණ මූලිකත්වය දරලා, ඒ වෙලාවේ තිබුණු ආණ්ඩුවත් පාවිච්චි කරගෙන උසාවියට කරුණු වාර්තා කරලා තමයි ඒ බලාගාරය නැවැත්තුවේ. අපි කියමු, ඒ බලාගාරය නවත්වපු එක කමක් නැහැ, මොකක් හරි හේතුවක් හින්දා ඒක නැවැත්තුවා කියලා. හැබැයි, බලාගාරය නවත්වලා ඒ වෙනුවෙන් ගෙනාපු විකල්පය මොකක්ද? මෙගාවොට් 500ක ජනන ධාරිතාවක් නැති වෙනකොට ඒක ලබා ගන්න ගෙනාපු යෝජනාව මොකක්ද? ඒක තමයි තිබෙන ගැටලුව, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙගාවොට් 500ක බලාගාරයක් අපි අහිමි කර ගන්නවා. හැබැයි හිතන්නේ නැහැ, ඊළඟ අවුරුදු කිහිපයේදී වුවමනා වන විදුලි අවශ්‍යතාව පුරවා ගැනීම සඳහා, පියවා ගැනීම සඳහා අපි කරන්න ඕනෑ සැලසුම මොකක්ද කියලා.

අදත් අපට මෙගාවොට් 200ක පමණ ප්‍රමාණයක් පෞද්ගලික බලාගාරවලින් ගන්න වෙනවා. දැන් හුඟක් දෙනෙක් මට බණිනවා. මම වැඩියෙන්ම බැණුම් අහන පුද්ගලයා බවටත් අද වන විට පත්වෙලා තිබෙනවා. රටේත් එහෙමයි, ආණ්ඩුව ඇතුළේත් සමහර වෙලාවට අපේම මන්ත්‍රීවරුන්ගෙනුත් මට විවේචන එල්ල වෙනවා. ඒ ඇයි? දැන් මේ අපොස (උසස් පෙළ) විභාගය පවතින කාලය. මේ කාලයේ අපි හිතාමතා විදුලි කප්පාදුවක් කරනවා කියලා මතයක් ගෙනිච්චා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවැනි කාරණාව විධියට අපි බැලුවේ, අඛණ්ඩව විදුලිය ලබා දෙන්න පුළුවන් ද කියන එකයි. ගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේත්, දෙසැම්බර් මාසයේත්, මේ අවුරුද්දේ ජනවාරි මාසයේත් මහජන උපයෝගිතා කොමිසමටත්, මේ පාර්ලිමේන්තුවටත්, කැබිනට් මණ්ඩලයටත්, මේ පාර්ලිමේන්තුවේ ජාතික සභාවටත්, ජනාධිපතිතුමාත්, මාත් ඒකාබද්ධ කැබිනට් පත්‍රිකාවකිනුත් ඉදිරිපත් කළා, මේ රටට අඛණ්ඩ විදුලිය දෙන්න පුළුවන් සැලසුම. අපි කිව්වා, ජනවාරි පළමුවැනි දා ඉඳලා පැය 24ම අපි විදුලිය දෙන්නම්, හැබැයි, මෙන්න මේ මේ කාරණා ඉෂ්ට කරන්න ඕනෑ කියලා. ඒ වෙනුවෙන් යම් ගාස්තු සංශෝධනයක් එන්න ඕනෑ කියලා. විදුලි ගාස්තුවල යම් සංශෝධනයක් වෙන්න ඕනෑ. ඒ ගාස්තු සංශෝධනය සිදු වුණොත් තමයි අපට බැංකු පද්ධතියෙන් මුදල් ටික ගන්න පුළුවන් වෙන්නේ, බැංකුවලින් මුදල් අරගෙන ගෙවීම් කරන්න පුළුවන් වන්නේ, පැහැර හැරපු බිල් ගෙවන්න පුළුවන් වන්නේ. හැබැයි, ඒවාට ඇහුම් කන් දුන්නේ නැහැ.

දැන් සමහරුන්ට අමතක වෙච්ච දෙයක් තිබෙනවා. විදුලි බිල වැඩි කිරීමට එරෙහිව මහජන උපයෝගිතා කොමිසම, මානව හිමිකම් කොමිසම මේ දවස්වල නඩු දාන එකත් හොඳයි. මේ දවස්වල පැය දෙකයි විනාඩි 20ක් -දවල් කාලයේ පැයකුත්, රාත්‍රී කාලයේ පැයයි විනාඩි 20කුත්- විදුලිය කප්පාදු කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගිය අවුරුද්දේ පෙබරවාරි මාසයේ 7වන දා ඉඳන් මාර්තු මාසයේ 5වන දා වනකල් උසස් පෙළ විභාගය පැවැත්වුණා. ඒ විභාගය පැවැති කාල සීමාවේ -පෙබරවාරි 18, 19, 21, 22, 23, 24, 25, 26, 27, 28, මාර්තු 1, 2, 3, 4 කියන දවස්වල- විදුලි කප්පාදුව, පැයයි විනාඩි 45යි, පැය 1යි, පැය 2යි, පැය 2යි, පැය 2යි විනාඩි 40යි, පැය 2යි විනාඩි 40යි, පැය 2යි විනාඩි 40යි, පැය 3යි වශයෙන් තිබුණේ. අවසාන දින තුනේ විදුලිය කප්පාදුව පැය 7යි විනාඩි 30යි. ඒ, දවල් කාලයේ පැය 5ක් සහ සවස් කාලයේ පැය දෙකයි විනාඩි 30ක් වශයෙන්. ඒ කාලයේ පැවැති ආණ්ඩුව ඒ කප්පාදුව කැමැත්තෙන්ද කළේ? විදුලිබල මණ්ඩලය එය කැමැත්තෙන් ද කළේ? නැහැ. විදුලිය ලබා දීමට අවශ්‍ය සම්පත් එදා තිබුණේ නැහැ. ඒ වෙලාවේ අපි අපේ ජලාශවල තිබුණු ජලය උපරිම වශයෙන් පාවිච්චි කළා, විදුලිය නිපදවීමට. දැන් මතයක් හදලා තිබෙනවා, දැන් ජලාශ පිරිලා තිබෙන්නේ. නමුත්, ඒ ජලාශ ජල විදුලිය නිපදවීම සඳහා මේ අවුරුද්දේ පාවිච්චි කරලා තිබෙන්නේ ගිය අවුරුද්දට වඩා අඩුවෙන්. විදුලිය නිපදවීම සඳහා ඒ ජලාශ පාවිච්චි කළා නම් විදුලිය ලබා දෙන්න පුළුවන් කියලා. මේ මොකක්ද කරන්න හදන්නේ? පසුගිය අවුරුද්දේ අපි ඒ ජලාශ වැඩියෙන් පාවිච්චි කරපු නිසාත්, අප්‍රේල්, මැයි, ජුනි වනකොට සැලසුම් සකස් කරලා තිබුණේ නැති නිසාත් තමයි අපට වැඩිපුර පැය ගණනක් -පැය 18ක්, 19ක් පමණ- විදුලිය කප්පාදු කරන්න වුණේ, ආණ්ඩුවට ගෙදර යන්න වුණේ, ජනාධිපතිවරයාට ජනාධිපති ධුරය අතහැර දාලා යන්න වුණේ. දැන් ඒ අය බලන්නේත් එළඹෙන මාර්තු මස 09වන දාට නියමිත පළාත් පාලන මැතිවරණය ළං වන විට මේ රටේ විදුලි කප්පාදුව තවත් වැඩි කරගන්න පුළුවන්ද කියලායි. අපි අපට තිබෙන සම්පත් කළමනාකරණය කරගන්න ඕනෑ. තිබෙන සම්පත් කළමනාකරණය කරගත්තොත් තමයි අපට අඛණ්ඩ විදුලි සැපයුමක් කිරීමට හෝ මේ තිබෙන විදුලි කප්පාදුව කළමනාකරණය කරගන්න හෝ පුළුවන් වන්නේ. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම කැබිනට් මණ්ඩලයටත්, මේ පාර්ලිමේන්තුවේ ජාතික සභාවටත්, ගරු කථානායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්ටත් පොරොන්දුවක් දීලා තිබෙනවා, පෙබරවාරි 15වන දාට ගාස්තු සංශෝධනයක් කරලා අවශ්‍යතාව අනුව කටයුතු කරන්නම් කියලා.

ගාස්තු සංශෝධනය ප්‍රමාද වීමම අද මේ බලශක්ති අර්බුදය තවදුරටත් උග්‍රවීමට හේතු වෙලා තිබෙනවා. අපි දවසින් දවස ඒ කටයුතු ප්‍රමාද කරන්න කරන්න අපට යථා තත්ත්වයට පත් වෙන්න කාලයක් ගත වෙනවා. ගරු ජනාධිපතිතුමා කිව්වා වාගේම ආර්ථිකයේ හැම තැනටම අවශ්‍ය ප්‍රතිකාරය ඉක්මනින් ලබා දුන්නොත් විතරයි අපට කඩිනමින් යථා තත්ත්වයට පත් වෙන්න පුළුවන්කම ලැබෙන්නේ. රජයක් හැටියටත්, විශේෂයෙන්ම විෂයභාර අමාත්‍යවරයා හැටියටත් මම කනගාටු වෙනවා, අඛණ්ඩව විදුලිය ලබා දීමට නොහැකි වීම පිළිබඳව සහ විදුලිය ගාස්තු වැඩිවීමත් එක්ක ජනතාව මත ඒ බර පැටවීමට සිදුවීම පිළිබඳව. අපට වෙනත් විකල්ප මාර්ග තිබෙනවා නම්, අප ඒ මාර්ග ඔස්සේ ගිහින් ඒ ජනන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුයි. ඒ නිසා මා යෝජනා කරන්නේ මේ පාර්ලිමේන්තුවේ ඉන්න සියලුදෙනාත්, එළියේ ඉන්න සියලුදෙනාත් එකතු විය යුතුය කියලායි. ඒ වෙනත් කිසිවක් නිසා නොව, අපේ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති තුළින් කඩිනමින් විදුලිය නිපදවාගැනීම සඳහායි. ඒක කරන්න පුළුවන් හැකියාව තිබියදී අපි තවමත් ගල් අඟුරුවලින්, තාප බලාගාරවලින් විශාල විදුලිය ප්‍රමාණයක් ජනනය කරනවා. සාමාන්‍යයක් හැටියට ගත්තොත්, අවුරුද්දකට අපි තවම ජලයෙන් විදුලිය උත්පාදනය කරන්නේ රටේ අවශ්‍යතාවෙන් උපරිම වශයෙන් සියයට 30යි. පුනර්ජනනීය බලශක්තියෙන් විදුලිය උත්පාදනය කරන්නේ සියයට 10යි. අවශ්‍ය ඉතිරි ප්‍රමාණය තමයි වැඩි මුදලකට මිල දී ගන්න අපට සිදු වෙලා තිබෙන්නේ. හැබැයි, අපි අවශ්‍ය පහසුකම් හැදුවොත්, නිවැරදි ගාස්තු ක්‍රමයක් හඳුන්වා දුන්නොත් ඒ තත්ත්වය වෙනස් කරන්න පුළුවන්.

[ගරු කංචන විජේසේකර මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලි ගාස්තු සංශෝධනය ගැන කියලා මා කථාව අවසන් කරන්නම්. පසුගිය කාලයේ නිවාසවල හිමියන් හැටියට ඔබතුමාත්, මාත්, අප හැමදෙනාත්, අනෙක් ගෘහ හිමියන් සියලුදෙනාත් -රටේ ඉන්න ගෘහස්ථ විදුලිය පාරිභෝගිකයන්- විදුලිය සඳහා ගෙවපු ප්‍රමාණයක් තිබෙනවා. හැබැයි, මහජන උපයෝගිතා කොමිසම තට්ටු නිවාසවල පදිංචි අයට ඒ ප්‍රමාණයට වඩා අඩු ගාස්තුවක් අය කළේ ඇයි කියන ප්‍රශ්නය මට තිබෙනවා. තට්ටු නිවාසවල පදිංචි අයගෙන් අය කරන්නේ ඉහත කී ගෘහස්ථ පාරිභෝගිකයන්ගෙන් අය කරන මුදලින් සියයට 50ක ප්‍රමාණයක්; අඩු ප්‍රමාණයක්. විදුලි ඒකකයකට උපරිම වශයෙන් රුපියල් 75ක් මේ රටේ ගෘහස්ථ පාරිභෝගිකයන්ගෙන් අය කර ගන්නවා. ඒක රුපියල් 30 ඉඳන් යනවා. සමහර තැන්වල රුපියල් 8 ඉඳන් යනවා. "Trillium" වාගේ apartment complexesවල -තට්ටු නිවාසවල- පදිංචි අයගෙන් ගෘහස්ථ පාරිභෝගිකයන්ගෙන් අය කරනවාට වඩා සියයට 50ක් අඩුවෙන් තමයි අය කරන්නේ. මම දන්නේ නැහැ ඒ අය වෙනම කණ්ඩායමක් හැටියට සැලකුවේ ඇයි කියලා. ගෘහස්ථ පාරිභෝගිකයන් ලෙස තට්ටු නිවාසවල ඉන්න අය, ගෘහස්ථ කාණ්ඩයෙන් අයින් කරලා වෙනත් කාණ්ඩයකට දාලා ඒ අයට විදුලි ගාස්තු අඩු කළේ ඇයි කියා මා දන්නේ නැහැ. ඒකත් නිවැරදි කරයි කියා මා විශ්වාස කරනවා. එහෙම වුණොත් ගෘහස්ථ කාණ්ඩයේ ඉන්න පිරිසට මීට වඩා සහනාධාරයක් ලබා දෙන්න අපට පුළුවන්කම ලැබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 15ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.58]

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithreepala Sirisena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව ආරම්භ කිරීමට පෙර කිව යුතු කරුණක් තිබෙනවා. මිනිසුන් වශයෙන් අපි කවුරුත් දැඩි වේදනාවකට පත් කරමින් තුර්කියේ සහ සිරියාවේ මහා භූමිකම්පාවක් ඇති වුණා. එම ඛේදවාචකයේදී මිනිසුන් විශාල පිරිසක් මරණයට පත් වුණා. එහිදී විපතට පත් සියලුදෙනා වෙනුවෙන් මා පෞද්ගලිකවත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියටත් අපගේ දැඩි සංවේගය සහ ශෝකය පළ කරනවා.

ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා ඊයේ පාර්ලිමේන්තුවේදී කරන ලද කථාව සම්බන්ධයෙන් පැවැත්වෙන මේ විවාදයේදී මා මූලික වශයෙන් කිව යුතු කරුණක් තිබෙනවා. එතුමා ඊයේ වාගේම, එතුමා තනතුරට පත් වුණු දවසේ ඉඳන් අවස්ථා ගණනාවකදීම පාර්ලිමේන්තුවේදී කිව්වා, මේ රට ගොඩ නඟන්න සියලුදෙනා එකට එකතු වෙමු කියලා. රටේ බරපතළ ආර්ථික අර්බුදයක් තිබෙනවා, ප්‍රශ්න රාශියක් තිබෙනවා, ඒ නිසා මේ රට ඉක්මනින් ගොඩ ගන්න සියලුදෙනා එකතු වෙමු කියලා එතුමා ආයාචනයක් කළා.

රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපතිවරයා වුණාට පසුව එතුමා සමඟත්, ඊට පෙර අරගළය පැවැති කාලය තුළ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා සමඟත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තමයි නායකත්වය අරගෙන යෝජනා කළේ, විශේෂයෙන් කොවිඩ් වසංගතයෙන් පසුව ඇති වූ ආර්ථික අර්බුදයෙන් මේ රට ඉක්මනින් ගොඩ ගැනීම සඳහා පාර්ලිමේන්තුවේ සිටින සියලුදෙනා දේශපාලන පක්ෂ භේදයෙන් තොරව එකට එකතු වෙලා සර්වපාක්ෂික ආණ්ඩුවක් හදමු කියලා. පසුගිය අවුරුදු එකහමාරක කාලයක් තිස්සේ අපි උත්සාහ ගත්තේ ඒ සඳහායි. සර්ව පාක්ෂික ආණ්ඩුවක් හැදීමේ ධජය අපි අවුරුදු එකහමාරක් තිස්සේ ඉදිරියට ගෙන ගියා. අපි සෑම දේශපාලන පක්ෂයක් සමඟම ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කළා. දැන් ඉන්න ජනාධිපතිතුමා සහ හිටපු ජනාධිපතිතුමා සමඟත් අපි සාකච්ඡා කළා. නමුත්, අවසානයේදී ඊට සිදු වුණේ කුමක්ද කියන එක සෑම කෙනෙක්ම දන්නවා. වර්තමාන ආණ්ඩු පක්ෂය තමයි කරුණු ඉදිරිපත් කරලා, එය කළ නොහැකියි කියන තත්ත්වය ඇති කරගත්තේ.

සර්ව පාක්ෂික ආණ්ඩුවක් හදලා මේ රට ගොඩ ගන්නවා නම්, ඒ සඳහා අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරන්නට ඕනෑ.

ඊයේ ගරු ජනාධිපතිතුමාගේ කථාව පිළිබඳව, මූලික වශයෙන්ම දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව තමයි රටේ සංවාදයක් ඇති වෙලා තිබුණේ. ඒ වාගේම ඊයේ එතුමා කථා කරන්න පෙරත්, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් ජනාධිපතිතුමා කථා කරන්න යනවාය කියන සාකච්ඡාව රට තුළ ජනගත වෙලා තිබුණා. මේ සම්බන්ධයෙන් තිබෙන විවිධ අදහස් හා මත තුළ, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආවේ කොහොමද, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට නිදන්ගත හේතු මොනවාද, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පෙර, එය ගෙන එන්න ඉන්දු-ලංකා ගිවිසුම මුල් වෙච්ච කරුණු ඉදිරිපත් වුණා. ඉන්දු-ලංකා ගිවිසුම, දහතුන්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හා පළාත් සභා පනත කියන කරුණු කාරණා එකින් එක ඉදිරිපත් වුණා.

ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ තමයි ඉන්දියාවෙන් උතුරට පරිප්පු ගෙනැල්ලා දැම්මේ. ඉන්දු-ලංකා ගිවිසුම පිළිබඳව සාකච්ඡා කිරීමට පෙර, 1987දී පමණ මේ සභාව නියෝජනය කළ උතුරේ නායකයකු වූ මුරුගේසු සිවසිදම්බරම් මහතා, එතුමාගේ සහෝදර මන්ත්‍රීවරයකු එක්ක ඉන්දියාවට ගිය බව මා දන්නවා. ගිහිල්ලා, ඉන්දියාව සමඟ සාකච්ඡා කරලා කිව්වා, උතුරේ ජනතාවට බරපතළ අසාධාරණකම් සිද්ධ වෙනවා, ඒක නිසා මෙන්න මේ යෝජනා ක්‍රියාත්මක කරන්න කියලා ලංකාණ්ඩුවට යම් කිසි බලපෑමක් කරන්න කියලා. ඒ යෝජනා ඉතාම බරපතළයි. ඒ යෝජනා ක්‍රියාත්මක කළා නම්, යුද්ධය ඇති වෙන්නේ ඒ දවස්වලමයි. ඒ නිසා ප්‍රධාන වශයෙන්ම එතැන් සිට තමයි ඉන්දියානු රජය ශ්‍රී ලංකා රජය සමඟ ඉන්දු-ලංකා ගිවිසුම සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න පටන් ගත්තේ. දිගින් දිගටම ඒ සාකච්ඡා කර ගෙන ආවා. ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මුළු රටටම ඇඳිරි නීතිය දාලා, රජීව් ගාන්ධි මැතිතුමාගේ කාලයේ තමයි ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කළේ. එවකට අගමැති රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ඒ ගිවිසුම අත්සන් කරද්දී ජනාධිපති මන්දිරයට ආවේත් නැහැ.

ඇමති මණ්ඩලයේ සමහර අයත් ඒ අවස්ථාවට සහභාගි වුණේ නැහැ. එවැනි පසුබිමක තමයි එම ගිවිසුම අත්සන් කළේ. එම ගිවිසුම අත්සන් කරන කාලය වනවිට, එල්ටීටීඊ සංවිධානය රට තුළ ප්‍රහාරයකට, යුද්ධයකට ලෑස්ති වෙනවා කියා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාටත්, එවකට පැවැති රජයටත් බුද්ධි අංශවලින් තොරතුරු වාර්තා ලැබී තිබුණා. ඒ වාගේම 1988-89 කාලය වනවිට රට තුළ කලබල ඇති කරන්න, ආණ්ඩුවට විරුද්ධව කැරලි ගසන්න ජනතා විමුක්ති පෙරමුණ සූදානම් වෙනවාය කියාත් තොරතුරු ලැබුණා. ජේ.ආර්. ජයවර්ධන කියන්නේ මේ රටේ සිටි බොහොම පරිණත දේශපාලනඥයෙක්;

දක්ෂිණාංශික දේශපාලනයේ දාර්ශනිකයෙක්. නමුත් ඒ ලැබුණු තොරතුරුත් එක්ක එතුමාට සිද්ධ වුණා, ඉන්දු-ලංකා ගිවිසුමට එකඟ වෙන්න. 1986දී රට තුළ කලබල ඇති කරන්න එල්ටීටීඊ සංවිධානයේ තිබුණු සූදානමත්, 88-89 කාලයේදී කලබල ඇති කරන්න ජවිපෙ තුළ තිබුණු සූදානමත්, රට බරපතළ තත්ත්වයකට ඇදගෙන යැමක් කියන එක ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාට පැහැදිලි වුණා. එතුමා ඒ ගැන අමාත්‍ය මණ්ඩලයට දන්වා සිටියා.

ඒ අතරතුර මේ ගරු සභාව තුළදී උතුර නියෝජනය කළ නායකයකු වන අමිර්තලිංගම් මැතිතුමා යෝජනාවක් ඉදිරිපත් කළා. එතුමා බොහොම උගත්, බුද්ධිමත්, ඥානවන්ත කෙනෙක්. එතුමා යෝජනා කළා, මුස්ලිම් ජනතාවට නැඟෙනහිරින් වෙනම කොටසක් දෙන්න ඕනෑය කියලා. මේ හේතුව නිසා රාජාවලිය වැනි වංශ කථා තුළින් අපි ඉතිහාස කථාව කියවා තිබෙන පුංචි ශ්‍රී ලංකාව - අපේ මාතෘ භූමිය, මේ පුංචි දූපත- බරපතළ අර්බුදයකට මුහුණ දෙන තත්ත්වයක් ඒ කාලයේ ඇති වුණා. ඒකේ ප්‍රතිඵලය තමයි ඉන්දු-ලංකා ගිවිසුම. ඊළඟට, ඒකේ ප්‍රතිඵලය විධියට දහතුන්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. ඒකේ ප්‍රතිඵලය විධියට තමයි, පළාත් සභා පනත ඇති වුණේ.

මට කලින් කථා කළ උතුරේ සහෝදර මන්ත්‍රීතුමා ෆෙඩරල් ක්‍රමයක් ඕනෑය කිව්වා. මම හිතන විධියට ඔය ෆෙඩරල් කථාව මේ රටේ සිංහල, බෞද්ධ ජනතාව වාගේම භික්ෂූන් වහන්සේලා දැඩි ලෙස අවුස්සන කථාවක්. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට, "Thirteen plus" ගෙනෙනවාය කියලා මහින්ද රාජපක්ෂ මැතිතුමාත් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හිටපු මහ ලේකම්, බැං කි-මූන්ට කිව්වා.

ඒ වාගේම බැසිල් රාජපක්ෂ මහත්මයා ඒ කාලයේ ඉන්දියාවට ගිහිල්ලා, ඉන්දියානු විදේශ ඇමතිතුමාට කිව්වා, "Thirteen plus" දෙනවා කියලා. ඒ දීපු පොරොන්දු එක්ක තමයි මේ රටේ ව්‍යාකූල තත්ත්වයක් ඇති වුණේ. මේ රටේ පළාත් සභා පිහිටුවනකොට, පළාත් සභා පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා එතැනින් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළාම, ශ්‍රේෂ්ඨාධිකරණය එහි තිබෙන අඩුපාඩු බලලා, කපන්න ඕනෑ ඒවා කපලා හැදුවා. එවකට සිටි අගවිනිසුරු පාරින්ද රණසිංහ මැතිතුමා ප්‍රකාශයක් කළා, මේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අබ පියල්ලක ප්‍රමාණයක් එහාට ගියොත් මේ රට බෙදෙනවා, ඒ නිසා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් එහාට මේ රට ගෙනියන්න එපා කියලා.

මේ ඇති වුණු කරුණු කාරණා එක්ක මෙච්චර කාලයක් ගතවෙලා තිබියදී පළාත් සභා ක්‍රමය කොතෙක් දුරට සාර්ථක වෙලා තිබෙනවාද කියලා අපි බලන්න ඕනෑ. 1987 ඉඳලා මේ දක්වා අවුරුදු තිස් ගණනක් ගතවෙලා තිබුණත්, පළාත් සභා පිළිබඳව කිසිම ආණ්ඩුවක් -මගේ ආණ්ඩුවවත්- පළාත් සභා ක්‍රමය සාර්ථකද, අසාර්ථකද, එහි තිබෙන අඩුපාඩු මොනවාද, කළ යුතු සංශෝධන මොනවාද කියන කරුණු කාරණා කිසිම දෙයක් ගැන අධ්‍යයනය කරලා නැහැ. ඒ තත්ත්වය තුළ අද පළාත් සභාවලටත් යම්කිසි සංශෝධනයක් අවශ්‍යයි කියන එකයි මගේ අදහස. අද පළාත් සභාවල රජයේ සේවකයන් විශාල පිරිසක් සේවය කරනවා. වාහන, ඉන්ධන, විදුලිය සහ ජලය විශාල වශයෙන් පාවිච්චි කරනවා. මාගේ මතකයේ හැටියට ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා 1987දී ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කරන්න කලින් දිස්ත්‍රික් සංවර්ධන සභා ක්‍රමය ගෙනාවා. දිස්ත්‍රික් සංවර්ධන සභා මැතිවරණයකුත් පැවැත්වූවා. දිස්ත්‍රික් සංවර්ධන සභා මැතිවරණය පැවැත්වුවත්, එය කාලයක් යනකොට අහෝසි වුණා. මා දන්නේ නැහැ, ඒකට මොන විධියේ කරුණු බලපෑවාද කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තිබෙන කරුණු සැලකිල්ලට ගත්විට මම පැහැදිලිවම යෝජනා කරනවා, රටේ තිබෙන මේ ප්‍රශ්න සාමකාමීව විසඳා ගැනීමට උතුර, නැඟෙනහිර, බටහිර සහ දකුණ යන සියලු ප්‍රදේශවල සිටින දේශපාලන නායකයන්, විද්වතුන්, විවිධ ක්ෂේත්‍රවල උගතුන් සහ ආගමික නායකයන් ඇතුළු සෑම කෙනෙකුම එකතුවෙලා, එකට වාඩිවෙලා පූර්ණ සාකච්ඡාවකට යා යුතුයි කියලා.

රටේ මෙච්චර ප්‍රශ්න තිබෙන වෙලාවක, රනිල් වික්‍රමසිංහ මැතිතුමා දෙකොන ගිනි ගන්නා විලක්කුවක් අතට ගත්තේ ඇයි කියලා මා දන්නේ නැහැ. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා තමයි දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ. හැබැයි, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා, රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා, ඩී.බී. විජේතුංග ජනාධිපතිතුමා, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිතුමිය, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා, මම -මේ කිසි කෙනෙකු- මේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඊට පස්සේ අත තියන්න ගියේ නැහැ. නමුත් උතුරු පළාතේ හිටපු මන්ත්‍රීවරු ඒ සෑම ජනාධිපතිවරයෙකුටම බලපෑම් කළා, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කරන්න කියලා. හැබැයි, ඒ කිසිම ජනාධිපතිවරයෙකු මේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අත තැබුවේ නැත්තේ මේ රටේ ජනතාවගෙන් වැඩි පිරිසක් සිංහල, බෞද්ධ ජනතාව නියෝජනය කරන නිසායි. සිංහල, බෞද්ධ ජනතාව අමනාප කර ගෙන මෙවැනි දෙයක් කිරීම සුදුසු වෙන්නේ නැහැ; එවැනි දෙයක් කරන්නත් බැහැ; එවැනි දෙයක් කරන්න ලැබෙන්නේත් නැහැ. නමුත් සිංහල, දමිළ, මුස්ලිම් කියලා අපි අතරේ කිසිම භේදයක් නැහැ. අපි හැම කෙනෙකුම සහෝදරත්වයෙන් ජීවත් වෙන්න ඕනෑ. එවැනි සමාජයක් ගොඩ නඟන්න නම් සාමයෙන් සාකච්ඡා කිරීම තමයි අවශ්‍ය වෙන්නේ.

බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තිබෙනවා, සාමයෙන් එක් රැස් වෙන්න, සාමයෙන් සාකච්ඡා කරන්න, සාමයෙන් විසිර යන්න කියලා. ලෝකයේ මීට වඩා බලවත් ප්‍රශ්න රාජ්‍ය නායකයන්,ලෝක බලවතුන් සාකච්ඡා කරලා විසඳා ගෙන තිබෙනවා. ඒ නිසා අපට මේ ප්‍රශ්නය සාකච්ඡා මාර්ගයෙන් විසඳාගන්නට බැරිකමක් නැහැ. ඒ නිසා මේ තිබෙන තත්ත්වය වෙනත් විවිධ අංශවලින් වර්ධනය කරගෙන, ප්‍රශ්න හදා ගෙන, රට තවත් අවුල් කරගෙන, මේ වැටිලා තිබෙන ආර්ථිකය තවත් පහළට දමාගෙන, වෙනත් විවිධ අංශවලින් තව තවත් ප්‍රශ්න වර්ධනය කරගන්න කටයුතු කරන එක නොවෙයි අපි කළ යුත්තේ.

දිස්ත්‍රික් සංවර්ධන සභා ක්‍රමය නැවත ගෙනෙන්න කියලා මා යෝජනා කරනවා. මගේ අදහසේ හැටියට දිස්ත්‍රික් සංවර්ධන සභා ක්‍රමය අනුව ඡන්දයක් පවත්වන්න අවශ්‍ය නැහැ. ඒ දිස්ත්‍රික්කයේ සිටින පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ දිස්ත්‍රික්කයේ සිටින පළාත් පාලන ආයතන ප්‍රධානීන් දිස්ත්‍රික් සංවර්ධන සභාවට ඇතුළත් විය යුතුයි. දැනට තිබෙන DCC එක මීට වඩා ව්‍යවස්ථාපිත කරලා, දිස්ත්‍රික්කය සංවර්ධනය සඳහා අවශ්‍ය බලතල හා සල්ලි ලබා දෙනවා. දිසාපති සහ අවශ්‍ය නම් මහ ඇමතිවරයෙකු, දිසා ඇමතිවරයෙකු පත් කරලා, ඔහුට බලතල පවරමින් ඒ ප්‍රදේශය සංවර්ධනය කරන්න සල්ලි ලබා දෙනවා. ඊට වඩා දෙයකට අප යා යුතුයි කියලා මා හිතන්නේ නැහැ. මේ තිබෙන කරුණු සැලකිල්ලට ගත් විට මූලික වශයෙන්ම අපි අතීතයේ ලැබූ අත්දැකීම් මොනවාද කියලා තේරුම් ගන්නට ඕනෑ.

1987දී වර්ධරාජා පෙරුමාල් මහත්මයා උතුරු පළාතේ මහ ඇමති වුණා. ඊට පස්සේ එතුමා සීමාව ඉක්මවා යන්න පටන් ගත්තා. එම නිසා එතුමාට එතැනින් ඒ ගමන නවත්වන්න සිද්ධ වුණා. ඒ පිළිබඳව ප්‍රශ්න රාශියක් ආවා. ලෝකයේ තවත් රටවල බලය බෙදා තිබෙනවා, මේ රටේත් මීට වඩා බලය බෙදන්න බැරි ඇයි කියන කථාව උතුරේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඇසුණා. උතුරු පළාත නියෝජනය කරන ඔබතුමන්ලා කරන මේ

[ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා]

ඉල්ලීම්වලදී ප්‍රධාන වශයෙන්ම අපි සැලකිල්ලට ගන්න ඕනෑ කරුණක් තිබෙනවා. ෆෙඩරල් ක්‍රමය ක්‍රියාත්මක වන රටවල් රාශියක් ලෝකයේ දැන් තිබෙනවා. මීට වඩා උගත්, බුද්ධිමත්, ඥානවන්ත ජනතාවක් ඒ රටවල ඉන්නවා. සාකච්ඡා කරලා යම්කිසි එකඟත්වයකට ඇවිල්ලා ප්‍රශ්න විසඳා ගැනීමෙන් තමයි ඒ රටවල් ඒ තත්ත්වය ඇති කර ගත්තේ. නමුත්, අපි තවම එතැනට ඇවිල්ලා නැහැ. දැන් අපි ඉතාම දුගී රටක්, බලවත් ප්‍රශ්න තිබෙන රටක්. අපි තවමත් ප්‍රධාන ප්‍රශ්න විසඳාගන්න බැරි වෙච්ච රටක්. එම නිසා අපි මේ තත්ත්වය සැලකිල්ලට ගැනීම අත්‍යවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. සෑම ආණ්ඩුවක් ම පළාත් සභාවලට අයත්ව තිබුණු පාසල්, රෝහල් වාගේ ගන්න පුළුවන් දේවල් ඔක්කෝම මධ්‍යම ආණ්ඩුව යටතට ගත්තා. ඒක හැම ආණ්ඩුවක් ම, හැම ජනාධිපතිවරයකු ම කළා. මාත් පොළොන්නරුව රෝහල මධ්‍යම ආණ්ඩුවට ගත්තා. පළාත් සභාවලට අයිති වෙලා තිබෙන දේවල් මධ්‍යම ආණ්ඩුවට ගන්න එක සුදුසු දෙයක් නොවෙයි. නමුත්, පළාත් රෝහල්වලට ලැබෙන පහසුකම් මදි නිසා, රේඛීය අමාත්‍යාංශයෙන් වැඩි පහසුකම් ලැබෙන නිසා තමයි ජනතාවගේ ඉල්ලීම් අනුව එසේ පවරා ගැනීම් කළේ.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව පැවැති කාලයේ පාසල් 1,000ක් ජාතික පාසල් බවට පත් කළා. එතකොට ඒ පාසල් 1,000 අයත් වන්නේ කාටද? ඒවා පළාත් සභාවලට අයත් පාසල්. මෙවැනි දේවල් කිරීම නිසා තමයි ප්‍රශ්න මතු වෙන්නේ. ඒ පාසල් දියුණු කිරීම විනා ඒවා රජයට අරගෙන ජාතික පාසල් කිරීම නොවෙයි කළ යුත්තේ. ඒ පාසල් 1,000ට මොකක්ද වුණේ? මම මෙහෙම කියනවාට ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු අමනාප වෙන්න එපා. ඒ පාසල් 1,000න් බොහොමයක බෝඩ් එක ගහලා තිබෙනවා, "ජාතික පාසල" කියලා. ඒ හැරෙන්න ගොඩනැඟිලි, swimming pools, ක්‍රීඩාංගණ, විද්‍යාගාර වාගේ ජාතික පාසලක තිබිය යුතු සම්පත් ඒ පාසල්වල නැහැ. ඒ තත්ත්වය තුළ ජාතික පාසල කියලා බෝඩ් එකක් ගැහුවාට වැඩක් නැහැ. මට පොළොන්නරුවේ පාසල් කිහිපයකම විදුහල්පතිවරු කිව්වා, සර්, මේ බෝඩ් එක ලියාගන්න අපට සල්ලි නැහැ, ඒත් හොඳ බෝඩ් එකක් ලියාගන්න ඕනෑ කියලා. ඒ ගැන කියන්න මම දන්නේ නැහැ. මම හිතන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් සමහර පාසල්වලට පසුව ඒ සඳහා සල්ලි දුන්නා. මෙවැනි හේතු නිසා දැනට පළාත් සභාවල තිබෙන සම්පත් මධ්‍යම රජයට පවරා ගැනීම අපි නතර කරන්න ඕනෑ. එහෙම කරලා දැන් තිබෙන මේ ප්‍රශ්න අර්බුදයකට යන්නේ නැති විධියට විසඳාගන්න ඕනෑ.

ඊයේ ස්වාමීන් වහන්සේලා කණ්ඩායමක් ඇවිල්ලා පාර්ලිමේන්තුව අසල පොල්දූව මංසන්ධියේ විශාල උද්ඝෝෂණයක් කළා. මේ රටේ ස්වාමීන් වහන්සේලා විරුද්ධ වෙන දෙයක් කවදාවත් අපට කරන්න බැහැ. එදා ස්වාමීන් වහන්සේලා වාඩිවෙලා උද්ඝෝෂණය කරපු තැනට එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා ඇවිල්ලා බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුම ගිනි තැබුවා. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා මේ රටේ හිටපු දාර්ශනිකයෙක්. ඇයි, එතුමා එහෙම කළේ? මහා සංඝ රත්නය එක්ක හැප්පෙන්න බැරි බව එතුමා දන්නා නිසා. මේක බෞද්ධ රටක්.

මම දැන් ඉන්න කාදිනල්තුමාත් එක්ක දවසක් chopper එකකින් මඩු පල්ලියට ගියා. ඒ අවස්ථාවේ එතුමා මට කිව්වා, "බලන්නකෝ ජනාධිපතිතුමා, මෙහෙම යනකොට හැම තැනම පෙනෙන්නේ චෛත්‍යවල කොත් නේ" කියලා. මේ රට එහෙම රටක්. මේ රටේ බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ පසුබිම, ඉතිහාසය ආදී සියල්ල සැලකිල්ලට ගත්තාම අපි සහජීවනයෙන් යුතු සාමකාමී වැඩ පිළිවෙළකටයි යා යුත්තේ. මේ රට දියුණු කරන්න නම්, මේ ප්‍රශ්නය විසඳන්න නම්, පාර්ලිමේන්තුවේ බෙදිලා කෑ ගහලා වැඩක් නැහැ. ජනාධිපතිතුමාගේ ඉල්ලීම සියලුදෙනා එකට එකතු වෙමු කියන එකයි. එහෙමනම්, සියලුදෙනා එකට එකතු වෙච්ච සර්වපාක්ෂික ආණ්ඩුවක් හදලා, මේ රටේ තිබෙන ප්‍රශ්න විසඳීමේ මාර්ගයකට තමයි අපි යා යුතු වන්නේ. සිංහල බෞද්ධ බලවේගයත්, මේ රටේ ස්වාමීන් වහන්සේලාත් තරහ කරගෙන කොහෙත්ම මේ ප්‍රශ්නය විසඳන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ජනාධිපතිවරයා විධියට හිටපු කාලයේ උතුරට විශාල වැඩ කොටසක් කළා. හමුදාවලට අරගෙන තිබුණු ඉඩම්වලින් සියයට 95කට වැඩිය මම නිදහස් කළා. තව සියයට 5ක් තමයි නිදහස් කරන්න තිබෙන්නේ. අනාථ කඳවුරුවල පවුල් පිටින් හිටියා. ඉඩම් නිදහස් කරලා ඒ සියලුදෙනාට දුන්නා. ඒ ප්‍රදේශවල ජනතාවට ඉඩම් දෙන්න ඕනෑ නම්, අපි පොළොන්නරුව, අනුරාධපුරය, හම්බන්තොට, මොණරාගල ජනතාවට ඉඩම් දෙනවා වාගේ applications කැඳවා, ඉඩම් කච්චේරියක් තියලා, ප්‍රදේශ තෝරාගෙන ඉඩම් දෙන එකයි කරන්න තිබෙන්නේ. එහෙම නැතිව වෙනත් විධියකට මේවා කරන්න ගියොත් විශාල අවුලක් ඇති වෙනවා.

ඒ නිසා මම අවසාන වශයෙන් උතුරේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන්, නායකයන්ගෙන් ඉතා ගෞරවයෙන්, ආදරයෙන් ඉල්ලීමක් කරනවා, මේ ප්‍රශ්නය විසඳාගන්න මීට වඩා බොහොම මධ්‍යස්ථ ප්‍රතිපත්තියකට එන්න කියලා. සම්පූර්ණ මස් රාත්තලම ඉල්ලන එක නොවෙයි කළ යුත්තේ. බුදුන් වහන්සේ දේශනා කර තිබෙන්නේ මැදි පිළිවෙත අනුගමනය කරන්න කියලායි. ඒ නිසා එක පැත්තකට බර නොවී අපි හැම කෙනෙක්ම මැද තැනකට ඇවිල්ලා මේ ප්‍රශ්නය විසඳා ගනිමු. අවුරුදු 30ක යුද්ධයක් තිබිලා, ඒ යුද්ධය අවසන් වෙලාත් මේ ප්‍රශ්නය යට ගිහිල්ලා නැහැ. ඒ නිසා කරුණාකරලා සාමය, සහජීවනය, සුහදත්වය, මනුස්සකම, මානවවාදය යන තත්ත්ව තුළ අපි මේ රට ගොඩ ගනිමු කියන ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඊළඟට, ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 15ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.18]

**ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා (ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பிரமித்த பண்டார தென்னகோன் - பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Premitha Bandara Tennakoon - State Minister of Defence)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තීරණාත්මක මොහොතක ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන්න යෙදුණු ප්‍රතිපත්ති ප්‍රකාශනය සම්බන්ධයෙන් අදහස් දක්වන්න අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. ඒ වාගේම තරුණ, අලුත් දේශපාලන පරම්පරාවක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු විධියට, රාජ්‍ය ඇමතිවරයකු විධියට හිටපු ජනාධිපතිතුමකුගේ කථාවට පසුව කථා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳවත් මා සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රථමයෙන්ම මම එක දෙයක් පැහැදිලි කරන්න ඕනෑ. පැරණි සාම්ප්‍රදායික, ගතානුගතික, පටු දේශපාලන ධාරාවෙන් ඉවත් වෙලා අලුත් විධියට හිතන්න, වැඩ කරන්න ඕනෑය කියන ස්ථාවරයේ ඉඳලා තමයි මම අද කථා කරන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිටපු ජනාධිපතිතුමා කථා කරද්දී මට හිතුණේ අපි තවම රටක් විධියට පාඩමක් ඉගෙන ගෙන නැති බවයි. අපි හැම දාම එකම දේ කරලා වෙනස් ප්‍රතිඵලයක් බලාපොරොත්තු වෙන රටක් බවට පත් වෙලා තිබෙනවා. එනම්, දර දාලා කේජු බලාපොරොත්තු වෙනවා. අපි මේ සම්ප්‍රදායෙන් ඉවත් වෙන්න ඕනෑය කියා මම කල්පනා කරනවා. අපි දේශපාලනයයි, ආගමයි, ඉතිහාසයයි, සංස්කෘතියයි, ආර්ථිකයයි කියන මේ ඔක්කෝම එකට පටලවා ගෙන ඉන්නේ. දශක හතහමාරක් තිස්සේ තිබෙන මේ පටලැවිල්ල ලිහා ගන්නකම් රටක් විධියට අපට ඉදිරියට එන්න පුළුවන් වෙයි කියා මා විශ්වාස කරන්නේ නැහැ. හිටපු ජනාධිපතිතුමාගේ කථාවේදී කියනවා මට ඇහුණා, සිංහල බෞද්ධ ජනතාව දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධයි කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හොඳ බෞද්ධයෙක් කියන්නේ හොඳ මානව හිතවාදියෙක්. පොඩි කාලයේ ඉඳලා සතා සීපාවාට පවා ආදරය කරන්න අපේ බුදු දහමෙන් අපට ඉගැන්නුවා. හොඳ බෞද්ධයෙකුට අන්තවාදියෙක් වෙන්න පුළුවන්කමක් නැහැ. හැම තිස්සේම මැද ඉඳලා කල්පනා කරන්න, වැඩ කරන්න කියලා බුදු රජාණන් වහන්සේගේ ධර්මයෙන් දේශනා කළා. බෞද්ධයෙකු කවදාවත් බෙදාගන්න කෙනෙක් වෙන්න බැහැ. හොඳ බෞද්ධයෙකුට පුළුවන්, බෙදාගන්න කෙනෙක් වෙන්න. මෙන්න මේ චින්තනයේ ඉඳලා වැඩ කරන්න පටන් ගන්න ඕනෑය කියලා තරුණ, අලුත් මන්ත්‍රීවරයෙකු විධියටත්, රාජ්‍ය ඇමතිවරයකු විධියටත් මම ප්‍රථමයෙන්ම මේ ගරු සභාවට යෝජනා කරනවා.

ඒ වාගේම හිටපු ජනාධිපතිතුමා හොඳ ප්‍රවේශයක් ගත්තා. එතුමා කිව්වා, එකතු වෙලා වැඩ කරන්න සූදානම් කියලා. එතුමා කිව්වා, මේ අර්බුදයෙන් ගොඩ එන්න එතුමාගේ දායකත්වය, සහයෝගය ලබා දෙන්න සූදානම් කියලා. ඒක අපි සුබවාදීව දකිනවා. හැබැයි, ඔබතුමාගේ පක්ෂයේ ලේකම්තුමාගේ මතය වෙනස් එකක්, ගරු හිටපු ජනාධිපතිතුමනි. එතුමා ඊයේත් වෙන යම් ආකාරයක ප්‍රකාශයක් පාර්ලිමේන්තුවේදී කළා. ඒ පටලැවිල්ලත් කරුණාකර ලිහා ගන්න කියලා මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ජනප්‍රියම මාතෘකා කිහිපයක් තිබෙනවා. "අවුරුදු 74ක දේශපාලන බේදවාචකය", "සිහින මරපු මිනිස්සු" යනාදී වශයෙන් සටන් පාඨ කිහිපයක් මේ දවස්වල ක්‍රියාත්මක වෙනවා. මේවා පැත්තකට දාලා අපට වැරදුණේ කොතැනද, අපි හදා ගන්න ඕනෑ කොතැනද කියා කල්පනා කරන්න කාලය දැන් ඇවිල්ලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මුල ඉඳලාම වරද්දා ගත්තා. අපේ රටේ ආකල්ප, සිතුම් පැතුම්, හැඟීම්වල වෙනසක් ඇති කරගන්න කල් මේ අර්බුදයෙන් අපට ගොඩ එන්න පුළුවන්කමක් නැහැ. System change එකකට කලින් attitude change එකක් කරගන්න, ආකල්ප හදා ගන්න අපට සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටට වැඩක් කරලා කවදාවත් හොඳක් අහපු මනුස්සයෙක් අපේ ඉතිහාසයේ නැහැ. අනිවාර්යයෙන්ම හොඳක් අහන්න නම්, ගෞරවයක් ලබන්න නම් මැරෙන්න ම ඕනෑ. ඒකට ඕනෑ තරම් උදාහරණ මේ සමාජයෙන් අපට ගන්න තිබෙනවා. අනගාරික ධර්මපාලතුමා රට දාලා ගියා, රට දිහා බලාගෙන නිදා ගන්නවත් කැමැති නැහැ කිව්වා. අද හන්දියක් හන්දියක් ගානේ එතුමාගේ පිළිරු හදලා අවුරුද්දකට වතාවක් ගුණ සමරුවක් පවත්වනවා.

ඒ වාගේමයි නිදහස් අධ්‍යාපනයේ පියා වන සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහත්මයා. එතුමා 1943දී නිදහස් අධ්‍යාපන පනත ගෙනැල්ලා හැම දුප්පත් කොල්ලෙකුටම, කෙල්ලෙකුටම නිදහස් අධ්‍යාපනය ලබා ගන්න පුළුවන් ආකාරයට අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් කළා. ඊළඟ මැතිවරණයේදී කන්නන්ගර මහත්මයා පරද්දලා ගෙදර යවපු රටක්, මේක. හැබැයි, මැරුණාට පස්සේ මල් තියලා වඳිනවා.

ගාමිණී දිසානායක මහත්මයා මහවැලිය හදද්දී සමාජ මතයක් ගෙන ගියා, "ගාමිණී හොරා", "ගාමිණී මහවැලි හොරා" කියලා. හැබැයි, එතුමා මැරුණාට පස්සේ ගාමිණී වාගේ මිනිහෙක් හිටියා නම් කියලා අද වනකොට මේ සමාජයේ හැමෝම කථා වෙනවා. ලෝකයේ පළමුවෙනි අග්‍රාමාත්‍යවරිය වන සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට "බින්දු කුමාරි" කිව්වා. එතුමියගේ ප්‍රජා අයිතිය අහෝසි කළා. හැබැයි, අද එතුමියට මල් තියලා වඳිනවා.

මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට අද ලැබිලා තිබෙන ගෞරව නාමය තමයි, "මහින්ද හොරා" කියන එක. හැබැයි, මම මේ සභාවේ කියනවා, කවදා හෝ මේ රටින් එතුමාට ගරු සැලකිලි ලැබෙද්දී එදාට ඔබතුමන්ලාට මගේ මේ කථාව මතක් වෙයි කියලා. මේක හොඳක් අහන්න නම්, ගෞරවයක් ලබන්න නම් මැරෙන්න ම ඕනෑ රටක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඉන්නකල් මඩ ගහනවා. මෑත කාලයේ මංගල සමරවීර ඇමතිතුමා නැති වුණා. එතුමා නැති වුණාට පස්සේ ඔක්කෝම එතුමාගේ ගුණ කියන්න, එතුමා හිටියා නම් හොඳයි කියන්න පටන් ගත්තා. මෙන්න, මේ ආකල්පවලින් අපට එළියට එන්න සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ හොරා කියන්නේ දේශපාලනඥයන්ට විතරක් නොවෙයි. ගමේ වුණත් යමක් කමක් හොයා ගත්තු, දියුණු වෙච්ච මනුස්සයාට චෝදනා දෙකක් එල්ල වෙනවා. මට උදාහරණයක් කියන්න අවසර දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම නියෝජනය කරන ප්‍රදේශයේ එක්තරා පුද්ගලයෙක් උදේ 4ට නැඟිටලා බිරිඳත් එක්ක ව්‍යාපාරයක් පටන් ගත්තා. ඔහු සාර්ථක ව්‍යාපාරිකයෙක් වුණා. අවුරුදු දෙක තුනකට පස්සේ ගමේ දේවාලය හදන වෙලාවේ පන්සලට ගිහිල්ලා ගමේ කමට රුපියල් ලක්ෂයක් දුන්නා. එතකොට ගමේ මිනිස්සු ඔක්කෝම කථාවක් හැදුවා, නිධානයක් හාරලා අලයක් ගත්තා කියලා. ඔහුගේ පුතාට ඉස්කෝලෙට යන්න බැරි වුණා. ඒ පොඩි එකාට ඉස්කෝලේ ළමයි නමක් දැම්මා, "අලයා" කියලා. දියුණුව ලබපු මිනිස්සුන්ට මේ රටේ දුන් ගෞරව නාම තමයි, ඒ. ගමේ කවුරු හරි දියුණු වුණා නම් එක පැත්තකින් නිධන් හොරෙක්, එහෙම නැත්නම් කුඩු කාරයෙක් බවට මේ සමාජය පත් කළා. මෙන්න, මේ ආකල්පවලින් එළියට එන්නේ නැතිව අපට දියුණු වෙන්න පුළුවන් කියලා හිතන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කතරගම ප්‍රදේශයේ සංචාරය කළ වෙලාවක එක සිද්ධියක් දැක්කා. තරුණ කාන්තාවන් තුන්දෙනෙක් garment factory එකේ වැඩට ගිහිල්ලා මහන්සියෙන්, හෙම්බත් වෙලා ඇවිදගෙන එනවා. ඒ වෙලාවේ රස්තියාදු ගහන, වැඩක් නොකරන කොල්ලෝ හතර පස් දෙනෙක් තාප්පයක් උඩ වාඩි වෙලා හිටියා. වැඩ කරලා මහන්සි වෙලා එන කෙල්ලෝ තුන්දෙනාට, මේ කොල්ලෝ ටික "ගාමන්ට් බඩු" කියලා විහිළු කළා. මේක එහෙම රටක්. රටවල් දියුණු කරන්න එහෙම පුළුවන් කියලා හිතන්න එපා. මෙවැනි ආකල්පවලින් එළියට එනතුරු රට හදන්න පුළුවන් වෙන්නේ නැහැ. වැඩ කරන්නේ නැති කෙනා හැම තැනදීම වැඩ කරන කෙනාට විහිළු කළා; ඔච්චම් කළා; ඇඟිල්ල දිගු කළා; හොරා කිව්වා. ගාමන්ට් එකේ කෙල්ල අමාරුවෙන් වැඩ කරලා දෙමවුපියන්ට කන්න දෙද්දී, ඒ කෙල්ල "ගාමන්ට් බඩුව" කරපු සමාජයක් මේක. එහෙම රටවල් දියුණු වෙයි කියලා කවදාවත් හිතන්න එපා.

[ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා]

ඊට පස්සේ වෙනම මතයක් හැදුවා, මේ රටේ දියුණු වෙන හැම මිනිහාම හොරකම් කරනවා කියන මතයක්. ඉතින් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කවුද අපේ රටේ ව්‍යාපාර කරන්නේ කියලා කරුණාකරලා කල්පනා කරලා බලන්න. අපේ රටේ ලාභ ලබන යම් කෙනෙක් සමාජ ද්‍රෝහියකු විධියට හංවඩු ගහනවා. විවෘත ආර්ථික වෙළෙඳපොළක ලාභය කියන්නේ වැරදි දෙයක් - profit is evil in this country - කියන තත්ත්වයට මේ රට පත් කළා. ඒ වාගේම ව්‍යාපාර යම්කිසි ලාභයක් ලබන වෙලාවට ඒක මාෆියා එකක් කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එළවලු වවන ප්‍රදේශයක මම ජීවත් වෙන්නේ. එක කාලයකට එළවලු මිල ඉහළ යනවා. තව කාලයකට පහළ යනවා. ඉහළ යන වෙලාවට එළවලු මාෆියාව කියලා මේ රටේ සමාජ මතයක් හදනවා. බිත්තර මාෆියාව කියලා මතයක් හදනවා.ගෑස් මාෆියාව කියලා මතයක් හදනවා. සහල් මාෆියාව, මෝල් මාෆියාව කියලා මත හදනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙච්චර මාෆියා ඉතාලියේවත් නැහැ. අපි අපේ රටේ දේශීය කර්මාන්ත දියුණු කරනවා වෙනුවට වැඩ කරන එකාගේ කකුලෙන් අදින දේශපාලන සංස්කෘතියක්, ආර්ථික සංස්කෘතියක් තමයි මේ රටේ හදලා තියෙන්නේ. එහෙම රටවල් දියුණු වෙයි කියලා හිතන්න එපා. IMF නොවෙයි, කවුරු ආවත් මේ ආකල්පවලින් මිදෙනතුරු මේ රට හදන්න පුළුවන් කියලා මම පෞද්ගලිකව හිතන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා මෙන්න මේ ප්‍රශ්න ටිකට අපට මුහුණ දෙන්න සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට 2022.12.15 වන දා ජාතික තරුණ සේවා සභාවෙන් ලිපියක් ආවා. මම මේ ලිපිය අත්සන් කරපු කෙනාගේ නම කියන්නේ නැහැ. හැබැයි, මේ වෙලාවේ එක දෙයක් මම මේ රටට කියන්න ඕනෑ. මේ ලිපියේ ශීර්ෂ පාඨය, "රණවිරුවන් හා නව වසරට ආශිර්වාද පතා වාර්ෂිකව සිරිපාදේ පැවැත්වෙන පිරිත් පිංකම හා දානමය පුණ්‍ය කර්මය" කියන එක. මෙහි අවසානයට කියනවා, "හැටන් ශ්‍රීපාද මාර්ගයේ නල්ලතන්නි ප්‍රදේශයේ සිට ශ්‍රීපාද මළුව වෙත දානමය පිරිත් පිංකමට අදාළ කිලෝ ග්‍රෑම් 1,000කට ආසන්න වන ද්‍රව්‍ය රැගෙන යෑමේ කාර්ය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සහයෝගය අපේක්ෂා කරන අතර, ඒ සඳහා අවශ්‍ය කටයුතු කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි" කියලා. මේ කොල්ලෝ කෙල්ලෝ ටිකක් එකතු වෙලා කරන පිංකමට බඩු ටික අදින්න හමුදාවේ කොල්ලෝ ඉල්ලනවා. ඒ කොල්ලෝ යන ගමන් සෙල්ෆි ගහන්න පුළුවන්, ඒ කොල්ලන්ට යන ගමන් විනෝදයෙන් යන්න පුළුවන්. හැබැයි, හමුදාවේ කොල්ලෝ ඉන්නේ මෙහෙම වැඩ කරන්න නොවෙයි කියන එක අපි මතක් කරන්න ඕනෑ. විශේෂයෙන් තරුණ ප්‍රජාවගෙන් අපි ඉල්ලනවා, මේ කටයුත්ත කරන්නේ ජාතික තරුණ සේවා සභාවෙන් නම්, ඒකට තරුණ තරුණියන් එකතු කර ගන්න කියලා. මේ පිංකම ඒ අයට පුළුවන් විධියට කරන්න. මොකද, අපේ හමුදාව මින් ඉදිරියට අපි මේ දේවලට යොදවන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නගර සභාවලින්, ප්‍රාදේශීය සභාවලින්, කානු අතුගාන්න, කානු සුද්ද කරන්න අපේ හමුදා නිලධාරීන් ඉල්ලනවා. අපි ප්‍රජා සත්කාරක වැඩසටහන් කරනවා. ඒ වාගේ කිසිම අඩුපාඩුවක් අපි කරන්නේ නැහැ. හැබැයි, ඒ තත්ත්වයට හමුදාව දාන්න එනවාට අපි කැමැති නැහැ කියන එකත් මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කලාපය එක්ක සංසන්දනය කළාම අපේ රට තමයි වැඩිම සහනාධාර දෙන රට; වැඩියෙන්ම බඩු බෙදපු රට; වැඩියෙන්ම වෘත්තීය සමිති ක්‍රියාමාර්ග තිබුණු රට; වැඩියෙන්ම වැඩවර්ජන තිබුණු රට; රටේ ජනගහනයේ ප්‍රතිශතයක් විධියට ගත්තාම වැඩිම රාජ්‍ය සේවකයෝ පිරිසක් ඉන්න රට; ප්‍රතිශතයක් විධියට ගත්තාම වැඩියෙන්ම විශ්‍රාම වැටුප් ගෙවන රට. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අත් දෙකෙන් කෝටි ගණනක බඩු බෙදලා ඇති. හැබැයි, අපි ප්‍රගතියක් දැකලා නැහැ. අපි සහනාධාරවලට අපේ ජනතාව හුරු කරලා තියෙනවා.

ඔබතුමා ගිහිල්ලා බලන්න, සහනාධාරය දෙන දවසට ඒ අදාළ බැංකුව ඉස්සරහා තිබෙන වාහන ප්‍රමාණය. අඩුම තරමේ රුපියල් දහයවත් එපා කියන්නේ නැහැ, අපේ රටේ සමහර අය. ඒ විධියට රටක් දියුණු කරන්න පුළුවන් කියලා හිතන්න එපා.

අපි ක්‍රීඩා භාණ්ඩ ඇතුළු භාණ්ඩ බෙදලා ලබා ගත්ත ප්‍රගතියක් නැහැ. අපි හදන්න අවශ්‍ය වැඩ කරන රටක්. වැඩ කළොත් දියුණු වෙන්න පුළුවන් කියන මතයක්, අදහසක් තිබෙන රටක් අපි හදන්න ඕනෑය කියන පණිවුඩය අපි මේ අවස්ථාවේදී දෙනවා. මම මේ කියපු කථාව ප්‍රසිද්ධ නොවෙන්න පුළුවන්. මේ කථාව අල්ලාගෙන හෙට ඉඳලා මට මඩ ගහන්නත් පුළුවන්. හැබැයි කවුරු හරි කෙනෙක් මේ තිත්ත ඇත්ත කථා කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ජනාධිපතිතුමාගේ රාජාසන කථාවේදීත් කිව්වා, අපට කරන්න වෙන්නේ ජනප්‍රිය දේවල් නොවෙයි, අපට ගන්න වෙන්නේ ඒ වෙලාවට ජනප්‍රිය තීන්දු නොවෙයි කියලා. හැම ජනප්‍රිය තීන්දුවක් තුළින්ම කල් යද්දී, ඒවායේ ප්‍රතිඵල ලැබෙද්දී ඇති වුණු තත්ත්වය ඔබතුමන්ලා දන්නවා. අන්තිමට ඒවාට වන්දි ගෙවන්න වුණේ අපේ ගෙවල්වලටත් ගිනි තියවාගෙනයි. ඒක අමතක කරන්න එපා. ඒ නිසා රට හදන්න, වෙනස් ආකල්ප සහිත, වෙනස් විධියට හිතන පතන, කල්පනා කරන සමාජයක් හදන්න සියලුදෙනාටම ආරාධනා කරමින්, ආයාචනය කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මහාචාර්ය චරිත හේරත් මැතිතුමා. ඔබතුමාට මිනිත්තු දහයක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.34]

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විවාදයට එකතු වෙන්න අවස්ථාව ලැබීම ගැන මා ඉතාම සන්තෝෂ වෙනවා. ගරු ජනාධිපතිතුමා ඊයේ හතරවැනි වතාවටත් එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කළා. ඒ ප්‍රතිපත්ති ප්‍රකාශය ගැන අද ආණ්ඩු පක්ෂයෙන් ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉතාම වැදගත්. මේ ප්‍රතිපත්ති ඉදිරිපත් කරන එකත් දැන් අපේ රටේ ප්‍රතිපත්තියක් වෙලා; ඒකත් පොඩි fashion එකක් වාගේ වෙලායි තිබෙන්නේ. ලොකු ප්‍රශ්නයක් නම්, ප්‍රතිපත්තියක් ඉදිරිපත් කරනවා. ඉස්සර කොමිෂන් සභා පත් කරන එක fashion එකක් වුණා වාගේ දැන් මේ ප්‍රතිපත්ති ප්‍රකාශ ඉදිරිපත් කරන එකත් fashion එකක් වෙලා තිබෙනවා. හැබැයි, ඊයේ ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශය document එකක් විධියට ගත්තාම, text එකක් විධියට ගත්තාම සමහර ඒවා හොඳයි, ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඕනෑම text එකක් context එකක් - සන්දර්භයක් - ඇතුළේ තියලා තමයි බලන්න ඕනෑ.

ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය අඩංගු මේ පොත නම් රජයේ මුද්‍රණාලයෙන් ඉතා ලස්සනට අච්චු ගහපු හොඳ text එකක්. කවුරු හරි ලියලා දෙන්නත් ඇති. නමුත්, ඒක ඉතාම හොඳ

text එකක්. හැබැයි, ඒ text එක විතරක් අරගෙන අපට මේ රටේ දේශපාලනය කරන්න බැහැ. ඒ පයිතය, නැත්නම් මේ ලියන ලද දේ පමණක් ගැන නොවෙයි, ඒක ලිව්වේ කවුද, කිව්වේ කවුද, කරන්නේ කවුද කියන සම්පූර්ණ සන්දර්භය - context එක - ඇතුළේ තියලා තමයි ප්‍රතිපත්ති ප්‍රකාශය ගැන කථා කරන්න ඕනෑ.

මම අද උදේ ඉඳලා මේ සංවාදය අහගෙන හිටියා. අපේ ආණ්ඩු පක්ෂයේ තරුණ මන්ත්‍රීවරු ගණනාවක් ඉතාම ජයග්‍රාහී ලීලාවෙන් මේ ප්‍රතිපත්ති මාලාව ගැන කථා කළා. එතුමන්ලා ගැන මම සතුටු වෙනවා. හැබැයි, මේ ප්‍රතිපත්ති මාලාවේ සන්දර්භය - context එක - මොකක්ද? මොකක්ද, රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ කියන්නේ? එතුමා කියන්නේ, මීට ඉස්සර වෙලා හිටපු ආණ්ඩුව මේ ආර්ථිකය සම්පූර්ණයෙන් අවුල් කළාය කියලායි. එතුමා කියන්නේ, මීට ඉස්සර හිටපු මුදල් ඇමතිතුමා මේ දේශපාලන, ආර්ථික ක්‍රියාදාමය ඉතාම මෝඩ විධියට හැසිරෙව්වාය කියලායි. එතුමා කියන්නේ, බදු පිළිබඳ ප්‍රශ්නයේදී, රාජ්‍යය පිළිබඳ ප්‍රශ්නයේදී මීට ඉස්සර හිටපු මුදල් ඇමතිතුමා සහ ආණ්ඩුව සම්පූර්ණ වැරදි විධියට කටයුතු ක්‍රියාත්මක කළාය කියලායි. "මේක හරි හොඳයි" කියලා ආණ්ඩු පක්ෂයේ තරුණ මන්ත්‍රීවරු උද්දාමයෙන් කියන්නේ ඒකයි. මේක හරි හොඳයි නම්, වැරදි එක කෝකද? මහින්ද රාජපක්ෂ මැතිතුමායි, බැසිල් රාජපක්ෂ මැතිතුමායි දෙදෙනා ඉදිරිපත් කළ අය වැය ප්‍රකාශ දෙක වැරදි දේශපාලන ලියවිලි කියලායි මේකෙන් නොකියා කියන්නේ. ඒකද, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා හුරේ දමලා, අත්පුඩි ගහලා කියන්නේ? මම දන්නේ නැහැ. කියනවා නම්, එහෙම කියන්න. නමුත්, ඒකද මේ කියන්නේ?

මේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ පැහැදිලිව කියනවා, පැවැති බදු ප්‍රතිපත්තිය ගැන. කවුද, ඒ බදු ප්‍රතිපත්තිය ගෙනාවේ? ඒ බදු ප්‍රතිපත්තිය ගෙනෙනකොට මුදල් ඇමතිවරයා වශයෙන් සිටියේ, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා. ඒක ක්‍රියාත්මක කරනකොට මුදල් ඇමතිවරයා වශයෙන් සිටියේ බැසිල් රාජපක්ෂ මැතිතුමා. ඒ බදු ප්‍රතිපත්තිය තමයි මේ වැරදියි කියන්නේ. ඒක වැරදියි නම්, අපි හුරේ දමන්නේ නැතුව පොඩ්ඩක් ඉඳගෙන ඒ ගැන කථා කරන්න ඕනෑ, ඒක වැරදුණේ කොොහොමද කියලා.

ඇයි, ඒක වැරදුණේ? ඒ වෙලාවේ කවුරුන් හෝ කියාපු දේ ඇහුවේ නැද්ද? ඇයි ඒක ඇහුවේ නැත්තේ? අන්න ඒ දේශපාලනය අපි නවත්වන්න ඕනෑද, එපාද? මේ ගැනයි අපි කථා කරන්න ඕනෑ. ඒ නිසා මේක context එකක් ඇතුළේ තබා කියවනවා මිසක, text එකක් විධියට හොඳද, නරකද කියන එකෙන් තඹ දොයිතුවක වැඩක් වෙන්නේ නැහැ.

ඒ වාගේම, අපේ ජනාධිපතිතුමා තවත් වැදගත් කාරණයක් ගැන කිව්වා. ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේදී එතුමා ඉතා පැහැදිලිව කිව්වා, "අපි මෙතෙක් කල් ගත්ත සමහර තීරණ වැරදියි. මෙතෙක් කල් ගත්ත සමහර තීරණ ජනප්‍රිය තීරණ මිසක හරි තීරණ නොවෙයි" කියලා. කවුද, මේ කියන තීරණ ගත්තේ? ජනප්‍රිය වන, හරි නොවන තීරණ ගත්තේ කවුද? එතුමා නියෝජනය කරන පක්ෂය තමයි අවුරුදු 40ක් විතර එවැනි තීරණ අරගෙන තිබෙන්නේ. එහෙම නම් පළමුවෙන්ම ඇවිල්ලා කියන්න ඕනෑ "අපි ගත්ත තීරණ වැරදියි. දැන් මම වෙනස් වෙලා ඉන්නේ. ඒ නිසා අපි දැන් අලුත් තීරණ ගන්නවා" කියලා. එහෙම නැතිව ඊයේ ඉපදුණා වාගේ ඇවිල්ලා "හුඟාක් අය අරගෙන තිබෙන්නේ ජනප්‍රිය තීරණ, ඒවා වැරදියි. මම ගන්නේ ජනප්‍රිය නොවන හරි තීරණ" කියලා අපිට කියනවා නම් එතැන ගැටලුවක් තිබෙනවා. මොකද, "මම" කියන්නේ කවුද? "මම" කියන්නේ මේ රටේ ඔය කියන වැරදි තීරණ, ජනප්‍රිය තීරණ ගත්ත දේශපාලන ධාරාවේ අවුරුදු 40ක නායකයා. ඒ නිසා එහෙම ප්‍රකාශ කිරීමෙන් වැඩක් තිබෙනවාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා එක්ක මට පෞද්ගලිකව කිසි ප්‍රශ්නයක් නැහැ. මම කියන්නේ මේ රඟපෑම ගැනයි. මේ නිසා තමයි එළියේ සමාජයේ; තරුණ සමාජයේ අය අපි ඔක්කෝටම හිනා වෙන්නේ. ඇවිල්ලා කියනවා, අවුරුදු 73ක් තිස්සේ ජනප්‍රිය තීරණ අරගෙන තිබෙනවා කියලා. කවුද එහෙම කියන්නේ? අවුරුදු 73න් අවුරුදු 40ක් රට පාලනය කරපු පක්ෂ නායකයා ඇවිල්ලා කියනවා, අවුරුදු 73ක්ම ජනප්‍රිය තීරණ අරගෙන තිබෙනවා, හරි තීරණ අරගෙන නැහැ කියලා. ඉතින් ජනතාව අපිට හිනා වෙන එක අහන්න දෙයක්ද? ජනතාව කියන්නෙත් ඒකම තමයි. මේක වැරදියි කියන එකයි කියන්නේ. ඒ නිසා මේ රඟපෑම වැඩක් නැහැ. ඕනෑ නම් මේ රඟපෑම කරගෙන යමු. නමුත්, මේකෙන් වැඩක් වෙන්නේ නැහැ. මේ රට ඉස්සරහට යන්නේ නැහැ.

අපි වාගේම ඉන්දියාවත් ඔවුන්ගේ නිදහස අවුරුදු 75ක් සැමරුවා. ඒ අය අවුරුදු 100 දක්වා යන ගමන් මාර්ගය ගැන කියලා තිබෙනවා. අපි නිදහස ලබා ගත් දිනවලම නිදහස ලබා ගත් රටක්. අපිට වඩා කටවල් තිබෙන රටක්; අපිට වඩා ජනතාව විශාල ප්‍රමාණයක් ඉන්න රටක්. නමුත්, අද වන විට ඉන්දියාවේ තත්ත්වය තමුන්නාන්සේලා දන්නවා. අද වෙනකොට GDP එක ඩොලර් ට්‍රිලියන 3.469යි. ඒ වාගේම ඒ රටේ විශාල growth එකක්, විශාල ආර්ථික දියුණුවක් තිබෙනවා. ඒ ආර්ථික දියුණුව ඇති වුණේ ඇයි? සමහර ප්‍රතිපත්ති එක්ක තීරණ ගන්න පුළුවන් නායකයෝ ඒ රටේ පාලනයට ආපු නිසායි. ඒ නිසා අවුරුදු 40ක්, 50ක් තිස්සේ රට පාලනය කරපු අපේ ප්‍රධාන දේශපාලන ධාරාවේ පක්ෂ ඇවිල්ලා අද කියනවා නම්, මේ ප්‍රතිපත්ති වැරදියි කියලා, ඒක තමයි අද අපේ රටේ තිබෙන ප්‍රධානම ප්‍රශ්නය බවට පත් වෙලා තිබෙන්නේ.

මේ ආර්ථික අර්බුදය ජය ගන්න ජනාධිපතිතුමා ඉදිරිපත් කර තිබෙන සමහර කරුණු එක්ක මම එකඟ වෙනවා. සමහර පනත් වෙනස් වෙන්න ඕනෑ. ඒ පනත් සඳහා එතුමා ඉදිරිපත් කර තිබෙන අලුත් පනත් කෙටුම්පත් මොනවාද කියා මම දන්නේ නැහැ. එතුමා සාමාන්‍යයෙන් පනත් කෙටුම්පත් ලැයිස්තු හැමදාම ඉදිරිපත් කරනවා. මේ දක්වා පනත් කෙටුම්පත් 17ක විතර නම් දාලා තිබෙනවා. ඒවාට මොනවා වෙනවාද කියා අපි දන්නේ නැහැ. නමුත්, ඒවා ඉතා මහන්සියෙන් කරන්න ඕනෑ වැඩ. මොකද, අපේ රටේ නීතිය වෙනස් කිරීමේ කටයුතුවලදී විශාල අභියෝගයක් තිබෙනවා.

ඊළඟට, විශේෂයෙන් මේ රටේ පවතින අර්බුදය ගැනත් කිව යුතු වෙනවා. එක පැත්තකින් ආර්ථික අර්බුදයක් තිබෙනවා. අනෙක් පැත්තෙන් දේශපාලනික අර්බුදයක් තිබෙනවා. එතුමා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය -Thirteenth Amendment එක - පිළිබඳවත් සංවාදයක් ඇති කර තිබෙනවා. අපේ විපක්ෂයේ ඉන්න අය අතරින් දහතුන්වන ව්‍යවස්ථා සංශෝධනය ගැන මම සමහර වෙලාවට සාමාන්‍යයෙන් වෙනස් අදහසක් දරන කෙනෙක් විය හැකියි. මම හිතන්නේ අපට මේ රට දියුණු කරන්න නම් ජන වර්ග අතර එකඟතාව අපි හදන්න ඕනෑ, ජනවර්ග අතර තිබෙන විරසකය නැති කරන්නේ නැතිව අපිට ආර්ථික වශයෙන් දියුණු වෙන්න බැහැ කියන එකයි. ඉන්දියාව ආර්ථික වශයෙන් දියුණු වෙන්න ප්‍රධාන හේතුවක් තමයි සංස්කෘතීන් ගණනාවක් එකට තබා ගන්න පුළුවන් රාජ්‍ය යන්ත්‍රණයක් ඉන්දියාවට හදන්න පුළුවන් වීම. අපි මේ දහතුන්වන ව්‍යවස්ථා සංශෝධනය දෙස බලන්න ඕනෑ ඒ අර්ථයෙන්. දහතුන්වන ව්‍යවස්ථා සංශෝධනය තුළ අපට ද්‍රවිඩ සමාජයත් එක්ක ලොකු සංවාදයක් හදන්න පුළුවන් නම්, ද්‍රවිඩ සමාජයත් එක්ක අපට මිත්‍රශීලී තත්ත්වයක් ගොඩ නඟන්න පුළුවන් නම් අපි දහතුන්වන ව්‍යවස්ථා සංශෝධනයත් එක්ක ඉස්සරහට යන්න ඕනෑ. එම සංශෝධනය තමයි benchmark එක වශයෙන් අපට තිබෙන්නේ. මීට වඩා යටට යන්නත් බැහැ, මීට වඩා උඩට එන්නත් බැහැ කියන තත්ත්වයට අපි යන්න ඕනෑ.

[ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා]

ජනාධිපතිතුමා මේ වෙලාවේ මේ ඇරලා තිබෙන්නේ අනවශ්‍ය box එකක්. මෙය අනවශ්‍ය ප්‍රශ්නයක්. මේ හේතුවෙන් මේ රටේ ජනතාව අතර කුළල් කාගැනීමක් තමයි ආයෙත් ඇති වෙලා තිබෙන්නේ. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව, අපට එකඟ වෙන්න පුළුවන් දේවල් රාශියකට අපි එකඟ වෙලා වැඩ කරගෙන යනවා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ශක්තිමත්ව ඉස්සරහට ගෙන යන්නේ නැතුව, ඒක වෙනත් තැනකට corner කරලා රට තුළ විශාල අර්බුදයක් ඇති කරන එක වැරැදියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ අපට කවදා හරි දවසක මේ රට, ශක්තිමත්, දිදුලන - shining - ශ්‍රී ලංකාවක් කරන්න නම් අංක එකේ අවශ්‍යතාව තමයි, රට තුළ සිටින ප්‍රධාන ජන වර්ග අතරේ එකඟතාවක් තිබීම. එහෙම නැතිව ආර්ථිකය හදන්න බැහැ; අපේ රට, ඉන්දියාව වාගේ ඉහළට ඔසවා තබන්නත් බැහැ; එය කරන්න කවදාවත් බැහැ. ඒ එකඟතාව සඳහා වන එකතු කිරීම කරන්න ඕනෑ ප්‍රධාන ජන වර්ගයට හානි කරන්නේත් නැතිවයි; ප්‍රධාන ජන වර්ගයේ හිත් තළන්නේත් නැතිවයි. එය කරන්න ඕනෑ, ප්‍රධාන ජන වර්ගය සහ අනෙක් ජන වර්ග අතරේ එකමුතුකම හදමින්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි Port City එකේ සියයට 51ක අයිතියක් චීනයට ලබා දෙමින් චීනයත් එක්ක ගිවිසුමක් අත්සන් කළා. ඒ නිසා Port City කියලා අලුතින් හදපු island එකේ අයිතියෙන් සියයට 51කට වඩා තිබෙන්නේ චීනයටයි. කිසිම බයක් සැකක් නැතිව චීනයත් එක්ක ඒ ගිවිසුම අත්සන් කරන්න කටයුතු කරපු අපි අපේම ජන වර්ග පිළිබඳව මීට වඩා වෙනස් විධියට හිතන්න පුරුදු වෙන්න ඕනෑ. ඒක තමයි මගේ අදහස. නමුත්, අපට එහෙම කරන්න පුළුවන්ද, බැරිද කියන එක අපේ රටේ දේශපාලන ක්‍රියාදාමය මත ඉදිරියේදී තීරණය වන එකක්. ඒ නිසා මම මේ අවස්ථාවේදී ඒ ගැන මීට වඩා කථා කරන්න යන්නේ නැහැ.

ජනාධිපතිතුමාගේ මේ ප්‍රතිපත්ති ප්‍රකාශය යම් සන්දර්භයකට එකතු කරන කොට අපට කියන්න සිද්ධ වෙනවා, මේ රටේ ජනමතය කොහේද තිබෙන්නේ කියන ප්‍රශ්නය හරියාකාරව විසඳා ගන්නේ නැතිව කිසිම සංවර්ධන කටයුත්තක් නිසියාකාරව කරන්න සිදු වන එකක් නැති බව. ජන මතය රකින දේශපාලනයක් ඇති කිරීමෙන් පමණයි, ආර්ථික ප්‍රතිසංස්කරණ සහ දේශපාලන ප්‍රතිසංස්කරණ කරන්න පුළුවන් වන්නේ. ආර්ථික ප්‍රතිසංස්කරණ හැටියට අලුත් යෝජනා ගෙනැල්ලා, දේශපාලන ප්‍රතිසංස්කරණ හැටියට අලුත් යෝජනා ගෙනැල්ලා, ජනමතය නොසලකා හරිමින් වැඩ කරන්න බැහැ කියන කාරණය ඉතාම පැහැදිලිව ප්‍රකාශ කරමින්, ඒ සඳහා අප සියලු දෙනා එකතු විය යුතු බවත් ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය නිමා කරනවා.

බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ජානක වක්කුඹුර රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 15ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.45]

**ගරු ජානක වක්කුඹුර මහතා (පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜானக வக்கும்புர - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி இராஜாங்க அமைச்சர்)
(The Hon. Janaka Wakkumbura - State Minister of Provincial Councils and Local Government)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමා ඊයේ මේ පාර්ලිමේන්තුව අමතා එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කළා. එවේලේ යම් මන්ත්‍රීවරු පිරිසක් එය අහන්නවත් සභාව තුළ රැඳී සිටියේ නැහැ. හැබැයි, අපි ඔක්කොම එතුමාගේ ඒ වැඩ පිළිවෙළ අනුගමනය කරමින් මේ රට අලුත් දිශාවකට ගෙන යන්න කටයුතු කරනවා. කවුරු කොහොම කිව්වත්, ගරු ජනාධිපතිතුමා ගෙන යන වැඩ පිළිවෙළ මේ රටේ ජනතාව පිළිගෙන තිබෙනවා. ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදී විධියට තමන්ගේ කටයුතු කරන්න අද අවස්ථාව ලැබී තිබෙනවා.

පසුගිය කාලයේ අපේ සංචාරක ව්‍යාපාරය එහෙම පිටින්ම වැටිලා තිබුණා. මොකද, උද්ඝෝෂණ නිසා අපේ රටට සංචාරකයන් එන්නේ නැතිව ගියා. නමුත්, දැන් සංචාරක ව්‍යාපාරය සාර්ථක වෙලා තිබෙනවා. ඒකට හේතුව, මේ රටේ තිබෙන ප්‍රශ්න ගණනාවක් විසඳන්න ගරු ජනාධිපතිතුමාට පුළුවන්කම ලැබී තිබීමයි. පසුගිය කාලයේ පෝලිම් ගණනාවක් තිබුණා. ඒ පෝලිම් නැති කරලා, ඒ වාගේම ජනතාවට නැවත වරක් බයෙන් සැකෙන් තොරව ගමනක් බිමනක් යන්න පුළුවන් විධියේ වාතාවරණයක් දැන් එතුමා ඇති කරගෙන යනවා. අපි දන්නවා, යම් පිරිසක් ජනතාව බය කරගෙන, ඒ අයගේ අවශ්‍යතා ඉෂ්ට කරගන්න කටයුතු කළ බව. නමුත්, එතුමා ඒකට මුහුණ දීලා රටේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය සෑම කෙනෙකුටම ලබා දුන්නා. ඊයේ මේ ගරු සභාවේ හිටපු නැති මන්ත්‍රීතුමන්ලාටත් ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ලබා දුන්නේ ගරු ජනාධිපතිතුමායි. අපි බලාපොරොත්තු වෙනවා, මේ රටේ ආර්ථිකය නැවත වරක් ශක්තිමත් කරලා ජනතාවට දෙන්න පුළුවන් සහන ලබා දෙන්න. ජපානයෙන් පැමිණි විදේශ කටයුතු රාජ්‍ය ඇමතිතුමා හමු වුණු වෙලාවේ එතුමා අපට කිව්වේ මොකක්ද? අපේ අමාත්‍යාංශය යටතේ විදේශ රටවලින් ගන්න පුළුවන් ව්‍යාපෘති රාශියක් තිබෙනවා. ඒ ඔක්කොම halt කරලා තිබෙන්නේ. අපේ ආණ්ඩුව IMF එකත් එක්ක කථා කරලා මේ ප්‍රශ්නය විසඳාගත්තාට පසුව ඒවා නැවත ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කටයුතු ඒ අය කරනවා කිව්වා.

ඒ එකඟතාව ලැබුණාට පස්සේ අපේ රටේ සංවර්ධන කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ගොඩක් අය අහනවා, IMF එකට ගිහිල්ලා ඩොලර් බිලියන 2.9ක් අරගෙන මොකක්ද කරන්න පුළුවන් කියලා. හැබැයි ඉන් පසුව, ඒ ඩොලර් බිලියන 2.9ට එහා ගිය ඩොලර් ප්‍රමාණයක් අපට උපයාගන්න පුළුවන්. දැනට නවත්වා තිබෙන සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කළාම, ඒකෙනුත් මේ රටට ඩොලර් තමයි හම්බ වෙන්නේ. ගරු ජනාධිපතිතුමාගේ මේ වැඩ පිළිවෙළත් එක්ක ඒ වාගේ විශාල වැඩ කොටසක් කරන්න අපට පුළුවන්කම ලැබෙනවා. හැබැයි, ඒ වැඩ පිළිවෙළ කඩාකප්පල් කරන්න යම් පිරිසක් නැවත වරක් උත්සාහ ගන්නවා. රටේ ජනතාව අද තමන්ගේ වැඩකටයුතු ආපහු සුපුරුදු පරිදි කරගෙන යනවා. ගොවියා, ගොවිතැන් කරනවා. ධීවරයා, ධීවර කර්මාන්තයේ යෙදිලා ඉන්නවා. අනෙක් සෑම දෙයම වාගේ දැන් යථා තත්ත්වයට පත්වෙලා තිබෙනවා. රැකියා විරහිත ගොඩක් අය ගම්වල හිටියා. ඒ අයට කුලී වැඩක් හෝ කරන්න නම් -ඉඩමක වැඩක් හෝ කරන්න නම්- තමන්ගේ ගම්වල සල්ලි තිබෙන අය ඉන්න ඕනෑ. දැන් ඒ කටයුතු නැවත වරක් ආරම්භ වෙලා තිබෙනවා. අපේ අමාත්‍යාංශ නවත්වපු වැඩ දැන් ආරම්භ කර තිබෙනවා. මහා මාර්ග අමාත්‍යාංශය නවත්වපු වැඩ කිහිපයක්

දැන් ආරම්භ කර තිබෙනවා. මගේ ආසනයේ යන්න එන්න බැරි පාරවල් කිහිපයක් තිබුණා. මම ගරු ජනාධිපතිතුමාටත්, අපේ ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාටත් ඒ සම්බන්ධව කිව්වා. දැන් ඒ පාරවල් හදන්න පටන් අරගෙන තිබෙනවා. ඒවායේ වැඩ කරන්නේ කම්කරුවෝ; ඒ ගම්වලම අය. ඒ අයට නැවත වරක් තමන්ගේ රැකියාව ලැබිලා තිබෙනවා. දැන් බඩු මිල අඩු කරමින් පවතිනවා. සතොස හැම දාම වාගේ භාණ්ඩවල මිල අඩු කරනවා. බඩු මිල වැඩි වුණා වාගේම අඩු කරන්නත්, රටේ ජනතාවගේ ආර්ථිකය ගොඩ නඟන්නත් ගරු ජනාධිපතිතුමා ලොකු උත්සාහයක් අරගෙන කටයුතු කරනවා. එම නිසා මේ වැඩ පිළිවෙළ කරගෙන යන්න සහයෝගය ලබා දීමයි අප සියලුදෙනාගේ වගකීම වන්නේ.

අපි, මැතිවරණ මැතිවරණ විධියට කරමු. ප්‍රාදේශීය සභා මැතිවරණයේදී ගමේ ජනතාවට අයිතිය තිබෙනවා තමන්ට හොඳ නියෝජිතයෙකු පත් කරගන්න. තමන්ට හිතවත් අයෙක්, ඥාතියෙක්, එහෙම නැත්නම් තමන්ට උදව්වක් කරපු හෝ උදව්වක් කරාවි යැයි බලාපොරොත්තුවක් තිබෙන අය එහිදී පත් කරගනියි. නමුත්, අද යම් පිරිසක් කියනවා, "අපේ ආර්ථික දැක්ම ප්‍රාදේශීය සභාවෙන් ගෙනෙනවා" කියලා. ප්‍රාදේශීය සභාවට කරන්න පුළුවන් මොකක්ද කියලාවත් ඒ අය දන්නේ නැහැ. මේ රටේ භාණ්ඩ මිල අඩු කිරීමවත්, ආර්ථිකය පවත්වාගෙන යෑමවත් ප්‍රාදේශීය සභාවෙන් කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ප්‍රාදේශීය සභාවෙන් කරන්න පුළුවන් වැඩ කොටසකුත් තිබෙනවා. ඒ වැඩ කොටස විතරයි ප්‍රාදේශීය සභා හරහා කරන්න පුළුවන්. ප්‍රාදේශීය සභා සියල්ලට මධ්‍යම රජයෙන් තමයි මුදල් දෙන්න ඕනෑ; පළාත් සභාවෙන් තමයි මුදල් දෙන්න ඕනෑ. ප්‍රාදේශීය සභා සහ නගර සභා කිහිපයක් හැරෙන්න අනෙක් සභා වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක වන්නේ, පළාත් සභා උදවු කළොත්, එහෙම නැත්නම් මධ්‍යම රජය උදවු කළොත්. ගිය අවුරුද්දේ කරපු වැඩවලට විතරක් අපේ අමාත්‍යාංශය රුපියල් මිලියන 2,000ක් විතර ගෙවන්න තිබුණා. ඒ සෑම ආයතනයක්ම රජයේ මැදිහත්වීම තුළ තමයි කටයුතු කරලා තිබෙන්නේ. ස්ථිර නොකරපු සේවකයෝ 5,800ක් පමණ ඒ ආයතනවල ඉන්නවා. අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත් කිව්වා, ඒ අය ස්ථිර කරන්න අවශ්‍ය කටයුතු කරමු කියලා. අපි පසුගිය කාලයේ "රැකියා ලක්ෂයේ වැඩසටහන" යටතේ 34,000ක් විතර බඳවා ගත්තා. ඒ අය ස්ථිර කරන්න, අපි දැන් බලාපොරොත්තු වනවා. අපි මේ වාගේ වැඩ කටයුතු ගොඩක් කරන්න ලොකු උත්සාහයක් අරගෙන තිබෙනවා. ඒවාට ආණ්ඩුවට මුදල් ඕනෑ.

ගොඩක් අය කියනවා, බදු ගහලා ගන්න සල්ලි හොරකම් කරනවා කියලා. හැමෝම වාගේ කියන්නේ, "ආණ්ඩුවට බදු ගෙවලා වැඩක් නැහැ. ඒ මුදල් හොරකම් කරනවා" කියලා. අපි කියනවා, ඒ හොරකම් කරන ක්‍රමවේදය මොකක් ද කියලා කියා දෙන්න කියලා. තවත් කණ්ඩායමක් කියනවා, "දේශපාලනඥයෝ හිටියාම තමයි රට විනාශ වෙන්නේ" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් සභා නවයේ දැන් කිසිම මහජන නියෝජිතයෙක් නැහැ. එහෙම නම්, වංචා, දූෂණ, හොරකම් කිසි දෙයක් නොවී අවුරුදු පහ තුළ පළාත් සභා නවය ඉහළම තැනකට එන්න ඕනෑ. පළාත් මාර්ග ටික හැදිලා, පළාත් පාසල්වල අඩු පාඩු ටික සම්පූර්ණ වෙලා, පළාත් සභා රෝහල්වල අවශ්‍යතා ඉෂ්ට වෙලා තිබෙන්න ඕනෑ; ඒ සියල්ල සිදු වෙලා තිබෙන්න ඕනෑ. හැබැයි, අපි අමාත්‍යාංශය හැටියට පළාත් සභාවලට වෙනදා විධියටම මුදල් යවා තිබෙනවා. ඒ විධියටම මුදල් යැව්වත්, එම අවශ්‍යතා ඉටු වෙලා ද, නැද්ද කියලා ඔබතුමන්ලා සොයා බලන්න. පළාත් සභාවක ඇමතිවරු පස්දෙනෙක් සිටියා. එතකොට, ඇමතිවරු 45දෙනෙක් විතර පාවිච්චි කළ වාහන සංඛ්‍යාවක් තිබුණා. අද එහෙම නම්, ඒ වාහන ටික තිබෙන්නට එපායැ. ඒ වාහන ටිකත් ඒ අයම පාවිච්චි කරලා තිබෙනවා.

මේ වංචාව, දූෂණය නවත්වන්න පුළුවන් කියලා කියන යම් දේශපාලනඥයකු සිටිනවා නම්, එතුමාට අවුරුදු 5කින් මැතිවරණයකට යන්න ඕනෑ නිසා හෝ යම් කිසි වැඩ කොටසක් කරනවා. මම කියන්නේ නැහැ, සියලුදෙනාම හොඳයි කියලා. හැබැයි, රට ගැන හිතලා වැඩ කරන දක්ෂ විශාල පිරිසක් ඉන්නවා. නමුත් අපි ඇඟිල්ල දිගු කරනකොට සියලුදෙනාටම ඇඟිල්ල දිගු වෙනවා. ජනාධිපතිතුමා "සියවසක්" පිළිබඳව කථා කරනකොට විපක්ෂයේ අය අහනවා, "එතුමා තව අවුරුදු 25ක් ජනාධිපති වෙලා ඉන්නද හදන්නේ?" කියලා. නැහැ, අපි හැමෝටම දැක්මක් තිබෙන්නට ඕනෑ. අපි අද ඉන්නවා, හෙට නැති වෙන්න පුළුවන්. ඒක නිසා අනාගතය පිළිබඳව අපට දැක්මක් තිබෙන්නට ඕනෑ. ඒ දැක්මට අනුව තමයි එතුමා කථා කරන්නේ. ඒ දැක්මත් එක්ක එතුමාට වැඩ පිළිවෙළක් තිබෙනවා, අනාගතයේ දී අපි සියවසක් සමරනකොට මේ රට කොතැනද තිබෙන්න ඕනෑ කියලා. ඒ දැක්මත් එක්ක කටයුතු කරන්න අපි එතුමාට දෙන්න පුළුවන් සහයෝගය ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම රට වෙනුවෙන් කරන්න පුළුවන් යුතුකම ඉෂ්ට කරන්න මේ පාර්ලිමේන්තුවේ අපි සියලුදෙනාම බැඳී සිටිනවා.

ජනාධිපතිතුමා කිව්වා වාගේ හොඳ වැඩක දී හෝ අපි එකතුවෙලා කටයුතු කරන්න ඕනෑ. නමුත් හැම වෙලාවේම දොස් කියනවා හැරෙන්න, මේ වැඩේ මෙහෙම කරමු කියලා කියන්නේ නැහැ. එම නිසා හොඳ වැඩක් කරනකොට අපි එකතු වෙලා කටයුතු කරන්න ඕනෑ. ජනාධිපතිතුමා කියලා තිබෙනවා, අවුරුදු 5ක් තිස්සේ පළාත් සභා ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියලා. එතුමා පළාත් සභා ගැන කියලා තිබෙනවා. පළාත් සභාවල දේශපාලන නියෝජිතයන් නැහැ. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ගැන බොහෝ දෙනා කථා කරනවා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා මේ වන විට අවුරුදු කීයක් ගතවෙලා තිබෙනවාද? එතුමා ඊයේ කිව්වා, කිසිම වෙලාවක රට බෙදන කිසිම කටයුත්තක් කරන්නේ නැහැ කියලා. අපි කොහොමත් රට බෙදන කිසිම දෙයකට හවුල් වෙන්නේත් නැහැ. රට බෙදන්න සහයෝගය දෙන්නේ නැහැ කියලා දිවුරුම් දීලා තමයි මේ හැම කෙනාම ඇවිල්ලා ඉන්නේ. එම නිසා රට බෙදන කිසිම කටයුත්තකට අපි හවුල් වෙන්නේ නැහැ.

අපි මේ රටේ ජනතාවට තව කාරණයත් කියන්න ඕනෑ. යම් පිරිසක් තමන්ගේ පැත්තට හරවා ගන්න ඕනෑ නිසා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාපු අයම අද ඒකට විරුද්ධයි කියනවා. අපි සෑම කෙනෙකුම රට පැත්තේ ඉඳගෙන කථා කරපු පිරිසක්. එම නිසා රට ගැන අපට ලොකු කැක්කුමක් තිබෙනවා. රට වෙනුවෙන් අපට කරන්න පුළුවන් ඕනෑම දෙයක් අපි ඕනෑම වෙලාවක කරනවා. හොඳ වැඩක් තිබෙනවා නම්, පක්ෂ, විපක්ෂ භේදයක් නැතිව අපි ඒ හොඳ වැඩවලට හැමදාම උදව් කරලා තිබෙනවා. එදා, ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ධුරයට පත් වුණු ගමන් බඩු මිල අඩු කරනකොට අපි ඒකට උදව් කළා. හොඳ දේ සඳහා අපි උදව් කළා. අදත් අපි විපක්ෂයට කියනවා, ජනාධිපතිතුමා ඇතුළු අපේ ආණ්ඩුව කරන හොඳ කටයුතුවලට උදව් කරන්න කියලා. අපි කොපමණ වැඩ කොටසක් කළත්, විපක්ෂය ඒ එකකවත් හොඳ පැත්තක් දකින්නේ නැහැ.

පසුගිය කාලයේ මේ රටේ සියලු ජනතාව දුක් වින්දා. අපිත් දුක් වින්දා. දැන් ඒ හැමෝටම වාගේ යම් කිසි සහනයක් ලැබී තිබෙනවා. ඒ සහනය ඉදිරියට ගෙන යන්න අපි ඔක්කෝම උදව් කරන්න ඕනෑ. එසේ උදව් නොකර කකුලෙන් ඇදලා ඒ කටයුතු කරන්න බැහැ. ජනාධිපතිතුමාගේ ඒ උත්සාහයට යම් කිසි සහයෝගයක් දෙනවා හැර, පටු දේශපාලන අරමුණු ඉෂ්ට කර ගන්න ඊට විරුද්ධව වැඩ කරන එක නොවෙයි කළ යුත්තේ. බොහෝ අය මේවාට සහයෝගය දෙන්නේ නැහැ. වංචාව,

[ගරු ජානක වක්කුඹුර මහතා]

දූෂණය, හොරකම නවත්වන වැඩ පිළිවෙළට මේ පාර්ලිමේන්තුවේ කවුරුවත් අකුල් හෙළයි කියලා අපි හිතන්නේ නැහැ. වංචාවයි, දූෂණයයි, හොරකමයි නවත්වන්න අපි ඔක්කෝම කැමැතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි බලයට පත් වුණාම මෙහෙම කරලා පෙන්වනවා කියලා යම් පිරිසක් කියනවා. බලයට පත් වෙනකල් ඉන්න ඕනෑ නැහැ. පවතින ආණ්ඩුවට කියන්න පුළුවන්, මේවා නවත්වන්න කියලා. ඊට පස්සේ මේක මේ විධියට කරන්න පුළුවන් කියලා පෙන්වා දුන්නොත්, අපි ඒක නොකර ඉන්නවාද? එම නිසා කවුරු හෝ වංචා කරනවා නම්, හොරකම් කරනවා නම්, දූෂිතයන් නම් අපි ඔක්කෝම එකතුවෙලා ඊට විරුද්ධව කටයුතු කරමු. අපි කොයි වෙලාවකවත් එහෙම කරන්න බැහැ කියලා නැහැ නේ. එහෙම කරන්න ඒ අයම බලයට එන්නම ඕනෑ නැහැ. මේ රටේ පුරවැසියෙකුට වුණත් පුළුවන්, මෙන්න මෙතැන වංචාවක්, දූෂණයක්, හොරකමක් සිදුවෙලා තිබෙනවා කියලා කියන්න. එම නිසා අපි සියලු දෙනාම එකට අත්වැල් බැඳ ගත්තොත්, අද මේ රට වැටී තිබෙන තැනින් ගොඩ ගන්න පුළුවන්.

පසුගිය මාස හතර, පහ දිහා බැලුවොත් අපි යම්කිසි ප්‍රගතියක් ලබා තිබෙනවා. ඒ ප්‍රගතිය ලබන්න ජනාධිපතිතුමා, අගමැතිතුමා ප්‍රමුඛ අපේ ආණ්ඩුව විශාල කැපවීමක් කරලා තිබෙනවා. ඊයේ මේ රටේ ගොඩක් වෘත්තිකයන් කියපු දෙයක් තමයි, මේ බදු ප්‍රමාණය වැඩියි කියන එක. අපි දැන් ඒක අඩු කරන්න කටයුතු කරලා තිබෙනවා. මේ බදු අය කරන්නේ ඇයි කියලාත් අපි දන්නවා. අපි හැමෝටම බදු පැනෙව්වේ නැහැ. රජයේ සේවකයෙක් රුපියල් 45,000ක වැටුපක් ගන්නවා නම්, - රාජ්‍ය සේවයේ දහහතර ලක්ෂයක් ඉන්නවා නම්, දහතුන් ලක්ෂයකට වඩා වැඩි පිරිසකට ඒ බද්ද පැනවෙනවා. නමුත් ජනාධිපතිතුමාට ආපු යෝජනාවකට අනුව කටයුතු කරලා අද ඒ ප්‍රමාණය නැවත වරක් අඩු කරන්න කටයුතු කර තිබෙනවා.

ඡන්දයක් පැවැත්වීමට නියමිතව තිබෙන වෙලාවක තෙල් මිල වැඩි කරන්නවත්, විදුලි බිල වැඩි කරන්නවත්, බදු අය කරන්නවත් කිසිම රජයක් කැමති වන්නේ නැහැ. එවැනි අවස්ථාවක බදු අඩු කරන්න, විදුලි බිල අඩු කරන්න, තෙල් මිල අඩු කරන්න තමයි ඕනෑම රජයක් කැමති වන්නේ. ඒවා වැඩි කරන්න කිසිම රජයක් කැමති වන්නේ නැහැ. අපේ රජයටත් එහෙම කරන්න පුළුවන්කමක් තිබුණා නම්, අපි නොකර ඉන්නේ නැහැ. ජනාධිපතිතුමා ඊයේත් කිව්වා වාගේ ඉදිරි කාලයේදී රාජ්‍ය සේවකයන්ට සහනයක් ලබා දෙන්න, මේ රටේ අහිංසක ජනතාවට සහනයක් ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. එතුමා මේ රටේ ජනතාවට හාල් ටිකක් දෙන්න ගියාම එතකොටත් අහනවා, හාල් දීලා මේක හරියනවාද කියලා. සමෘද්ධි සහනාධාරය දෙන්න ඕනෑ ලොකු පිරිසක් අපේ රටේ ඉන්නවා. සමෘද්ධි සහනාධාරය හම්බවෙන අය වාගේම හම්බ වෙන්න ඕනෑ නැති පිරිසකුත් ඒක ගන්නවා. ඒ නිසා ඒවා කළමනාකරණය කරලා අවශ්‍ය පරිදි කටයුතු කරන්න ඕනෑ.

අපි කියනවා, පාඩු ලබන ආයතන ලාභ ලබන ආයතන බවට පත් කරන්න අපි ඔක්කෝම වෙහෙස වෙලා කටයුතු කරන්න ඕනෑ කියලා. ඒ නිසා ඒ කටයුතු කළමනාකරණය කරන්න ඕනෑ. ඒක කරන්න බැහැ කියලා එකකුත් නැහැ. කරන්න පුළුවන්. අපි ඒක කරලා පෙන්වලා තිබෙනවා. ඒ අනුව අපි පාඩු ලබපු ආයතන ලාභ ලබන ආයතන බවට පත් කරලා පෙන්වලා තිබෙනවා. දැන් ගොඩක් අය කියනවා, රජයට ඒවා කරන්න බැහැ කියලා. රජයට ඒවා කරන්න පුළුවන්. රජයට ඒවා කරන්න බැරි නම් මොකක්ද කරන්න ඕනෑ? යමක් කරන්න හදනකොටත් එපා කියනවා. පාඩු ලබන රජයේ ආයතන තිබෙනවා නම්, ඒවා මේ රටේ අහිංසක මහජනතාවගේ බදු මුදල්වලින් නඩත්තු කරනවාට වඩා ඒවා සම්බන්ධයෙන් යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්න ඕනෑ. ඒ ක්‍රියාමාර්ග ගන්න ජනාධිපතිතුමා කටයුතු කරමින් ඉන්නවා. ඉදිරි කාලයේදී මේ රටේ ජනතාවගේ ප්‍රශ්න විසඳලා ඒ අයට දැන් ඉන්නවාට වඩා හොඳ රටක් නිර්මාණය කරන්න අවශ්‍ය සහයෝගය ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු උදය ගම්මන්පිල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[මධ්‍යාහ්න 12.00]

**ගරු උදය ගම්මන්පිල මහතා**
( மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya Gammanpila)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරනවා කියලා ජනාධිපතිතුමා සර්ව පාක්ෂික සමුළුවේදී ප්‍රකාශ කරලා තිබුණා. ඒ විතරක් නොවෙයි. රාජාසන කථාවේදී පාර්ලිමේන්තුවට ඒ බව ප්‍රකාශ කරනවා කියලාත් එතුමා කිව්වා. එදා එතුමා සිංහනාද කළත්, ඊයේ නම් අපට ඇහුණේ පුංචි කෙඳිරියක් විතරයි. ඒ නිසා මේ රටේ මහ සඟරුවන ප්‍රමුඛ කරගෙන අපි එදා නඟපු විරෝධය ජනාධිපතිතුමාගේ ඇඟට දැනිලා තිබෙන බවක් පෙනෙන්න තිබෙනවා. ඒ ඇඟට දැනීම ඒ විධියටම තියා ගැනීම එතුමාගේ ශරීර සෞඛ්‍යට බොහොම යහපත් කියලා අපි එතුමාට සිහිපත් කරනවා.

දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීමට පක්ෂයි කියන අය වාගේම, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරනවාට විරුද්ධයි කියන අයටත්, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ඉතිරි වෙලා තිබෙන බලතල මොනවාද කියලා හරි අවබෝධයක් නැති බවයි ඔවුන් කරන කථාවලින් පෙනෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් සභාවලට ඉඩම් බලතල දෙන්න එපා කියලා සමහරු උද්ඝෝෂණ කරනවා අපි දැක්කා. නමුත් ඉඩම් බලතල දීලා ඉවරයි. මම පළාත් සභාවේ ඇමතිවරයකු විධියට කටයුතු කළ නිසා දන්නවා, ඉඩම් බදු දීම සම්බන්ධයෙන්, රජයේ ඉඩම් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් සම්පූර්ණ බලය තිබෙන්නේ පළාත් සභාවට බව. ඒ වාගේම, යම් ඉඩමක් තෑගි දෙන්න, විකුණන්න, පවරන්න ජනාධිපතිවරයාට ඕනෑ නම් ජනාධිපතිවරයාට එය කළ හැක්කේ පළාත් සභාවේ උපදෙස් මත පමණයි. දැනට දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ඉඩම් සම්බන්ධ බලතලවලින් ඉතුරු වෙලා තිබෙන්නේ ජාතික ඉඩම් කොමිසම ස්ථාපිත කිරීම පමණයි. එහෙම නම් ඇත්තටම ක්‍රියාත්මක කරලා නැතුව ඉතුරු වෙලා තිබෙන බලතල ටික මොනවාද? එකක් තමයි උතුරු සහ නැඟෙනහිර පළාත් ඒකාබද්ධ කිරීම. නැත්නම් ඒ වෙනුවෙන් තනි පළාත් සභාවක් පිහිටුවීම. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154අ. (3) අනුව්‍යවස්ථාව අනුව සඳහන් වෙනවා, පළාත් දෙකක් හෝ තුනක් ඒකාබද්ධ කර තනි පළාත් සභාවක් පිහිටුවිය හැකියි කියලා. 1987දී උතුරු සහ නැඟෙනහිර පළාත් වෙනුවෙන් තනි පළාත් සභාවක් පිහිටෙව්වේ හදිසි නීතිය යටතේ නිසා, හදිසි නීතිය අහෝසි වුණාම ඒ උතුරු-නැඟෙනහිර පළාත් ඒකාබද්ධ කිරීමත් අහෝසි වුණාය කියලා ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කළා.

එදා ඒ ඒකාබද්ධ කිරීම අහෝසි වුණාට, ඒකාබද්ධ කිරීම පිළිබඳ ඒ ව්‍යවස්ථාව අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනතාක් දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන්

ක්‍රියාත්මක කරනවා කියන්නේ, යළි උතුර සහ නැඟෙනහිර ඒකාබද්ධ කරනවා කියන එකයි. නැඟෙනහිර පළාතේ බහුතරයක්ම ඉන්නේ මුස්ලිම් ජනතාව. නැඟෙනහිර පළාතේ මුස්ලිම් ජනතාව උතුරට පාවා දෙන්න ඔබ සූදානම්ද කියලා මුස්ලිම් කොංග්‍රසයේ නායක මා මිත්‍ර රවුෆ් හකීම් මන්ත්‍රීතුමාගෙන් මම අහනවා. එකඟ නැත්නම් 154අ. (3) අනුව්‍යවස්ථාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඉවත් කරන්න අපි හැමෝම එකතු වෙලා කටයුතු කරමු කියා මම යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව නම්, 'පුරාවිද්‍යාව' කියන්නේත් පළාත් සභා විෂයයක්. එහි කියනවා, "පළාත් සභාව විසින් ජාතික වශයෙන් වැදගත් යැයි නම් කර ඇති පුරාවිද්‍යා ස්ථාන හැර අන් සියල්ලම පළාත් සභාවේ විෂයයට අයිති වෙනවා" කියලා. හැබැයි, ඒකත් ක්‍රියාත්මක වෙලා නැහැ. මොකද, මේ වෙනකොට අපේ පාර්ලිමේන්තුවෙන් කිසිම පුරාවිද්‍යා ස්ථානයක්, ඓතිහාසික ස්ථානයක් ජාතික වශයෙන් වැදගත් කියලා සම්මත කර නැහැ. එහෙම නම්, උතුරු සහ නැඟෙනහිර පළාත්වල තිබෙන නාගදීපය, තන්තිරිමලේ, ගිරිහඬු සෑය, දීඝවාපිය, සේරුවාවිල ආදී මේ සියල්ලම අයිති වෙන්නේ පළාත් සභාවට. උතුරු නැඟෙනහිර දෙමළ නිජබිම් කිව්වාට, උතුරු නැඟෙනහිර සිසාරා තිබෙන්නේ බෞද්ධ ශිෂ්ටාචාරයක නටබුන්; සිංහල ශිෂ්ටාචාරයක නටබුන්. ඒක තමයි දෙමළ බෙදුම්වාදීන්ට තිබෙන ලොකුම ප්‍රශ්නය. ඒ නිසා උතුරු නැඟෙනහිර තිබෙන මේ පුරාවස්තු දෙමළ බෙදුම්වාදීන්ගේ ඇඟේ ඇනුණු කටුවක් හා සමානයි. මේ කටුව ඉවත් කර ගන්න ඕනෑ නිසා තමයි සිරිවර්ධන බෝධිය කපා දැම්මේ; චෛත්‍ය ගණනාවක් ඩෝසර් කරලා දැම්මේ. එහෙම බෙදුම්වාදී මනසක් තිබෙන උතුරු පළාත් සභාවට පුරාවිද්‍යා විෂයය භාර කරනවා කියන්නේ, නරින්ට කුකුල්ලු භාර දුන්නා හා සමාන වැඩක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් දැනට ක්‍රියාත්මක කර නැති තීරණාත්මකම බලය තමයි, පොලිස් බලය. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගෙන් පටන් ගත්තාම හිටපු ජනාධිපතිවරු හත් දෙනෙක් මේ පොලිස් බලතල පළාත් සභාවට ලබා නොදෙන්න ඉතා වැදගත් හේතු තිබුණා. ඇත්තෙන්ම, දෙමළ බෙදුම්වාදය මේ ලංකා භූමිය තුළ පරාජය කළාට, ලංකාවෙන් පිටත වෙනදාටත් වඩා හොඳින් එය ක්‍රියාත්මක වෙනවා. ලංකාවේ බොහෝ දෙනෙක් නොදන්නවා වුණාට ලංකාවෙන් පිටත දෙමළ ඊළමක් පිහිටුවා ඉවරයි. ඒකට කියන්නේ, Transnational Government of Tamil Eelam - රාජ්‍යයන් පුරා පැතිරුණු දෙමළ ඊළාම් රාජ්‍යය - කියලායි. එහි අගමැති ධුරයට පත් වෙලා ඉන්නේ, කොටි සංවිධානයේ ප්‍රධාන නීති උපදේශක විශ්වනාදන් රුද්‍රකුමාරන් මහතා. එතුමා අද විවිධ රාජ්‍යවලට ගිහිල්ලා රාජ්‍ය නායකයන් හමු වෙලා දෙමළ ඊළම ලංකාවේ පිහිටුවන්න සහාය ඉල්ලනවා.

නැඟෙනහිර ටිමෝරය, පලස්තීනය වැනි රාජ්‍ය බිහි වෙන්න කලින් තිබුණේත් භූමියක් නැති ආණ්ඩු විධියටයි. අදටත් දලයි ලාමාතුමාගේ ටිබෙට් ආණ්ඩුව තිබෙන්නේ භූමියක් නැති ආණ්ඩුවක් විධියටයි. එහෙම නම්, නැඟෙනහිර ටිමෝරය, පලස්තීනය ගිය මඟ ඔස්සේ තමයි විශ්වනාදන් රුද්‍රකුමාරන්ගේ අගමැති ධුරය යටතේ අද දෙමළ ඊළාම් ආණ්ඩුව ගමන් කරමින් තිබෙන්නේ. හැබැයි, දෙමළ ඊළාම් ආණ්ඩුවට භූමිය අහිමි වුණේ, යුධ බලය නැති වුණු නිසායි. විශේෂයෙන්ම නන්දිකඩාල් කළපුවේදී අපේ රණවිරුවන් කොටි සංවිධානය යුදමය ලෙස පරාජය කරපු නිසායි. උතුරු පළාතට පොලිස් බලතල ලැබුණොත්, අවි දරන හමුදාවක් පළාත් සභාවට ලැබෙනවා. පළාත් සභාවේ මහ ඇමති ධුරයට පත් වෙන්නේ, බොහෝදුරට විග්නේශ්වරන් මහත්මයා වාගේ බෙදුම්වාදියෙක් වෙන්න පුළුවන්. එහෙම වුණොත් අනාගත ඊළාම් යුද්ධය, අනාගත බෙදුම්වාදී යුද්ධය ආරම්භ වෙන්නේ, ශ්‍රී ලංකා හමුදාවයි, උතුරේ පොලීසියයි අතර. එදා, කොටි ත්‍රස්තවාදීන්ට විවිධ රටවල් ආයුධ දුන්නේ, හොරෙන්-හොරෙන්. පුහුණුව ලබා දුන්නේ, හොරෙන්-හොරෙන්. ඇයි ඒ? ත්‍රස්තවාදීන්ට උදව් කිරීම ජාත්‍යන්තර නීතිය යටතේ තහනම් දෙයක් නිසා. හැබැයි, උතුරේ පොලිස් හමුදාව නම් බෙදුම්වාදී යුද්ධය පටන් ගන්නේ, ඒක අපේ ව්‍යවස්ථාවෙන් පිළිගත්ත නිල හමුදාවක් විධියටයි..

ඔවුන්ට විවෘතව උදවු කරන්න ඕනෑම රාජ්‍යයක් පැකිළෙන්නේ නැහැ. ඒ නිසා මේ දෙමළ බෙදුම්වාදී විෂබීජය මේ මහ පොළොවේ තිබෙන තුරාවට උතුරට පොලිස් බලතල ලබා දෙනවා කියන්නේ 30,000ක් රණ විරුවන් දිවි පූජා කරලා රැක ගත්ත මේ මව්බිම නැවත වතාවක් දෙපළු කරලා මේ රට ලේ විලක්, ගිනි ගොඩක් බවට පත් කිරීමයි කියන එක අපි මේ ගරු සභාවට මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි වාගේ කුඩා රාජ්‍යයක පොලිස් හමුදා 10ක් පිහිටුවා, තවත් කෙනකුගේ පළාතකට නිල ඇඳුමෙන් යන්න බැහැයි කියන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන නීතිය ක්‍රියාත්මක වුණොත් අපේ රටේ අපරාධ මර්දනය කිරීම ලොකු ප්‍රශ්නයක් වෙනවා. මුම්බායි ත්‍රස්තවාදී ප්‍රහාරයට පස්සේ ඉන්දියාවේ ආරක්ෂක ඇමතිවරයා කියනවා, "මෙතරම් බලගතු රටක් වුණත්, අපට ඒ ත්‍රස්තවාදී ප්‍රහාරය වළක්වා ගන්න බැරි වුණේ රට පුරා විහිදුණු ආරක්ෂක ජාලයක් මධ්‍යම ආණ්ඩුවට නොතිබුණු නිසායි" කියලා. ඉන්දියාවට එම ත්‍රස්ත ප්‍රහාරය වළක්වා ගන්න බැරි වුණේ පොලිස් බලය මධ්‍යම ආණ්ඩුවට නොතිබුණු නිසාය කියලා ඉන්දියාවේ හිටපු ආරක්ෂක අමාත්‍යවරයා කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නම් නිකමට හිතන්න, අපේ පොලීසිය බස්නාහිර පළාතේ ඉඳලා හොරෙක් ලුහුබැඳගෙන වාහනයක යනවා කියලා. වත්තලින් පටන් ගත්තොත් පැයක් යන්න කලින් සබරගමුව පළාතට යනවා, එතැනින් පැයක් යන්න කලින් මධ්‍යම පළාතට යනවා, එතැනින් පැය එකහමාරක් යද්දී උතුරු මැද පළාතට යනවා. ඒ අනුව හොරෙකු ලුහුබැඳීම කිසිම පොලීසියකට කරන්න බැරි වෙනවා; අපරාධ මර්දනය අතිශය දුෂ්කර කටයුත්තක් බවට පත් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අද සිටින්නේ ඉතිහාසයේ සිට මේ දක්වා සිදු වූ දැවැන්තම අර්බුදයට මුහුණ දීලා. ඊයේ ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුව අමතා සිදු කළ රාජාසන කථාවේදී ඉතා වැදගත් කාරණා දෙකක් සිහිපත් කළා. එකක් තමයි, බලය බෙදීම සම්බන්ධයෙන් අපේ සමාජය තියුණු ලෙස බෙදී ඉන්නවා කියන එක. 1957දී රටේ කෝලාහල ඇති වුණේ, 87-89දී භීෂණය ඇති වුණේ බලය බෙදීම කියන ප්‍රශ්නය මතයි. එතුමා කියන දෙවැනි කාරණය තමයි, සියලු භේද පසෙක ලා ආර්ථික අර්බුදය නමැති රකුසාට එරෙහිව සමස්ත ජාතියම එකතු විය යුතුයි කියන එක. ගරු ජනාධිපතිතුමා අග්‍රාමාත්‍යවරයා විධියට සිටියදී පාර්ලිමේන්තුව අමතමින් 2022 ජූනි මාසයේ 22වෙනි දා මොකක්ද කිව්වේ? එතුමා කිව්වේ, අතීතයේ වටු කුරුළු රැන දැල ඔසවාගෙන ගිය ආකාරයෙන් සමස්ත ජාතියම -මිලියන 22ම- මේ ආර්ථික අර්බුදයට එරෙහිව සමගි වෙන්න ඕනෑ කියලායි. ජාතික සමගිය අත්‍යවශ්‍යම මෙහොත මේක නම්, සමාජය තියුණුම ලෙස බෙදුණු, සමාජය වැඩියෙන්ම බෙදී සිටින ප්‍රශ්නය වන බලය බෙදීම මේ මොහොතේ ක්‍රියාත්මක කිරීමෙන් සිදු වෙන්නේ ආර්ථික අර්බුදයට එරෙහිව සමස්ත ජාතිය සමගි කිරීමට අපට තිබෙන අවස්ථාව අහිමි වීම පමණමයි.

අවසාන වශයෙන්, ජනාධිපතිතුමාට පොඩි අවවාදයක් කරන්න තිබෙනවා. ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා බලය බෙදීම කියන ලී කොටය ඉරාගෙන ඉරාගෙන ඇවිල්ලා කුඤ්ඤයක් ගහලා ලී කොටය ඉරන එක නතර කළේ හේතුවක් ඇතිව. අනෙක්

[ගරු උදය ගම්මන්පිල මහතා]

ජනාධිපතිවරු ඒ කුඤ්ඤය හොලවන්නවත් උත්සාහ නොකළේ හේතුවක් ඇතිව. ඒ හේතුව හරියට හොයන්නේ බලන්නේ නැතිව අර ලී කොටයට ගහපු කුඤ්ඤය ගලවපු මෝඩ වඳුරා වාගේ මේක හොලවලා හොලවලා ගැලෙව්වොත් අර මෝඩ වඳුරාට අත් වුණු ඉරණමමයි ජනාධිපතිතුමාටත් අත් වෙන්නේ. එතුමා විනාශ වීම නොවෙයි අපට තිබෙන ප්‍රශ්නය. එතුමා මරාගෙන මැරෙන ඇඳුමක් ඇඳගෙන ඉන්නේ එතුමාත් විනාශ වෙන ගමන් රටත් විනාශ කරන්න කියන එකයි අපට තිබෙන ප්‍රශ්නය.

ජනාධිපතිතුමාගේ ඉතිහාසය බලන්නකෝ. එතුමා 2001දී අගමැති ධුරයට පත් වෙනවා. වසර දෙකකින් අගමැති ධුරය අහිමි වෙන්නේ බලය බෙදීමක් කරන්න උත්සාහ කළ නිසා. ආයෙත් 2015දී එතුමා අගමැති වෙනවා. එතුමාට වසර තුනකින් අගමැති ධුරය අහිමි වෙන්නේ බලය බෙදන්න ගිය නිසා. එතුමාට හැම දාමත් අගමැති ධුරයේ බලය අහිමි වෙන්නේ බලය බෙදීම කියන ප්‍රශ්නය කරට ගන්න නිසායි. Albert Einstein once said, "If you repeat the same test under same conditions expecting a different result, you are insane." ඇල්බට් අයින්ස්ටයින් කියන මහා ප්‍රාඥයා වරක් ප්‍රකාශ කරනවා, "ඔබ එකම පරීක්ෂණය එකම කොන්දේසි යටතේ වෙනත් ප්‍රතිඵලයක් බලාපොරොත්තුවෙන් වරින් වර කරනවා නම්, ඔබට හොඳටම පිස්සු" කියලා. අතිගරු ජනාධිපතිතුමනි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියන්නේ මම නොවෙයි, ඇල්බට් අයින්ස්ටයින්.

අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හැටියට, ජනාධිපතිතුමාට පිස්සු හැදුණොත් වහාම එතුමා ධුරයෙන් ඉවත් කරන්න ඕනෑ. ඒ නිසා බලය බෙදීම කියන ගිනි බෝලය අතට අරගත්තොත් ඔබතුමාට ජනාධිපති ධුරයත් අහිමි කර ගැනීම පමණයි වෙන්නේ. 1987දී දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එරෙහිව අපි පාරට බහිනකොට අපි පාසල් ශිෂ්‍යයෝ. අපේ ජීවිත කාලයම ගෙවුණේ, අපේ හිස නිකට සුදු වුණේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එරෙහිව අරගළ කරලා. ඒ නිසා මේ රට බෙදන, මේ රට ලේ විලක්, ගිනි ගොඩක් බවට පරිවර්තනය කරන, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා බලය බෙදීම සම්පූර්ණ කරන්න කිසිවෙකුටත් අපි ඉඩ තබන්නේ නැහැ කියන ප්‍රතිඥාව ජාතිය හමුවේ තබමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අනුරාධ ජයරත්න රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.13]

**ගරු අනුරාධ ජයරත්න මහතා (අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுராத ஜயரத்ன - நீதி மற்றும் சிறைச்சாலை அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Anuradha Jayaratne - State Minister of Justice and Prison Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබාදීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අද අපේ රට බරපතළ අර්බුදයකට වැටිලා, ප්‍රශ්න ගණනාවකට මුහුණ දීලා ඉන්න වෙලාවේ අද මේ මට්ටමින් හෝ අපේ රට සාමාන්‍යකරණය කරන්න, රට තිබුණු තත්ත්වයෙන් සුබවාදී තැනට ගෙනෙන්න කටයුතු කිරීම පිළිබඳව විශේෂයෙන්ම හදවතට එකඟව ජනාධිපතිතුමාට අපේ ස්තුතිය පුද කළ යුතුයි. මම මේ කාරණාව කියන්නේ වෙන මොනවත් නිසා නොවෙයි, එදා මේ තනතුරු බාර අරගෙන වැඩ කටයුතු කරන්න කියලා විපක්ෂ නායකතුමාට කියනකොට ඒකට සූදානම් වුණේ නැති නිසා. අපේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා හදපු ආණ්ඩුවේ හිටපු උගතුන්, වියතුන්, බුද්ධිමතුන් කියන පිරිස මොකක්ද කළේ? ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ පරිපාලනය කඩා වැටෙනකොට, එතුමා ගත්ත තීන්දු තීරණ වැරදියි කියලා සමාජගත වෙනකොට, එතුමා කරගෙන ආපු වැඩ පිළිවෙළ අසාර්ථක බව දකිනකොට, එතුමා හදපු, එතුමාගේ ළඟ ඉඳලා හැමදාම කනට උපදෙස් දීපු ඒ උගත්තු, බුද්ධිමතුන් විපක්ෂයට ගිහිල්ලා ඉඳගත්තා. ඒ පැත්තේ ඉඳගත්තා විතරක් නොවෙයි, ඔවුන් එතුමා විවේචනය කරලා, පැවැති ආණ්ඩුවත් විවේචනය කළා. මේ වගකීම බාර අරගෙන, වගකීම් ඉදිරියට ගෙනයන්න එතුමන්ලා කවුරුවත් සූදානම් වුණේ නැහැ. ඒක තමයි ඇත්ත. එතුමා ළඟම හිටපු පිරිසෙන් බොහෝ දෙනෙක් ඒ විධියට වෙනම ගිහිල්ලා විපක්ෂයේ ඉඳගෙන දැන් වැඩ කටයුතු කරනවා. මේ රට ගැන විශාල බලාපොරොත්තුවක් ඇතිව ඡන්දය ප්‍රකාශ කරපු මේ රටේ ජනතාව නොමඟ යවලා ඒ මහා උගත්තු, බුද්ධිමත්තු විපක්ෂයට ගිහිල්ලා ඉඳගත්තා.

රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා පිළිබඳව අපට ප්‍රශ්න ගැටලු ගණනාවක් තියෙන්න ඇති. හැබැයි, එතුමා එදා මේ වගකීම බාර ගත්තා. එදා ලැබෙමින් තිබුණු ඩොලර් ටික අද අලුතින් මේ රටට මහා පරිමාණයෙන් එන්න පටන් ගත්තේ නැහැ. එදා අපේ රටේ තිබුණු සම්පත් ටික මහා පරිමාණයෙන් දෙගුණ, තෙගුණ වෙන්න පටන් ගත්තේ නැහැ. හැබැයි, අද පෝලිමේ යන්නේ නැතිව මනුස්සයෙකුට ගිහිල්ලා ඉන්ධන පිරවුම්හලකින් වාහනයට අවශ්‍ය තෙල් ටික ගහගන්න පුළුවන්. ඉස්පිරිතාලවල සියල්ල සම්පූර්ණ වෙලා නැතත්, අද ඉස්පිරිතාලවලින් රෝගීන්ට අවශ්‍ය බෙහෙත් ටික ගන්න පුළුවන්. අඩුම ගණනේ මිනිස්සුන්ට රැකියාව කරලා යම් හෝ බලාපොරොත්තුවක් ගොඩනඟන්න පුළුවන් පරිසරයක් අද මේ රටේ ඇති කරලා තිබෙනවා. අපි හදවතට එකඟව ජනාධිපතිතුමා ගත්ත සියලු තීන්දු තීරණ පිළිබඳව නොවෙයි කථා කරන්නේ. මේ රටේ ඇති වෙච්ච අර්බුදය විසඳීමට එතුමා ඒ වගකීම බාර ගැනීම පිළිබඳවත්, ඒ අර්බුදය අද මේ තත්ත්වයට හෝ විසඳීම පිළිබඳවත් ජනාධිපතිතුමාට අපේ ගෞරවය, ස්තුතිය විශේෂයෙන්ම පුද කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද බොහෝ දෙනා විටින් විට කථා කරන්නේ මේ මැතිවරණය පිළිබඳවයි. මේ මැතිවරණයට අපි නාම යෝජනා බාර දුන්නා. මැතිවරණයට අපි අපේ අපේක්ෂකයන් ඉදිරිපත් කළා. ඒ ගැන කිසි ගැටලුවක් නැහැ. අපි මැතිවරණයට යමු. හැබැයි, අද විපක්ෂය පැත්තේ ඉඳගෙන කථා කරන උගත්තු, බුද්ධිමත්තු අහන්නේ මොකක්ද? ප්‍රාදේශීය සභා මැතිවරණය කල් දමනවා ද කියලා ඔවුන් අහනවා. අද ජනතා විමුක්ති පෙරමුණ අහනවා, ප්‍රාදේශීය සභා මැතිවරණය කල් දමනවාද කියලා. කල් දාන්න දෙයක් නැහැ, නාම යෝජනා බාර දීලා, අපේක්ෂකයෝ නම් කරලා, මාර්තු 9වැනි දා මැතිවරණය කියලා ප්‍රකාශයට පත් කරලා හමාරයි. ඒ සියල්ල කරලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි පෞද්ගලිකව මට වෙන මතයක් තිබෙනවා. අපි මැතිවරණවලට මෙච්චර ආසයි නම්, අපිට මේ රට ගොඩ නඟන්න පුළුවන් ප්‍රතිපත්තියක් තිබෙනවා නම්, මේ රට ගොඩ දමන වැඩ පිළිවෙළක් අපි සතුව තිබෙනවා නම්, එහෙම නම් අපි ඔක්කෝම එකතුවෙලා පාර්ලිමේන්තු මැතිවරණයකට යමු. එහෙම නැත්නම් අපි

ජනාධිපතිවරණයකට යමු. මොකද, මාර්තු 9වැනි දා පළාත් පාලන ඡන්දයෙන් හදන ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා ගිහිල්ලා IMF එකත් එක්ක සාකච්ඡා කරන්න ද? මාර්තු 9වැනි දා අපි හදන ප්‍රාදේශීය සභාවේ සභාපතිවරු මේ රටේ ආර්ථික ප්‍රතිපත්ති ටික හදන්නද? නැහැ. මාර්තු 9වැනි දායින් පස්සේත් මේ රට හදන්න වෙන්නේ රනිල් වික්‍රමසිංහ මැතිතුමාටයි. එතුමාට පින් සිද්ධ වෙන්න හදන ප්‍රතිපත්ති ටික විතරයි ඔය කාට කාටත් ඉස්සරහට දක්කාගෙන යන්න සිද්ධ වෙන්නේ. මැතිවරණයකට යන්න මෙච්චරටම ඕනෑ නම්, ප්‍රාදේශීය සභාවල ඉන්න පොඩි උන් ටික බිල්ලට දෙනවා වෙනුවට අපි පාර්ලිමේන්තුව විසුරුවාගෙන පාර්ලිමේන්තු මැතිවරණයකට යමු. එහෙම නැත්නම් ජනාධිපතිවරණයකට යමු. ඒක කරලා රටේ නිවැරදි, තිරසර සංවර්ධන වැඩ පිළිවෙළක් හදමු. හැබැයි, ඒක ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ප්‍රාදේශීය සභා මැතිවරණය බිල්ලට දීලා ඒ මැතිවරණය පිළිබඳව කථා කරනවා. හැබැයි, එතැනින් එහාට ගිහිල්ලා පාර්ලිමේන්තු මැතිවරණයක් ගැන හෝ ප්‍රතිපත්ති හදන මැතිවරණයක් පිළිබඳ කිසි කෙනෙක් කථා කරන්න සූදානම් නැහැ. ඒක තමයි මේ රටේ අවාසනාව, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අවශ්‍ය වෙලාවේ අවශ්‍ය තීන්දු එකක්වත් ගන්න අපට බැරි වුණා.

අපි හැමෝම මේ සභාවේදී විවිධ කතන්දර කිව්වා. අපි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වෙන්න අවශ්‍ය කටයුතු කළා. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා වරද්දා ගත් දෙයක් තිබෙනවා. හැබැයි, ඒ දේ නිවැරදි කරන්න මේ පාර්ලිමේන්තුවේ ඉඳලා අපට මොනවා හරි කරන්න පුළුවන් නම් ඒ සියලු දේට අපි සහයෝගය දෙනවා. අපි ඒ තත්ත්වය තිබේද්දී දාලා පැනලා යන්න සූදානම් නැහැ. ඊළඟ මැතිවරණයෙන් පාර්ලිමේන්තුවේ අසුන දිනයි ද, මොකක්ද කරන්නේ, කින්ද මන්ද කියන ඒ සියල්ලට වඩා අපට මේ රට නිවැරදි තැනකට ගෙන යන්න පුළුවන් නම්, ඒ සඳහායි අපි වැඩ පිළිවෙළ හදන්න ඕනෑ. ඒ දේ කිරීම සඳහා ලබා දෙන්න පුළුවන් සෑම ආකාරයකම සහයෝගය අපි ලබා දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනවාර්ගික අර්බුදය පිළිබඳව ජනාධිපතිතුමා මතක් කළා. මම 2013 ඉඳලා පළාත් සභාව ඉන් අනතුරුව පාර්ලිමේන්තුව නියෝජනය කළා. ඒ නියෝජනය කරපු සෑම අවස්ථාවකම අපි දැක්කේ දේශපාලන වශයෙන් අර්බුදයක්. දෙමළ ජාතික සන්ධානය හැම දාම එක මතයක හිටියා. බෞද්ධ බලවේග එක්ක ගොඩනඟා ගත්තු දේශපාලන පක්ෂ මේ රටේ වෙනමම වෛරයක් හැදුවා. මුස්ලිම් ජනතාව නියෝජනය කරපු පිරිස මේ රටේ වෙනම ප්‍රශ්නයක් හැදුවා. හැබැයි, මුස්ලිම්, දමිළ, සිංහල ජනතාව නියෝජනය කළ මන්ත්‍රීවරුන් 225දෙනා දෙකට, තුනට, හතරට කැඩිලා හැම දාම අරගළ කළා. ඒකෙන් මොකක් ද අපට ආපු ප්‍රතිඵලය?

නිදහස ලැබිලා අවුරුදු 75ක් තිස්සේ ඒ විධියට කටයුතු කරපු එකේ ප්‍රතිඵලය තමයි අපි භුක්ති විඳින්නේ. අපට කවදාවත් එක මතයකට ඇවිල්ලා, එකට ඉඳගෙන වැඩ කරන්න පුළුවන් පරිසරය අපි ගොඩනඟා ගත්තේ නැහැ. කථානායකතුමාගේ පුටුවේ ඉඳගෙන ජනාධිපතිතුමා රාජාසන කථාව කරන වෙලාවේ එතුමා කිව්වා, පොලිස් බලතල දෙන්නේ නැහැ කියලා. එතුමා කරපු කථාවේ බොහොම පැහැදිලිව කියනවා, පොලිස් බලතල දෙන්නේ නැහැ කියලා. හැබැයි, විපක්ෂයේ අය අවුස්සන්නේම පොලිස් බලතල ලබා දීම පිළිබඳවයි. ඉඩම් පිළිබඳව, ජාතික ඉඩම් සභාවක් පිහිටුවීම ගැන එතුමා කිව්වා. ඉඩම් සභාවක් පිහිටුවලා ඉඩම් සභාවකට සියලු ඉඩම් භාර දුන්නා නම් ඔය කියන ප්‍රශ්නය පළාත් හැටියට පැන නඟින්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම මේ කියන්නේ වෙන මොනවත් නිසා නොවෙයි. මගේ ගම්පොළ ආසනයේ රජයේ ඉඩම්වල අයිතිය ගැන කථා කරන කොට ඒවා ප්‍රාදේශීය ලේකම් යටතේ තිබෙනවා, LRC එක යටතේ තිබෙනවා, ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරිය යටතේ තිබෙනවා. රජයේ ඉඩම් වෙනත් විවිධ ආයතන සතුවත් තිබෙනවා. මගේ වයස අවුරුදු 36ක් නම් මගේ වයසට වැඩි කාලයක් තිස්සේ වගා කරමින් ආපු දොරගල ඉඩම්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මේ මොහොත වෙන කොටත් පවරා ගන්න ගැසට් කරලායි තිබෙන්නේ.

සාකච්ඡා වාර 10ක්, 15ක් තියලා මගේ කටේ බලයට තමයි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඒ ගැසට්ටුව පැත්තකින් තියලා තිබෙන්නේ. ඒක නිසා තවම ඒ මිනිස්සු වගා කරනවා. හැබැයි, ඒ මිනිසුන්ගේ ඉඩම් ටික වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පවරාගෙන තිබෙනවා. එහෙම නම් මේ රටේ ඉඩම් ප්‍රතිපත්තිය මොකක් ද? මගේ වයසට අනුව අවුරුදු 36ක් ගැනයි මම කිව්වේ. අවුරුදු 50ක් විතර වගා කරපු ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ගැසට් කරනවා නම්, ඒ ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම් කියලා කියනවා නම් ඒ ජනතාවට මොකක්ද වෙන්නේ? අපි ජාත්‍යන්තර සමුළුවලට ගිහිල්ලා, අපේ වන ඝනත්වය සියයට 32යි, අපි එය සියයට 35 කරනවා, සියයට 38 කරනවා කියලා මහා පම්පෝරි ගහනවා. එහෙම කියලා පාරම්පරිකව වගා කරපු අහිංසක මනුස්සයාගේ ඉඩම් ටික අපි අහිමි කරනවා. මීමුරේ ගම්මානය කොයි තරම් පැරණි ගම්මානයක් ද? ඒක මේ රටේ තිබෙන පැරණිම ගම්මානය. ඒ මුළු ගම්මානයම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම් ලෙස ගැසට් කරලා ඉවරයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම පරිසර ඇමතිවරයා හැටියට ඉන්න කොට GPS මිනුම් වෙනස් කරලා ඒක යම් ප්‍රමාණයක් වෙනස් කළා. හැබැයි. ඒ මිනිස්සු අදටත් ඒ ගැටලුව උඩ ඉන්නේ. මේක තමයි අපේ රටේ ඉඩම් ප්‍රතිපත්තිය. දෙමළ ජාතික සන්ධානය හිතනවා නම්, මේක ඔවුන්ට විතරක් තිබෙන ප්‍රශ්නයක් කියලා, එහෙම නැහැ. මේක දකුණ ද, උතුර ද කියලා භේදයක් නැතුව අපි සියලුදෙනාට තිබෙන ප්‍රශ්නයක්. අපි නිවැරදිව ඒක විසඳා ගන්න ඕනෑ. LRC එක සතු ඉඩම් වේවා, ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරිය සතු ඉඩම් වේවා අපි එක තීරණයකට ඇවිල්ලා ඒවා සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් හදා ගන්න ඕනෑ. හෙට ව්‍යාපාරිකයෙක් ඇවිල්ලා ඉඩමක් ඉල්ලුවොත් අපට දෙන්න ඉඩම් නැහැ.

වගා කරන්න අක්කර දෙසීයක, තුන්සීයක, පන්සීයක ඉඩමක් පෙන්වන්න කිව්වොත් එහෙම පෙන්වන්න ඉඩමක් නැහැ. හැබැයි, විවිධ ආයතන සතු අක්කර දහස් ගණනක ඉඩම් තිබෙනවා. ගොවි ජනසේවා දෙපාර්තමේන්තුවට අයත් වගා නොකරපු කුඹුරු කොපමණ ප්‍රමාණයක් තිබෙනවා ද කියලා ඇහුවොත්, අද වෙන කොට හෙක්ටයාර 125,000කට වැඩියි. හැබැයි, මොකක්ද අපේ ප්‍රතිපත්තිය? ඒ කුඹුරු වගා කරන්න අපි හදපු වැඩ පිළිවෙළ මොකක්ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොරු බිල්ලෙක් මවා ගෙන මේ ප්‍රශ්න විසඳන්න ගියොත් අපි තව තව පහළට යනවා හැර මේ රට කවදාවත් නැඟිට්ටවන්න කාටවත් පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා ජනවාර්ගික හැටියට දෙමළ, සිංහල, මුස්ලිම් ලෙස බෙදුණු යුගය අපි අවසන් කරන්න ඕනෑ. මේ සභාවේ මන්ත්‍රීවරුන් 225දෙනාටවත් එකට ඉඳගෙන තීන්දු-තීරණ ගන්න බැරි නම්, මේ රටට ඉදිරියට ගෙන යනවා කියන එක බරපතළ අර්බුදයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහෙම වුණොත් මේ රට දියුණු කරන්න ලැබෙන්නේ නැහැ.

දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැනත් යමක් කියන්න ඕනෑ. අපට ඒ ප්‍රශ්නය විසඳාගෙන ඉදිරියට යන්න වෙනවා. හෙට දවස වනකොට මේ රටේ දමිළ ජනතාව සතුටු නැත්නම්, හෙට දවස වෙන කොට මේ රටේ මුස්ලිම් ජනතාව සතුටු නැත්නම්, සිංහල ජනතාවට ඒ ආරක්ෂාව නැත්නම් මේ රට කොහේටද ගමන් කරන්නේ? මේ රට යන්නේ තවත් ලේ විලකට. ගරු ජනාධිපතිතුමා රාජාසන කථාව කරමින්, සිංහල, දමිළ,

[ගරු අනුරාධ ජයරත්න මහතා]

මුස්ලිම් සියලුදෙනා එකට ඉඳගෙන එක වැඩ පිළිවෙළක් හදමු කියපු එකත් විවේචනය කරලා විවිධ කණ්ඩායම් හා බලවේග විසින් ඒ කථාව වෙන වෙන පැතිවලට අරගෙන ගිහිල්ලා රටේ ජනතාව අවුස්සන්න උත්සාහ කරනවා. අපි ඒ ගැන කනගාටු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි වැටුණු තැනින් නැඟිටින්න ඕනෑ. අද යම් විදියකට මිනිසුන්ට හුස්ම ගන්න පුළුවන් පරිසරයක් ගොඩනැඟිලා තිබෙනවා. අපි කියන්නේ නැහැ, සියල්ල හරි කියලා. අපි කියන්නේ නැහැ, සියල්ල අපි බලාපොරොත්තු වුණු ඉලක්කයට ආවා කියලා. හැබැයි, හිටපු තැනින් ඉස්සරහට ඇවිත් තිබෙනවා. ඒක ආපස්සට ගෙන යන්න කවුරු හරි කටයුතු කරනවා නම්, ඒක අනුමත කරන්න පුළුවන්කමක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු ජනාධිපතිතුමා ගෙනාපු එක යෝජනාවක් තමයි දේශපාලන පක්ෂ පිළිබඳව සොයා බලන්න කොමිසමක් පත් කරනවා කියපු එක. ඒක නොවරදවාම පත් කළ යුතු කොමිසමක්. ඒ විතරක් නොවෙයි, ඒ කොමිසම පිළිබඳව පාර්ලිමේන්තුවේ විවාදයක් පැවැත්විය යුතුයි. අද මෙතැනට ඇවිල්ලා කථා කරන සමහරු විවිධ කණ්ඩායම් හදා ගෙන එක්කෝ ජාතිවාදය අවුස්සනවා; එක්කෝ කොහේ හරි රටක තිබෙන සල්ලි අරගෙන ඇවිල්ලා එක මන්ත්‍රීවරයකු හදාගෙන යම් යම් කටයුතු කරනවා. ඒ මන්ත්‍රීවරයා එන්නේ ඒ තිබෙන විවිධ අණපනත්වලට පමණයි. ඔවුන් තමන් නියෝජනය කරන ජනතාව ගැන මේ පාර්ලිමේන්තුවේදී කථා කරන්නේ නැහැ. කථා කරන්නේ වෙන රටවලට. මෙතැන ඉඳගෙන කථා කරන්නේ වෙන NGOs පිළිබඳව. ඒ පිරිස් තමයි මේ රට හැමදාම ගිනි තියන්නේ.

බලන්න, මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත ගෙනාවා. මැතිවරණ කොමිසම සඳහන් කර තිබෙනවා, එක කොට්ඨාසයක එක් ඡන්ද දායකයකු වෙනුවෙන් රුපියල් 20ක් ප්‍රචාරණය සඳහා වියදම් කරන්න පුළුවන් කියලා. ඒ වාගේම එක් පළාත් පාලන ආයතනයකට තව රුපියල් 20ක් වියදම් කරන්න පුළුවන් කියලා තිබෙනවා. එතකොට රුපියල් 40යි. යම් ප්‍රචාරණ කටයුතු හා ඉන්ධන වියදම් වාගේ විවිධ කාරණා අතහැරලා රුපියල් 40යි. හැබැයි, සමහර දේශපාලන පක්ෂ කරන වියදම් දිහා පොඩ්ඩක් බලන්න. ඒවාට මුදල් කොහෙන්ද? වේදිකාවක් සවි කරන්න විතරක් රුපියල් ලක්ෂ 50ක්, 60ක් යනවා. ඒ කියන්නේ, එක රැස්වීමක වේදිකාව සවි කරන්න. එහෙම නම්, ඒ සඳහා මුදල් කොහෙන්ද? ඔය සියලු දෙනා -පක්ෂයත්, අපේක්ෂකයනුත්- මැතිවරණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කළ දින සිට දින 21ක් ඇතුළත වියදම් සම්බන්ධයෙන් සහතික කළ ගිණුම් පිටපතක් ලබා දෙන්න ඕනෑ. ඒකෙදි බලා ගන්න පුළුවන් කොහොමද ඒ කණ්ඩායම් වියදම් කළේ කියලා. හැබැයි, එතකොට ඒ ඒ කොට්ඨාසවල එක් ඡන්ද දායකයකුට රුපියල් 20යි වියදම් කළේ කියලා සියල්ල ගානට හදලා දෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා මේ පිළිබඳ සොයන්න ඕනෑ.

අපේ රටේ ඉන්න මිලියන විසිදෙකක ජනතාවගේ අවශ්‍යතා ගැනද පාර්ලිමේන්තුවේ මේ පුටුවල ඉන්න 225දෙනා කථා කරන්නේ? සමහර දේශපාලන පක්ෂ කථා කරන්නේ මේ රටේ මිලියන විසිදෙකක ජනතාවගේ අවශ්‍යතා ගැනද? අද සමහර කාරණා පිළිබඳ විවිධ අලුත් අදහස් හා මතවාද එන කොට සමහරු තර්ක කරනවා. අද අපේ Sri Lanka Railways ගත්තොත්, කෝච්චියේ වහලය උඩ විතරයි සෙනඟ යන්නේ නැත්තේ. හැබැයි, ඒ ආයතනය කොච්චර අලාභ ලබනවාද බලන්න. හෙට දවසේ ඒක ප්‍රතිව්‍යුහගතකරණය කරලා යම් කණ්ඩායම් එක්ක ඒකාබද්ධ කරන්න. එතකොට ලාභ ලබන්නේ නැද්ද බලන්න. හැබැයි, අපි හැමදාම "ජනසතු, ජනසතු" කියලා කෑගහලා ඒ ආයතනය විනාශ කර දාලා තිබෙනවා. අවසානයේ කෝච්චිය එළවන මනුෂ්‍යයාට වැඩකුත් නැහැ; කෝච්චියේ යන මනුෂ්‍යයාට, ඒ ආයතනයේ වැඩ කරන මනුෂ්‍යයාට සැනසීමකුත් නැහැ, රටත් ඉවරයි. ඒ වාගේම, මහා භාණ්ඩාගාරයෙන් රුපියල් බිලියන හතරක් විතර ඒ ආයතනය පවත්වාගෙන යන්න නැවත වරක් ගෙවනවා. ඊළඟට SLTB එක ගැන බලන්න. බස්වල වහලය උඩ යන්න පුළුවන් නම්, ඒත් යනවා. හැබැයි, අවසානයේ SLTB එකට මොකක්ද වෙලා තිබෙන්නේ? ඒවා ගැන අලුතෙන් හිතලා, අලුත් වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. වරාය දිහා බලන්න. වරාය පිළිබඳ විවිධ තර්ක විතර්ක ගෙනාවා. අන්තිමට ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළාද? අපට මහා භාණ්ඩාගාරයේ මුදල් තිබෙනවාද? ඒක නැවත හදන්න කවුරු හරි අපට ණය දෙනවාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක අද බරපතළ ප්‍රශ්නයක්. අද අපි සියලු දෙනා මේ ඉටු කරන්නේ, රටේ මිනිස්සුන්ගේ අවශ්‍යතාද කියන එක පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා පක්ෂ පිළිබඳව විතරක් නොවෙයි, ඒ පක්ෂ නියෝජනය කරන නායකයෝ, මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරන පිරිස පිළිබඳවත් සොයා බලා, පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කරලා ඒ පිළිබඳව විවාදයක් පැවැත්විය යුතුයි කියලා මම යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් කාරණාව තමයි, ජනමාධ්‍ය පිළිබඳව ආයතන පිහිටුවීම කියන කාරණය. ජනමාධ්‍ය හැසිරවීම පිළිබඳව හා මාධ්‍යකරණයේ යෙදී සිටින අපේ සහෝදර සහෝදරියෝ පිළිබඳව යම් විධියක නියාමන වැඩ පිළිවෙළක් අපි සැදිය යුතුමයි. මම මේ කථා කරන කාරණාව අද ආණ්ඩුව හැටියට ඉන්න අපට අදාළ වෙන්න පුළුවන්. හැබැයි, මතක තියා ගන්න, අද විපක්ෂයේ ඉන්න අයටත් කවදා හරි දවසක මේ කාරණා අදාළ වෙන්න පුළුවන් කියන එක. අද සමාජ මාධ්‍ය තුළ පතුරුවන සමහර කාරණා ගත්තොත්, ඒ ගෙන යන අසත්‍ය මතවාද ටික ජනතාවට දකින්න සලස්වලා, සමාජගත කරලා, "ඒක තමයි ඇත්ත" කියලා මිනිස්සුන්ගේ ඔළුගෙඩිවලට දමනවා. මිනිස්සු ඒවා හයහත් පාරක් දැක්කාට පස්සේ, ඒක තමයි ඇත්ත කියලා විශ්වාස කරනවා. හැබැයි, සමාජ මාධ්‍ය නියාමනය කරන්න අපට තිබෙන නීතිය මොකක්ද? මේකෙදි එක පැත්තකින් නීතිය හැදෙන්න ඕනෑ. අනෙක් පැත්තෙන්, මාධ්‍යකරණයේ යෙදී සිටින පිරිස හරියට නියාමනය වෙන වැඩ පිළිවෙළකුත් අපි හදන්න ඕනෑ. එහෙම නැත්නම් මේ රට ඉදිරි වැඩ කටයුතු එක්ක පෙළ ගස්වන්න පහසු වන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නොවෙනස් වන ජාතික ප්‍රතිපත්තියක් අපි ඉදිරිපත් කරන්න ඕනෑ. මම එහෙම කියන්නේ ඇයි? වර්තමාන ජනාධිපතිතුමා යහ පාලන ආණ්ඩුව කාලයේ අග්‍රාමාත්‍යතුමා හැටියට ඉන්න කොට Port City එක පටන් ගත්තා. පරිසර බලපත්‍රය අහෝසි කරලා, අවුරුදු දෙකක් Port City එක සෑදීම නතර කරගෙන හිටියා. අවසානයේ මොකක්ද වුණේ? අපි විනය වෛර කර ගත්තා. ඒ තමයි, අපේ රටට අවුරුදු ගණනාවක් එක ප්‍රතිපත්තියක් නොමැති වීමේ ප්‍රතිඵලය. ඊළඟට මොකක්ද වුණේ? ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ජනාධිපතිතුමා විධියට පත් වෙන කොට එතුමාට උපදෙස් දෙන්න ඕනෑ තරම් උගත්තු, වියත්තු හිටියා; බුද්ධිමතුන් හිටියා. නමුත්, අවසානයේ monorail project එක අපි නැති කර ගත්තා.

ජපානය සමඟ අපේ තිබුණු හොඳ හිත සම්පූර්ණයෙන්ම විනාශ වුණා. චන්ද්‍රිකා මැතිනිය බලයේ සිටියදී අධිවේගී මාර්ගය අත්තනගල්ල හරහා මධ්‍යම පළාතට යනතෙක් හදන්න සැලසුම් සකස් කර තිබුණා. නමුත් අවසානයේ මොකක්ද වුණේ? එම

අධිවේගී මාර්ග සැලැස්ම සම්පූර්ණයෙන්ම වෙනස් කරලා ඒක කුරුණෑගල පැත්තෙන් හැදුවා. ඒ විධියට උදේ, සවස අපේ ප්‍රතිපත්ති වෙනස් කරනකොට ආයෝජකයෝ මේ රට තුළ ආයෝජන කරන්නේ කොහොමද? අඩුම ගණනේ දේශීය ආයෝජකයන්ට අධිවේගී හෝ අනෙක් මාර්ගයක් පිළිබඳව සැලසුමක් හෝ සකස් කරලා තෙල් ගහන ෂෙඩ් එකක්වත් දමා ගන්න බැරි රටකට, විදේශීය ආයෝජකයෝ එයිද? එහෙම කරන්න නම් මේ රටේ නිවැරදි සැලැස්මක්, ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂ නායකතුමා ඇතුළු සියලු දෙනාගෙන් අපි ගෞරවයෙන් ඉල්ලනවා, අඩුම ගණනේ ඒ ප්‍රතිපත්තිය හදන්නවත් අපි එකට එකතු වෙමු කියලා. අපි මාස හයකට ප්‍රතිපත්තියක් හදලා මේ පාර්ලිමේන්තුව තුළ සම්මත කරමු. ඊළඟට බලයට එන්නේ කවුද, කින්ද-මන්ද කියන එක අපට අදාළ නැහැ. එන ඕනෑම කෙනකු ඒ නිවැරදි වැඩ පිළිවෙළ ඉදිරියට අරගෙන යයි, ඒ නිවැරදි වැඩ පිළිවෙළ ඉදිරියටත් ක්‍රියාත්මක කරාවි. එතැනට මේ පාර්ලිමේන්තුව පෙළ ගස්වමු කියා අපි බොහොම ගෞරවයෙන් ඉල්ලනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

තවම මේ රටේ සියල්ල සම්පූර්ණ වී නැහැ. මේ රටේ අපට අවශ්‍ය කරන සියල්ල අඩු පාඩුවකින් තොරව සම්පූර්ණ කරගන්න මේ වෙනකම් පුළුවන්කම ලැබී නැහැ. හැබැයි, තිබුණු තත්ත්වය එක්ක සංසන්දනය කර බලන විට අපි මේ රට සාමකාමී කරලා, ජනතාවගේ අවශ්‍යතා සැහෙන දුරකට ඉටු වන තැනකට රට අරගෙන ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා මේ කටයුත්ත තව මාස හයක් හෝ අවංකව ඉදිරියට කරගෙන යමින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක තිබෙන වැඩ කටයුතු අවසන් කරලා මේ රටට ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව වාගේ මූල්‍ය ආයතනවලින් මුදල් ගලා ගෙන වැඩ පිළිවෙළ හදලා, මේ රටේ මිනිස්සුන්ට හුස්ම ගැනීමට පුළුවන් පරිසරය ගොඩනඟන්න කටයුතු කරමු කියා අපේ ගරු විපක්ෂ නායකතුමා ඇතුළු අපේ පැත්තේ ඉඳලා ඒ පැත්තට ගිය -අපේ හිටපු ජනාධිපතිතුමාට උපදෙස් දෙමින් එතුමා ළඟම සිටි- ඒ උගත්, බුද්ධිමත්, වියතුන්ගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ගෝවින්දන් කරුණාකරම් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු දහයක කාලයක් තිබෙනවා.

[පි.ව. 12.29]

**ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා**
(மாண்புமிகு கோவிந்தன் கருணாகரம்)
(The Hon. Govindan Karunakaram)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, மாண்புமிகு சனாதிபதி அவர்களின் நேற்றைய அக்கிராசன உரை சம்பந்தமான இன்றைய ஒத்திவைப்புப் பிரேரணைமீதான விவாதத்தில் எனக்கும் பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கிய மைக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். மாண்புமிகு சனாதிபதி அவர்கள் அதிகாரங்களைப் பரவலாக்கி, நாட்டில் புரையோடிப்போயுள்ள இனப் பிரச்சினைக்கு ஒரு தீர்வைக் காணவேண்டும் என்ற அடிப்படையில் அக்கிராசன உரையை ஆற்றியிருந்தாலும், பொலிஸ் அதிகாரமற்ற அதிகாரப் பரவலாக்கலை, ஒற்றையாட்சிக்குள் அதிகாரப் பரவலாக்கலை எங்களால் எள்ளளவும் ஏற்றுக்கொள்ள முடியாது எனக் கூறி, என்னுடைய உரையைத் தொடங்கலாமென நினைக்கின்றேன்.

இலங்கையின் 75ஆவது சுதந்திர தினம் கடந்த வாரம் கொண்டாடப்பட்டது. இலங்கை சுதந்திரம் அடைந்ததோ, என்னவோ தமிழ் மக்களுக்கான சுதந்திரம் இன்றுவரை கிடைக்காமல் இருக்கிறது. ஒரு சொட்டு இரத்தம்கூட சிந்தாமல் சுதந்திரம் அடைந்தது இந்த நாடு! சுதந்திரம் பெறும்போது இலங்கையின் பொருளாதாரம் யப்பானின் பொருளாதாரத் துக்கு நிகராக இருந்ததாகக் கூறப்படுகிறது. ஆனால், இன்று பொருளாதார ரீதியில் யப்பான் எங்கிருக்கிறது, இலங்கை எங்கு இருக்கிறது என்பதை நாங்கள் கூறித்தான் தெரியவேண்டும் என்றில்லை. இந்தியா அஹிம்சை ரீதியாகப் போராடிச் சுதந்திரம் அடைந்தது. சுதந்திரத்துக்கு முன்னர் இந்தியா, பாகிஸ்தான், பங்களாதேஷ் ஆகிய நாடுகள் ஒன்றாகவே இருந்தன. பாகிஸ்தான் இந்தியாவிலிருந்து பிரிந்தாலும், பாகிஸ்தானில் வாழும் முஸ்லிம்களைவிட, அதிகளவான முஸ்லிம்கள் இந்தியாவில் வாழ்கின்றார்கள். அதுமாத்திரமல்ல, அவர்கள் அங்கு பாதுகாப்பாகவும் சுதந்திரமாகவும் வளமாகவும் வாழ்ந்துகொண்டிருக்கிறார்கள். அங்கு முஸ்லிம்கள் வாழும் பிரதேசங்களில் இந்துக் கோயில்களோ, இந்துக்கள் வாழும் பிரதேசங்களில் முஸ்லிம் பள்ளிவாசல்களோ அடாத்தாக - பலாத்காரமாக - அமைக்கப் படுவதில்லை. ஆனால், இலங்கையில் சுதந்திரம் அடைந்தது முதற்கொண்டு, தமிழ் பேசும் மக்கள் அடக்கி ஒடுக்கப் பட்டுக்கொண்டே வருகிறார்கள்.

இலங்கை சுதந்திரம் அடைந்த 1948ஆம் ஆண்டிலிருந்து தமிழ் மக்கள் கிட்டத்தட்ட 30 ஆண்டுகள் அஹிம்சை ரீதியாகவும், கிட்டத்தட்ட 30 ஆண்டுகள் ஆயுத ரீதியாகவும் போராடினார்கள். 1948ஆம் ஆண்டில் இலங்கை சுதந்திரம் அடைந்திருந்தாலும், 1949ஆம் ஆண்டு இலங்கையின் முதலாவது பிரதமராக இருந்த டீ.எஸ். சேனாநாயக்கா அவர்கள் கிழக்கு மாகாணத்தைக் கபளீகரம் செய்வதற்காக, அங்குள்ள தமிழ் பேசுகின்ற மக்களைச் சிறுபான்மையினர் ஆக்குவதற்கான வேலைத்திட்டத்தை கல்லோயா குடியேற்றத் திட்டத்தின்மூலம் தொடங்கிவைத்தார்.

1921ஆம் ஆண்டு கிழக்கு மாகாணத்தில் வெறும் 0.5% சிங்கள மக்களே வாழ்ந்ததாக வரலாறு இருக்கிறது. ஆனால், இன்று அவர்கள் 24%ஆக உயர்ந்திருக்கிறார்கள். அதற்காக நீங்கள் கல்லோயா தொடக்கம் சேருவில, கந்தளாய் வரை குடியேற்றங்களை மேற்கொண்டது மாத்திரமல்லாமல், அம்பாறையைத் தனித் தேர்தல் தொகுதியாகவும் சேருவிலவை புதியதொரு தேர்தல் தொகுதியாகவும் உருவாக்கினீர்கள். மேலும், நீங்கள் 1956ஆம் ஆண்டு சிங்களம் மட்டும் சட்டத் தைக் கொண்டுவந்தீர்கள்; 'ஸ்ரீ'யைக் கொண்டு வந்தீர்கள். அன்றிலிருந்து இன்றுவரை எத்தனையோ இனக்கலவரங்கள் இடம்பெற்றிருக்கின்றன. குறிப்பாக, 1958ஆம், 1978ஆம், 1983ஆம் ஆண்டுகளில் இனக்கல வரங்கள் இடம்பெற்றன. 1983ஆம் ஆண்டு இடம்பெற்ற இனக்கலவரம் காரணமாக, தெற்கிலிருந்து - கொழும்பிலிருந்து வடக்கு, கிழக்குக்குத் தரை வழியாகத் தமிழர்கள் செல்லமுடியாமல், கடல் வழியாகச் சென்ற வரலாறும் இந்த நாட்டில் இருக்கிறது.

அதுமாத்திரமல்ல, வெலிக்கடை வெஞ்சிறையில் 53 தமிழ்க் கைதிகள் கொடூரமாகக் கொல்லப்பட்டார்கள். தமிழீழ விடுதலை இயக்கமாகிய என்னுடைய இயக்கத்தின் - அதாவது, ஆயுதப் போராட்டத்தை முதன்முதலாகத் தொடக்கிய இயக்கத்தின் - ஆரம்ப கர்த்தாக்களான தங்கத்துரை, குட்டிமணி போன்றோர் மிகவும் கொடூரமான முறையில் கொல்லப் பட்டார்கள். குட்டிமணி அவர்கள் நீதிமன்றத்தில், "நீங்கள் என்னைத் தூக்கிலிடுவதன்மூலம் ஒரு குட்டிமணியைத்தான் அழிப்பீர்கள். அதன்மூலம் ஆயிரம்

[ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා]

ஆயிரம் குட்டிமணிகள் இந்த நாட்டின் வடக்கு, கிழக்கில் உருவாகுவார்கள். அவர்கள்மூலமாக தமிழீழம் மலரும். அந்தத் தமிழீழத்தை என்னுடைய கண்களால் நான் பார்க்கவேண்டும். ஆகையால், என்னுடைய கண்களை பார்வையற்ற ஒரு தமிழனுக்கு வழங்கவேண்டும்" என்று கூறியதற்காக, அவரைக் கொன்று, அவருடைய கண்களைத் தோண்டி எடுத்து, சப்பாத்துக் கால்களால் மிதித்த வரலாறுகூட இருக்கிறது. 1983ஆம் ஆண்டு இடம்பெற்ற இனக்கலவரத்தைத் தொடர்ந்து, ஆயுதப் போராட்டம் வீறுகொண்டு எழுந்ததை நீங்கள் அறிவீர்கள். வடக்கு, கிழக்கைச் சேர்ந்த ஆயிரக்கணக்கான இளைஞர்கள் ஆயுதப் போராட்டத்தில் இணைந்தது மாத்திரமல்ல, இந்த நாட்டில் உக்கிரமாகப் போர் புரிந்த வரலாறும் இருக்கிறது.

1987ஆம் ஆண்டு ஆடி மாதம் 29ஆம் திகதி இலங்கை - இந்திய ஒப்பந்தம் கைச்சாத்திடப்பட்டது. அவ்வொப்பந்தம் கைச்சாத்திடப்படாமல் இருந்தால், "நாங்கள் தனி ஈழம் பெற்றிருப்போம்; எங்களுக்குத் தனி நாடு கிடைத்திருக்கும்" என்று இன்றும்கூட தமிழர்கள் கூறுகிறார்கள். இலங்கை - இந்திய ஒப்பந்தம்மூலம் ஏற்படுத்தப்பட்டதுதான் இந்த 13ஆவது திருத்தம்! இத்திருத்தம் அரசியலமைப்பின் ஓர் அங்கமாக இருக்கும்போது, அதிலுள்ள விடயங்களை இந்த நாட்டை மாறி மாறி ஆண்டுகொண்டிருக்கும் அரசாங்கங்கள் முழுமையாக அமுல்படுத்தாமல் அரசியலமைப்பை மீறிக் கொண்டிருக்கின்றன. இங்கு உரையாற்றிய மாண்புமிகு உதய கம்மன்பில அவர்கள், "இலங்கை - இந்திய ஒப்பந்தம் கைச்சாத்திட்ட பின்னர், இந்த நாட்டை 07 சனாதிபதிகள் ஆட்சி செய்திருக்கிறார்கள். எனினும், அவர்களில் யாரும் பதின்மூன்றாவது திருத்தத்திலுள்ள பொலிஸ் அதிகாரத்தை அமுலாக்கவில்லை" என்று கூறியிருந்தார். அதிலிருந்து நீங்கள் எதை உணர்ந்துகொள்கிறீர்கள்? நீங்களே அரசியலமைப்பை மீறிக்கொண்டிருக்கிறீர்கள். முன்னாள் சனாதிபதி மைத்திரி பால சிறிசேன அவர்கள், "இந்த நாடு பௌத்த நாடு; பௌத்த பிக்குகளை எதிர்த்துக்கொண்டு எதையும் செய்ய முடியாது. ஆகையால், அவர்களைப் பகைத்துக்கொண்டு இந்த நாட்டில் ஒரு தீர்வைத் தரமுடியாது" என்ற கோணத்தில் உரையாற்றி யிருந்தார்.

2015இல் அவரை சனாதிபதியாக்கியது சிறுபான்மை மக்கள் என்பதை நான் அவருக்குக் கூறிக்கொள்ள விரும்புகின்றேன். அந்த மக்களைக்கூட கருத்திலெடுக்காமல், அவர் அந்த உரையை ஆற்றியிருக்கிறார். அவருக்காக வடக்கு, கிழக்கிலுள்ள தமிழ் மக்களிடம் சென்று வாக்குக்கேட்டவன் என்ற அடிப்படையில் நான் வெட்கப்படுகிறேன். ஆயுதப் போராட்டம் ஏற்பட்டதன் காரணமாகத்தான் 13ஆவது திருத்தம் உருவாகியது. இது எங்களுடைய தமிழ் மக்களுக்கான ஓர் அரசியல் தீர்வல்ல! மாறாக, அவர்களுடைய அரசியல் தீர்வுக்கான ஓர் அடிப்படைப் புள்ளியாகவே நாங்கள் கருதுகின்றோம். மீளப்பெற முடியாத சமஷ்டி அடிப்படை யிலான தீர்வே எங்களுக்குத் தேவை என்பதை நாங்கள் மீண்டும் மீண்டும் வலியுறுத்துகின்றோம். ஏனென்றால், 13ஆவது திருத்தத்தினூடாகப் பரவலாக்கப்பட்ட அதிகாரங் களைக்கூட, நீங்கள் மீளப்பெற்றுக்கொண்ட வரலாறு இந்த நாட்டில் இருக்கிறது. நேற்று பௌத்த பிக்குகள் 13ஆவது திருத்தச் சட்டத்தை எரித்தார்கள். அவர்கள் எரித்தது 13ஆவது திருத்தத்தை அல்ல, மாறாக ஒட்டுமொத்த நாட்டையும் என்பதை நீங்கள் உணர்ந்துகொள்ள வேண்டும். பண்டா - செல்வா ஒப்பந்தம் கைச்சாத்திடும்போது, பௌத்த பிக்குகள் கொழும்பிலிருந்து கண்டிக்கு யாத்திரை சென்றார்கள். எதற்காக? அன்று பண்டா - செல்வா ஒப்பந்தம் கைச்சாத்திடப் பட்டிருக்குமானால், இந்த நாடு அழிவுப் பாதைக்குள் சென்றிருக்காது என்பதை நீங்கள் அனைவரும் உணர்ந்து கொள்ள வேண்டும்.

இறுதியாக, நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற மாவட்டம் சார்ந்த பிரச்சினையொன்றைக் கூறிப்பிட விரும்புகின்றேன். தற்போது மட்டக்களப்பு மாவட்டத்தில் நெல் அறுவடை நடந்துகொண்டிருக்கிறது. ஒரு கிலோகிராம் நெல்லை 63 ரூபாய்க்கு தனியார்துறையினர் கொள்வனவு செய்கிறார்கள். அங்கு நெற் பயிர்களில் 'நேமற்றோடு நோய்' என்னும் நோய் தாக்கம் ஏற்பட்டிருக்கிறது. அது compostமூலமாக - சேதனப் பசளை மூலமாக - உருவாகியிருக்கிறது. அதை அதிகாரிகள் 'மஞ்சள் நோய்' என்று கூறுகின்றார்கள். அப்படியல்ல! இந்த நாட்டில் சேதனப் பசளையை அறிமுகப்படுத்தியதன் காரணமாகவே அந்த நோய் உருவாகியிருக்கிறது. இதனால் ஓர் ஏக்கருக்கு 120,000 - 130,000 ரூபாய் செலவுசெய்து வேளாண்மை செய்தவர்கள், இன்று ஓர் ஏக்கருக்கு 50,000 - 60,000 ரூபாய் வரை நஷ்டமடையும் நிலை உருவாகி யிருக்கிறது. பொலன்னறுவை, அநுராதபுரம் ஆகிய மாவட்டங்களின் அறுவடைகளை மையமாக வைத்தே, இந்த நாட்டில் நீங்கள் நெல்லுக்கான நிர்ணய விலையைத் தீர்மானிக்கின்றீர்கள். ஒரு மாதத்துக்கு முன்னரே விதைத்து, அறுவடை செய்யும் வடக்கு, கிழக்கு மாகாணங்களில் நெல்லுக்குரிய நியாய விலையை Paddy Marketing Board - நெல் சந்தைப்படுத்தும் சபைமூலம் - நிர்ணயித்து, அங்குள்ள விவசாயிகளையும் விவசாயத்தையும் காப்பாற்ற வேண்டு மெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.39]

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දිනවල විශේෂයෙන්ම බදු සම්බන්ධව විශාල සාකච්ඡාවක් ඇති වෙලා තිබෙනවා. අපි කවුරුත් දන්නවා, මේ රටට අමාරු කාලයක් උදා වෙලා තිබෙන බව; මිනිසුන්ට ජීවත් වෙන්න අමාරු තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙන බව. හැබැයි, අපි මීට වඩා බැරෑරුම් කාලයක් පසු කරලා තමයි අද මෙතැනට ඇවිත් තිබෙන්නේ. පසුගිය කාලයේ ගෑස් පෝලිම්වලදී මිනිස්සු මැරුණා; පෙට්‍රල් පෝලිම්වලදී මිනිස්සු මැරුණා. හැබැයි, ඒ තත්ත්වය වෙනස් වෙලා අද යම්තාක් දුරකට සාධනීය තැනකට අපේ රට ඇවිල්ලා තිබෙනවා.

අද බදු ගැන, බදු ගෙවීම ගැන කථා කරනවා; බදු ගෙවිය යුතු වෘත්තිකයන් පිරිසක් ගැනත් කථා කරනවා. පසුගිය වසර දෙක තුළ ඒ අය permits ලබා ගෙන තීරු බදු රහිත වාහන 7,000කට වැඩි ප්‍රමාණයක් ගෙන ආ බව අපි දන්නවා. ඒ වාගේම ඒ අය විශාල වැටුපක් ලැබූ අය. සමහර නිලධාරින් ගෙවිය යුතු උපයන විට බද්ද ඒ අය වෙනුවෙන් රජයේ සමහර ආයතනවලින් ගෙව්වා. ඒ කොහොම වුණත් දැන් ඒ අයටත් අමාරුයි. අපි ඒක පිළිගන්නවා. අපි දන්නවා, සාමාන්‍යයෙන් ණයක් ගන්නකොට, වැටුපෙන් සියයට 40 සීමාව ඉක්මවා ණය ගන්නේ නැති බව. නමුත් සමහර නිලධාරින් ගත් ණය නිසා ඒ අයගේ පඩි පත සෘණ

වුණු අවස්ථාත් තිබෙනවා. අපි එවැනි අවස්ථා දැක්කා. ලංකා බැංකුව ගත්තොත්, එවැනි අවස්ථා කිහිපයක් දකින්න තිබෙන බව මම දන්නවා. අන්න ඒ වාගේ අවස්ථාවල අපට සිද්ධ වෙනවා ඒ අයට මොකක් හෝ සහනයක් සලසන්න. බදු ගන්නවා වාගේම ඒ මිනිස්සු ජීවත් කරවන්නත් එපා යැ. ඒ අයට යම් ණයක් හෝ දීලා මේ අමාරු කාලයේ ඒ අයව ජීවත් කරවීමේ අවශ්‍යතාව තිබෙනවා. හැබැයි, අනෙක් පැත්තෙන්, මේ රටේ ජනතාවගෙන් සියයට 21යි සෘජු බදු ගෙවන්නේ; සියයට 79ක් ගෙවන්නේ වක්‍ර බදු. එතකොට ලක්ෂ ගණන් උපයපු අය නිවැරැදි පරිදි බදු ගෙව්වාද කියන ගැටලුව තිබෙනවා.

ජනතා විමුක්ති පෙරමුණේ සුනිල් හඳුන්නෙත්ති මහත්මයා COPE එකේ සභාපතිත්වය දැරූ කාලයේදී තමයි මුලින්ම හොයා ගත්තේ නිලධාරින් විසින් ගෙවිය යුතු උපයන විට බද්ද රජයේ ඇතැම් ආයතනවලින් ගෙවනවා කියලා. ඊට පසුව එම කමිටුවෙන් තමයි නිර්දේශ කළේ රජය ඒ ගෙවීමෙන් ඉවත් විය යුතුය, ඒ අදාළ ඉපයීම කරන තැනැත්තා විසින් අනිවාර්යයෙන් එය ගෙවිය යුතුය කියලා. පසුගිය කාලය පුරාවට COPE එකෙන් මෙවැනි කරුණු සොයා ගත්තා. හැබැයි, අපි දන්නවා, මේක ක්‍රියාත්මක කරද්දී විශාල ප්‍රතිවිරෝධයක් එල්ල වන බව. කොවිඩ් වසංගතයට ඉස්සෙල්ලා වෙනත් ආදායම් මාර්ග තිබුණු නිසා ජනතාවට බදු බරක් දෙන්නේ නැතුව කොහොම හරි - Bank of Ceylon එකේ, ඒ වාගේම Ceylon Petroleum Corporation එක වාගේ ආයතනවල නිලධාරින්ට අදාළව - මේ බද්ද ආණ්ඩුවෙන්ම ගෙව්වා. නමුත් මේ සම්බන්ධයෙන් දැන් විශාල ගැටලුවක් තිබෙනවා. මේ වෙලාවේ අපට එහෙම කරන්න පුළුවන්කමක් නැහැ. රට තුළ අමාරු තත්ත්වයක් තිබෙන්නේ. ඒ නිසා මේ බද්ද ගෙවීම සම්බන්ධයෙන් මිනිසුන් යම් ආකාරයකින් පරිත්‍යාගශීලී විය යුතු තත්ත්වයක් අද ඇති වෙලා තිබෙනවා. ඇතැම් නිලධාරින්ගේ පඩි පත සෘණ වීම සම්බන්ධවත් අවධානය යොමු කර, මේ බදු අය කිරීම සම්බන්ධව සාධනීය ආකාරයට හිතලා, වෙනස් විධියකට හිතලා කටයුතු කරන්න වෙනවා. ඒ වාගේම මේ අමාරු කාලය තුළ වෘත්තිකයන් හැටියට අපට සාධාරණ අයුරින් කටයුතු කරන්න සිද්ධ වෙනවා.

විශේෂයෙන්ම නීතිඥයෙකු හැටියට, පූර්වයේ ඉඳලාම බදු ගෙවන කෙනෙකු හැටියට මම අහන්න කැමැතියි, ඒ බදු ගෙවිය යුතු අය නිවැරැදිව, තමන්ට අවංකව ඒ අදාළ බදු ගෙවනවාද කියලා. එහෙම වුණා නම් අද මෙහෙම තත්ත්වයක් නිර්මාණය වේවිද? ඒ ගැන අපට පැහැදිලිව කියන්න. අද සමහර අය අහනවා, මේ ගෙවන බදුවලට පසුගිය කාලය පුරාවට සිදු වුණේ මොනවාද කියලා. ඒ සම්බන්ධව විනිවිද ස්වරූපයකින් බලන්න පුළුවන් ක්‍රමයක් නිර්මාණය කරන්න ඕනෑ. ඒ වාගේම අපි කවුරුත් පිළිගන්න ඕනෑ, අවුරුදු 70ක සිට අද තිබෙන තත්ත්වය දක්වා සාක්ෂරතාව ඉහළට ගෙනෙන්න, මේ රටේ අධ්‍යාපනය ඉහළට ගෙනෙන්න, මේ රටේ පරිගණක ඥානය ඉහළට ගෙනෙන්න විශාල වැය කිරීමක් කර තිබෙන බව. ඒ නිසා තමයි රටක් හැටියට අද අපි මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා, "නැහැ, මේ බදු මුදල්වලින් කිසිම දෙයක් වෙන්නේ නැහැ, ඒ නිසා අපි ගෙවන්නේ නැහැ" කියලා කවුරු හරි කියනවා නම්, ඒක විය යුතු දෙයක් නොවෙයි. ඒ වාගේම, ඒක කරන්න පුළුවන් දෙයක් නොවෙයි, ඒක සාධාරණ දෙයකුත් නොවෙයි කියන කාරණය අපි පැහැදිලිව කියන්න ඕනෑ. අවුරුදු 70ක් තිස්සේ "සාපය" කියලා කියපු සමහර අයට අද අමතක වෙලා තිබෙනවා, 1971 දී සහ 1989 දී ඇති වුණු කැරලිවලින් මිනිසුන්ගේ ජීවිතවලට, මිනිසුන්ගේ දේපළවලට සහ රාජ්‍ය දේපළවලට හානි සිදු වුණාම ඒවා නැවත වතාවක් ප්‍රතිස්ථාපනය කරන්න වැය කළේ මේ ජනතාව විසින් ගෙවපු බදු මුදල් කියලා. මේ, ජනතාවගේ බදු මුදල්, රාජ්‍ය ධනය. මේවා ප්‍රතිස්ථාපනය කරලා තිබෙන්නේ බදුවලින් කියන කාරණය ඒ කට්ටියට අමතක වෙලා තිබෙනවා.

දේශපාලනමය වශයෙන් බොහෝ අය කියනවා, අපේ කණ්ඩායම නියෝජනය කරන්නේ "වහල්ලු වාගේ අය" කියලා. ඇත්තටම වහල්ලු කියන්නේ කවුද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අද පැහැදිලිවම දේශපාලනමය වශයෙන් වෙනස්වෙලා තිබෙනවා. සමහර තීන්දු තීරණ ගනිද්දී, පූර්වයේ විශ්වාස කරපු ඒවා අපට වෙනස් කරන්න සිදු වෙලා තිබෙනවා. හැබැයි, ඔය කියන ජනතා විමුක්ති පෙරමුණ ගත්තාම, එදා -1994 දී- එක තැනකින් පටන් ගත්තා. 2000 වෙන කොට ඒ අය තවත් තැනක. 2005 වෙන කොට මේ රටේ යුද්ධය අවසන් කරන්න කියලා දේශ හිතෛෂී ජාතික ව්‍යාපාරය ආරම්භ කළා. හැබැයි, 2008 වෙන කොට යුද්ධය කරන්න බැහැ කියලා ඒ ආණ්ඩුව අතර මං කරලා මේ අය අනික් පාර්ශ්වය පැත්තට පනිනවා. එතකොට ඇත්තටම වහල්ලු කවුද? හැබැයි, අද වෙනතුරු කිසිම වෙලාවක ඔය කියන ආකාරයේ වෙනස්වීමක් ඔවුන්ගේ දකින්න ලැබෙන්නේ නැහැ. ජන නායකයා කියන්නේ කවුද? ජනතා විමුක්ති පෙරමුණේ පහළ සිටින අය එහි නායකයෝ විවේචනය කරනවා කවදාවත් අහලා තිබෙනවාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි හැම වෙලාවේම පසුගිය ආණ්ඩුවේ වුණත්, අද වුණත් නිවැරැදිව දකින දේ හරියි කියලා කියන බව ඔබතුමාත් දන්නවා. ඒකට කියනවා, මේ පක්ෂ බෙදිලා කියලා. නැහැ, ඒවා තමයි නියම ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ. හැබැයි, ඇත්ත වහල්ලු කවුද කියන එක අපට විශ්වවිද්‍යාලවලට ගියාම පැහැදිලිව පේනවා. අද සමහර දරුවෝ විශ්වවිද්‍යාලවලට යන්න භයයි. ඒ අයට විශ්වවිද්‍යාලය එපා වෙලා තිබෙනවා. මොකද, සියයට 10ක පිරිසක් විසින් සිදු කරන අපරාධ, දරුණු ක්‍රියා සහ දේශපාලනය හසුරුවන විධිය දැක්කාම සමහර දරුවන් බොහෝ වෙලාවට තමන්ගේ අධ්‍යයන කටයුතු සිදු කරන්න මැළිකමක් දක්වනවා. ඒ අය හුරුවෙලා තිබෙනවා, අධ්‍යයන කටයුතු සිදු කරලා ඇස්, කන් වසා ගෙන විශ්වවිද්‍යාලයෙන් පිට වෙන්න. මේක තමයි ඇත්ත තත්ත්වය. ඒ අය තමයි අද දේශපාලනය කරන්න බිමට බැහැලා තිබෙන්නේ. ඒ අය මේ කියන දේශපාලන යන්ත්‍රණය තුළින් අද එළියට ඇවිල්ලා ඒ ක්‍රමයට බලය අල්ලන්න පුළුවන් කියලා විශ්වාස කරනවා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට තමයි, ඔය අරගළය කියන එක මතු වෙන්නේ. නමුත් ජනතාවගේ අවශ්‍යතාව වෙන දෙයක්. හැබැයි, එවකට තිබූ ආණ්ඩුවට සහාය දුන් පොහොට්ටුවේ සහ ආණ්ඩුවේ අයගේ නිවාසවලට, දේපළවලට සහ ඒ පාක්ෂිකයන්ට පහර දීම දේශපාලන වශයෙන් සුළුතර කණ්ඩායමකගේ වැඩක් කියන කාරණය මම පැහැදිලිව කියන්න ඕනෑ. ඒක කිසිම ආකාරයකින් ඔය කියන විධියේ ජනතා විරෝධය නිසා එල්ල කරපු ප්‍රහාරයක් නොවෙයි. මේක ඡන්දයෙන් තමන්ට බලය ලබා ගන්න බැරිවුණු අය, ආණ්ඩුවේ හිටපු තමන්ට වඩා ඡන්ද ගත් අයට හානි කරලා යම් සතුටක් ලබා ගන්න දරපු උත්සාහයක් බව අපි පැහැදිලිව කියන්න ඕනෑ. අපට කිසිම අවස්ථාවක රනිල් වික්‍රමසිංහ මහත්මයා එක්ක එකට වැඩ කරන්න බලාපොරොත්තුවක් තිබුණේ නැහැ.

හැබැයි, මේ වෙලාවේ ඒ ආකාරයට වැඩ කරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. මොකද, වෙන කිසිම කෙනෙකු මේ තත්ත්වය පාලනය කරගෙන ඉස්සරහට යන්න සමත් වෙලා නැහැ. ඒ නිසා අපට අකමැත්තෙන් වුවත් එතුමා එක්ක වැඩ කරන්න සිදුවෙලා තිබෙනවා. එතකොට අපිද වහල්ලු? අපි වෙනස් වෙලා තිබෙනවා. අපි වෙනස් වෙලා, මේ පාලනය සඳහා අවශ්‍ය දායකත්වය ලබා දීලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වෙනස්වීමත් එක්ක අපට යන්න සිද්ධ වෙලා තිබෙනවා. මොකද, අපි කවදාවත් දැකපු නැති, කවදාවත් අහපු නැති ප්‍රශ්න ගොඩක අද මේ රට පැටලිලායි තිබෙන්නේ. ඒ ප්‍රශ්නවලින් මිදෙන්න අපිට නිවැරැදි නායකත්වයක් අවශ්‍ය වෙනවා; ඒ කටයුත්ත කරන්න පුළුවන් කෙනෙකු අවශ්‍ය වෙනවා. ඒ නිසා අපි එතුමා එක්ක වැඩ කරගෙන යනවා.

[ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා]

දැන් සමහරු බලාගෙන ඉන්නවා, කෙසේ හෝ බලය ලබා ගන්න. හැබැයි, බලය ලබාගෙන කරන්නේ මොකක්ද කියලා නිවැරැදි පිළිවෙතක්, නිවැරැදි ක්‍රමවේදයක් කිසිම අවස්ථාවක ඒ අය එළියේදී කියන්නේ නැහැ. එතැන තමයි ගැටලුව තිබෙන්නේ. අපි බලයට ආවාම අපට යාළුවෝ සල්ලි දෙයි, ජනතාව සල්ලි දෙයි, පිට රටින් ආධාර ලැබෙයි කියලා කවුරු හෝ දෙන දෙයක් ගැන බලාපොරොත්තු වෙන ඒ ආර්ථික න්‍යාය තුළ තවදුරටත් ගමන් කරන්න ඕනෑද, නැත්නම් ඒ ක්‍රමය වෙනස් කරලා, ස්වයංපෝෂිත ආර්ථික න්‍යායකට යන්න පුළුවන් ක්‍රමවේද අනුගමනය කරනවාද කියන කාරණය අද තහවුරු කර ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ගන්න තීන්දු-තීරණ කිසිම දෙයක් ජනතාව ආදරයෙන් වැළඳ ගන්න තීන්දු-තීරණ නොවෙයි. මේ තීන්දු-තීරණ, තවත් අමාරු -දුෂ්කර-, ජනප්‍රිය නොවන තීන්දු-තීරණ. හැබැයි, අද අපට එවැනි තීන්දු-තීරණ ගන්න සිදු වෙලා තිබෙනවා. මොකද, මේ රට නිසි ක්‍රමවේදයකට පවත්වා ගෙන යන්න අද අපට එවැනි තීන්දු-තීරණ ගන්න සිදු වෙලා තිබෙනවා කියන එක අද අපි කවුරුත් පිළිගන්නා දෙයක්. ඒ වෙනුවෙන් දේශපාලනමය වශයෙන් තීන්දු ගන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. හැබැයි, ඒ මේ රටේ ශුභ සිද්ධිය හා මේ රටේ පැවැත්ම සඳහායි. සමහර වෙලාවට විපක්ෂය නියෝජනය කරන ප්‍රධාන ධාරාවේ පක්ෂ දෙකම උත්සාහ කරන්නේ යැපුම් ආර්ථික ක්‍රමය තුළ ජනතාවට අපි මේවා දෙන්නම්, අරවා දෙන්නම් කියන ආකාරයේ සුබවාදී ක්‍රමවේදයක් තුළ කටයුතු කරන්නයි. එවැනි පොරොන්දුවක් තුළ තමයි එතුමන්ලා කටයුතු කරන්න උත්සාහ කරන්නේ. හැබැයි, ඒ කටයුත්ත කරන්න පුළුවන් ක්‍රමයක් තිබෙනවාද?

අපි උදාහරණයක් අරගෙන බලමු. දැන් සමගි ජන බලවේගය පාසල්වලට බස් රථ ලබා දෙනවා. ඒක ඉතා හොඳ දෙයක්. හැබැයි, ඒ බස් රථයක් නඩත්තු කරන්නේ කොහොමද? ඒ පාසල් බස් රථය ධාවනය කරන්න රියැදුරු මහතෙක් සොයා ගන්නේ කොහොමද? ඒ ගැටලුවලට ස්ථිරසාර විසඳුම් තිබෙන්න ඕනෑ. තිරසාර විසඳුමක් නැතිව, හුදු ගැලරිය පිනවන තීන්දු-තීරණ ගන්න නිසා මෙච්චර අමාරුවේ වැටිලා තිබෙනවාය කියන එක අද අපි කවුරුත් පිළිගන්න ඕනෑ. ඒක තමයි ඇත්ත කාරණය.

අද කථා කරනවා, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන. මේ රටේ විධායක ජනාධිපතිවරයා සතු බලතලත් එක්ක එකතු වුණු -බලය කේන්ද්‍රගත වුණු- ආණ්ඩු ක්‍රමයක් තමයි අපිට තිබෙන්නේ. 1987 දී, බෙදුණු ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් තුළ මේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා අවශ්‍ය දායකත්වය, අවශ්‍ය තීරණය ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලැබුණා. හැබැයි, අද වෙනකොට ඒ කියන බලය සහිත විධායක ජනාධිපතිවරයෙක් අපේ රටේ නැහැ. ඒ කොහොම වුණත්, උතුරු ප්‍රදේශය නියෝජනය කරන සමහර දේශපාලන නායකයන් එක අන්තයකින් -එක පැත්තකින්- දිගින් දිගටම සම්පූර්ණ මස් රාත්තලම ඉල්ලද්දි -බෙදුම්වාදය ගැනම කථා කරද්දි- මේ බලය බෙදීමේ කාරණය සම්බන්ධයෙන් සමහර අවස්ථාවල දකුණු ප්‍රදේශය නියෝජනය කරන දේශපාලන නායකයන් කථා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඉගෙන ගත් පාසල නියෝජනය කළ අපේ උගත් මිත්‍රයා; උදය ගම්මන්පිල මැතිතුමා ඊයේ ජනාධිපතිතුමා ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනය අහගෙන ඉන්න මේ ගරු සභාවේ හිටියේ නැති නිසා මේ කාරණය මා එතුමාට මතක් කර දෙන්න ඕනෑ. ජනාධිපතිතුමා ඊයේ ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 18වන පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

"පොලිස් බලතල සම්බන්ධයෙන් කිසිදු වෙනසක් සිදු වෙන්නේ නෑ."

එහි 20වන පිටුවේ තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

"මේ සියලු කරුණු සැලකිල්ලට ගනිමින් ඒකීය රාජ්‍යයක් තුළ උපරිම ලෙස බලය බෙදන්න අප බලාපොරොත්තු වෙනවා. නමුත් මම අවස්ථා ගණනාවකදී අවධාරණය කළ කරුණක් යළිත් මෙහිදී සඳහන් කරන්නට කැමැතියි. රට බෙදීමට හෝ බෙදීමට තුඩු දෙන හෝ කිසිදු පියවරක් අප ගන්නේ නැහැ."

ඒ කාරණය පැහැදිලිව තිබියදී නැවත වතාවක් එය උලුප්පමින් මේ රටේ හැම දාම කරන ඒ ජුගුප්සාජනක ක්‍රියාවලියම සිදු කරන්නේ ඇයි කියන කාරණය සම්බන්ධයෙන් අපට විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඇත්තටම මේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ සංවාදය තුළ නැවත වතාවක් ඒ ඊනියා දේශ ප්‍රේමීන්ට යම් අවස්ථාවක් ලැබුණාද කියන ප්‍රශ්නය අපට තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට ජන වරම දුන්නේ එක රටක්, එක නීතියක් හදන්න. තේසවලමෙයි නීතිය, මුස්ලිම් නීතිය, උඩරට නීතිය කියන සියල්ල අයින් කරලා, එක නීතියක් හදන්න තමයි අපිට ජන වරම දුන්නේ. හැබැයි, එදා -අපේ ආණ්ඩුව පැවති කාලයේ- අපිට ඒ කටයුත්ත කර ගන්න බැරිව ගියා. එදා ඔය ඊනියා දේශ ප්‍රේමීන් හිටියේ කොහේද? මුස්ලිම් නීතිය අනුව අදටත් අවුරුදු 18ට අඩු දරු-දැරියන් විවාහ කරනවා. අපිට ඒක යථාර්ථයක් කරන්නවත් ලැබුණේ නැහැ. ඒ නිසා කරුණාකරලා මේ කියන අසත්‍යය හැම දාම සමාජගත කරන්න හදන්න එපා. අදත් විපක්ෂය නියෝජනය කරන සමහර මන්ත්‍රීවරු පාර්ලිමේන්තුව වර්ජනය කරනවා. මා විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගෙන් අහන්න කැමැතියි, සාධනීය විපක්ෂයක නියම ක්‍රියාවලියද මේ සිද්ධ කරන්නේ කියලා. මොකක්ද මේ කරන්නේ? මේ සන්දර්භය තුළ මෙම කතිකාව ඇති කරලා අපිට විවාද කරන්න බැරිද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට හිතෙන හැටියට නම් මේ බොන තිත්ත බෙහෙත් ඇඟට ගුණයි කියලා ඒ අය දන්නවා. නමුත් ඒ අය අද වෙනකොට භය වෙලා ඉන්නවා. ප්‍රධාන මැතිවරණයක් එනකොට මේ තිත්ත බෙහෙත් බීලා ජනතාව කෙළින් කරලා, රට කෙළින් කරලා ගත්තාම ආපසු කවදාවත් තමන්ට බලය ගන්න බැරිවෙයි කියලා මේ අයට පොඩි සැකයක් තිබෙනවා. ඒ නිසා මේ අය උත්සාහ කරනවා, මොන යම් හෝ ක්‍රමයකට බලය ලබා ගන්න. මේ අයට තිබෙන්නේ හුදෙක් බලය ලබා ගැනීමේ අවශ්‍යතාව පමණයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා පැහැදිලිව මම කියා සිටිනවා, මේ වෙලාවේ අප සියලුදෙනාම එක්කහු වෙලා වෙනස් වෙන්න ඕනෑ බව. ඒක තමයි මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙන්නේ. මේ රටේ ජනතාව මැතිවරණයක් තියලා වෙනස් බල හුවමාරුවක් බලාපොරොත්තු වෙන්නේ නැහැ. ජනතාවට අද සියලුම දේශපාලනඥයෝ එපා වෙලා තිබෙන්නේ. ජනතාවගේ බලාපොරොත්තු ඉෂ්ට කරන්න නම්, අපි එක්කහු වෙන්න ඕනෑ. ඊළඟ වතාවේ පාර්ලිමේන්තුවේ ඉන්නවාද,

ඊළඟ වතාවේ අපට ඇමතිකම් ලැබෙයිද, ඊළඟ වතාවේ අපට පළාත් සභාව ලැබෙයිද කියන කාරණා නොවෙයි අපි බැලිය යුත්තේ. අපි මේ වෙලාවේ ගත යුතු තීන්දු-තීරණ ගත්තේ නැත්නම් අපට ජීවත් වෙන්න රටක් නැති වෙනවා. අපට අපේ දරුවන්ට නිවැරැදිව අධ්‍යාපනය ලබා දෙන්න, ඒ අධ්‍යාපන ක්‍රමය තුළ අවශ්‍ය පහසුකම් ලබා දීලා රට දියුණු කරන තත්ත්වයට ගෙන ඒමේ හැකියාව නැති වෙනවා, නැවත වතාවක් අපට අර ආර්ථික දුෂ්කරතාවලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා, ජනතාව බලාපොරොත්තු වෙන්නේ අපි ඔක්කෝම එක්කහු වෙලා වැඩ කරාවි කියලායි. හැබැයි, ජනතාව අද යම් ආකාරයකින් තේරුම් අරගෙන තිබෙනවා, ජනප්‍රිය තීන්දු-තීරණ එක්ක යනවාට වඩා මේ ගන්නා තීන්දු-තීරණ යම් ආකාරයකට සාධනීයයි කියන කාරණය. ඒ අය අද ස්වයං වෙනස් වීමකට භාජන වෙලා තිබෙන බව අපට පෙනෙනවා.

ආධාර ලබා දීම කියන කාරණය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති ප්‍රකාශනයේදී ගරු ජනාධිපතිතුමා පැහැදිලි කළා. ආධාර ලබා දීමේදී එම මුදල් බැංකුගත කිරීම ඉතාම සුදුසුයි කියා මම විශ්වාස කරනවා. මොකද, සමහර වෙලාවට දරුවෙකුට රෙදි කෑල්ලක් අරගෙන දෙනකොට, ඇඳුමක් ලබා දෙනකොට සමහර දේශපාලනඥයෝ අඳින branded කමිසයක වටිනාකම තරම් විශාල මුදලක් ඒකට වැයවෙලා තිබෙනවා. හැබැයි ඊට වඩා අපට ලෙහෙසියි, ඒ අයට මුදල් ලබා දුන්නා නම්. එසේ ආධාර ලබා දීමේදී ඒවා මිලදී ගන්නා ක්‍රමවේදයට, බෙදා හැරීමේ ක්‍රමවේදයට විශාල වශයෙන් මුදල් වැය වන නිසා අපට පුළුවන්, එම සහනාධාර බැංකුගත කරලා, බැංකුවකින් ලබා දීමේ ක්‍රමයක් ඇති කරන්න. එය විය යුතු දෙයක්. හුදෙක්ම මේ තිබෙන තත්ත්වය අපි තේරුම් ගන්න ඕනෑ. මේ බිමේ තිබෙන යථාර්ථය අපි තේරුම් ගන්න ඕනෑ. මිනිස්සුන්ට අවශ්‍ය වෙලා තිබෙන්නේ මැතිවරණයක්වත්, දේශපාලන බල හුවමාරුවක්වත්, තමන් කැමැති දේශපාලන පක්ෂයක් බලයට ගෙනෙන්නවත් නොවෙයි. මිනිස්සුන්ට අවශ්‍ය වෙලා තිබෙන්නේ තමන් එදිනෙදා මුහුණපාන ගැටලුවලින් මිදිලා මේ රට නිවැරැදි තැනකට ගෙන යන්න, මේ රට ලස්සන කරන්න, මේ රටට සංචාරකයෝ ගෙන්වලා කීයක් හරි හොයාගන්නයි. සංචාරකයෝ ලංකාවට එන මේ වෙලාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයයි, මේ කියන කාරණායි බොරුවට අරගෙන නැති උද්ඝෝෂණ ඇති කරලා ගැටුම්කාරී තත්ත්වයක් නිර්මාණය කරන්න එපා කියලා අපි ඉල්ලා සිටිනවා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා නම් ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න පුළුවන්, ගිහිල්ලා ඒ සම්බන්ධයෙන් කථා කරන්න පුළුවන්. මොකද, ශ්‍රේෂ්ඨාධිකරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සම්බන්ධයෙන් තීන්දු දී තිබෙන්නේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පස්සේ දිගින් දිගටම ඔය කියන, 'බලතල පාවිච්චි නොකිරීම මත' කියන කාරණය සලකා බලායි. අපි කවුරුත් දන්නවා, මේ කාරණය සම්බන්ධයෙන් ඕනෑම වෙලාවක උසාවියකට යන්න පුළුවන් කියලා. ඒ වාගේම දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රකාශිතව අච්චු ගහලා පොතේ තිබෙන වෙලාවක අසත්‍ය කරුණු උපයෝගි කර ගෙන, නැති භයක් ඇති කරලා මේ රටේ ජන මනස විකෘති කරන්න එපා කියන කාරණය මේ අවස්ථාවේ මම මතක් කරනවා. මේ වෙලාවේ පාට, පක්ෂවලට බෙදෙනවාට වඩා මාස හය හතක් අපි ඔක්කෝම එක්කහු වෙලා මේ රටේ ජනතාවට අවශ්‍ය සහන ලබා දෙන්න, ඒ අය ජීවත් කරන්න, ඒ අයගේ ජීවන තත්ත්වය නඟා සිටුවන්න අවශ්‍ය කටයුතු සිදු කරන්න ඕනෑය කියන කාරණය මේ අවස්ථාවේ පැහැදිලිව මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු නාලක ගොඩහේවා මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.56]

**ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා**
(மாண்புமிகு (கலாநிதி) நாலக்க கொடஹேவா)
(The Hon. (Dr.) Nalaka Godahewa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපතිතුමාගේ ජාතිය ඇමතීමේ තවත් කථාවක් අපි ඊයේ දැක්කා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතිය ඇමතීමේ තවත් කථාවක් කියලා මම කියන්නේ, අපේ ජනාධිපතිතුමාට නිතර නිතර ජාතිය අමතන්න පොඩි ආසාවක් තිබෙන නිසායි. මෙවර අගමැති වුණාට පසුව කීවැනි වතාවටද එතුමා මේ කථා කළේ කියලා මම දන්නේ නැහැ. නමුත්, එතුමා තුන් හතර වරක්ම කථා කළා. එතුමා ජනාධිපති වුණාට පසුවත් මාස හයක් ඇතුළත මේ දෙවැනි වතාවට තමයි අපි රාජාසන කථාවක් දැක්කේ. මේ වාගේම පුරුද්දක් මීට කලිනුත් - 2015-2019 කාලයේ- මෙතුමා අග්‍රාමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන කාලයේ අපි දැක්කා. ඒ කාලයේත් මාස හයකට වරක් එතුමා ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ඉදිරිපත් කළා. මට මතකයි, 2015-2019 කාලයේ එතුමා ප්‍රතිපත්ති ප්‍රකාශන 10ක් ඉදිරිපත් කළා. ඉංග්‍රීසි භාෂාවෙන් කියමනක් තිබෙනවා නේ, "If you want to predict the future, the best way is to analyse the past" කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! මේ අවස්ථාවේ කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெட்டகொட)
(The Hon. Jayantha Ketagoda)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. PREMNATH C. DOLAWATTE took the Chair.*

**ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා**
(மாண்புமிகு (கலாநிதி) நாலக்க கொடஹேவா)
(The Hon. (Dr.) Nalaka Godahewa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කිව්වේ, if you analyse somebody's past, you can predict the future කියලායි. ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ ආර්ථික කළමනාකරණයෙන් ඉදිරියේදී අපට බලාපොරොත්තු වෙන්න පුළුවන් මොකක්ද කියලා තේරුම් ගන්න අපි කරන්න ඕනෑ හොඳම දේ තමයි, එතුමා අවසානයට රාජ්‍ය පාලනය කරපු 2015-2019 කාලය ගැන පොඩ්ඩක් විග්‍රහ කර බලන එක. මම මෙන්න මේ කරුණ මතක් කරලා දෙන්නම්. 2015දී යහ පාලන ආණ්ඩුව බලයට එනකොට මේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 5.5ට තිබුණු බව අපට මතකයි. ප්‍රතිපත්ති ප්‍රකාශන 10ක් ඉදිරිපත් කරලා තිබියදී අවුරුදු 5ක් යනකොට මේ ආර්ථික වර්ධන වේගය සියයට 2.1ට කඩා වැටුණා. මේ කාලය තුළ රටේ ණය බර ට්‍රිලියන 7.4 සිට 13 දක්වා වැඩි වුණා. මේ කාලය තුළ තමයි ලංකා ඉතිහාසයේ වැඩිම ස්වෛරී බැඳුම්කර ප්‍රමාණයක් නිකුත් කළේ. බංකොලොත් වීම නිසා අද අපට ගෙවන්න බැරිව තිබෙන ණය ප්‍රමාණය වන ඩොලර් බිලියන 12.5ක මුදල ගත්තේත් මේ කාල සීමාව තුළයි. මේ ණය

[ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා]

ගෙවා ගන්න බැරි වුණේ ඇයි? සමහර අය කියනවා, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේදීත් ඩොලර් බිලියන 5ක් ණය ගත්තා, මේ ඔක්කෝම ණය එකතු වෙලා තමයි මේ තත්ත්වය ඇති වුණේ කියලා. හැබැයි, රටකට ණය ගෙවන්න සැලැස්මක් තිබෙනවා නම්, ණය ගත්තාට ප්‍රශ්නයක් නැහැ නේ. ඒ ණය ගෙවන්න නම් 2015-2019 කාලයේ මේ රටේ අපනයන ආදායම වර්ධනය විය යුතුව තිබුණා. නමුත්, කොහොමද අපනයන ආදායම වර්ධනය වුණේ? අවුරුදු 5ක් තුළදී අපේ අපනයන ආදායම වර්ධනය වුණේ ඇමෙරිකානු ඩොලර් බිලියන 11.1 සිට 11.9 දක්වා පමණයි. ඒ කියන්නේ, අවුරුදු 5ක කාලයක් තුළ මේ රටේ අපනයන ක්ෂේත්‍රයේ ආදායම වර්ධනය වෙලා තිබුණේ සියයට දශම අටයි හයකින්. ඒ කියන්නේ අවුරුද්දකට සියයට 1.44ක් වාගේ ප්‍රමාණයක් තමයි වර්ධනය වෙලා තිබුණේ. මෙන්න මේ හේතු නිසා තමයි අවසානයේදී මේ ණය ටික ගෙවාගන්න බැරිව මහා අර්බුදයකට මේ රට ගියේ.

රනිල් වික්‍රමසිංහ මහත්මයා එතුමාගේ රාජාසන කථාවේදී බොහොම උජාරුවට කියපු දෙයක් තමයි, මේ රටේ ඩොලර් සංචිත මිලියන 500කින් වැඩි කරගෙන තිබෙනවා කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩොලර් මිලියන 500ක් කියන්නේ විශාල මුදලක් නොවෙයි. ඒක ඉතාම සුළු මුදලක්. මේක, විශාල වශයෙන් වැඩි කර ගැනීමක් කියලා කයිවාරු ගහන්න දෙයක් නොවෙයි. මම මුලින් කිව්වා වාගේ, එතුමා අවසානයට රාජ්‍ය පාලනය කළ 2015-2019 කාලයේ -ඒ අවුරුදු 5 තුළ- මේ රටේ ඩොලර් සංචිත මිලියන 1,000කින් පහළට ගෙනාවා. මොකද, එතුමා බලයට එනකොට ඩොලර් බිලියන 8.3ක්ව තිබුණු සංචිත ප්‍රමාණය ඒ අවුරුදු 5 තුළ ඩොලර් බිලියන 7.1 දක්වා පහළ වැටුණා. කොහොමද, සංචිත පහළ වැටුණේ? විශ්වාස කරන්නත් බැරි තත්ත්වයක් යටතේ තමයි මේ සංචිත මේ විධියට පහළ වැටුණේ. මොකද, ඒ අවුරුදු 5 තුළ ඩොලර් බිලියන 12.5ක කෙටි කාලීන ණය අරගෙන තිබුණා. හම්බන්තොට වරාය විකුණලා ඩොලර් බිලියනයක් සොයාගෙන තිබුණා. එතකොට ඔක්කෝම ඩොලර් බිලියන 13.5යි, රට ඇතුළට ආපු -රට ඇතුළට මුදල් ආවා නම් පමණයි- මුදල. ඊට අමතරව ඒ වෙලාවේ රටේ තෙල් මිල විශාල වශයෙන් අඩු වුණා. 2010-2014 කාලයේ පැවැති ආණ්ඩුවට තිබුණු බරපතළ ප්‍රශ්නයක් තමයි, ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල ඉහළ යෑම. සාමාන්‍යයෙන් 2014 වර්ෂය වාගේ වෙනකොට තෙල් බැරලයක් තිබුණේ ඩොලර් 110ක් වාගේ මිලකට. 2015දී මේ මිල පුදුමාකාර විධියට කඩා වැටුණා. මට මතකයි, තෙල් බැරලයක මිල ඩොලර් 45ට කඩා වැටුණා. ඒ අවුරුදු 5 ගත්තාම සාමාන්‍යයෙන් තෙල් බැරලයක් ඩොලර් 60ක වාගේ මිලකටයි තිබුණේ. මේ කාලය තුළ තෙල්වලින් පමණක් ඉතිරි වුණු මුදල් ප්‍රමාණය ඩොලර් බිලියන 5ක්. මොකද, 2010-2014 කාලයේ තෙල්වලට ඩොලර් බිලියන 21ක් වියදම් කරලා තිබුණා. නමුත්, 2015-2019 කාලයේ තෙල්වලට වියදම් කරලා තිබුණේ ඩොලර් බිලියන 16යි. එහෙම නම් තව ඩොලර් බිලියන 5ක් ඉතිරි වෙලාත් තිබුණා. මම කියපු ඩොලර් බිලියන 13.5ට මේ ඩොලර් බිලියන 5ත් එකතු කරන්න ඕනෑ. එතකොට ඩොලර් බිලියන 18.5ක්. කොහේටද, ඒ සල්ලි ගියේ? ඒ සල්ලි ආ ගිය අතක් නැහැ. අන්තිමට සංචිතය ඩොලර් බිලියන 18.5කින් වැඩි වෙනවා වෙනුවට ඩොලර් මිලියන 1,000කින් අඩු වෙලා තිබුණා. ඒ නිසා අද මේ කථා කරන දේවල් ගැනත් අපට කියන්න තිබෙන්නේ ඒ දේම තමයි,

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද ක්‍රියාත්මක වෙන්නේ එදා ක්‍රියාත්මක වෙච්ච ආර්ථික ප්‍රතිපත්තියම තමයි. 2015-2019 කාලයේ ඒ ආර්ථික ප්‍රතිපත්තියේ යම් කිසි දෙයක් වැරදුණා නම්, ඒ දේවල් සියල්ල අද ඒ ආකාරයටම ක්‍රියාත්මක වෙනවා. වරද්දා ගත්ත දේවල් මොනවාද කියා බලන්න. බලයට ආපු ගමන් ඉස්සෙල්ලාම කළේ මොකක්ද? ඉස්සෙල්ලාම කළේ බදු වැඩි කරපු එක. ඒ කාලයේ බදු ප්‍රතිශතය තිබුණේ 9ක් වාගේ ප්‍රමාණයක්. ඒක වැඩි කළා. ඒක සියයට 16ට ගෙනියන්න ඕනෑ කියලා අද වාගේම වේගයෙන් බදු වැඩි කරගෙන ගියා. මට මතකයි, 2019 වර්ෂය වන විට ඇස්තමේන්තුගත බදු ප්‍රමාණය සියයට සියයකින් වැඩි වෙලා තිබුණු බව. හැබැයි, ඒ ආදායම ලැබුණේ නැහැ. මොකද, ආර්ථික විද්‍යාවේ පිළිගත් න්‍යායක් තමයි, බදු වැඩි කරන ප්‍රමාණයට ආදායම එන්නේ නැහැ කියන එක. බදු වැඩි කළාම ඇත්තටම ආදායම අඩු වෙනවා. මොකද, මිනිස්සු බදු ගෙවන්නේ නැතිව ආදායම හංගන්න පටන් ගන්නවා. ඉතින්, ඒක හරි ගියේ නැහැ.

ඒකෙන් පාඩමක් ඉගෙන ගත්තේ නැහැ. ආයෙත් ඇවිල්ලා ඒකම කරනවා; ආයෙත් බදු ගහනවා. අද මිනිස්සු පාරේ උද්ඝෝෂණය කරන්නේ මේ බදු ප්‍රතිපත්තියට විරුද්ධවයි. මහා පරිමාණයෙන් බදු පැනෙව්වාම රාජ්‍ය ආදායම වැඩි වෙයි කියලා හිතනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවුරුද්දේ ආදායම ලැබුණාම අපට දකින්න පුළුවන් වේවි, ඇස්තමේන්තුගත ආදායමින් සියයට 75ක්වත් ලැබෙන්නේ නැහැ කියලා. මේ විධියට බදු වැඩි කරලා ආදායම ලබා ගන්න බැහැ. ඊළඟට, ඒ ආණ්ඩුවේ පොලී අනුපාතය අරගෙන බලමු. single-digit අනුපාතයක් ලෙස තිබුණු පොලී අනුපාතය වැඩි කර ගත්තා. ඒක වැඩි කරන්න පටන් ගත්තේ මහ බැඳුම්කර මංකොල්ලයෙන්. අද කාටවත් ඒක මතක නැහැ. මෙතුමා නායකයා වෙලා හිටපු කාලයේ තමයි මහ බැඳුම්කර මංකොල්ලය සිද්ධ වුණේ. ඒ මහ බැඳුම්කර මංකොල්ලය නිසායි පොලී අනුපාතය වැඩි වුණේ. රජයේ ප්‍රතිපත්ති නිසා, මිනිස්සුන්ට ගත්ත ණය ගෙවා ගන්නත් බැරි විධියටයි පොලී අනුපාතය වැඩි වුණේ. ඒ නිසා ඔවුන්ට බිස්නස් එකක් කරගන්නත් බැරුව ගියා. ඒක ආර්ථිකය කඩා වැටීමට හේතු වුණා. අදත් කරන්නේ ඒකම නේ. අද තත්ත්වය ඊටත් වඩා බරපතළයි. අද පොලී අනුපාතය කීයද? සියයට 30ක් විතර වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සියයට 30ක පොලී අනුපාතයකට ණයක් අරගෙන බිස්නස් එකක් කරන්න පුළුවන් කාටද? ව්‍යාපාරයක් කරන්න පුළුවන් කාටද? අද ස්වයං රැකියා කරන පුද්ගලයෙකුට ස්වයං රැකියාවක් කරගන්නත්, සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරිකයාට ව්‍යාපාරයක් කරගන්නත්, මහා පරිමාණයේ ව්‍යාපාරිකයාට තමන්ගේ ව්‍යාපාර කරගන්නත් බැරි වෙලා තිබෙන්නේ මේ විශාල පොලී අනුපාතය නිසායි. මේවා වැරදි ආර්ථික ප්‍රතිපත්ති; අත්හදා බලා අසාර්ථක වෙච්ච ප්‍රතිපත්ති; මේ නායකයා යටතේම අසාර්ථක වෙච්ච ප්‍රතිපත්ති. ඒ ප්‍රතිපත්තිම නැවත නැවත ක්‍රියාත්මක කරමින් ඉන්නවා. මොන සුරංගනා කථා කිව්වත්, මාස හයකට වතාවක් මේ වාගේ පොතක් දුන්නා කියලා මේ රටේ ආර්ථිකය ගොඩ ගන්න බැහැ.

ඊළඟට ලස්සනම කථාව මේකයි. මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පුරාම තිබෙන්නේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ රජය විසින් කරපු දේවල් හාස්‍යයට ලක් කිරීම සහ අපහාසයට ලක් කිරීම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නායකයෝ කියනවා මේක ප්‍රශස්ත කථාවක් කියලා. අන්න ඒක නම් මට තේරෙන්නේ නැහැ. අපිත් ඒ ආණ්ඩුවේ හිටපු නිසා අපට නම් ඒක ඉවසන්න බැහැ. අපි දන්නේ නැහැ, මෙතුමන්ලා ආණ්ඩුව පැත්තේ ඉඳගෙන මේක ඉවසන්නේ කොහොමද කියලා.

ජනාධිපතිතුමා තවත් හොඳ කථාවක් කිව්වා. එතුමා කිව්වා, 'සොරකම් කළ වත්කම් යළි සොයා ගැනීමේ ප්‍රයත්නය' සම්බන්ධයෙන් පනතක් ගෙනෙනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකට නම් අපි අත් දෙකම ඔසවා සහයෝගය දෙනවා. අපි ඉල්ලා සිටිනවා, මාසයක් ඇතුළත පුළුවන් නම් මේ කටයුත්ත කරන්න කියලා. ඒ කටයුත්ත කරනවා නම් ඒකට අපේ

සම්පූර්ණ සහාය ලබා දෙනවා. ඇයි, ඒ කටයුත්ත නොකරන්නේ? මේවා කථාවට විතරක් කියන්න එපා. රනිල් වික්‍රමසිංහ මහත්මයාට මේ කියන කථා ඊළඟ රාජාසන කථාව වෙනකොට මතක නැති එකයි වැඩේ. අය වැය කථාවේදී කියපු ඒවා මතකද? අය වැය කථාවේදී කිව්වා, මේ රටේ බදු එකතු කරන ආයතන ප්‍රතිව්‍යුහගත කරනවා කියලා. ඒක තමයි ඉස්සෙල්ලාම කරන්න ඕනෑ, මේ රටේ අහිංසක මිනිස්සුන්ට බදු ගහන්න කලින්. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව ප්‍රතිව්‍යුහගත කරන්න. මේ ආයතන ප්‍රතිව්‍යුහගත කළා නම්, බදු වැඩි කරන්නේ නැතිව බදු ආදායම වැඩි කරගන්න පුළුවන් කියලා ඕනෑ කෙනෙක් දන්නවා. හැබැයි, දැන් ඒක මතක නැහැ. මාස දෙකක් යනකොට ඒ කථා මතක නැහැ. මේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ විහිළුවටවත් ඒක නැහැ. ඒක තමයි තිබෙන ප්‍රශ්නය.

මගේ කථාව අවසන් කරන්න කලින් තව කාරණාවක් කියන්න ඕනෑ. ජනාධිපතිතුමාගේ රාජාසන කථාවේ අලුතින්ම ආපු කථාව තමයි, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. අද මිනිස්සු පාරේ සටන් කරන්නේ කරුණු දෙකකට. එකක් තමයි, බදු වැඩි කිරීම. මම ඒ ගැන කථා කළා. දෙවෙනි එක, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීම. ඒ සම්බන්ධයෙන් අද ස්වාමීන් වහන්සේලා පාරට බැහැලා ඉන්නවා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හදිසියේ බලාත්මක කරන්න කියලා කවුද ඉල්ලුවේ? මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය 1987දී ගෙනාවාට පසුව මේ වනතුරු ජනාධිපතිවරු හත් දෙනෙක් පත් වුණා. අඩු ගානේ ඒ සංශෝධනය සම්මත කළ හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාවත් ක්‍රියාත්මක නොකළ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන් බලාත්මක කරන්නට මේ අනුප්‍රාප්තික ජනාධිපතිවරයාට තිබෙන හදිසිය මොකක්ද? කවුද එතුමාට බලය ලබා දුන්නේ? එතුමා වාඩි වෙලා ඉන්නේ ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ගත්ත ජන වරම උඩ. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා එදා ජන වරම ගන්න වෙලාවේ එතුමා මේ රටට පොරොන්දු වුණේ අලුත් ව්‍යවස්ථාවක් ගෙනෙනවා කියලායි. මේ රටේ සුළු ජාතික ප්‍රශ්නය විසඳන්න, මේ රටේ ජාතිවාදය නැති කරන්න, මේ රටේ සියලුදෙනාට සාධාරණ අලුත් ව්‍යවස්ථාවක් ගෙනෙනවා කියලා එතුමා කිව්වා. ඒකටයි බලය තිබෙන්නේ. ජන වරම තිබෙන්නේ අලුත් ව්‍යවස්ථාවකට මිස දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන් බලාත්මක කරන්න නොවෙයි. අනුප්‍රාප්තික ජනාධිපතිවරයෙක් යටතේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන සාකච්ඡාවක් මෙතැනට අවශ්‍ය නැහැ කියන එක අපි පැහැදිලිවම කියනවා. කරුණාකරලා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා පොරොන්දු වෙච්ච ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙනෙන්න. අපි ඒක ගැන විවාද කරමු. අපි ඒක ගැන සාකච්ඡා කරලා බලමු, ඒකෙන් යම්කිසි කෙනෙකුට සාධාරණයක් වෙනවාද කියලා. අසාධාරණයක් වෙනවා නම් ඒ අසාධාරණයට විරුද්ධව අපි ඔක්කෝම නැඟී සිටිමු. ඒකයි කළ යුත්තේ කියන කාරණය අපි මතක් කර සිටිනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම අවසාන වශයෙන් කියන්නේ, පැහැදිලිවම මේ රාජාසන කථාව තවත් එක් බොරුවක්. එතුමා තව මාස හයක් හිටියොත් අපට ආයෙත් රාජාසන කථාවක් අහන්න ලැබේවි. ඊට පස්සේ, තවත් මාස හයක් හිටියොත් ආයෙත් රාජාසන කථාවක් අහන්න ලැබේවි. මාස හයෙන් හයට රාජාසන කථා ඉදිරිපත් කළා කියලා මේ රට ගොඩ ගන්න බැහැ. මේ රට ගොඩ ගන්නට නම් කරුණාකරලා මේ ආර්ථිකය සක්‍රිය කරන්න; මේ ආර්ථිකය සක්‍රිය කරන්න අවශ්‍ය ව්‍යවසායකයෝ ශක්තිමත් කරන්න. මේ රටට අවශ්‍ය ප්‍රාග්ධන වෙළෙඳ පොළ ශක්තිමත් කරන්න, මේ රට ඩිජිටල්කරණය කරන්න. සුරංගනා කථා කිය- කියා ඉන්නේ නැතුව කරනවා නම් මේ රටේ කරන්න ඕනෑ තරම් දේවල් තිබෙනවා. බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.06]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ දවසේ ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය ආරම්භ කළා. එතුමා මේ පාර්ලිමේන්තුවේදී රාජාසන කථාව කරමින් රටේ ජනතාවට එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා බුද්ධිමත් නීතිඥ මහත්මයෙක්. මෙවර පාර්ලිමේන්තුවට පත් වුණු තරුණ මන්ත්‍රීවරයෙක් හැටියට ඔබතුමා දන්නවා, අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයෙකුට පැවරෙන බලතල අනුව ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා ඊයේ දිනයේ මේ පාර්ලිමේන්තුව නව සැසිවාරයකින් ආරම්භ කළ බව. මේ වෙලාව රටටත්, ජනතාවටත්, දේශපාලනය කරන අපටත් ඉතාම අසීරු අවස්ථාවක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ආර්ථික වශයෙන් බරපතළ අර්බුදයකට අප මුහුණ දීලා තිබෙන අවස්ථාවක්. එවැනි වෙලාවක මේ ඉදිරිපත් කරපු රාජාසන කථාව දිහා බැලුවාම මේක ඇත්තක්. හැබැයි, මේක තිත්තයි. සාමාන්‍යයෙන් තිත්ත බෙහෙත් බොන්න කවුරුත් කැමැති නැහැ. හැබැයි, අමාරුවෙන් හරි බිව්වොත් ලෙඩේ හොඳ කර ගන්න පුළුවන්.

මට කලින් වියත් මහ වෙනුවෙන් මන්ත්‍රීවරයෙක් කථා කළා. ගෝඨාභය මැතිතුමා බලයට ගෙනාවා කියලා කියන වියතෙක් කථා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, මේ උත්තරීතර පාර්ලිමේන්තුව මන්ත්‍රීවරු 225දෙනෙක් නියෝජනය කරන බව. මහජනතාවගේ ඡන්දයෙන්, ජාතික ලැයිස්තුවෙන් පත්වෙලා ඇවිල්ලා මන්ත්‍රීවරු 225දෙනෙක් තමයි පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ. මේ පාර්ලිමේන්තුවේ දීර්ඝ කාලයක් හිටපු මන්ත්‍රීවරයෙක් හැටියට මම නම් දන්නවා යම් යම් කාරණා ගැන. සාමාන්‍යයෙන් රාජාසන කථාවක් කරලා පාර්ලිමේන්තු සභාවාරයක් ආරම්භ කරනකොට විපක්ෂයට අයිතියක් තිබෙනවා, ඒ දවසට තමන්ගේ අකමැත්ත ප්‍රකාශ කරන්න ඕනෑ නම්, ඒ වාගේම තමන්ට ඒ සම්බන්ධයෙන් රටේ ජනතාවට පණිවුඩයක් දෙන්න ඕනෑ නම් එය කරන්න. හැබැයි, එය කරන ක්‍රමයක් තිබෙනවා. මොකද, අපිත් විපක්ෂයේ ඉඳලා තිබෙනවා, මහින්ද රාජපක්ෂ විපක්ෂ නායකවරයා යටතේ. අපි එය කරපු ක්‍රමවේදයක් තිබුණා. අපි පාර්ලිමේන්තුවට එන්නේ නැහැ. අපි දැක්කා, ඊයේ විපක්ෂ නායකවරයා පාර්ලිමේන්තුවට ආවේ නැහැ. ඒ, සමගි ජන බලවේගයේ ප්‍රතිපත්තිය. ඊට පස්සේ අපි දැක්කා, අර වියතුන් කියලා කියාගත්තු කට්ටිය,- *[බාධා කිරීමක්]* ඉස්සර මේක ඇතුළේ ටොයියොයි බයියොයි කියලා දෙගොල්ලක් හිටියා. දැන් ඉන්නවා, ටොයියොයි බයියොයි කලවම් වෙලා. දැන් හොයා ගන්න බැහැ ටොයියා කොහේද, බයියා කොහේද කියලා. මේ ටොයියොයි බයියොයි දෙගොල්ලන් එක්කහු වෙලා ඊයේ රාජාසන කථාව කරන්න ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට එනකොට එකපාරටම කිව්වා, ජනාධිපතිතුමාට රාජාසන කථාව කරන්න මේනියාවක් තිබෙනවා කියලා; ඒ වාගේම "හූ" කියලා මොන්ටිසෝරියක හැසිරෙන විලාසය පෙන්වා සභා ගැබෙන් පිටවෙලා ගියා. ඒකේ හිටියා, ටොයියෝ, බයියෝ, වියත්තු කියන ඔක්කෝම. මම ඕකට එක දෙයක්

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

අතීතයෙන් මතක් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජාසන කථාව කරන්න ජනාධිපතිතුමා එන වෙලාවේදී මේ විධියට අපි නැඟිටලා යමුයි කියන යෝජනාව කළේ ඔය කණ්ඩායම නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. එක මන්ත්‍රීවරයෙක් තමයි ඔය කණ්ඩායමට ඔය යෝජනාව ගෙනාවේ. එතුමා යෝජනාව ගෙනැල්ලා කිව්වා, අපි හොඳ සෙල්ලමක් දාමු; මෝඩ වුන් එකක් කරමු කියලා. එහෙම කිව්වාම එයාගේ මෝඩ වුන් එක අර ටොයියෝ ටිකයි, බයියෝ ටිකයි පිළිගත්තා. හැබැයි, ඒ මෝඩ වුන් එක කරපු කෙනා ඉතිහාසයේ කරපු දෙයක් ගැන මම ඔබතුමාට මතක් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට මතක් කරන්න වෙනවා ඔබතුමාගේ කොළඹ දිස්ත්‍රික්කයේ 2015දී තිබුණු රැලිය ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කොළඹින් තමයි තරග කළේ. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, මහින්ද රාජපක්ෂ මැතිතුමාත් 2015 ජනවාරි 08වන දා පැවති ජනාධිපතිවරණයට ඉදිරිපත් වුණා. ඒ ජනාධිපතිවරණයේ අවසාන රැලිය මහරගම තිබුණේ. මහින්ද රාජපක්ෂ මැතිතුමා දිනවන අවසාන රැලිය තිබුණේ මහරගම. ඊයේ ඔය විධියට කියපු මන්ත්‍රීවරයා එදා මහරගම රැලියේ කොහොමද කථා කළේ? ඔය මන්ත්‍රීවරයා හොඳ කථිකයෙක්. වෙන මොනවා නැතත් හොඳ කථිකයෙක්. රම්පෙට පොරි හැලෙන්න දෙන්න පුළුවන්. රම්පෙට පොරි හැලෙන්න දෙන්න පුළුවන් හින්දා ඔය කථිකයා මහරගම වේදිකාවේ කථා කළා. එතුමා කොහොමද කථා කළේ? අන්තිම රැලියේදී එතුමා කළ කථාව ඔන්න අහගන්න. "කෝ, මේ සිරිසේනයා; අනේ! සිරිසේනයා කොහේද ඉන්නේ; මේකා පුටුවක් යට රිංගාගෙනද ඉන්නේ; වර සිරිසේනයෝ." ඔන්න කථා කරපු විධිය. මම වේදිකාව පහළ හිටියේ. ඒ වෙලාවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රැස්වීම් සංවිධානය කරන වගකීම මටයි පැවරිලා තිබුණේ. මම දැන ගත්තා, අනිවාර්යයෙන්ම මෛත්‍රීපාල මැතිතුමා ජනාධිපතිවරයා වෙනවා කියලා.

මම දැන ගත්තා, ඒක. කොළඹ දිස්ත්‍රික්කයේ තිබුණු ඒ රැලිය සජීවීව මාධ්‍ය හරහා රටටම පෙන්වනවා අපි දැක්කා. ඒ වාගේම සමාජ මාධ්‍ය හරහා එය ප්‍රචාරය වුණා. එතුමා පොළොන්නරුවට ගිහිල්ලා ජනාධිපති අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට නොලැබෙන ඡන්ද ටික අරගෙන දුන්නා. එතුමා ඡන්ද දෙලක්ෂ ගණනකින් නේ ජයග්‍රහණය කළේ. ඔන්න! මෝඩ වුන් දීපු හැටි. එහෙම කටයුතු කළ කණ්ඩායම ඊයේ ජනාධිපතිතුමා ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනයට විරුද්ධ වෙලා මේ ගරු සභාවෙන් ඉවත් වෙලා ගියා. අද ඇවිල්ලා ඒ ගැන කථා කරනවා.

මට ඉස්සෙල්ලා කථා කරපු වියත්මඟින් ආපු මහත්මයා ගැන කිව්වොත්, එතුමා මොකද කළේ? තව උදාහරණ තිබෙනවා. මම මේ කියන්නේ දේශපාලන ඉතිහාසයත් එක්ක කරුණු කාරණා අරගෙන. පාර්ලිමේන්තුවට, පළාත් සභාවට, ප්‍රාදේශීය සභාවට යනාදී වශයෙන් ආයතන තුනකටයි මහජන නියෝජිතයෝ පත් වෙන්නේ. මේ ආයතන තුනට මහජන නියෝජිතයෝ පත් වනකොට එක එක දේශපාලන රැලි තිබෙනවා. කාලයෙන් කාලයට එක එක රැලි එනවා. ඒ වාගේ ආපු එක රැල්ලක් මම කියන්නම්. මේ, මෑත යුගයේ ආපු රැල්ලක්. අපට ඒවා මතකයි. 2004දී අපි සන්ධානයක් හදා ගත්තා. කා එක්කද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි, ජනතා විමුක්ති පෙරමුණයි අතර සන්ධානයක් හදා ගත්තා. අපි සන්ධානය හදා ගෙන මාතර ඉඳන් කොළඹට පා ගමනින් ආවා. එතකොට අපි, අනුර කුමාරලා, සුනිල් හඳුන්නෙත්තිලා, ලාල් කාන්තලා එක්ක කරට අත දා ගෙන රතු කොඩි, නිල් කොඩි වනමින් ආවා. 2004දී අපි මැතිවරණයට ඉදිරිපත් වුණා. එවකට චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය තමයි ජනාධිපතිතුමිය හැටියට හිටියේ. මොකක්ද ඒ වෙලාවේ ආපු රැල්ල? හැම දිස්ත්‍රික්කයකම ජනතා විමුක්ති පෙරමුණෙන් මන්ත්‍රීවරු තේරී පත් වුණා. හතළිස් දෙදෙනකු මන්ත්‍රීවරු විධියට පත් වුණා. වෙන දා නම් අපේ දිස්ත්‍රික්කවල අපි මනාප ඡන්දවලින් පළමුවෙනියා, දෙවැනියා. ඒ වතාවේ අපි හතරවෙනියා, පස්වෙනියා වුණා.ඇයි ඒ? මනාපවලින් පළමු, දෙවන, තුන්වන ස්ථාන ලබා ගත්තේ ජනතා විමුක්ති පෙරමුණේ අය. අන්න! රැල්ල. මම කිව්වා නේ, දේශපාලන රැලි එනවා කියලා. අන්න! රැල්ල ආවා. ඊට පස්සේ ඊළඟ මැතිවරණය ආවා. ඒ මැතිවරණයේදී ජනතා විමුක්ති පෙරමුණෙන් පත් වුණේ කී දෙනා ද? තුන්දෙනායි. මන්ත්‍රීවරු හතළිස් දෙක, මන්ත්‍රීවරු තුනක් දක්වා අඩු වුණා. රැල්ල ඉවරයි. හතු පිපුණා, හතු පර වුණා. ඒ ආකාරයට තවත් රැලි තිබුණා. එක කාලෙක නළු-නිළි රැලි තිබුණා. මේ පාර්ලිමේන්තුවට තේරී පත්වන මැතිවරණයේදී නළු-නිළි රැලි තිබුණා. ඒ නළු-නිළි රැල්ලත් ඒ වාගේයි. නළු-නිළියෝ එක පාරට ආවා. ඉහළින් තිබ්බා. ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ ගරු නලින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගේ දිස්ත්‍රික්කයේත් නිළියක් තමයි පළමුවෙනියා වුණේ. කරු ජයසූරිය මහත්මයා දෙවැනියා. දෙයියාමුදුරුවනේ! වෙච්ච දේ. ඊළඟ පාර නිළියත් නැහැ, නළුවාත් නැහැ. අන්තිමට බලන ප්‍රේක්ෂකයොත් නැහැ. ඒ රැල්ලත් ඉවරයි. ඒ වාගේම තමයි, යුද්ධය අවසන් කළාට පස්සේ මැතිවරණයට රණ විරුවෝ ඉදිරිපත් කළා. මම මේ රණ විරුවන්ට අපහාසයක් කරනවා නොවෙයි. රණ විරුවෝ මැතිවරණයට ඉදිරිපත් කළා. රණ විරුවන්ටත් ඒ වාගේම රැල්ලක් ආවා. ඒ රැල්ලත් ඊළඟ සැරේම ඉවරයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට වියත්තු ආවා. ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා එක්ක එකතු වෙලා වියත්තු ආවා. හැම දිස්ත්‍රික්කයකින්ම ආවා. වියත්තු හොඳ දේවල් ටිකකුත් කළා. මට කලින් කථා කළ වියත්මඟේ මහත්මයා තමයි ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ ආණ්ඩුවේ සභාපතිවරු පත් කළේ. දැන් ඒ මහත්මයාගෙන් ඒ පැටිකිරිය ඇහුවා නම් කොහොමද? අහවල් ගෑස් සමාගමට සභාපති පත් කළේ ඔබ ද, සතොසට සභාපති පත් කළේ ඔබ ද, ශ්‍රී ලන්කන් ගුවන් සේවා සමාගමට සභාපති පත් කළේ ඔබ ද, වරායට සභාපති පත් කළේ ඔබ ද, ලේක්හවුස් එකට සභාපති පත් කළේ ඔබ ද කියලා ඒ මහත්මයාගෙන් ඇහුවා නම්, "ඔව්" කියාවි. නමුත්, එතුමන්ලා ඒ වැඩේ හරියට කර තිබෙනවාද? එතුමා කැඩපතක් ගාවට ගිහිල්ලා ඒක ඇහුවා නම්, ඇඳුම ඇඳ ගෙන ඉන්න බැරි වෙනවා. ඒක මතක තියා ගන්න.

මම කියපු ජේවීපී රැල්ල, නළු නිළි රැල්ල, රණ විරු රැල්ල විතරක් නොවෙයි, තවත් රැල්ලක් තිබුණා. ඒ තමයි, ස්වාමීන් වහන්සේලාගේ රැල්ල. එහෙම රැල්ලකුත් තිබුණා. සිවුරු කඩාගෙන එදා මර්වින් සිල්වා මහත්මයා එක්ක නටපු රැල්ලකුත් තිබුණා. ඒ රැල්ලත් අවසන් වුණා. මතක තියා ගන්න, ඒ රැලි ඔක්කෝම යට ගියා වාගේ මේ "වියත් මඟ" රැල්ලත් ඊළඟ පාර්ලිමේන්තුවේ නැහැ කියන එක. ඒවා ලියවෙනවා නේ. මේකයි ඇත්ත කථාව.

ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ එක් තැනක මෙසේ සඳහන් වෙනවා:

> "..මතක තබා ගන්න, මට අවශ්‍ය ජනප්‍රිය වෙන්න නෙවෙයි. මට අවශ්‍ය මේ රට වැටී ඇති අර්බුදකාරී තත්ත්වයෙන් යළි ගොඩනංවන්නයි. ඔව්, මම රට වෙනුවෙන් ජනප්‍රිය නොවන තීරණ ගන්නවා. එම තීරණවල වැදගත්කම තව අවුරුදු දෙක තුනකින් බොහෝ දෙනෙකුට අවබෝධ වේවි"

මේකයි ඇත්ත කථාව. බොහෝ අයට ජනප්‍රිය තීන්දු ගන්න පුළුවන්. ඊයෙත් මේ ගරු සභාවෙන් එළියට ගිහිල්ලා සමහරු මෝඩ වුන් එකක් ගත්තා. ඒක ජනප්‍රිය තීන්දුවක්. ඒ කාටද? ඒක මිනිස්සුන්ගේ ඔළුවලට දේශපාලන වශයෙන් රිංගන්න පුළුවන් ක්‍රමවේදයක්.

දැන් ඒ එක්කම අල්ලා ගන්නවා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1987දී මේ හරහා පළාත් සභා ක්‍රමය ගෙනැල්ලා, දැනට අවුරුදු 35කට වැඩි කාලයක් වෙනවා. දැනට පළාත් සභා තිබෙනවා. නමුත්, පළාත් සභාව නියෝජනය කරන්න මහජන නියෝජිතයෝ නැහැ. හැබැයි, පළාත් සභා තිබෙනවා.

දැන් මේ විරුද්ධ කථා කරපු හුඟක් අය පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරු, ඇමතිවරු. එහෙම නම් කරුණාකර මුළු පළාත් සභා ක්‍රමයම අහෝසි කරන්න. පළාත් සභා තිබෙනවා. රාජ්‍ය නිලධාරින් ඒවා මෙහෙයවනවා. අද පළාත් සභා ආණ්ඩුකාරවරුන්ගේ තනි අතට ගිය බුද්ධලයක් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙනදා මහ ඇමතිවරයකු, ඇමතිවරු හතරදෙනකු ඇතුළුව ආණ්ඩු පක්ෂය, විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු ජනතාවට සේවය කළ පළාත් සභාව අද ආණ්ඩුකාරවරයකුට දීලා තිබෙනවා. දැන් මොකක්ද සිද්ධ වෙන්නේ? ඒ ආණ්ඩුකාරවරුන්ගෙන් අපි බලාපොරොත්තු වෙන දේ සිද්ධ වෙනවාද? නැහැ. වෙනමම නිලධාරින් එක්ක සම්බන්ධ වුණු, නිලධාරි වාදයක් එක්ක තනි ආණ්ඩුකාරවරයකු නටවන වැඩ පිළිවෙළක් තමයි අද ක්‍රියාත්මක වෙන්නේ.

දැන් කියනවා, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජනාධිපතිතුමා පැහැදිලිවම කිව්වා, පොලිස් බලතලවල කිසිම වෙනසක් කරන්නේ නැහැ කියලා. ඔබතුමාත් දැන් කිව්වා පොලිස් බලතලවල කිසි වෙනසක් කරන්නේ නැහැ කියලා. මේකේ පැහැදිලි ලෙස කියන දේ පිළිගන්නේ නැතුව, මොකක්ද මේ කරන්නේ? ඉඩම් බලතල ගැන කියනවා පැහැදිලිව. එහෙම නම් දැන් පළාත් සභා ක්‍රියාත්මක වෙනවා නේ. මොකක්ද මේ කියන්නේ? දැන් බලනවා, මොනවා හරි දේශපාලන මාතෘකාවක් අතට ගන්න; පාරට බහින්න ක්‍රමවේදයක් හොයා ගන්න. මොකද, පාරට බහින මේ හුඟක් අයට වාසි තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යම් ආගමික නායකයකු වෙන්න පුළුවන්, යම් ස්වේච්ඡා සංවිධානයක් වෙන්න පුළුවන්, යම් වෘත්තීය සමිතියක් වෙන්න පුළුවන්, පාරට බහින අයට වාසි තිබෙනවා. ඒ වාසි එක්ක තමයි, මේ සියල්ල ක්‍රියාත්මක වෙන්නේ. ඒ වාසි එක්ක තමයි, ඒ ගොල්ලෝ ඉදිරියට යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මෙම සභාවේ විපක්ෂයේ මන්ත්‍රීවරු නොහිටියත්, ඔවුන්ගෙන් පොඩි කරුණු පැහැදිලි කර ගැනීමක් කර ගන්න මට අවශ්‍යයි. කොහොමද මේ අසීරු ගමන යන්නේ, ආර්ථිකය උඩට ගන්නේ කොහොමද කියන එක ගරු ජනාධිපතිතුමා මේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළින් පැහැදිලි කර තිබෙනවා. විශේෂයෙන් මම කිව්වා මේ අරගෙන තිබෙන්නේ ජනප්‍රිය තීන්දු නොවෙයි කියලා. ඔබතුමාවත්, මමවත්, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ අනෙක් කෙනෙකුවත් කැමැති නැහැ, මේ බදු බර මිනිස්සුන්ට එකතු කරනවාට, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. උපයන විට ගෙවීමේ බද්ද අය කරනවාට අපි කවුරුත් කැමැති නැහැ. මිනිස්සුන්ට ජීවත් වෙන්න අමාරුයි. ඒක ඉතාම පැහැදිලියි. හැබැයි, අපිට ඒ දේවල් කරන්න සිදුවෙලා තිබෙනවා.

විදුලිය කප්පාදු කරනවාට අපි අකැමැතියි. තෙල් මිල වැඩි කරනවාට අපි අකැමැතියි. බඩු මිල අඩුවෙන්න ඕනෑ, තෙල් මිල අඩු වෙන්න ඕනෑ, රාජ්‍ය සේවකයාගේ වැටුප් වැඩිවෙන්න ඕනෑ. අපි කැමැති දේවල් ඒවා. හැබැයි මේ දේවල් කරගන්න බැහැ, මේ තිබෙන ආර්ථික තත්ත්වය මත. මම විපක්ෂ නායකතුමාට -සජිත් ප්‍රේමදාස මැතිතුමාට- කියනවා, ඔබතුමා තැන් තැන්වල රැස්වීම් තියලා කෑ මොර දීගෙන කථා කරනවා වාගේම තමුන්නාන්සේගේ වැඩ පිළිවෙළ මොකක්ද කියලා අපට ඉදිරිපත් කරන්න කියලා. "2024 වසරේදී මට මේ රටේ නායකත්වය දෙනවා නම්, රාජ්‍ය සේවකයන්ගේ වැටුප මම වැඩි කරනවා. ඔවුන්ගෙන් උපයන විට බදු අය කිරීම නතර කරනවා. රාජ්‍ය සේවය කප්පාදු කරන්නේ නැහැ. ඒ වාගේම එක මොහොතකටවත් මම මේ රටේ විදුලිය කපන්නේ නැහැ. මම තෙල් ටික හරි වෙලාවට දෙනවා. මම මේ රටේ පොලී අනුපාතය අඩු කරනවා" කියලා සහතිකයක් දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සහතිකය දෙන්න කියන්න එතුමාට. එතුමාට විතරක් නොවෙයි, අනුර කුමාර දිසානායක මැතිතුමාටත් -ජනතා විමුක්ති පෙරමුණේ නායකයාටත්- මම ඒක කියනවා. ඒ වාගේම, මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා, ඩලස් අලහප්පෙරුම මැතිතුමා සහ තිස්දෙනකුගෙන් සැදුම්ලත් "හෙලිකොප්ටරය" ලාංඡනය සහිත කණ්ඩායමේ අයටත් මම කියනවා, කරුණාකරලා ඒ සහතිකය අපට ඉදිරිපත් කරන්න, මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා. "අපි රට භාර ගන්නවා. අපි රට භාර ගත්තාම මෙන්න මේ ක්‍රමවේදය අපි ක්‍රියාත්මක කරනවා. මෙන්න, අපේ වැඩ පිළිවෙළ" කියලා ඉදිරිපත් කරන්න කියන්න. ඒ වාගේම මේවාට සල්ලි හොයා ගන්නේ කොහොමද, විදේශ විනිමය; විදේශ සංචිත වැඩි කරගන්නේ කොහොමද කියන එකත් අපිට කියන්න ඕනෑ. ඒවා හරියට කිව්වොත්, මූලාසනයේ ඉන්න ඔබතුමාත්, මේ කථා කරන, දේශපාලනයේ එක තැනක ඉන්න මමත් වෙනස් වෙන්න පුළුවන්. මොකද, දේශපාලනයේ සදාකාලික මිතුරෝත් නැත, සදාකාලික හතුරෝත් නැත. ඒ නිසා රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා මේ කියන ක්‍රමවේදය නොවෙයි මේ සඳහා තිබෙන ක්‍රමය කියලා මේ අය කියනවා නම්, "අපි ළඟ තිබෙනවා සල්ලි හොයන ක්‍රම. අපි ළඟ මේ වාගේ වැඩ පිළිවෙළක් තිබෙනවා" කියලා පෙන්වන්න ඕනෑ; අපි වැඩ කරන විධිය මෙන්න මේකයි කියලා පෙන්වන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නොවුණොත් අපි මේ ඉන්න තැනෙනුත් පල්ලමට වැටෙන බව මතක තබාගන්න. මොකද, වැඩ පිළිවෙළක් නැහැ; ක්‍රමවේදයක් නැහැ. හැම දාම එකම දේ කියව කියවා ඉන්න, හැම දාම කරන්න බැරි දේ කියන ක්‍රමයක් බවට මේක පරිවර්තනය වෙනවා. පාර්ලිමේන්තුවේ ඉන්න සමහර පක්ෂවල අය හුඟක් වෙලාවට ගොඩ ඉඳගෙන පීනන්න උගන්වනවා. එවැනි අය අපි දැකලා තිබෙනවා. පීනන්න පුරුදු වෙන්න වතුරට දාපු කෙනාට කියනවා, "පුතේ, මෙන්න මෙහෙම පීනපන්" කියලා. හැබැයි පීනන්න උගන්වන කෙනා ඉන්නේ, ගොඩ. ගොඩ ඉඳගෙන කියනවා, "අත ගන්න ඕනෑ ඔය විධියට නොවෙයි, ඉස්සරහට ගන්න. කකුල් දෙකෙන් හරියට වතුර තල්ලු කරන්න ඕනෑ. එතකොට හොඳට පීනන්න පුළුවන්" කියලා. වැරදිලාවත් කවුරු හෝ ඇවිත් ඒ පුහුණුකරු තල්ලු කළොත් ඔහු ගිලිලා මැරෙනවා. මොකද, ඔහු කවදාවත් පීනපු කෙනෙක් නොවෙයි.

ගරු සරත් වීරසේකර මැතිතුමනි, ඔබතුමාත් මමත් හිටපු කැබිනට් මණ්ඩලයේ හිටපු බලශක්ති ඇමතිවරයා අද කථා කළා. එතුමා අද මේ ගරු සභාවේ ධර්ම දේශනාවක් කරනවා වාගේ ලොකු දේශනාවක් කරනවා මම දැක්කා. ඒ, ආර්ථිකය ගැනයි. මම එතුමාගෙන් අහනවා, ආර්ථිකය ගැන දේශනා කරන ඔබතුමාට අර කංචන විජේසේකර කියන ළාබාල, තරුණ ඇමතිවරයාට හොයා ගන්න පුළුවන් වුණ QR code ක්‍රමය හොයා ගන්න බැරි වුණේ ඇයි කියලා. තරුණ, ළාබාල ඇමතිවරයා QR code ක්‍රමය හොයා ගත්තා. තෙල් එනවා නම්, බෙදා දෙන්න quota එකක් හදා ගන්න ඕනෑ. තරුණ ඇමතිවරයා ඒ ක්‍රමය හදාගෙන තෙල් බෙදා දීමට විසඳුමක් දුන්නා නම්, ඇයි ඒ මහෞෂධ පණ්ඩිතයා වාගේ කෙනාට එය බැරි වුණේ? ඇයි ඒ? පණ්ඩිතයාට ඒදණ්ඩේ යන්න පුළුවන්ද? බැහැ නේ. පණ්ඩිතයාට පාලම්වල යා හැකියි. පණ්ඩිතයාට ඒදණ්ඩේ යන්න බැහැ. ඒ ගොල්ලෝ හැම දාම කථාකාරයෝ විතරයි. ඒ ගොල්ලෝ ළඟ විසිල් තිබෙනවා; බල්ටි නැහැ. එහෙම කණ්ඩායමක්, ඒ. අපි එතුමන්ලාට කියනවා, පුළුවන් නම් මේ අභියෝගය ජයග්‍රහණය කරන්න කියලා.

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට අපි ගනිමු පළාත් පාලන මැතිවරණය. ඔබතුමා ඇතුළු මේ අපි ඔක්කෝම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ. ඒ අපේ පක්ෂය. අපේ පක්ෂයේ නායකයා, මහින්ද රාජපක්ෂ මැතිතුමා. අපි මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය යටතේ මේ රටේ තිබෙන පළාත් පාලන ආයතනවලින් 255කට පොහොට්ටුව ලකුණ යටතේ නාම යෝජනා භාර දුන්නා. අප සමඟ සන්ධානගත වෙච්ච තවත් පක්ෂ එක්ක ඒකාබද්ධව වෙනත් ලාංඡන යටතේත් උතුරේත්, නැඟෙනහිරත්, තවත් පළාත්වලටත් අදාළව අපි නාම යෝජනා භාර දුන්නා. අපි ලෑස්තියි. අපි ඡන්දයට ලෑස්තියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ජය, පරාජය ලබා දීම ජනතාවගේ අතේ තිබෙන්නේ. නමුත්, රටේ ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන්න ඕනෑ. අපි ලෑස්තියි. අපි නාම යොජනා භාර දීලා, දේශපාලන කටයුතු සියල්ල ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. මේ වනකොට අපි හැම දිස්ත්‍රික්කයකම ඉන්න දිස්ත්‍රික් නියෝජිතයන් කැඳවා, අවශ්‍ය කටයුතු කරනවා. අපි මැතිවරණයට ලෑස්තියි. අපි බයවෙලා, මැතිවරණ හකුළන මිනිසුන් නොවෙයි. අපි බයවෙලා, පස්සට යන මිනිසුන් නොවෙයි. අපි අභියෝගය භාර ගන්න ලෑස්තියි. ගරු ජනාධිපතිතුමා අභියෝගාත්මක ගමනක් යනකොට, ආණ්ඩුව කරගෙන යන ප්‍රධාන පක්ෂය හැටියට, ආණ්ඩුවේ ඉන්න ප්‍රධාන පක්ෂය හැටියට අප කියන්නේ, "මැතිවරණය පවත්වන්න. මැතිවරණයට ඉදිරිපත් වෙන්න අපි ලෑස්තියි. මැතිවරණයට ඉදිරිපත් වෙලා ජනතාවගේ මතය අහන්න අපි ලෑස්තියි." කියලා. අපට පෙනෙනවා, දැන් එක එක රැලි එන බව. ඒ, රැලි එයි. හැබැයි, ආවාට වැඩි වේගයෙන් ආපහු යයි. නමුත්, පොළවේ පය ගහන දේශපාලනයක් කරන්න පුළුවන් වෙන්න ඕනෑ. මිනිසුන්ගේ හෘද ස්පන්දනය හඳුනන දේශපාලනයක් කරන්න පුරුදු වෙන්න ඕනෑ. මිනිසුන්ගේ හදවත හඳුනා ගන්න ඕනෑ. මිනිසුන් ජීවත් වන ක්‍රමවේදය හඳුනා ගන්න ඕනෑ. මෙන්න මේවා හඳුනා ගන්නා දේශපාලන ක්‍රමවේදයකට තමයි අද අප ලෑස්ති වෙන්නේ. අපි මේ අර්බුදයෙන් ගොඩ එමු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් දෙවියන්ගේ පිහිටෙන් රටට සංචාරකයෝ එනවා. දකුණු පළාතට ගියාම, මධ්‍යම පළාතට ගියාම සංචාරකයන් ඉන්න බව පෙනෙනවා. රටේ නැහැ කියන විදේශ සංචිත ටික හැදෙන්න ගන්නේ ඩොලර් ටිකක් රටට එනකොට. මේ රටට සංචාරකයෝ එනවා නම් හොඳයි. හැබැයි මේ උන්නැහේලා ටික දැන් බලනවා, සංචාරකයන් ඒම නවත්වා ගන්නේ කොහොමද කියලා. ඒක කරන්න නම් පාරට බහින්න ඕනෑ කියලා හිතනවා. පාරට බැහැලා පාර මැද්දේ කෑ ගහනවා. එතකොට barriers දානවා, කඳුළු ගෑස් ගහනවා. එතකොට, එන සංචාරකයෝ ටික ආපහු යනවා. ඊට පසුව ඩොලර් නැතුව ආපහු තෙල් පෝලිම් ඇති වනවා; ආපහු විදුලිය කපන්න වෙනවා. අන්න ඒකයි කඩාකප්පල්කාරීන්ගේ වුවමනාව. නැවත ගෙවල්වලට ගිනි තියන්න උත්සාහ කරනවා. මේ තත්ත්වය ඇති වෙන්න ඉඩ දෙනවා ද, එහෙම නැත්නම් අපි මේකට මුහුණ දෙනවා ද කියන එකයි අපට මේ වෙලාවේ කල්පනා කරන්න සිදු වන්නේ.

අපි ගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වනවා. අපි දන්නවා, එතුමා මේ තත්ත්වයට හොඳට මුහුණ දෙන බව. එතුමා බොහොම පැහැදිලිව මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කියනවා, රට විනාශ කරන අයට කිසිසේත් ඉඩ දෙන්නේ නැහැ, ප්‍රජාතන්ත්‍රවාදීව ආණ්ඩු පෙරළන්න කියලා. හරියට හරි! හැබැයි, අර විධියට ආවොත් අපි ඉඩ තබන්නේ නැහැ කියලාත් එතුමා බොහොම පැහැදිලිව කියනවා. රටේ ආර්ථිකය කඩා වැටුණු මේ අර්බුදකාරී අවස්ථාවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ අපි කොන්දේසි විරහිතව සහයෝගය ලබා දෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජනාධිපතිතුමා සමඟ මේ ගමන ගිහිල්ලා, මේ රට නඟා සිටුවීමේ වගකීමට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ උපරිම ශක්තිය හා ධෛර්යය ලබා දෙන බව මතක් කරමින්, මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[பி.ப. 1.28]

**ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மாண்புமிகு சனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்களுடைய அக்கிராசன உரைமீதான விவாதம் இங்கு நடைபெற்றுக் கொண்டு இருக்கின்றது. இந்த உரை பெரியதோர் எதிர்பார்ப்பைக் கொடுப்பது போன்றதொரு தோற்றப் பாற்றைக் காட்டி ஆற்றப்பட்டிருந்தாலும், தமிழர்களைப் பொறுத்தவரையில் நூற்றுக்கு நூறுவீதம் ஏமாற்றத்தை அளித்திருக்கின்ற ஓர் உரையாகவே அமைந்திருக்கிறது. இந்தத் தீவில் 75 வருடங்களாகப் புரையோடிப்போயிருக்கின்ற இனப்பிரச்சினைக்குத் தீர்வு காணப்போவதாக கடந்த நவம்பர் மாதத்தில் மாண்புமிகு சனாதிபதி அவர்கள் ஓர் அறிவிப்பைச் செய்திருந்தார். குறிப்பாக, சுதந்திர தினத்திற்கு முன்னர், இதற்கு ஒரு தீர்வைக் கண்டுவிடுவதாகப் பரப்புரைகளைச் செய்துகொண்டிருந்தார். இப்பொழுது, சுதந்திர தினமும் கடந்துவிட்டது. நேற்றைய தினம் அக்கிராசன உரையும் இடம்பெற்றுவிட்டது. ஆனால், இனப்பிரச்சினைக்கான தீர்வு தொடர்பாக ஆக்கபூர்வமான எந்தக் கருத்தும் முன்வைக்கப்பட வில்லை. அதுமட்டுமல்ல, இனப்பிரச்சினையைத் தீர்த்து, வீழ்ந்து போயிருக்கின்ற நாட்டின் பொருளாதாரத்தைக் கட்டி யெழுப்புவதற்கான எந்தவிதமான ஆக்கபூர்வமான சிந்தனை யும் அவரிடம் இல்லை என்பதைத்தான் அவருடைய உரை காட்டி நிற்கிறது. "இனப் பிரச்சினையைத் தீர்ப்பதற்கு ஒற்றையாட்சிக்குள் உச்சபட்ச அதிகாரப் பகிர்வு வழங்கப் படும்" என அவர் சொல்லியிருக்கிறார். ஒரு சனாதிபதியாக முதலில் அவர் உண்மையைப் பேசுவதற்கு முன்வரவேண்டும். தொடர்ந்தும் அப்பட்டமான பொய்களைக் கூறிக்கொண்டு இருக்கக்கூடாது.

இச்சபையில் இருக்கக்கூடிய மூத்த அமைச்சரான மாண்புமிகு பிரசன்ன ரணதுங்க அவர்கள் நேற்றைய தினம் இடம்பெற்ற ஒரு பிரசாரக் கூட்டத்தில், "13ஆவது திருத்தச் சட்டம் முழுமையாக நடைமுறைப்படுத்தப்பட்டுவிட்டது" எனக் கூறியிருக்கிறார். அதுதான் உண்மை! அதாவது, 1987ஆம் ஆண்டு கொண்டுவரப்பட்ட 13ஆவது திருத்தச் சட்டம் முற்றுமுழுதாக நடைமுறையில் இருக்கின்றது. அது கொண்டு வரப்படுகின்ற பொழுது, அது தொடர்பாகத் தீர்ப்பளித்த உச்ச நீதிமன்றம், 13ஆவது திருத்தச் சட்டம் அதனுடைய அதிகாரங் களைப் பரவலாக்கக்கூடிய வகையில் உச்ச எல்லையைத் தொட்டிருப்பதாகவும் அதற்குமேல் எதுவும் செய்யமுடியாது எனவும் அழுத்தம் திருத்தமாகவே கூறியிருந்தது. அதற்குப் பிற்பாடு, மாகாண முதலமைச்சர்கள் சிலர் அந்த அதிகாரங் களைக் கையாளமுயன்றபொழுது, உச்ச நீதிமன்றமும் மேன்முறையீட்டு நீதிமன்றமும் 30 வழக்குகள் ஊடாக மாகாண முதலமைச்சர்களுக்கு அல்லது முதலமைச்சர்களையும் மாகாண அமைச்சர்களையும்கொண்ட சபைக்கு எந்தவிதமான அதிகாரங்களும் இல்லையென குறிப்பாக, காணி அதிகாரம்,

பொலிஸ் அதிகாரம் உட்பட ஏனைய விடயங்களில்கூட அதிகாரங்கள் இல்லை என்பதைத் தெட்டத்தெளிவாகச் சொல்லியிருக்கின்றன. ஆகையால், ஒற்றையாட்சிக்குள் உச்சபட்ச அதிகாரப்பகிர்வு என்று அவர் சொல்வது, முழுக்க முழுக்க நாட்டு மக்களை ஏமாற்றுவதற்காகச் சொல்லப்படு கின்ற கதையாகும். அத்தோடு, அவர் தமிழ்த் தரப்புக்களுடன் சேர்ந்து, தமிழ் மக்களை ஏமாற்றுவதற்காகச் செய்கின்ற ஒரு சதியாகவும் நான் இந்த விடயத்தைப் பார்க்கின்றேன்.

மேலும், அவர் மாவட்ட அபிவிருத்திச் சபை தொடர்பாக வும் பிரஸ்தாபித்திருந்தார். நாங்கள் இந்த விடயத்தை ஆரம்பத்திலிருந்தே அடியோடு நிராகரித்து வருகின்றோம். இந்த நாட்டைக் கட்டியெழுப்பவேண்டுமாக இருந்தால், புரையோடிப்போயிருக்கின்ற இனப்பிரச் சினைக்குத் தீர்வு காண முன்வாருங்கள்! என நாங்கள் மீண்டும் திட்டவட்டமாகப் பதிவுசெய்ய விரும்புகின்றோம். இனப்பிரச்சினைக்கான தீர்வை ஒற்றையாட்சிக்குள் ஒருபொழுதும் காணமுடியாது. ஒற்றையாட்சியைக் குப்பையில் போடுங்கள்! இந்தத் தீவினுடைய வடக்கு, கிழக்கின் சொந்தக்காரரான தமிழர் களுடைய இறையாண்மையை நீங்கள் 1948ஆம் ஆண்டு பிரித்தானியர்களிடமிருந்து இலவசமாகப் பெற்றுக்கொண்டீர் கள். வடக்கு, கிழக்குத் தமிழர்களுடைய தேசத்தை அங்கீகரியுங்கள்! அவர்களுடைய தேசத்தின் இறைமையை அங்கீகரியுங்கள்! அவர்களுடைய சுயநிர்ணய உரிமையை அங்கீகரியுங்கள்! அந்த அடிப்படையில் ஒரு சமஷ்டி அரசியல் கட்டமைப்பை நீங்கள் உருவாக்குங்கள்! அதனூடாக மட்டும்தான் உங்களால் இந்த நாட்டை முன்னோக்கிக் கொண்டுசெல்ல முடியும். அப்போதுதான் இந்த நாட்டில் ஒரு பகுதியினராக இருக்கின்ற தமிழர்களுடைய ஒத்துழைப்பை நீங்கள் அபிவிருத்தி நோக்கிய பாதையில் பெற்றுக்கொள்ளக் கூடியதாக இருக்கும் என்பதை நான் பொறுப்புணர்வுடன் சுட்டிக்காட்ட விரும்புகின்றேன். அதைவிடுத்து, வெறுமனே பாராளுமன்ற அமர்வு நிறுத்தத்தை மேற்கொண்டு, அக்கிராசன உரைகளில் கவர்ச்சிகரமான வார்த்தைகளைப் பிரயோகிப்பத னூடாக உங்களால் ஒருபோதும் இந்த நாட்டைப் பாதுகாக்க முடியாது. இதைவிட மோசமான நிலைக்குத்தான் இந்த நாட்டைக் கொண்டுசெல்வீர்கள் என்பதை நான் இந்த இடத்தில் பொறுப்புணர்வோடு பதிவுசெய்துகொள்ள விரும்பு கின்றேன்.

மாண்புமிகு சனாதிபதி அவர்கள் அக்கிராசன உரையில், "அரசாங்கங்கள் மாறுகின்றபோது மாற்றமடையாத தேசியக் கொள்கை வேண்டும்" என்று சொல்லியிருக்கிறார். அது உண்மையான ஒரு விடயம்தான். நாட்டுக்குத் தேசியக் கொள்கையொன்று தேவையென்று அவர் கூறியிருப்பது சரி; நாட்டுக்குத் தேசியக் கொள்கையொன்று இல்லையென்று சொல்லவது பிழை! ஏனென்றால், உங்களிடம் ஒரு தேசியக் கொள்கை இருக்கின்றது. அதாவது, இந்தத் தீவிலிருக்கின்ற தமிழர்களினதும் முஸ்லிம்களினதும் மலையகத் தமிழர் களினதும் அடையாளங்களை அழித்து, இந்த நாட்டை ஒரு சிங்கள பௌத்த நாடாக மாற்ற வேண்டும் என்ற ஒரு மாறாத தேசியக் கொள்கை இருக்கின்றது. 1948ஆம் ஆண்டிலிருந்து இந்த நாட்டை மாறி மாறி ஆட்சிசெய்த ஒவ்வோர் அரசாங்கமும் அந்தக் கொள்கையின் அடிப்படையில் குறித்த இலக்கை அடைவதற்காகத்தான் உழைத்திருக்கின்றன.

அந்தக் கொள்கையின் பெயரில் ஆட்சிபீடம் ஏறி, பொருளாதார ரீதியாக மிகப் பெரும் கொள்ளைகளையடித்து, நீங்கள் உங்களை வளப்படுத்திக் கொண்டிருக்கிறீர்கள். அவ்வாறு கொள்ளையடித்ததன் விளைவாகவும் இனவாத ரீதியாகச் செயற்பட்டதன் விளைவாகவும்தான் - இவை இரண்டும் கூட்டுச்சேர்ந்ததனால்தான் - தமிழ் மக்கள்மீது பாரியதோர் இனப்படுகொலையைச் செய்த கோட்டாபய ராஜபக்ஷ மற்றும் அவருடைய சகோதரனான மஹிந்த ராஜபக்ஷவினுடைய காலப்பகுதியில் இந்த நாடு பாதாளத்தில் வீழ்ந்ததாக வரலாறு பதிவுசெய்திருக்கிறது. அரசாங்கம் மாறினாலும் மாறாத ஒரு தேசியக் கொள்கை உண்மையிலே உங்களுக்குத் தேவையென்றால், முதலில் இந்த நாட்டை அழிவுப் பாதைக்குள் கொண்டுசென்றுகொண்டிருக்கின்ற 75 வருடங்களாக நீங்கள் தேசியக் கொள்கையாக வைத்திருக்கின்ற "இலங்கை தீவு சிங்கள, பௌத்த தீவு" என்று மகாவம்சம் சொல்லுகின்ற புனைகதையின் அடிப்படையிலான கொள்கையைக் கைவிடுங்கள்! "இந்த நாடு பல தேசங்களைக் கொண்ட ஒரு நாடு" என்பதை நீங்கள் ஏற்றுக்கொள்ளுங்கள்! பல தேசங்களைக்கொண்ட இந்த நாட்டைக் கட்டியெழுப்பு வதற்கென ஒரு கொள்கையை வகுப்பதற்கு முன்வாருங்கள்! இந்த நாட்டைக் கட்டியெழுப்புவதற்கான ஒரு தேசியக் கொள்கையை வகுப்பதற்கு நாங்களும் உங்களுடன் சேர்ந்து ஒத்துழைப்பதற்குத் தயாராக இருக்கிறோம் என்பதை நான் இந்த இடத்திலே குறிப்பிட்டுக்கொள்ள விரும்புகின்றேன்.

மாண்புமிகு சனாதிபதி அவர்கள், “இந்த நாட்டை அராஜக நிலைக்கு இட்டுச்செல்ல இடமளிக்க முடியாது. தேர்தல்களின் போது, ஜனநாயக ரீதியில் அரசாங்கத்தை மாற்றியமைக்கும் சந்தர்ப்பம் எல்லோருக்கும் உண்டு" என்று குறிப்பிட்டிருக் கின்றார். அது தத்துவ ரீதியாகச் சரியாக இருக்கலாம். ஆனால், அவர் ஒன்றை விளங்கிக்கொள்ள வேண்டும். இந்தத் தீவில் அதிருப்தியடைகின்ற மக்களுக்கு மட்டும் ஆட்சி மாற்றம் தேவைப்படவில்லை. இந்தத் தீவைச் சுற்றியிருக்கின்ற பிராந்திய வல்லரசுகள் அதிருப்தியடைகின்றபோதும், ஆட்சி மாற்றம் தேவைப்படுகின்றது. அதேபோல், இந்தத் தீவில் பூகோள ஆதிக்கத்தை நிலைநிறுத்திக்கொள்ள விரும்புகின்ற வல்லாதிக்க சக்திகள் ஆட்சியாளர்கள்மீது அதிருப்தியடை கின்ற பொழுதும் ஆட்சி மாற்றம் தேவைப்படுகிறது. அதிருப்தியடைகின்ற மக்கள் தங்களுடைய விருப்பப்படி நாட்டில் ஆட்சி மாற்றத்தை ஏற்படுத்த முடிகின்றதோ, இல்லையோ பிராந்திய வல்லரசுகளும் பூகோள ரீதியாக ஆதிக்கம் செலுத்த விரும்புகின்ற உலக வல்லாதிக்க சத்திகளும் இந்தத் தீவில் ஆட்சி மாற்றத்தை ஏற்படுத்துவதில் கணிசமான பங்கு வகிக்கின்றன.

1977ஆம் ஆண்டு ஆட்சிபீடமேறிய ஜே.ஆர். ஜயவர்தன அவர்கள் பிராந்திய வல்லரசை மதிக்காது, ஓர் உலக வல்லாதிக்க சக்திக்குப் பின்னால் சென்றதன் விளைவாக, அன்று இந்தத் தீவில் அதிருப்தியடைந்திருந்த மக்கள், சிங்கள - பௌத்த பேரினவாதிகளால் படுகொலைக்குள்ளாக்கப்பட்ட தமிழ் மக்கள் அதிருப்தியடைந்திருந்தபொழுது, அந்த மக்களுக்கு ஆயுதங்கள் கொடுக்கப்பட்டு, அன்றைய அரசுக்கு நெருக்கடி கொடுக்கப்பட்டு, 1987ஆம் ஆண்டில் ஜே.ஆர். ஜயவர்தன அவர்கள் இந்தியாவினுடைய காலடியில் வீழ்த்தப் பட்டார். இந்தியாவினுடைய காலடியில் வீழ்த்தப்பட்ட ஜே.ஆர். ஜெயவர்தன இலங்கை - இந்திய ஒப்பந்தத்திற்கு இணங்கினார். அதுபோன்று, 2015ஆம் ஆண்டில் ராஜபக்ஷக்கள் சீனாவுக்குச் சார்பாகச் சென்றதன் காரணமாக, அன்று ஸ்ரீ லங்கா சுதந்திரக்கட்சி இரண்டாக உடைந்து, 60 வருடங்கள் எதிரியாக இருந்த ஐக்கிய தேசியக் கட்சி, ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியினுடைய உறுப்பினராக இருந்த மைத்திரிபால சிறிசேனவை சனாதிபதி வேட்பாளராக ஏற்கவேண்டிய நிலைமை உருவானது. அதுபோன்று, 2022இல் ராஜபக்ஷக்கள் சீனாவுக்குச் சார்பாக இருந்த காரணத்தினால், பொருளாதார ரீதியாகப் பாதிக்கப்பட்ட சிங்கள மக்கள் உற்சாகப்படுத்தப்பட்டு, 69 இலட்சம்

[ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා]

வாக்குகளைப் பெற்றவர் வீட்டுக்கு அனுப்பப்பட்டார். ஆகவே, மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் கனவுலகிலிருந்து ஆட்சி செய்யக்கூடாது. தான் ஆட்சியைப் பொறுப்பேற்ற தனால் தான் நாட்டின் பொருளாதாரம் உயர்வதாகக் கனவு காணக்கூடாது. அவர் இந்தியா, மேற்குலகம் சார்ந்த ஒருவராக இருக்கின்ற காரணத்தினாலே, அவருக்கு இன்று வல்லாதிக்க சக்திகள் ஒத்துழைப்பு வழங்குகின்றன. நீங்கள் வல்லாதிக்க சக்திகளின் எடுபிடியாக இருக்காமல், இந்தத் தீவினுடைய பங்காளர்களாக இருக்கக்கூடிய தமிழர்களுடைய தேசத்தை அங்கீகரித்து, தமிழ்த் தேசம் அங்கீகரிக்கப்பட்ட, இறைமை அங்கீகரிக்கப்பட்ட, சுயநிர்ணய உரிமை அங்கீகரிக்கப்பட்ட, ஒரு புதிய சமஷ்டி அரசியலமைப்பை உருவாக்குவதன்மூலம் ஆக்கபூர்வமாக நாட்டைக் கட்டியெழுப்புவதற்கு முன்வர வேண்டும்.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Yes, Hon.(Dr.) Sarath Weerasekera?

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට සිංහල-බෞද්ධ රටක් නොවෙයි කියලා මෙතුමා කියනවා. ඓතිහාසික කුරුන්දි විහාරයට ගිහිල්ලා මලක්වත් පූජා කරන්න දෙන්නේ නැතුව ස්වාමීන්වහන්සේලා පන්නා දමලා, මෙතැන ඇවිල්ලා නිරුපද්‍රිතව ඉන්නේ මේ රට සිංහල-බෞද්ධ රටක් නිසායි. මෙතුමා යාපනයට ගිහිල්ලා, සිංහලයාට අයිතියක් නැහැ කියලා මෙතැන ඇවිල්ලා නිරුපද්‍රිතව ඉන්නේ, මේ රට සිංහල-බෞද්ධ රටක් නිසායි. ඒක එතුමාට කියලා දෙන්න ඕනෑ.

**ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
இவரைப் போன்ற இனவெறியர்களால்தான் இந்தத் தீவிலே இரத்த ஆறு ஓடியது; இந்த நாடு 30 ஆண்டுகளாக இரண்டாகப் பிரிந்திருந்தது. இந்த நாட்டிலிருந்த விடுதலைக் கோரிக்கையை நீங்கள் ஓர் இனவழிப்பின்மூலம் முடிவுக்குக் கொண்டுவர வேண்டியிருந்தது. இப்படிப்பட்டவர்களை விட்டுவிட்டு, முற்போக்காகச் சிந்திக்கக்கூடிய முன்வரிசையில் இருக்கக்கூடிய நல்ல மனிதர்களைத் தேர்ந்தெடுங்கள்! பச்சை இனவாதிகளை வைத்துக்கொண்டு நாட்டை மென்மேலும் அழிவுப் பாதைக்குள் கொண்டுசெல்லாதீர்கள்! இவர் போன்ற வர்களிடம் ஆலோசனை கேட்டபடியால்தான் தனது சொந்த இன மக்களாலே விரட்டியடிக்கப்படக்கூடிய நிலை கோட்டாபய ராஜபக்ஷவுக்கு ஏற்பட்டது. சிங்கள நாட்டார் கதைகளில் மஹதென முத்தாவினுடைய கதைகள் முக்கிய இடம்பெறுகின்றன. மஹதென முத்தாவுக்குச் சமமானவர்தான் இந்த

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

இவ்வாறான முட்டாள்களின் கதைகளைக் கேட்டு, கோட்டாபய ராஜபக்ஷவும் மஹிந்த ராஜபக்ஷவும் தெருவுக்கு வந்ததுபோன்று, ஏனையவர்களும் எதிர்காலத்தில் தெருவுக்கு வரக்கூடாது என்றால், தயவுசெய்து நிதானமாகச் சிந்தியுங்கள் என நான் இந்த இடத்தில் பொறுப்புடன் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இன்று வடக்கு, கிழக்கில் எங்களுடைய மக்கள் பாரிய நெருக்கடிகளை எதிர்நோக்கியிருக்கிறார்கள். கிட்டத்தட்ட 30 ஆண்டுகள் போரால் பாதிக்கப்பட்ட மக்களுக்குப் பொருளா தார ரீதியாக முன்னேறுவதற்கு கடந்த 13 வருடங்களாக எந்தவித உதவியும் வழங்கப்படவில்லை. இன்று அவர்கள் தங்களுடைய சொந்த முயற்சியால் விவசாயம் செய்து கொண்டிருக்கிறார்கள். நெல் அறுவடை செய்யப்படுகின்ற இக்காலத்தில், அரசாங்கம் நெல்லுக்கு நிர்ணய விலையைத் தீர்மானிக்க வேண்டும் என்று கோரப்பட்டதன் விளைவாக, ஒரு கிலோகிராம் நெல்லுக்கு 100 ரூபாய் என விலை நிர்ணயிக்கப்பட்டிருக்கிறது. ஆனால், வடக்கு, கிழக்கில் அந்த விலைக்கு நெல் கொள்வனவு நடைபெறவில்லை.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please conclude your speech.

**ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
முடித்துக் கொள்கின்றேன்.

அங்குள்ள அரசாங்க அதிபர்கள் இவ்விடயத்தில் பொறுப் பற்றவர்களாக இருக்கிறார்கள். இது அரசாங்கத்தினுடைய வேலை, அரசாங்கம் நெல்லைக் கொள்வனவு செய்யும் என்று சொல்லிக் காலத்தைக் கடத்தும்பொழுது, அந்த விவசாயிகள் தவிர்க்க முடியாத சூழ்நிலை காரணமாக 50 - 55 ரூபாய்க்கு நெல்லை விற்கவேண்டியிருக்கிறது. 2015இற்குப் பிற்பாடு, மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் தனது ஆட்சிக் காலத்தில் நெல்லை உலர்த்துகின்ற நிலையங்களைத் திறந்து வைத்தார். இன்று மழையில் நனைந்த நெல்லை உலர்த்துவதற்கு ஒரு கிலோகிராமுக்கு 10 ரூபாய் வீதம் கேட்கிறார்கள். ஒரு கிலோகிராம் நெல்லை 50 ரூபாவுக்கு விற்கின்றவர், அதனை உலர்த்துவற்கு 10 ரூபாயைக் கொடுத்தால், அவருக்கு 40 ரூபாய்தான் கைக்குக் கிடைக்கும். ஆனால், ஒரு கிலோகிராம் நெல்லுக்கான உற்பத்திச் செலவு கிட்டத்தட்ட 150 ரூபாய். விநியோகஸ்தர்களுக்கு 38,000 ரூபாவுக்கு வழங்கப்படுகின்ற களைநாசினி 45,000 ரூபாவுக்கு விற்கப்படுகிறது. இதைக் கண்டுகொள்வதற்கு கமநல திணைக் களம் தவறுகிறது.

எங்களுடைய மக்களின் பொருளாதாரத்தைத் தொடர்ந்தும் அழித்துக்கொண்டு, தமிழ்த் தலைவர்களைப் பேச்சுவார்த்தை மேசையில் அமர வைத்து, உலக நாடுகளிடம் நிதியைப் பெற்று, உங்களுடைய இந்திய - மேற்கத்திய சார்பான ஆட்சியை நீங்கள் நீண்ட காலத்துக்குத் தொடார முடியாது. ஆகையால், நீங்கள் இவ்வாறான போக்குகளைக் கைவிட்டு, எங்களுடைய தேசத்தின் அதிகாரத்தை எங்களிடம் ஒப்படையுங்கள்! அவ்வாறு ஒப்படைத்தால், எங்களுடைய தேசத்து விவசாயிகளின் பொருளாதாரத்தை எப்படிப் பாதுகாக்க வேண்டும், முன்னேற்ற வேண்டும் என்பதை எங்களால் தீர்மானித்துக்கொள்ள முடியும். நாடு ஐக்கியமாக இருக்க வேண்டுமாக இருந்தால், சமஷ்டி அரசியலமைப்பைக்

கொண்டுவாருங்கள்! மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்கள்கூட, "ஒற்றையாட்சியைக் கடந்தால், நாடு பிளவுபட்டு விடும்" என்று திரும்பத் திரும்ப பொய் சொல்கிறார். இந்தப் போக்கை நீங்கள் கைவிட்டு, சமஷ்டி அரசியலமைப்பின் மூலம் நாட்டை ஐக்கியப்படுத்த முன்வரவேண்டும் என்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නලින් ප්‍රනාන්දු ඇමතිතුමා. ඔබතුමාට විනාඩි පහළොවක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.40]

**ගරු නලින් ප්‍රනාන්දු මහතා (වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு நலின் பர்னாந்து - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. Nalin Fernando - Minister of Trade, Commerce and Food Security)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජනාධිපතිතුමා විසින් ඊයේ දිනයේ ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශය පිළිබඳව අදහස් දැක්වීමට මට අවස්ථාව ලබා දීම පිළිබඳව ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඊයේ ජනාධිපතිතුමා කළ ප්‍රකාශය විශාල ප්‍රශ්නයක් විධියට සලකලා, ඒ ප්‍රකාශය අහගෙන ඉන්නේ නැතුව විපක්ෂයේ සමහර කණ්ඩායම් සභාවෙන් පිටව ගියා. ජනාධිපතිතුමා දෙසැරයක් මේ පාර්ලිමේන්තුවේ රාජාසන කථාව කළාය කියන එක තමයි අද විපක්ෂයට තිබෙන ලොකුම ප්‍රශ්නය. ඒක තමයි ඒ ගොල්ලන් අද රටේ තිබෙන ලොකුම ප්‍රශ්නය විධියට දකින්නේ. ජනාධිපති ධුරයට එතුමා පත් වෙලා, නැවත ආණ්ඩුවක් හදාගෙන, කැබිනට් මණ්ඩලයක් පත් කරගෙන, ඒ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන අවස්ථාවක්, මේක. එදා අපි හිටියේ මොන තත්ත්වයේද කියලා අපි කල්පනා කර බලන්න ඕනෑ. අද විපක්ෂයට ගිහිල්ලා ඉන්න සමහර මන්ත්‍රීවරු ඒ ආණ්ඩුවේ හිටපු ඇමතිවරු. විශේෂයෙන්ම අප ගැටලු සහගත තත්ත්වයකට මුහුණ දුන් අවස්ථාවේ දී එතුමන්ලා මේ රටේ විශාල වගකීමක් දරපු අය. එතුමන්ලා අද විපක්ෂයට ගිහිල්ලා මේ රටේ තිබෙන ආර්ථික ප්‍රශ්නය ගැනත්, දේශපාලන ප්‍රශ්නය ගැනත් කථා කරනවා. එතුමන්ලාත් ඇමතිවරුන් විධියට කටයුතු කරපු ඒ රජය පවත්වාගෙන යද්දී රටක් විධියට අපි කොච්චර පහළට වැටුණාද කියලා අපි දන්නවා. රටේ ජනතාවට එදිනෙදා කටයුතු කර ගැනීම සඳහා අවශ්‍ය ඉන්ධන ටික නැතුව, ගෑස් ටික නැතුව, රටේ ජනතාවට අවශ්‍ය කරන ආහාර ටික නැතුව, ජනතාව පාරේ දවස් ගණන් රස්තියාදු වුණා. මිනිස් ජීවිත මහ මඟ නැති වන තත්ත්වයක් අපේ රටේ තිබුණා. ඒ නිසා තමයි මේ අර්බුදයට මුහුණ දීලා මේ රට ඉස්සරහට ගෙන යන්න පුළුවන් නායකයෙකුට මේ රට භාර ගන්න කියලා අප සියලුදෙනාම ඉල්ලා සිටියේ. මේ පාර්ලිමේන්තුවත්, රටේ ජනතාවත් කිව්වේ, මේ අර්බුදයෙන් රට ගොඩ ගන්න නම් හරි නායකයකු පත් කර ගන්න ඕනෑය කියලායි. ඒ අවස්ථාවේදී අප සියලුදෙනා ඒක පිළිගත්තා.

අපි කියපු අනික් නායකයෝ අගමැතිකම භාර ගන්න බැහැයි කියද්දී, ඒ අය කොන්දේසි පිට කොන්දේසි ඉදිරිපත් කරද්දී රනිල් වික්‍රමසිංහ මැතිතුමා පමණයි මේ රට වෙනුවෙන් ඉදිරිපත් වුණේ. ඒ වාගේම එතුමා කැබිනට් මණ්ඩලයක් හදලා මේ රටේ තිබුණු ප්‍රශ්න එකින් එකට උත්තර ලබා දෙන්න කටයුතු කළා. ඒ අනුව තමයි අපේ රට එදා තිබුණු විශාල ගැටලු සහගත තත්ත්වයෙන් මුදා ගන්න අද වෙද්දී අපට හැකි වුණේ. නැවත පාසල් ටික විවෘත කරලා දරුවන්ට පාසල් යන්න, සාමාන්‍ය ජනතාවට එදිනෙදා අවශ්‍ය භාණ්ඩ ඇතුළු සියලු පහසුකම් ටික ලබා ගන්න, ඒ අයට කරදරයක් නැතුව තමන්ට ඕනෑ දේවල් සඳහා වෙලාව වෙන් කර ගන්න පුළුවන් තත්ත්වයකට අද අපි මේ රට පත් කරලා තිබෙනවා. මම කලින් කිව්වා වාගේ, ඊට පස්සේ එතුමා ඇයි දෙවැනි කථාවක් පිළිබඳව ආපහු කථා කරන්නේ? එතුමාට අවශ්‍ය වුණා, ඊළඟ දීර්ඝ කාලීන වැඩ පිළිවෙළ මේ රටට ඉදිරිපත් කරන්න. රටක් විධියට ඉස්සරහට යනවා නම්, අපි මේ රටට දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් හඳුන්වා දෙන්න අවශ්‍යයි. විශේෂයෙන්ම අපි පසුගිය කාලයේ IMF එකත් එක්ක කටයුතු කරද්දී ඒ සඳහා අවශ්‍ය හැම තීන්දුවක්ම ගත්තේ ආර්ථිකය හරියට කළමනාකරණය කරමින්. ඒ සෑම කටයුත්තකටම අදාළ සෑම වැඩ පිළිවෙළක්ම සාර්ථකව ගෙන යන්න එතුමා කටයුතු කළා.

රටේ ආදායම වැඩි කර ගන්න අපට ක්‍රම කිහිපයයි ක්‍රියාත්මක කරන්න තිබෙන්නේ. රටේ ආදායම වැඩි කර ගන්නවා නම්, අනිවාර්යයෙන්ම බදු ප්‍රතිශතය යම් ප්‍රමාණයකින් වැඩි කරන්න වෙනවා. ඒ වාගේම වියදම් කරන මුදල අඩු කරන්න වෙනවා, අපනයන ආදායම වැඩි කරන්න වෙනවා. ආදායම වැඩි කර ගන්න නම්, විශේෂයෙන් සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න වෙනවා. දැන් තිබෙන ආදායම සහ වියදම පාලනය කරන එක තමයි අපි කරන්න ඕනෑ. මේ රට තුළ ඊට එහා කරන්න දෙයක් ඉතුරුවෙලා නැහැ. දැන් අපි එක ප්‍රශ්නයයි අහන්නේ. ඉස්සරහට මේ රට භාර ගන්න කථා කරන නායකයෝ දැන් අපි කරගෙන යන IMF වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යනවාද, නැද්ද? වර්තමාන බදු ක්‍රමය අයින් කරලා බදු ආදායමක් නැති තත්ත්වයක් තුළ මේ රටේ පාලනය ගෙන යන්න පුළුවන්ද? එහෙම නැත්නම්, මීටත් වඩා පඩි වැඩි කරලා මේ ආර්ථිකය තුළින් මේ රටේ ජනතාවට සුබසාධන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවාද, නැද්ද? මේ අහන ප්‍රශ්නවලට උත්තර දුන්නොත්, ඒ නායකයන්ට යම් වැඩ පිළිවෙළක් තිබෙනවා කියලා අපට පිළිගන්න පුළුවන්. හැබැයි, ඒ අය තමන්ට තිබෙන වැඩ පිළිවෙළෙන් කියන්නේ, "නුඹලාට බැහැ මේක කරන්න, මේ කරන ක්‍රමය අසාර්ථකයි, එම නිසා වහාම අයින්වෙලා යන්න" කියන එක විතරයි. මේ රටේ ජනතාවවත්, මේ රටේ ව්‍යාපාරිකයන්වත් කිසිම වෙලාවක ඒක පිළිගන්න කැමැති වෙයි කියා මම නම් හිතන්නේ නැහැ. අපි යම් දෙයක් කියනවා නම්, එය කරුණු කාරණා එක්ක කිව්වොත් විතරයි මේ රටේ ජනතාව පිළිගන්නේ.

අනික් කාරණය මේකයි. අපට මේක සාමාන්‍ය ආණ්ඩුවක් විධියට සලකන්න බැහැ. මේ වාගේ විශාල කඩා වැටීමක් තුළ රජයක් ගෙන යනවාය කියන එක ඉතාම අමාරු කාර්යයක්. මේකේ ගැඹුර දන්නා නිසා තමයි මම කලින් කියපු නායකයෝ කොයි වෙලාවකවත් මේ රට භාර නොගත්තේ. නමුත්, රජය විධියට අපි මේ ප්‍රශ්න එකින් එක විසඳාගෙන යන ගමනේදී ඒකට බාධා කිරීම පමණයි ඔවුන්ට කරන්න පුළුවන් එක අපි අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ. සාමාන්‍යයෙන් ඒක තමයි දේශපාලනයේ හැටි. හැබැයි, මම කලින් කිව්වා වාගේ අපි අවුරුදු 74ක් තිස්සේ ක්‍රියාත්මක කළ ආර්ථික ප්‍රතිපත්තිවල නරකම ප්‍රතිඵලය ඇතිවෙලා තිබෙන මේ වෙලාවේ ආණ්ඩුව භාර ගත් නායකයා තමයි, වර්තමාන ජනාධිපතිවරයා. ඒ ජනාධිපතිවරයාට ගන්න තිබෙන්නේ සාමාන්‍ය ආණ්ඩුවක් විසින් ගත යුතු සාමාන්‍ය තත්ත්වයේ තීන්දු නොවෙයි. ඒ නිසා තමයි, බදු වැඩි කරලා ආදායම වැඩි කිරීමේ කටයුත්තට එතුමා යොමු වුණේ.

පසුගිය කාලයේ සිදු වුණු මේකේ අනෙක් පැත්ත පිළිබඳව අපි දැන් බලමු. 2021 අය වැය ඉදිරිපත් කරන වෙලාවේ රටේ ජනතාවට විශාල වශයෙන් බදු සහන දුන්නා. එතෙක් ව්‍යාපාර, සමාගම් සහ පුද්ගලයන් දහසය ලක්ෂයක් බදු ගෙව්වත්, ඉන් පසු ඒ ප්‍රමාණය ලක්ෂ පහකට අඩු වුණා. ඒ වෙලාවේ විපක්ෂය කිව්වේ

[ගරු නලින් ප්‍රනාන්දු මහතා]

මොකක්ද? විපක්ෂය කිව්වා, "බදු කපන්න එපා. මේ බදු සහන ලබා දෙන්නේ තමන්ගේ හිතවතුන්ට සලකන්න" කියලා. ඒ වාගේම, තවත් බදු ප්‍රමාණයක් පනවන්න කියලාත් විපක්ෂය යෝජනා කළා. එලෙස යෝජනා ගණනාවක් එදා ලිඛිතව ඉදිරිපත් කළා, වැඩි කරන්න ඕනෑ බදු ප්‍රමාණය සම්බන්ධයෙන්. විපක්ෂ නායකතුමා යටතේ සජබයේ ඉන්න ආර්ථිකය පිළිබඳ විශේෂඥයෝ මේ බදු වැඩි කරන්න කියලා ලිඛිතව දැනුම් දුන්නා. අද බදු වැඩි කළාම එතුමන්ලා කියනවා බදු අඩු කරන්න කියලා. මෙතුමන්ලා බදු අඩු කරනකොටත් විරුද්ධ වෙනවා, බදු වැඩි කරනකොටත් විරුද්ධ වෙනවා. මෙතුමන්ලා කියන්නේ කවදාවත් මෙතුමන්ලාටවත් කරගන්න පුළුවන් දේවල් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම මෙතුමන්ලා හිතාගෙන ඉන්නවා, මෙතුමන්ලා ගැන රටේ මිනිස්සු තුළ ලොකු විශ්වාසයක් තිබෙනවා, මෙතුමන්ලා ජනාධිපති වෙනකම් මිනිස්සු බලාගෙන ඉන්නවා, ව්‍යාපාරිකයෝ බලාගෙන ඉන්නවා කියලා.

ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය මෙසේ කියා තිබෙන බව "The Daily Morning" පුවත් පත වාර්තා කර තිබෙනවා අද මම දැක්කා, I quote:

"Ceylon Chamber sees no solution to economic crisis from SJB or NPP"

මෙතුමන්ලා බලයට ඇවිල්ලා මේ ආර්ථිකය හදනකම් මේ රටේ මිනිස්සු බලාගෙන ඉන්නවා, පැය 24න් ආර්ථිකය හදන්න පුළුවන් ඔස්තාර්ලා විධියට ජනතාව විසින් මෙතුමන්ලාව පිළිගෙන තිබෙනවා, ඒ නිසා මෙතුමන්ලා එනකම් තමයි මිනිස්සු බලන් ඉන්නේ කියලා මෙතුමන්ලා හිතනවා. මේ රටේ ජනතාව එහෙම හිතනවා නම්, මෙතුමන්ලාට මේ වැඩේ කරන්න පුළුවන්ද කියන එක අපි සියලුදෙනාම කල්පනා කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අනෙක් කාරණය මෙයයි. රටක් විධියට අපි ගත්ත තීන්දු නිසා තමයි, රුපියලට සාපේක්ෂව ඩොලරයේ අගය මේ ගණනේ - රුපියල් 370ට පමණ- තබාගන්න අපට පුළුවන් වුණේ. ඊට පෙර රුපියලට සාපේක්ෂව ඩොලරයේ අගය රුපියල් 400ට, 420ට වැඩි වුණා. ඒ වාගේම, ලංකා ඉතිහාසයේ කවදාවත් නැති විධියට බැංකුවක් ඩොලරයකට ගෙවන මුදල එක ගණනකුත්, එළියේ - market එකේ - ඩොලරයට ගෙවන මුදල තව ගණනකුත් වුණා. ඒ අනුව එළියෙන් - black market එකෙන් - ඩොලර් ගනිද්දී රුපියල් 40ක, 50ක වෙනසක් තිබුණා. අද වෙනකොට එහෙම ශත පහකවත් වෙනසක් නැහැ. අද ඩොලරයක් ගන්නවා නම්, බැංකුවේ ගණනටම පිටිනුත් ඒ ඩොලරය ගන්න පුළුවන් තත්ත්වයට මේ රටේ ආර්ථිකය අපි පාලනය කරලා තිබෙනවා. ඒ තුළින් ආනයනකරුවන්ට විශාල වාසියක් ලැබුණා. ආනයනකරුවන් ඒ වාසිය රටේ ජනතාවට ලබා දුන් නිසා තමයි, අද වන විට අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අඩුවෙලා තිබෙන්නේ.

මීට මාස 6කට පමණ පෙර අපේ රටේ තිබුණු භාණ්ඩ මිලත් එක්ක බලද්දී අද ඒ භාණ්ඩවල මිල සියයට 40කින්, 45කින් පමණ අඩු වෙලා තිබෙනවා. සමහර භාණ්ඩවල මිල සියයට 200කින්, 300කින් පමණ අඩු වෙලා තිබෙනවා. උදාහරණයක් ගත්තොත්, එදා පරිප්පු කිලෝවක් රුපියල් 585යි. අද වෙද්දී පරිප්පු කිලෝවක මිල රුපියල් 230කින් පමණ අඩුවෙලා තිබෙනවා. සීනි කිලෝවක මිල රුපියල් 125කින් විතර අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම, හාල් කිලෝවක මිල රුපියල් 60කින්, 70කින් පමණ අඩු වෙලා තිබෙනවා. හාල්මැස්සෝ කිලෝවක මිල රුපියල් 600කින්, 700කින් පමණ අඩු වෙලා තිබෙනවා. ඒ අත්‍යවශ්‍ය භාණ්ඩ අඩු මිලට ගන්න ලැබුණේ අපි ගෙන ගිය ආර්ථික ප්‍රතිපත්තිය නිසායි; ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය ඒ මට්ටමේ තබාගන්න පුළුවන් වුණු නිසායි. හැබැයි, ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය 450ට, 500ට, 600ට යයි, පරිප්පු කිලෝවක් රුපියල් 1,500ට 2,000ට යයි, මේවා ගෙන්වන්න බැරි වෙයි, මේවා ගෙන්වන්න බැරි වුණාම මිනිස්සුන්ට කන්න නැති වෙයි, කන්න නැති වුණාම මිනිස්සු පාරට එයි, තෙල් පෝලිම්වලට ආහාර පෝලිමත් එකතු වෙයි, ඒ නිසා තවත් ඉක්මනින් අපට මේ ආණ්ඩුව ගෙදර යවන්න පුළුවන් වෙයි කියලා තමයි මේ අය කල්පනා කළේ. දැන් අපි අපේ ඒ ආර්ථික ප්‍රතිපත්තිය සැලසුම් කරලා ඉවරයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපට මේ ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරද්දී විපක්ෂයේ ඉන්න මේ කියන ආර්ථික විශේෂඥයෝ කියන ඒ කිසිම දෙයක තර්කයක් නැහැයි කියන එකත් මේ රටේ ජනතාව දන්නවා. ඒ නිසා රටේ ආර්ථිකය පිළිබඳව ජනාධිපතිතුමා ක්‍රියාත්මක කරන මේ වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් ආණ්ඩුවක් විධියට අප සියලුදෙනා එක මතයක ඉන්නවා. මේක තමයි අද රටට අවශ්‍ය කරන දේ. විපක්ෂය මොන තරම් දේවල් කිව්වත්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුනුත්, කැබිනට් මණ්ඩලයත් -අප සියලුදෙනාම- එක මතයක ඉන්නවා. මේ රටේ ආර්ථිකය හදලා අපේ අන්තිම ඉලක්කය දක්වා යනකම් අපි මේ වැඩ පිළිවෙළ ඉස්සරහට අරගෙන යනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, මම අමාත්‍යවරයා වශයෙන් පත් වෙද්දී ආහාර උද්ධමනය සියයට 93.7කට වැඩි වෙලා තිබුණු බව. අද වෙද්දී එය සියයට 60.1යි. සාමාන්‍යයෙන් ආහාර උද්ධමනය සියයට 35කින්, 40කින් අඩු වෙනවා කියන්නේ අපට ඉතාම හොඳ තත්ත්වයක්. මේ අවුරුද්ද අවසන් වෙද්දී මේ උද්ධමනය සියයට 9කට, 10කට ගේන්න අපි බලාපොරොත්තු වෙනවා. අනිවාර්යයෙන් අපට ඒ වැඩ කොටස කරන්න පුළුවන්. ඉදිරියේදී ගෙන එන වැඩ පිළිවෙළත් එක්ක මේ රටේ ජනතාවට අවශ්‍ය භාණ්ඩ ටික, තෙල් ටික, පෙට්‍රල් ටික, පොහොර ටික ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ ලබා දීමට අප බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දීර්ඝ කාලීනව ණය ප්‍රතිව්‍යුහගත කර, නැවත ඒ ණය ගෙවන වැඩ පිළිවෙළත් එක්ක මේ ආර්ථිකය හසුරුවා ගන්න ජනාධිපතිතුමාත්, කැබිනට් මණ්ඩලයත් -මේ ආණ්ඩුවත්- කැප වෙන බව මතක් කරමින්, මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.54]

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නවවැනි පාර්ලිමේන්තුවේ හතරවැනි සැසි වාරය විවෘත කරමින් ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශනය වෙනුවෙන් දවස් දෙකක් තිස්සේ කාලය මැරීම දැවැන්ත අපරාධයක්. එක පැත්තකින් බලනකොට මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කළ යුත්තක් නොවෙයි, අනවශ්‍ය කාරණාවක්. මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ නිමිත්ත බවට පත් වුණේ, ජනාධිපතිතුමා පාර්ලිමේන්තු සැසි වාරය අවසන් කිරීම; කල් දැමීම. ඒ තුළින් සිද්ධ වුණේ

ජනාධිපතිතුමා ඊයේ මූලාසනයේ වාඩි වෙලා ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කිරීම විතරක් නොවෙයි, එයින් පාර්ලිමේන්තු ක්‍රියාදාමයත් දින කිහිපයකට අකර්මණ්‍ය වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් සිටින කාරක සභා සියල්ලක්ම අහෝසි වුණු බවත් ඔබතුමා දන්නවා. ඒ සියලුම කාරක සභා ස්ථාපිත කරන්න නැවත කාලයක් ගත වෙනවා. ඒ වාගේම මිනිස්සු මාස ගණන්, අවුරුදු ගණන් බලා ගෙන හිටපු පෙත්සම් ටික මුල ඉඳලාම විභාග කරන්න සිද්ධ වෙනවා. මන්ත්‍රීවරුන් විධියට අපි ඉදිරිපත් කරපු ප්‍රශ්න, යෝජනා සියල්ලම අහෝසි වෙනවා. මේ පාර්ලිමේන්තු සම්ප්‍රදායම අකුළා දමමින් තමයි ප්‍රතිපත්ති ප්‍රකාශන රාජයා ඉදිරිපත් කරන්න ජනාධිපතිතුමා කටයුතු කළේ. ඒක නිසා තමයි ඒ ප්‍රතිපත්ති ප්‍රකාශන විවාදයට අපි විරුද්ධත්වය පළ කළේ. එය ඵලදායී කටයුත්තක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තු ඉතිහාසයේ ප්‍රතිපත්ති ප්‍රකාශන එකක්, දෙකක්, තුනක් ඉදිරිපත් කළ අවස්ථා තිබෙනවා. හැබැයි, මාස කිහිපයක් තුළ එකම ජනාධිපතිවරයා දෙවරක් ප්‍රතිපත්ති ප්‍රකාශන විවාදය කරන්නේ ඇයි? ඒ ප්‍රතිපත්ති ප්‍රකාශන විවාදයේ සමස්තය ගත්තාට පස්සේ අපට පේන්න තිබෙන්නේ කාරණා දෙකයි. එක් කාරණාවක් තමයි, මේ අධික බදු බර සහ මිනිස්සුන්ගේ පීඩාව සාධාරණීකරණයට ලක් කරන්න මේ පාර්ලිමේන්තුව එතුමන්ලාට තෝතැන්නක් බවට පත් වෙලා තිබෙනවා කියන එක. ආණ්ඩු පක්ෂයෙන් ඉදිරිපත් කරන හැම කථාවක්ම ඒක පාදක කරගෙනයි යන්නේ. අනෙක් කාරණාව තමයි, ජනාධිපතිතුමාට කඩිමුඩියේම සද්භාවයක් පහළ වෙලා, එතුමා නායකත්වය දීපු, මූලිකත්වය දීපු, මෙහෙයවපු යහ පාලන ආණ්ඩුවෙන් අවුරුදු පහකට පස්සේ, -අවුරුදු පහක් යහ පාලන ආණ්ඩුවත් කරලා- එතුමා කරන්න කිසිම උත්සාහයක් දරපු නැති දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බලාත්මක කරන්න යෝජනාවක් ගෙනැල්ලා, ඒ තුළින් මේ රටේ දේශපාලන පක්ෂ සහ දේශපාලන යාන්ත්‍රණය තනිකරම හකුළා දාන්න, විනාශ කරන්න, ඒ වාගේම රට අර්බුදයට තල්ලු කරන්න උත්සාහ දරන එක. ඒ කාරණා දෙක තමයි මේ ප්‍රතිපත්ති ප්‍රකාශන විවාදයේදී දේශපාලනඥයන් විධියට අපි දකින්නේ. මෙන්න මේ කාරණා දෙක මුල් කර ගෙන තමයි බදු ගැසීම් සාධාරණීකරණය කරන්නත්, ජනතාව දරන පීඩනය සාධාරණීකරණය කරන්නත් උත්සාහ දරන්නේ.

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු අතරින් අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කරමින් කථා කරපු සංජීව එදිරිමාන්න ගරු මන්ත්‍රීතුමාත්, මට කලින් කථා කරපු අපේ හිතවත් ගරු නලින් ප්‍රනාන්දු ඇමතිතුමාත් -එතුමාට අපේ ගෞරවයක් තිබෙනවා. ජීවන වියදම සහ බඩු මිල අඩු කිරීම සම්බන්ධයෙන් එතුමා ලොකු උත්සාහයක් දරනවා. ඒකට එතුමාට ගෞරවයත් පුද කරනවා- කිව්වා, කවුරුවත් භාර ගන්න හිටියේ නැති නිසා තමයි රනිල් වික්‍රමසිංහ මහත්මයා රට භාර ගත්තේ කියලා. ඒක අමූලික, පට්ටපල් කෙබරයක් නේ. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා සජිත් ප්‍රේමදාස මහත්මයාට හරි වෙන කාට හරි රට භාර ගන්න එන්න කියලා කථා කරපු එක ඇත්ත වෙන්න පුළුවන්. හැබැයි, රනිල් වික්‍රමසිංහ මහත්මයා රට භාර ගත්තේ කවුරුවත් භාර ගන්න හිටියේ නැති නිසා නොවෙයි. ඒක හොඳින්ම දන්නා කෙනෙක් තමයි අපේ හිතවත් නලින් ප්‍රනාන්දු ඇමතිතුමා. ඒ අර්බුදය ඇති වෙච්ච වෙලාවේ මේ රටේ ප්‍රධාන පක්ෂ-විපක්ෂ සියල්ල එකතු වෙලා යම් යෝජනාවක් ජනාධිපතිතුමාට භාර දුන්නා. එක නමක් නොවෙයි, නම් දෙක-තුනක් ඉදිරිපත් කළා. රට භාර ගන්න සූදානම් කණ්ඩායමකට, සර්ව පාක්ෂික ආණ්ඩුවක් සඳහා වන වැඩ පිළිවෙළකට ආරාධනා කළා. ඒ වැඩ පිළිවෙළ තුළ රනිල් වික්‍රමසිංහ මහත්මයා හිටියා. නමුත්, එදා ඉදිරිපත් කරපු ඒ යෝජනාව පැත්තකින් තියලා, රනිල් වික්‍රමසිංහ මහත්මයාට මේ රට භාර දුන්නේ තමන්ගේ කඳවුර ශක්තිමත් කරන්න. එහෙම කළේ කවුරුවත් භාර ගන්න හිටියේ නැති නිසා නොවෙයි. තමන්ගේ කඳවුර වෙනුවෙන් තමයි ඒ දේ කළේ. ඒ කටයුත්ත නම් මේ වෙනකොට රනිල් වික්‍රමසිංහ මහත්මයා අපූරුවට කරපු බවයි පේන්න තිබෙන්නේ.

මේ බදු රටට අවශ්‍යද, නැද්ද කියන කාරණයේදී මගේ දේශපාලන කියවීම නම් බදු ගහන්න ඕනෑ කියන එකයි. හැබැයි, ඒ බදු ගහන්න ඕනෑ යම් ක්‍රමානුකූල පදනමක් මතයි. ආර්ථික දර්ශනයේ කියන්නේ, "මල නොතලා රොන් ගන්නා බඹරුන් සේ" බදු පනවන්න ඕනෑ කියලා. ඒක මිනිසුන්ට නොදැනෙන ආකාරයට සිදු වෙන්න ඕනෑ. මල නොතලා බඹරා රොන් ගන්නවා වාගේ නොව එක පාරට පොල්ලෙන් ගහනවා වාගෙයි නේ බදු ගහන්න කටයුතු කළේ. ඒක මේ රටේ සමස්ත රාජ්‍ය සේවයම, ඉහළ පන්තියම, පෞද්ගලික අංශයම කඩා වැටෙන ක්‍රමයක් බවට පත් වුණා. අනෙක් පැත්තෙන් බැලුවාම මේ බදු ක්‍රියාවලිය තුළ මේ රටේ කර්මාන්ත ඇතුළු අනෙක් ක්ෂේත්‍රවල බරපතළ ප්‍රශ්න නිර්මාණය වුණා. ඒ නිසා මේ බදු ක්‍රියාවලිය වහාම වෙනස් විය යුතුයි. ඍජු බදු ප්‍රමාණය වැඩි කළ යුතු බව ඇත්ත. හැබැයි ඒක ක්‍රමානුකූලව, මේ රටේ ආර්ථිකයට ගැළපෙන ආකාරයට විය යුතුයි. ඊයේ සංශෝධන කිහිපයක් ගෙනැත් තිබුණා. ඒක හොඳයි. ඍජු බදු ප්‍රමාණය වැඩි කළ යුතු වුවත්, වැඩි කළ යුතු ක්‍රමවේදයක් නිර්මාණය කරන්න ඕනෑ. මේ ඍජු බදු වැඩි කරන්නේ කාටද? එහෙම වැඩි කරන්නේ රාජ්‍ය සේවයේ ඉන්න අතළොස්සක් පිරිසකගෙන් බව ඇත්ත; සියයට 5ක්, 10ක් පමණ ප්‍රමාණයක් වේවි. හැබැයි, ඒ මිනිස්සු කරන සේවාවටත් බදු ගහන ක්‍රමයක් තමයි හැදුවේ. මේ රටේ සුපිරි ධනවතුන් සංඛ්‍යාවක් ඉන්නවා. මේ රටේ කළු සල්ලි ආර්ථිකයක් තිබෙනවා. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන ඇතැම් මහත්වරු කෝටි ප්‍රකෝටිපතියෝ. අපේ රටේ කෝටිපතියන්ගේ ලැයිස්තුවේ අංක 1, 2, 3 ස්ථානවල ඉන්න අය මේ පාර්ලිමේන්තුවේත් ඉන්නවා. ඒ අයට හරියට බදු ගහනවාද? ඒ අයගෙන් හරියට බදු අය වෙනවාද? ඒවා අය කර ගන්න ක්‍රමයක් තිබෙනවාද?

මෙහේ අයගේ නම් කියලා උදාහරණ දෙනවා වෙනුවට මම අල්ලපු රට වන ඉන්දියාවෙන් උදාහරණයක් දෙන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉන්දියාවේ ගෞතම් අදානි මහත්මයා තමයි 2014දී, -මේ පාර්ලිමේන්තුවේ ඇතැම් ඇමතිවරුන්ගේ ඉෂ්ට දේවතාවා කියලා හිතාගෙන ඉන්න අදානි- ලෝකයේ කෝටිපති නාමාවලියේ 600වැනි තැන හිටියේ. නමුත් ඔහු 2022දී ලෝක කෝටිපති නාමාවලියේ 2වන ස්ථානයට ආවා. ඔහු ඒ ස්ථානයට ආවේ ඉන්දියාවේ අගමැතිවරයාගේ පූර්ණ ආශිර්වාදයෙන් රජයේ බිස්නස්කාරයා විධියට රාජ්‍ය තාන්ත්‍රිකව ලංකාව වාගේ රටවලට බලපෑම් කරලා, දේවල් සොරා ගනිමින් සහ එකතු කර ගනිමින්. හැබැයි, ගෞතම් අදානි වාගේ අයගෙන් බදු ගහන එක, මේ රටේ ඉන්න අදානි පරම්පරාවේ ධනපතියන්ගෙන් බදු ගහන එක මේ මොහොතේ වෙන්නේ නැහැ. ගජ මිතුරු ආර්ථිකයක්, ගජ මිතුරු සන්තර්පන ආර්ථිකයක් මේ මොහොතේ ක්‍රියාත්මක කරන්නේ. ඒ නිසා අමාරුවෙන් ඉගෙන ගත්ත දොස්තර මහත්මයා, අමාරුවෙන් ඉගෙන ගත්ත ඉංජිනේරු මහත්මයා, අමාරුවෙන් ඉගෙන ගෙන පරිගණක ක්ෂේත්‍රයේ හෝ වෙනත් රැකියාවක් කරන පෞද්ගලික අංශයේ සේවකයන්ගෙන්, වෙනත් වෘත්තිකයන්ගෙන්, රාජ්‍ය සේවකයන්ගෙන් අසාධාරණ විධියට බදු ගැනීම "සහගහන බදු" කියලා තමයි සඳහන් කරන්න වෙන්නේ.

අනෙක් පැත්තෙන්, මේ රට එක සැරේට ආපස්සට හරවන්න තමයි මේ මහත්වරු උත්සාහ කරන්නේ. තව සති දෙකකින් විදුලි බිල වැඩි කරන්න හදනවා. විදුලි බිල වැඩි කිරීම සම්බන්ධයෙන් මේ රටේ ලොකු කතිකාවක් තිබෙනවා. විදුලි බිල වැඩි කරන්න ඕනෑ ප්‍රමාණයක් තිබෙනවා. හැබැයි, මේ රටේ සියයට 30කට

[ගරු වීරසුමන වීරසිංහ මහතා]

ආසන්න සංඛ්‍යාවක් ඉන්නේ විදුලි ඒකක 30කට වඩා අඩුවෙන් පාවිච්චි කරන මිනිස්සු. මේ ආකාරයෙන් ඒ මිනිස්සුන්ට බදු වැඩි කරනකොට, විදුලි බිල වැඩි කරනකොට තවත් බරපතළ අර්බුදයක් නිර්මාණය වෙනවා. අනෙක් පැත්තෙන්, කර්මාන්තශාලා පවත්වාගෙන යාමේ අර්බුදයකුත් ඒ තුළ නිර්මාණය වෙනවා.

අපේ රටේ ප්‍රධාන ප්‍රශ්න හතර ගැන ඊයේ ජනාධිපතිතුමාගේ කථාවේ කිසි තැනක හරියාකාරව කියැවුණේ නැහැ. අද අපේ අධ්‍යාපන ක්ෂේත්‍රය බරපතළ අර්බුදයකට මුහුණ දීලා තිබෙනවා. එක පැත්තකින් කොවිඩ් අර්බුදය, අනෙක් පැත්තෙන් ආර්ථික අර්බුදය සහ රටේ තිබුණු කැරලිකාරිත්වය කියන මේ හැම දෙයකින්ම ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය තමයි බරපතළම පීඩාවට පත් වුණේ. මම හිතන විධියට, අධ්‍යාපන ක්ෂේත්‍රයේ පරම්පරාවක් loss වෙන learning loss එකක් නිර්මාණය වෙලා තිබෙනවා. අධ්‍යාපන අමාත්‍යතුමා දරන උත්සාහයන් ප්‍රමාණවත්ද කියලා සැකයි, මේක මේ තත්ත්වයෙන් ගොඩ ගන්න. මේ දවස්වල අපොස උසස් පෙළ විභාගය පැවැත්වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ දරුවන්ගෙන් අහලා බලන්න. මේ විභාගයේ ප්‍රශ්න පත්‍ර හදන මහත්වරු හිතන්නේ මේක රට සුබිත මුදිත වෙලාවක පවත්වන විභාගයක් කියලා. මේක තමන්ගේ දැනුම ප්‍රදර්ශනය කරන විභාගයක් බවට පත් කරගෙන, ගම්වල ඉන්න අහිංසක දරුවන්ට අධ්‍යාපනයෙන්, ඉගෙනීමෙන් ඉහළ තැන්වලට යන්න තිබෙන අවස්ථාව හිතා මතාම වළක්වන ආකාරයෙන් ප්‍රශ්න පත්‍ර නිර්මාණය කර තිබෙන බවයි මම නම් හිතන්නේ. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රශ්නය ප්‍රධාන ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ වාගේම, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ බරපතළ කඩා වැටීමක් තිබෙනවා. බෙහෙත් ටික නැහැ, වෛද්‍යවරු නැහැ. විශේෂඥ වෛද්‍යවරු රට හැර දාලා යනවා. ඒකට දොර විවෘත කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් කිසිම මැදිහත් වීමක් වෙලා නැහැ.

ඊළඟට, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, Thirteen plus ගැන මට වචනයක් කියන්න ඕනෑ. මේ මොහොතේ ජනාධිපතිතුමා ධම්ම පදයයි, ත්‍රිපිටකයයි ගැන කිය කියා ක්‍රියාත්මක කරන්නේ මැකියාවෙලිගේ "කුමාරයා" කියන පොතයි. මැකියාවෙලිගේ "කුමාරයා" නමැති පොතේ තිබෙනවා, "පාලකයා වරෙක සිංහයෙකු මෙන් විය යුතුය. වරෙක නරියෙකු මෙන් කපටි විය යුතුය" කියලා. මේ දෙවැනි කාරණාව තමයි රනිල් වික්‍රමසිංහ මහත්මයා මේ මොහොතේ කරන්නේ. TNA එකේ අපේ සහෝදර මන්ත්‍රීවරු මේ මොහොතේ ඉල්ලුවේ නැහැ Thirteen plus ක්‍රියාත්මක කරන්න, පළාත් සභාවලට බලය දෙන්න කියලා.

මම දන්නේ නැහැ, ඉන්දියාවේ ජයශංකර් මහත්මයා ඇතුළු උදවිය එහෙම කිව්වා ද කියලා. හැබැයි, ජනාධිපතිතුමා කෘත්‍රිමව සර්ව පාක්ෂික සමුළු තියලා මෙවැනි අර්බුදයක් නිර්මාණය කරන්නේ රට තුළ ව්‍යාකූල තත්ත්වයක් හදන්නයි. දැන් මේකට අපේ මිනිස්සුත් පැටලැවිලා යනවා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අපේ රටට ඕනෑ ද, එපා ද? දහතුන්වන ව්‍යවස්ථා සංශෝධනය අපේ රටට ඕනෑ ද, එපා ද කියන ප්‍රශ්නය මගෙන් විමසුවොත්, මා නියෝජනය කරන පක්ෂයෙන් විමසුවොත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අත් දෙකම උස්සලා කියනවා, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අපේ රටට ඕනෑය කියලා. Thirteen plus දෙනවා නම් හොඳයි. අපි ඒ වෙනුවෙන් පෙනී හිටපු දේශපාලන පක්ෂයක්. මේ පාර්ලිමේන්තුවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන එනකොට එදා විපක්ෂයේ හිටපු මන්ත්‍රීවරුන්ගෙන් ඒකට පක්ෂව අත ඉස්සුවේ කොමියුනිස්ට් පක්ෂයේ ඩිව් ගුණසේකර සහෝදරයා විතරයි. අපි දේශපාලනය වෙනුවෙනුයි ඒ කටයුත්ත කළේ. එහි ප්‍රතිඵලය වුණේ අපේ පක්ෂයේ නායකයෝ පණස්ගණනක් අමු අමුවේ මරා දැමූ එකයි. දහස් ගණනක් පාක්ෂිකයන්ට පීඩාවට ලක් වන්න සිදු වුණා.

අපි එදා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වෙනුවෙන් පෙනී සිටියා. අවුරුදු 13ක් ගිහිල්ලා පළාත් සභා ඒක බලාත්මක කරන්න ඕනෑ වෙලාවේ, රනිල් වික්‍රමසිංහ මහත්මයා නායකත්වය දීපු ආණ්ඩුව තමයි පළාත් සභා ක්‍රමය හකුළා දැම්මේ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ හකුළා දැමූ පළාත් සභා නැවත සක්‍රිය කරන්න ඕනෑ. පළාත් සභා මැතිවරණය තියන්න ඕනෑ. කවුරු හරි ඇහුවොත් පළාත් සභා සුදු අලියෙක් ද කියලා මම කියනවා, "නැහැ, පළාත් සභා තමයි වැඩ කරන අලියා" කියලා. සුදු අලියා මොකක්ද කියලා ඇහුවොත්, "මෙන්න, මේ පාර්ලිමේන්තුව තමයි සුදු අලියා". පළාත් සභාවේ හිටපු අමාත්‍යවරයෙක් විධියට, එහි කටයුතු කළ කෙනකු විධියට අපි දන්නවා, පළාත් සභා ක්‍රමය තුළ කොයි තරම් දේවල් නිර්මාණය වුණා ද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මේ රටේ මහත්වරු සියලු දෙනාටම මම කියන්න ඕනෑ, මේ රට නැවතත් අර්බුදයකට තල්ලු කරන්න එපා කියලා. මේ වෙලාවේ අපේ රටේ මූලික ප්‍රශ්නය ආර්ථික ප්‍රශ්නයයි. ඒකට උත්තර දෙන්න මැදිහත් වෙන්න කියන කාරණයත් මම සිහිපත් කරනවා. ජනාධිපතිතුමා ඉදිරිපත් කළ පළමුවැනි ප්‍රතිපත්ති ප්‍රකාශනයෙනුත්, දෙවැනි ප්‍රතිපත්ති ප්‍රකාශනයෙනුත් එතුමා හුණුවටයේ නාටකයේ ගෲෂා වෙන්න හැදුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් මමත් දන්නා හුණුවටයේ නාට්‍යය තමයි මම උසස් පෙළ විභාගයට පෙනී සිටි කාලයේ නිර්දේශිත ග්‍රන්ථය විධියට තිබුණේ. ජනාධිපතිතුමාගේ ක්‍රියාකාරකම් බලනකොට එතුමා "ගෲෂා" නොවෙයි, එතුමා හරියට හුණුවටයේ නාටකයේ "අසඩක්" වාගෙයි. හුණුවටයේ නාටකයේ "අසඩක්" තමයි එයාට ඕනෑ ඕනෑ තීන්දු දුන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔය පුටුවේ වාඩිවෙලා ජනාධිපතිතුමා ඊයේ කරන්න හැදුවේත් ඒ කාරණයයි. අවසාන වශයෙන් මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්. හුණුවටයේ නාටකයේ එක් තැනෙක මෙසේ කියනවා:

"නඩුව විසඳු එම - වගතුග විනිසකරුගේ
යොමා දෙසවන ඔබ - අසා දැනගනු මෙලෙසින්
එදා එම ඉරු දින - මරු දුටු දිනේ යුව රජ
ජෝර්ජ් අබෂ්විල්ලි - එරට මහ රජහු ද
බියපත්වී කැරැල්ලෙන් - පලා ගොස් සැඟවී සිටින්නේ"

පසුගිය ජූලි මාසයේ 9වැනි දා ගැන කියනවා වාගේ තමයි. එහි තවදුරටත් මෙසේ කියනවා.

"අසඩක් නමින් යුත් - එක් ගැමියෙකුට සොර දෙටු
සැඟවී සිටි වනේ - හමුව මිනිසෙක් බියට පත් වූ"

අපේ රටත් දැන් අසඩක්ගේ ගොදුරක් බවට පත් වෙමින් තිබෙනවා. මේ උවදුරෙන් මේ රට බේරා ගන්න කවුරුත් මැදිහත් වෙන්න ඕනෑ. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නිමල් පියතිස්ස මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.06]

**ගරු නිමල් පියතිස්ස මහතා**
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ජනාධිපතිතුමා විධියට නවවන පාර්ලිමේන්තුවේ හතරවැනි සැසි වාරය විවෘත කරමින් ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනය පදනම් කරගෙන තමයි අද මේ පවත්වාගෙන යන්නේ. විශේෂයෙන්ම මේ ඉදිරිපත් කරපු මූලික සැලැස්ම, මූලික ප්‍රකාශනය දිහා බලපුවාම විවිධ පැති පිළිබඳව නව විග්‍රහයන් ප්‍රමාණයක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා (වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சஷீந்திர ராஜபக்ஷ - நீர்ப்பாசன இராஜாங்க அமைச்சர்)
(The Hon. Shashindra Rajapaksa - State Minister of Irrigation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. PREMNATH C. DOLAWATTE left the Chair, and THE HON. WEERASUMANA WEERASINGHE took the Chair.*

**ගරු නිමල් පියතිස්ස මහතා**
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නව විග්‍රහයන් ප්‍රමාණය දෙස ආපස්සට අපේ අවධානය යොමු කළොත්, විශේෂයෙන්ම විවිධ බදු ප්‍රතිපත්ති පිළිබඳවත්, රටේ සාමාජීය, ආර්ථික, සංස්කෘතික කරුණු කාරණා පිළිබඳවත් යම් පමණක සාරාංශගත ඉදිරිපත් කිරීමක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මගේ අවධානය ප්‍රධාන වශයෙන් යොමු කරනවා කාලීනව මතුවෙලා තිබෙන ප්‍රශ්නයක් සම්බන්ධව. නැවත වතාවක් දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව ප්‍රශ්නයක්, කථා බහක් ඇතිවෙලා තිබෙනවා. ඒ නිසා මම උත්සාහ ගන්නවා, මේ ලැබිච්ච කෙටි කාලය තුළ ඒ පිළිබඳව කරුණු කාරණා කිහිපයක් ඉදිරිපත් කරන්න. මොකද ඒකට හේතුව, මේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එරෙහිව ඉතා බරපතළ ලෙස කටයුතු කරපු ව්‍යාපාරයක සාමාජිකයෙක් මම. 1987 කියන යුගය මට මතකයි. මම 1986දී ශිෂ්‍ය ව්‍යාපාර හරහා තමයි ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ වෙන්නේ. 1986දී මම ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ වෙන්න බලපෑ ප්‍රධානම කාරණය තමයි, ඉන්දියානු ව්‍යාප්තවාදය. ඉන්දියානු අධිරාජ්‍යවාදය හරහා අපේ රට ගිල ගැනීම සඳහා, අපේ රට දෙකඩ කිරීම සඳහා, අපේ රට දුර්වල කිරීම සඳහා ඔවුන් විසින් එලා තිබිච්ච දැලක් සම්බන්ධව පූර්ණ අවබෝධයක් එවකට ජනතා විමුක්ති පෙරමුණේ නායකයෝ අපට ලබා දුන්නා.

ජනතා විමුක්ති පෙරමුණ ලබා දීපු ඒ දැනුම හරහා පෝෂණය වුණු ශිෂ්‍ය ව්‍යාපාරයේ සාමාජිකයකු විධියට ජාතිකත්වය වෙනුවෙන් අපේ ඔළු, අපේ මනස නිර්මාණය වුණා. ජාතිකවාදය, දේශප්‍රේමීත්වය කියන කාරණා මත පදනම් වුණු ගමනකට අවශ්‍ය අඩිතාලම වැටුණේ, ඒ සඳහා මගේ මනස සම්පූර්ණ කෙරුවේ ජනතා විමුක්ති පෙරමුණෙන්. මට මතකයි, ජනතා විමුක්ති පෙරමුණේ කටයුතුවල නියැළෙද්දී අපට මහා දැනුමක් ලැබුණා. ඒ දැනුම ඇතුළේ රට, ජාතිය පිළිබඳව අපේ ලේ කකියන තැනට අපේ මනස ගොඩනැඟුවා. ඒ ආභාසයත් එක්කයි අපි කටයුතු කළේ. ජනතා විමුක්ති පෙරමුණ අපට මූලික පන්ති සාකච්ඡා පහක් පැවැත්වූවා. ඒ පන්ති සාකච්ඡා පහ ඇතුළේ අපට කියාපු දෙය සක් සුදක් සේ යථාර්ථයක් වෙනවා 1987දී අපි දැක්කා.

1987 ජූලි මාසයේ මගේ මතකයේ හැටියට 29වැනි දා වාගේ දවසක ඉන්දියාව ඉතා ප්‍රබල විධියට අපේ රටේ ස්වෛරීභාවය, අපේ රටේ ඒකීයත්වය සම්පූර්ණයෙන් උල්ලංඝනය කරලා සාගරය පැත්තෙන් රට ආක්‍රමණය කරන එකත්, තව පැත්තකින් ගුවන ආක්‍රමණය කරන එකත් සිදු වුණා. එතැන් සිට බෙදුම්වාදී ත්‍රස්තවාදීන් අපේ රට දෙකඩ කිරීම සඳහා ආරම්භ කරන ත්‍රස්ත වැඩ පිළිවෙළ ක්‍රමානුකූලව දියත් වෙන්න පටන් ගත්තා. එය දියත් වීමේ ප්‍රතිඵලයක් විධියට ඊට එරෙහිව ජනතා විමුක්ති පෙරමුණ විතරයි රටේ ජනතාවට නායකත්වය ලබා දුන්නේ. මේ රටේ අනෙකුත් දේශපාලන පක්ෂ මුණිවත රකිද්දී ඒ ආක්‍රමණයට එරෙහිව කටයුතු කළේ ජනතා විමුක්ති පෙරමුණ විතරයි. එදා ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයෝ විධියට අපි මරණ වරෙන්තුව එක අතක තියාගෙන, දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය හරහා, ඊට එරෙහිව ප්‍රතිචාර දක්වන්න කටයුතු කෙරුවා.එදා ජනතා විමුක්ති පෙරමුණ අපට කිව්වේ, "පළමුව මව්බිම. දෙවනුව අධ්‍යාපනය" කියලායි. ජනතා විමුක්ති පෙරමුණේ නායකයෝ එදා අපට කියාපු කාරණය පිළිගෙන "පළමුව අධ්‍යාපනය නොවෙයි, පළමුව මව්බිම" කියන පදනම මත ඉඳලා සටන පටන් ගත්තා. මම වාගේම රට පුරා විහිදී සිටි දස දහසක් වූ ශිෂ්‍ය කෙල්ලො-කොල්ලෝ ඒ ශිෂ්‍ය ව්‍යාපාරයට එකතු වුණා. වෙනත් වෘත්තීය සමිති, විවිධ විධියේ වෘත්තීය ව්‍යාපාරවල හිටපු අය සම්බන්ධ වුණා. ගොවියෝ, කම්කරුවෝ, වෘත්තිකයෝ වාගේම ආරක්ෂක අංශවල ඇතැම් නිලධාරින්ද ඒ කටයුත්තට දායක වුණා; සම්බන්ධ වුණා.

අපට මතකයි, 1987 ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කළේ, එවකට ජනාධිපතිවරයා වෙලා හිටපු ජේ.ආර්. ජයවර්ධන මහත්තයා බිය ගන්වලා; අත කරකවලා; යටත් කරලා. ඒ විධියට තමයි ඉන්දියාව ඒ කටයුත්ත කළේ. ඒක බලහත්කාරී කටයුත්තක්. අපේ රටට එරෙහිව කරපු ආක්‍රමණයක්. අපේ රටේ ජනතාව ඇතුළු නායකයෝ බිය වද්දලා, ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිවරයා දණ ගස්සලා තමයි ඒ ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කරන්න බලහත්කාරයෙන් අපේ අය යොදවා ගත්තේ. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා තමයි එවකට ජනාධිපතිවරයා විධියට මේ කටයුත්ත කළේ. හැබැයි, ඒ ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කිරීමට එරෙහිව එදා ජනතා විමුක්ති පෙරමුණ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය,

[ගරු නිමල් පියතිස්ස මහතා]

ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමාගේත් යම් පාර්ශ්වයක් කටයුතු කෙරුවා. "ඒ බෙදීම නීත්‍යානුකූල වෙයි, ඒක යථාර්ථයක් වෙයි, ඒක රටට බරපතළ හානියක්. රටේ ඒකීයත්වයට බරපතළ හානියක් වෙයි" කියන පදනමේ ඉඳලායි ජනතාව ඒකාබද්ධ වුණේ; ඒකරාශී වුණේ.

බෙදුම්වාදී ත්‍රස්තවාදීන් අවි-ආයුධ අතට අරගෙන එහෙන් දෙමළ නායකයෝ මරනවා, මෙහෙන් සිංහල නායකයෝ මරනවා, තව පැත්තකින් මුස්ලිම් නායකයෝ මරනවා, දේපළ විනාශ කරනවා, මානව සම්පත විනාශ කරනවා. ඒ ක්‍රියාවලිය ඇතුළේ රටේ ඒ මොහොතේ පැන නැඟුණු අසරණකම පාවිච්චි කරලායි ඉන්දියාව ඒ ආකාරයට ඉන්දු-ලංකා ගිවිසුමට අපේ රට යටත් කර ගත්තේ. ඒ මොහොතේ මුළු රටම ඒකාබද්ධ කිරීමේ හැකියාව ජනතාව විමුක්ති පෙරමුණට තිබුණා. මට මතකයි, ජනතා විමුක්ති පෙරමුණේ එවකට නායක රෝහණ විජේවීර සහෝදරයා "දෙමළ ඊළම් අරගළයට විසඳුම මොකක්ද" නමින් කෘතියක් එළිදැක්වූවා. මම විශ්වාස කරනවා, බෙදුම්වාදය පිළිබඳව, ඊළාම් ව්‍යාපාරය පිළිබඳව, දෙකඩ කරලා, බෙදලා, දුබල කරලා රට පාලනය කරන සැලැස්ම පිළිබඳව, ජනතා විමුක්ති පෙරමුණේ එවකට නායක රෝහණ විජේවීර සහෝදරයා ඉතා ප්‍රශස්ත විධියට, ඉතා පරිණත විධියට "දෙමළ ඊළම් අරගලයට විසඳුම කුමක්ද" කියන කෘතියේ සමස්ත කාරණා ඔක්කෝම ඇතුළත් කර තිබෙනවා කියලා. ඒ නිසා එදා පන්ති සාකච්ඡා 5න් විතරක් නොවෙයි, ප්‍රාදේශීය වශයෙන් පැවැති කඳවුරේදී ලබපු අධ්‍යාපනයෙනුත්, ජාතික වශයෙන් පැවැති කඳවුරේදී ලබපු අධ්‍යාපනයෙනුත්, "දෙමළ ඊළම් අරගළයට විසඳුම කුමක්ද?" කියන කෘතියේ බොහෝ කරුණුවලිනුත් අපි පෝෂණය වුණා; අපව පෝෂණය කළා.

එදා සිදුවූ ක්‍රියාකාරකම් අතර, ඉන්දියාව පැත්තෙන් කරන ලද බලපෑමෙහි, බෙදුම්වාදී, ජාතිවාදී, උන්මත්තක ත්‍රස්තවාදීන් ආරම්භ කරපු යුද්ධයෙහි සහ ආණ්ඩුව පැත්තෙන් ඒ දෙසට නම්‍යශීලී වීමෙහි ප්‍රතිඵලයක් විධියටත්, ජනතා විමුක්ති පෙරමුණට එරෙහිව, රටේ දේශප්‍රේමී ජන කොටස්වලට එරෙහිව මර්දනය දියත් කිරීමේ ප්‍රතිඵලයක් විධියටත් ජනතා විමුක්ති පෙරමුණට සිද්ධ වුණා, අවි ආයුධ අතට ගන්න. එදා එවැනි පරිසරයක් හැදුණා; එවැනි පරිසරයක් නිර්මාණය කළා. ඉන්දියාව ලංකාවට බලෙන් පරිප්පු දැම්මා; වෙනත් වෙනත් දේවල් බලෙන් කළා. දින තුනක් ගත වන කොට ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වයෙන් ගොඩනැඟුණු දේශ ප්‍රේමී ජනතා ව්‍යාපාරයේ සන්නද්ධ අංශය කටුනායක ගුවන් තොටුපොළට ප්‍රහාරයක් එල්ල කළා; කොතලාවල ආරක්ෂක පීඨයට ප්‍රහාරයක් එල්ල කළා; ටී-56 ඒවා 14ක් ගත්තා; මගේ මතකයේ හැටියට අර්ධ ස්වයංක්‍රිය තුවක්කු 200කට ආසන්න ප්‍රමාණයක් ගත්තා; පිස්තෝල හයක් ගත්තා; ටී-56 උණ්ඩ විතරක් 3,300ක් ගත්තා. ඔන්න ඔය ආකාරයට පටන් ගත්තා, ප්‍රහාර එල්ල කිරීම. එතකොට හිතයි, මමත් ඒවාට ගියාද කියලා. මා සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරපු ආකාරය ගත්තාම, මමත් ගියා වාගේ තමයි හැඟෙන්නේ. එදා ඒ ව්‍යාපාරයට බොහෝ අය සම්බන්ධ වෙලා හිටියා. අපි මරණ වරෙන්තුව අතට අරගෙන මර්දනයට විරුද්ධව, ඉන්දියානු ආක්‍රමණයට විරුද්ධව කටයුතු කළා. අවසානයේදී ඒ කටයුත්ත හමාර වුණේ, රෝහණ විජේවීර සහෝදරයා ඇතුළු 60,000ක මානව සම්පතක් අපට අහිමි වෙලා.

අපි දන්නවා, එදා විශ්වවිද්‍යාල ශිෂ්‍ය ව්‍යාපාරයේ හිටපු නිස්මි මැරුණේ ශිෂ්‍ය ව්‍යාපාරය හරහා මෙන්න මේ කියන බෙදුම්වාදයට එරෙහිව අරගළ කිරීමේ ප්‍රතිඵලයක් විධියටයි කියලා. වෙනුරලා, නිමල්ලා, රංජිතම් ගුණරත්නම්ලා වාගේ ශිෂ්‍ය නායකයන් විශාල ප්‍රමාණයක් ඒ ක්‍රියාවලියට එරෙහිව තමන්ගේ දිවි කුසුම සම්පූර්ණයෙන් පුද කළා, මේ පුණ්‍ය භූමිය වෙනුවෙන්. ඒ විතරක් නොවෙයි, උපතිස්ස ගමනායක, එච්.බී. හේරත්, ශාන්ත බණ්ඩාර වාගේ ප්‍රබල නායකයන් තානාපති කාර්යාලවල සල්ලිවලින් යැපෙන්නේ නැතුව, වෙනත් විවිධ NGOsවල න්‍යාය පත්‍රවලට අනුකූලව කටයුතු කරන්නේ නැතුව, එදා රට අභ්‍යන්තරයේ සිදු වුණු ඒ ක්‍රියාවලියට මුහුණ දීලා, බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ගේ වැඩ පිළිවෙළ ආපස්සට හැරවීම සඳහා කටයුතු කළා. ඒ අනුව අපි දන්නවා, ජනතා විමුක්ති පෙරමුණේ නායක රෝහණ විජේවීර සහෝදරයා එදා මේ මහ පොළොව සිපගත්තේ, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය එක්ක බෙදුම්වාදය යථාර්ථයක් විධියට ආරම්භ කරන ක්‍රියාවලියත් සමඟ බව. එතුමා විතරක් නොවෙයි, රට පුරා සෑම ග්‍රාම නිලධාරි වසමකම ඒ වෙනුවෙන් කෙනෙකු මිය නොගිය ග්‍රාම නිලධාරි වසමක් නැහැ. මේ කථා කරන මමත් ඒ ක්‍රියාන්විතය ඇතුළේ කටයුතු කරලා අත් අඩංගුවට පත් වුණා. අපි එදා ශිෂ්‍ය ව්‍යාපාර හරහා රටේ ජනතාවට නායකත්වය දුන්නා. එසේ ශිෂ්‍ය ව්‍යාපාර හරහා නායකත්වය ලබා දීමේ ප්‍රතිඵලයක් විධියට මා ද අත් අඩංගුවට පත් වෙලා, මරණ මංචකයෙන් බේරුණේ අහම්බෙන්. එදා ඒ විධියට අත් අඩංගුවට පත් වෙලා, විවිධ වධ වේදනාවලට ලක් වෙච්ච කෙනෙක්, මම. ඒ සියලු වධ වේදනාවලට ලක් වෙලා මා මරණයෙන් අහම්බෙන් බේරුණා. ඒ අරගළය වෙනුවෙන් තවත් දසදහස් ගණනක් මියැදුණා.

මා අද ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය නොකළත්, ජනතා විමුක්ති පෙරමුණ ඇතුළේ එදා අප කරපු ඒ කාර්යභාරය එක්ක බැලුවාම, ජනතා විමුක්ති පෙරමුණ අද දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට නම්‍යශීලී වෙලා ඉන්නවා නම්, ඒ අයට කිව යුතු දෙයක් තිබෙනවා. හරිනි අමරසූරිය පාර්ලිමේන්තු මන්ත්‍රීතුමිය පසු ගිය දවස්වල මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරලා තිබුණා. ජනතා විමුක්ති පෙරමුණේ වත්මන් නායකයන්ට කිසිම සදාචාරාත්මක අයිතියක් නැහැ, තමන්ගේ පක්ෂයේ නිර්මාතෘවරයා ඇතුළු 60,000ක් මේ මහ පොළොව සිප ගත්තේ මේ බෙදුම්වාදයට එරෙහිවයි කියන එක අමතක කරලා කටයුතු කරන්න. මහා සංඝ රත්නය, දේශ ප්‍රේමී ජාතිකවාදී ජනතාව, ශිෂ්‍ය ව්‍යාපාරවල කොටස් වාගේම ගොවීන්, කම්කරුවන් ආදි හැම කෙනෙක්ම ඒ බෙදුම්වාදයට විරුද්ධව කටයුතු කරලා මේ මහ පොළොව සිපගෙන තිබෙනවා. අප අන්න ඒ කාරණය ඔළුවේ තියාගත්තොත් හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක වෙලාවක නුවරඑළියේ සිනිසිටා කඳවුරේ වෙනම තැනකට මාව අරගෙන ගිහින් දස වධ දිදී එක එක චරිත පිළිබඳව ප්‍රශ්න කරන කොට, කිසිම මොහොතක කිසිවෙකු පාවා දෙන්නේ නැතුව මා මරණය තෝරාගෙන සිටි වෙලාවේ, ඒගොල්ලන් බලාපොරොත්තු වුණු කට උත්තරය මගෙන් ගන්න බැහැ කියලා ඒගොල්ලන්ට දැනුණා. එහෙම වෙලාවට ඒගොල්ලන් කරන දෙයක් තිබෙනවා. එතැන ලොකු උදුනක් තිබුණා. එහෙම ගෙන යන අයව ඒ උදුන මැදට දමා කරන්ට් එක අල්ලනවා. එහෙම කරන්ට් එක අල්ල අල්ලා ශරීරය සම්පූර්ණයෙන් අප්‍රාණික කරලා, දුර්වල කරනවා. එහෙම කරලා ඒගොල්ලන් බලාපොරොත්තු වන දේවල් එළියට ගන්න පුළුවන් වුණොත් එහෙමයි, ගන්න බැරි වුණොත් එහිම මියැදෙන්න තබනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් මට තිබෙන අත්දැකීම මේකයි. ඒ සිනිසිටා රුඳවුම් කඳවුර ඇතුළේ තිබුණු වධකාගාරයට මාව අරගෙන ගිහිල්ලා විවිධ විධියේ ප්‍රශ්න කිරීම් ගොඩකට මාව ලක් කළා. අවසානයේදී විදුලිය අල්ලන උදුනට මාව දමා ඒක ක්‍රියාත්මක කරන switch එක on කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිනිසිටා කඳවුර කියන්නේ, වෝල්ට් 33,000ක විදුලියක් නිරන්තරයෙන් - පැය 24ම - ලැබෙන ස්ථානයක්. නමුත් මගේ වෙලාව කියන්නේ, මාව එම උදුනට දමා switch එක on කරන කොට, විදුලිය ඇන හිට - විසන්ධි වෙලා - තිබුණේ. කවදාවත් සිනිසිටා කඳවුරේ එහෙම දෙයක් සිද්ධ වෙලා නැහැ. එහෙම වුණත් වෙන්නේ, බොහොම

කලාතුරකින්. නමුත් එදා මට කරන්ට් එක ඇල්ලුවාට මගේ වාසනාවකට වාගේ මට කරන්ට් එක වැදුණේ නැහැ. ඊට පසුව එදිනම සවස 3.00ට ප්‍රශ්න කිරීමකට ගන්නවා කියා මාව එතැනින් අරගෙන ගියා. එදා සවස් වනකොට, මගෙන් ප්‍රශ්න කරලා ඒගොල්ලන් බලාපොරොත්තු වන කට උත්තර කෙසේ හෝ අරගෙන, එසේ කට උත්තර ගැනීමේ අවසානය ලෙස මගේ මරණය සිදු කරන්න තමයි කටයුතු සූදානම් කර තිබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ ජීවිත අහම්බෙන් බේරාගෙන ආ අය. ඒ අත් දැකීම නැති, දැන් මේ රැල්ලට යන සමහර අය එනවා අපට දේශපාලන අධ්‍යාපනය දෙන්න. ඒ අය අපට දේශපාලනය උගන්වන්න හදනවා. අද වාගේ රැල්ලට යන අය නොවෙයි, එදා සිටියේ. එදා ජනතා විමුක්ති පෙරමුණට අපි සම්බන්ධ වුණේ, මරණ වරෙන්තුව අතේ තබාගෙනයි. අපේ සටන් පාඨය වුණේ, "මව්බිම නැතිනම් මරණය!" යන්නයි. පළමුව අධ්‍යාපනය නොවෙයි, "පළමුව මව්බිම-දෙවනුව අධ්‍යාපනය". පළමුව වැඩ බිම නොවෙයි, "පළමුව මව්බිම-දෙවනුව වැඩ බිම". අන්න එවැනි දේශපාලනයක් හරහා පෝෂණය වෙලා අපේ රට ආ මේ ගමන් මග තුළ ත්‍රස්තවාදයේ සන්නද්ධ බලය සහමුලින් පරාජයට පත් කර තිබෙන බව අපි දන්නවා.

සමහරු මහින්ද රාජපක්ෂ මහත්මයාට "හොරා-හොරා" කියනවා; තව තව දේවල් කියනවා. මම පෞද්ගලිකව දේශපාලන වශයෙන් රාජපක්ෂලාට කැමැති කෙනෙක් නොවෙයි; රාජපක්ෂලාගේ දේශපාලනයට කැමැති කෙනෙක් නොවෙයි. මම ඒ දේශපාලන භාවිතය ප්‍රතික්ෂේප කරනවා. ඒ භාවිතයට මම එකඟ නැහැ. හැබැයි, ජේ.ආර්. ජයවර්ධන මහත්මයාට බැරි වුණු, ප්‍රේමදාස ජනාධිපතිවරයාට බැරි වුණු, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියට බැරි වුණු, රනිල් වික්‍රමසිංහ මැතිතුමාට බැරි වුණු, ත්‍රස්තවාදීන්ගේ සන්නද්ධ බලය සහමුලින් පරාජයට පත් කිරීමේ හැකියාව තිබුණු එකම නායකයා තමයි මහින්ද රාජපක්ෂ මැතිතුමා. එතුමාට තමයි ඒ කටයුත්ත කරන්න පුළුවන්කම ලැබුණේ. එතුමා අධිරාජ්‍යවාදී බලපෑම්වලට යට වුණා නම්, NGO කාක්කන්ට, ඉත්තන්ට, ගැත්තන්ට, කුක්කන්ට ගොදුරු වුණා නම්, රටවල් ඉදිරියේ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කකුල් දෙක වෙවුලුවා නම් අදටත් ප්‍රභාකරන් ජීවත් වෙනවා; අදටත් ත්‍රස්තවාදය තිබෙනවා. ඒක අමතක කරන්න අපට බැහැ. මහින්ද රාජපක්ෂ මැතිතුමා පිළිබඳ ඒ වටිනාකම, ඒ ගෞරවය ඉතිහාසයට එකතු වෙලා ඉවරයි. අද අපි කවුරුත් මේ පිටියේ සෙල්ලම් කරන්නේ එතුමා නිසායි. උතුරු නැගෙනහිර සිටින මුස්ලිම්, දෙමළ ජනතාව ඇතුළු අපි කවුරුත් මේ පිටියේ සෙල්ලම් කරන්නේ, කවුරුත් දේශපාලනය කරන්නේ මහින්ද රාජපක්ෂ මහත්මයාට පින් සිද්ධ වෙන්නයි කියන කාරණය අපට අමතක කරන්න බැහැ. එතුමා සම්බන්ධයෙන් ඒ ගෞරවය අප තුළ තිබෙනවා. ඒ අභිමානය අපි එතුමාට දෙනවා. හැබැයි, පසුගිය කාලයේ පැවැති එතුමන්ලාගේ දේශපාලන භාවිතය අපි ප්‍රතික්ෂේප කරනවා. ඒ පිළිබඳව අපේ එකඟතාවක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි, මේ රට බෙදනවාට විරුද්ධ අය; මේ රටේ ජනතාව බෙදනවාට හැම විටකම විරුද්ධ අය.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නිමල් පියතිස්ස මහතා**
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි කීයක් තිබුණාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට විනාඩි 20ක් වෙන් කර තිබුණා.

**ගරු නිමල් පියතිස්ස මහතා**
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මෙහිදී මෙන්න මේ කාරණය විශේෂයෙන් මතක තබාගන්න ඕනෑ. ඒ තමයි, අතීතයේ 60,000ක් දෙනා මැරුණේ, රෝහණ විජේවීර සහෝදරයා මහ පොළොව සිපගත්තේ, ශිෂ්‍ය ව්‍යාපාරවල හිටපු ත්‍රිමාවිතානලා, වෙනුරලා, නිමල්ලා, නිස්මිලා, රංජිතම් ගුණරත්නම්ලා මහ පොළොව සිපගත්තේ බෙදුම්වාදයට විරුද්ධ නිසා කියන එක. නමුත් අද අපේ රටේ තිබෙන ආර්ථික අසහනය පාවිච්චි කරලා, අපේ රටේ තිබෙන ආර්ථික අසරණකම පාවිච්චි කරලා උතුරේ බෙදුම්වාදී අන්තවාදීන් කටයුතු කරන බවක් පෙනෙනවා. අපි දන්නවා, රාසමාණික්කම්ලා, විග්නේෂ්වරන්ලා ඇතුළු පිරිස අදටත් ත්‍රස්තවාදය අත් හැරපු අය නොවෙයි, ජාතිවාදය අත් හැරපු අය නොවෙයි කියන එක. ඒ අය මෙහේදි බයිලා ගහනවා. මම විශේෂයෙන් දැක තිබෙනවා, රාසමාණික්කම් කියන මන්ත්‍රීවරයා දෙමළ ජනතාවට දෙමළ භාෂාවෙන් එක කථාවක් කියනවා, සිංහල ජනතාව නොමඟ යවන්න සිංහල ජනතාවට සිංහලෙන් තව කථාවක් කියනවා, පිට රට ඉන්න අය රවටන්න ජාත්‍යන්තර භාෂාව වන ඉංග්‍රීසි භාෂාවෙන් තවත් එකක් කියනවා.

දෙමළ ඩයස් පෝරාවේ කරට අත දමාගෙන, දෙමළ ඩයස් පෝරාවේ න්‍යාය පත්‍රය තමයි මේ ත්‍රස්තවාදියෝ ටික පාර්ලිමේන්තුව ඇතුළේ ක්‍රියාත්මක කරන්නේ. ඒ ත්‍රස්තවාදියෝ ටික තවමත් ඒ නොමඟ යෑම ප්‍රතික්ෂේප කරලා නැහැ. ඒ අය ඊළම ප්‍රතික්ෂේප කරපු අය නොවෙයි; ත්‍රස්තවාදය ප්‍රතික්ෂේප කරපු අය නොවෙයි. ප්‍රභාකරන්ගේ ක්‍රියාකාරිත්වය ප්‍රතික්ෂේප කරපු අයත් නොවෙයි. ඒ නිසා අදටත් ඔවුන් ත්‍රස්තවාදීන්ම තමයි; අන්තවාදීන්ම තමයි; බෙදුම්වාදීන්ම තමයි කියන එක මම භය නැතුව කියනවා. ඒ අයගෙන් පරිස්සම් වෙන්න ඕනෑ. විශේෂයෙන්ම සාමකාමී මුස්ලිම් ජනතාව, සාමකාමී දෙමළ ජනතාව, සාමකාමී සිංහල ජනතාව මේ වාගේ ත්‍රස්තවාදීන්ගෙන් පරිස්සම් වෙන්න ඕනෑ. එහෙම නැති වුණොත් අනාගතයේ දී නැවත වතාවක් බේදවාචකයක් නිර්මාණය වෙන්න පුළුවන්. ඒ බේදවාචකය තුළ සිංහල, දෙමළ, මුස්ලිම් මිනිස්සු මරාගෙන මැරෙන, දැවැන්ත මිනී කඳු ගොඩගැහෙන තත්ත්වයක් හැමදාම නිර්මාණය වෙන බව අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පළාත් සභා හඳුන්වා දුන්නා. ඒක ඇත්ත. හැබැයි, දැන් ඒ ගොල්ලන් ඒ අසරණකම පාවිච්චි කරලා පොලිස් බලතල සහ ඉඩම් බලතල ඔක්කෝම ඉල්ලා ගන්නවා. ඒවා තිබුණේ නැති පසුගිය කාලයේත් ඒ ගොල්ලන් හැසිරුණේ කොහොමද කියලා අපි දැක්කා. පොලිස් බලතල දුන්නොත් පොලීසියට කෙළවනවා, ආරක්ෂක අංශවලට කෙළවනවා. ඒ වාගේම ඉඩම් බලතල ඇතුළු අනෙකුත් බලතල දුන්නොත් බෙදා ගැනීම හෝ නිවැරැදිව කරගෙන යනවා. මේ ක්‍රියාන්විතයට මුහුණ දීලා පොලීසියේ විශාල පිරිසකට ජීවිත අහිමි වුණා. ආරක්ෂක අංශයේ විශාල පිරිසක් මේ ක්‍රියාන්විතයට සම්බන්ධ වුණා. ඒ නිසා අපට රණවිරුවන් දස දහස් ගණනක් අහිමි වුණා. ඒක අපට මිල කරන්න බැහැ. අනෙක් පැත්තෙන් ඉන්දු-ලංකා ගිවිසුමට විරුද්ධව රෝහණ විජේවීර සහෝදරයා ඇතුළු 60,000ක් මහ පොළොව සිප ගත්තා. ඒ වාගේම එම ක්‍රියාන්විතයේ ඊළඟ අදියර හැටියට, අපේ රටේ -මව්බිමේ- ඒකීයත්වය රැක ගැනීම සඳහා ඉදිරිපත් වූ ආරක්ෂක අංශ, ත්‍රිවිධ හමුදාව, පොලීසිය සහ සිවිල් ආරක්ෂක

[ගරු නිමල් පියතිස්ස මහතා]

දෙපාර්තමේන්තුව වැනි අංශවලින් අපට දරාගන්න බැරි විධියේ මානව සම්පත් අහිමි වුණා. එදා යුද්ධයෙන් කරගන්න බැරි වුණු දේ, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාත්, ආණ්ඩුවේ නායකයෝත් ඇතුළු මුළු රටම භය කරලා ඉටුකර ගන්න මේ පාර්ලිමේන්තුවේ සිටින ත්‍රස්තවාදීන් අද උත්සාහ ගන්නවා.

දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නැවත තිබුණාටත් වඩා පූර්ණව බලාත්මක කරන්න උත්සාහ ගන්නවා කියන අනතුර අපි අඟවනවා. මහා නායක, ත්‍රෛනිකායික ස්වාමීන් වහන්සේලාගෙන්, මේ රටට ආදරය කරන මහා සංඝ රත්නයෙන් සහ මේ රටට ආදරය කරන දේශප්‍රේමී ජාතිවාදී සමස්ත ජනතාවගෙන් අපි වැඳ නමස්කාර කර ඉල්ලා සිටිනවා, මේ සිදු කරන කුමන්ත්‍රණයට විරුද්ධව, මේ ජාතිවාදී කුමන්ත්‍රණයට විරුද්ධව, මේ බෙදුම්වාදී කුමන්ත්‍රණයට විරුද්ධව සහ ඊළාම්වාදී කුමන්ත්‍රණයට විරුද්ධව පෙළ ගැහෙන්න කියලා. එක්සත් ජනතා නිදහස් සන්ධානය නැමැති හෙලිකොප්ටරය වටා රටේ ජනතාව ඒකරාශිවෙලා අවසාන මොහොතේ හෝ මේ මව්බිම බේරා ගැනීම සඳහා එක්වන්න; රොක්වන්න; රොද බැඳගන්න කියන ඉල්ලීම කරමින් මගේ කතාව අවසාන කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.26]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිවරයා විසින් නවවැනි පාර්ලිමේන්තුවේ හතරවැනි සැසි වාරය විවෘත කරමින් ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශනය පිළිබඳව විවාද කරන අවස්ථාවයි මේ. මෑත ඉතිහාසයේ දරුණුතම ආර්ථික අර්බුදයකට මුහුණ දෙන වකවානුවකයි අපි මේ සිටින්නේ කියන එක අපි කවුරුත් දන්නවා. එයින් ගොඩ ඒම සඳහා, කටුකවුත්; වේදනාකාරීවුත්; ජනතාව දැඩි පීඩනයට ලක්වන්නාවූත් තීරණ ගණනාවක් ගැනීමට අකමැත්තෙන් වුවත් රජයට සිද්ධ වෙලා තිබෙනවා. මේ වන විට බිඳ වැටෙමින් තිබෙන රාජ්‍ය මූල්‍ය පද්ධතිය යම්තාක් දුරකට හෝ සුරක්ෂිත කිරීමට රජයට හැකියාව ලැබී තිබෙනවා. ඒ සඳහා රාජ්‍ය වියදම් පාලනය, බදු පැනවීම් ඇතුළු විවිධ ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. රජය ගත් මේ තීන්දුවලට එරෙහිව මේ වෙන කොට පාර්ලිමේන්තුව තුළත්, ඉන් පිටතත් විශාල විරෝධතා ගොඩ නැඟෙමින් පවතිනවා.

මට කලින් කතා කළ මගේ මිත්‍ර මන්ත්‍රීතුමාත් සඳහන් කළා, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව රටේ විශාල මතයක් ගොඩ නැඟිලා තිබෙනවා. මට කියන්න තිබෙන්නේ මේ කාරණයයි. ජනාධිපතිතුමා, මේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නැවත බලාත්මක කරන්න හැදුවත්, ඒක සම්මත කරන්න ඕනෑ මේ පාර්ලිමේන්තුවෙන්. මේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව අපටත් යම් මතයක් තිබෙනවා. ඒ නිසා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙනවා කියලා ගරු ජනාධිපතිතුමා ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කිව්වාට, එය සම්මත කිරීමේ අයිතිය තිබෙන්නේ අපට. ඒ නිසා, ජනාධිපතිතුමාට ඒක හේත්තු කරලා වැඩක් නැහැ. අපි ඒක සම්මත කළේ නැත්නම් ඒක බලාත්මක වෙන්නේ නැහැ. ඒ නිසා අපි ඒ පිළිබඳව කලබල විය යුතු නැහැ. ඒ පිළිබඳව විවිධ පුද්ගලයන්ගේ විවිධ මත තිබෙනවා.

ඒ නිසා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ එල්ලිලා ඡන්දය ගන්න හදනවා නම්, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ එල්ලිලා දේශපාලනය කරන්න හදනවා නම්, ඒ ගැන කලබල විය යුතු නැහැ. මොකද, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බලාත්මක කරන්න කියලා තවම පාර්ලිමේන්තුවට ගෙනැල්ලාත් නැහැ; ඒ ගැන තීරණයක් අරගෙනත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම බදු ක්‍රමය පිළිබඳවත් කියන්න කැමැතියි. අපේ රටේ වෘත්තිකයන් හයිඩ් පිටියට රැස් වෙලා, බදු වැඩි කිරීම පිළිබඳ විරෝධතා රැලියක් පැවැත් වූ බව මම ඊයේ දැක්කා. ඊයේ දවසේ රාජ්‍ය සේවයේ නිරත වෘත්තිකයන් වැඩ වර්ජනයක් කළා. "මේ බදු වැඩි කිරීම වැරැදියි, මේ බදු වැඩි කිරීම වහාම අකුළා ගන්න" කියා තමයි මේ සියලුදෙනා සටන් කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අලුතින් බදු වැඩි කිරීමක් කරලා නැති බව අපි මුලින්ම කියන්න ඕනෑ. 2019 තිබුණු බදු ප්‍රතිපත්තිය තමයි නැවත මේ ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. ඒ හැර අලුතින් වැඩි කරපු බද්දක් නැහැ. 2019 තිබුණු බදු ටික තමයි නැවත මේ පනවා තිබෙන්නේ. හැබැයි, එදා -2019 දී- තිබුණු තත්ත්වය නොවෙයි, අද අපේ රටේ තිබෙන්නේ. ඒක තමයි තිබෙන ප්‍රශ්නය. අද වෙනකොට අපේ රටේ උද්ධමනය වැඩි වෙලා; පොලී අනුපාතය වැඩි වෙලා තිබෙනවා. ජීවත් වීමට ඇති අමාරුව හේතුවෙන් මේ බදු පැනවීම මිනිස්සුන්ට දැනිලා තිබෙනවා. නමුත් අලුතින් බදු වැඩි කිරීමක් දැන් සිද්ධ වෙලා නැහැ. වාර්ෂිකව රුපියල් ලක්ෂ 12ට වඩා අඩු ආදායමක් ලබන පුද්ගලයන් ආදායම් බදුවලින් නිදහස් කරනවාය කියන සහනය දිගටම මේ රටේ තිබුණා. ඒ නිසා මේක පටලවා ගන්න හොඳ නැහැ. හුඟක් අය හිතා ගෙන ඉන්නවා, මේක අලුතින් ගෙනාපු බද්දක් කියලා. මේ ආණ්ඩුව අලුතින් ගෙනාපු බද්දක් නැහැ. තිබුණු බද්ද තමයි නැවත යථාවත් කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ බදු ප්‍රතිපත්තියේ තිබෙන දුර්වලතා පිළිබඳව, අපේ රටේ සිටින බදු හොරු ගැන, බදු ගෙවන්නේ නැති මිනිස්සු පිළිබඳව මා දිගින් දිගටම මේ පාර්ලිමේන්තුවේදී කථා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ දළ දේශීය නිෂ්පාදිතය 2021 අවුරුද්දේ රුපියල් මිලියන 16,809,000යි. දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව 2021 අවුරුද්දේ රාජ්‍ය ආදායම රුපියල් මිලියන 1,463,810යි. දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව රාජ්‍ය ආදායම ප්‍රතිශතයක් හැටියට ගත්තොත් එය සියයට 8.71යි. අපේ රටේ බදු ක්‍රමයේ තිබෙන හිඩැස කොහොමද කියලා මේ සංඛ්‍යා දත්ත තුළින්ම පැහැදිලි වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව රාජ්‍ය ආදායම ප්‍රතිශතයක් හැටියට ගත්තොත් ඉන්දියාවේ එය සියයට 19යි; පාකිස්තානයේ සියයට 12යි; නේපාලයේ සියයට 24යි; ඕස්ට්‍රේලියාවේ සියයට 35යි; ජර්මනියේ සියයට 52යි; ඉතාලියේ සියයට 48යි; ජපානයේ සියයට 35යි; ෆින්ලන්තයේ සියයට 52යි. ඒ අනුව ඕනෑම රටක සංවර්ධනය හා ජනතාවට ලබා ගත හැකි සුබසාධනය තීරණය වෙන්නේ ඒ රටේ රාජ්‍ය ආදායම පදනම් කරගෙනයි. ඕනෑම රජයකට ආදායම නැත්නම් ඒ ආදායම ලබා ගන්න පුළුවන් ක්‍රම තිබෙන බව අපි පිළිගන්න ඕනෑ. ඒ ආකාරයට රජයකට ආදායම් ලැබෙන ක්‍රම ගණනාවක් තිබෙන බව ඔබතුමාත් දන්නවා ඇති, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රජයකට ආදායම් ලබා ගත හැකි එක ක්‍රමයක්

තමයි රටේ ඇති භෞතික සම්පත් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත පවත්වා ගෙන යැමෙන් ලැබෙන ආදායම. ඒ වාගේම ජාත්‍යන්තර වෙළෙඳාම තුළින් ලැබෙන ආදායම, බදු වශයෙන් ලැබෙන ආදායම, රජය මඟින් පනවන විවිධ ගාස්තු සහ විවිධ රටවලින් ලැබෙන ප්‍රදාන තමයි රාජ්‍ය ආදායම් යටතට අයත් වන්නේ. මේ මූලාශ්‍රවලින් තමයි රාජ්‍ය ආදායම සමන්විත වෙන්නේ. අපේ රටේ බදු ආදායම් දශක දෙකක සිට සමගාමීව, ශීඝ්‍ර ලෙස පහත වැටිලා තිබෙනවා. ගොඩක් අය හිතා ගෙන ඉන්නවා, බදු ආදායම පහත වැටිලා තිබෙන්නේ ආණ්ඩු විසින් ගන්නා තීරණ නිසා කියලා. නමුත් මා ඒ කාරණයට එකඟ නැහැ. බදු ආදායම පහත වැටීමට බලපාන්නේ ආණ්ඩු විසින් ගන්නා තීරණ පමණක් නොවෙයි. අපේ රටේ ධනවතුන්, සමාගම්, වෘත්තීයවේදීන් බදු ගෙවන්නේ නැත්නම් මොන ප්‍රතිපත්ති ගෙනාවත්, මොන බද්දක් පැනෙව්වත් වැඩක් වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා හැම දාම කියපු කාරණයක් නැවත මතක් කරන්න කැමැතියි. අපේ රටේ පෞද්ගලික ආදායම් බදු ලිපි ගොනු විවෘත කරලා තිබෙන්නේ 292,000යි. ඒකෙන් 2021 අවුරුද්දේ returns එවලා තිබෙන්නේ 125,000යි. මිලියන 22ක ජනගහනයක් සිටින අපේ රටේ රුපියලක් හෝ ආදායම් බදු වශයෙන් ගෙවලා තිබෙන්නේ 30,000ක් බව ඔබතුමා පිළිගන්නවාද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

අපේ රටේ ලියාපදිංචි ප්‍රධාන සමාගම් තිබෙන්නේ 105,000යි. ඒ ප්‍රධාන සමාගම්වලින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලිපි ගොනු දීලා තිබෙන්නේ 65,000යි. ඒකෙන් returns එවලා තිබෙන්නේ 25,000යි. හැබැයි, 105,000ක් වන අපේ රටේ තිබෙන සමාගම්වලින් 2022 අවුරුද්දේ බදු ගෙවලා තිබෙන්නේ 15,069යි. මා ඔබතුමාට මේ කාරණයත් කියන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ රටේ බදු ගෙවන පුද්ගලයන් ගත්තොත්, රුපියල් මිලියන 300කට වැඩියෙන් බදු ගෙවන අය ඉන්නේ එක්කෙනායි; රුපියල් මිලියන 100 සිට රුපියල් මිලියන 50 දක්වා බදු ගෙවන අය ඉන්නේ තුන්දෙනායි; රුපියල් මිලියන 50 සිට රුපියල් මිලියන 25 දක්වා බදු ගෙවන අය ඉන්නේ දහසයදෙනායි; රුපියල් මිලියන 25 සිට රුපියල් මිලියන 10 දක්වා බදු ගෙවන අය ඉන්නේ හැටදෙනායි. ඒ කියන්නේ, ලංකාවේ රුපියල් මිලියන 10කට වැඩිය බදු ගෙවන අසූදෙනායි ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022 අවුරුද්දේ අපේ රටේ මුළු බදු ආදායම රුපියල් බිලියන 860යි. ඒ කියන්නේ, අපි බදු විධියට එකතු කරගෙන තිබෙන්නේ රුපියල් බිලියන 860යි.

සුරාබදු ආදායම ඇතුළුව මේ ඔක්කෝම ගත්තත් රජයට ලැබෙන්නේ රුපියල් බිලියන 1,628යි. එහෙම නම් මම ඔබතුමාගෙන් අහනවා, රුපියල් මිලියන 10ට වැඩියෙන් බදු ගෙවන 80දෙනකු පමණක් නම් මේ රටේ ඉන්නේ, තවත් මොනවාද අපි කථා කරන්නේ කියලා. මේක රජයේ වරදක් නොවෙයි, මිනිස්සු බදු ගෙවන්නේ නැහැ. සමාගම් 105,000කින් සමාගම් 15,069යි, බදු ගෙවන්නේ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මොනවාද කරන්නේ? ලංකාවේ 290,000කට වැඩි ලිපිගොනු ප්‍රමාණයක් තිබෙනවා, රුපියලක් හරි ගෙවලා තිබෙන්නේ 30,000යි. මිලියන 22ක ජනගහනයක් ඉන්න රටේ 30,000යි නම් බදු ගෙවන්නේ, අපි කථා කරන්නේ මොනවාද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

දැන් මේ බදු ප්‍රතිපත්තිය ගැන බලමු. බදු වැඩි කළා කියලා වෘත්තිකයෝ බැන්නා. මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, අපේ රටේ සමස්ත රාජ්‍ය සේවය වෙත. අපේ රටේ සමස්ත රාජ්‍ය සේවකයන් ප්‍රමාණය 14,93,472යි. නමුත්, මේ බද්ද බලනොපාන සංඛ්‍යාව කී දෙනෙක් ඉන්නවාද? 14,17,306යි. ඒ කියන්නේ රාජ්‍ය සේවයේ සියයට 95කට මේ බද්ද බලපාන්නේ නැහැ. රාජ්‍ය සේවකයන්ගේ උපයන විට ගෙවීමේ බදු ප්‍රමාණය වැඩි කළාය කියනවා. රාජ්‍ය සේවයේ ඉන්න 14,93,472න් 14,17,306කට මේ බද්ද බලපාන්නේ නැහැ. එහෙම නම්, මේ බද්ද බලපාන්නේ කී දෙනෙකුටද? 76,166කට විතරයි. ඒ කියන්නේ වෛද්‍යවරු, විශ්වවිද්‍යාල ආචාර්යවරු, ඉංජිනේරුවන් වාගේ මේ රටේ රාජ්‍ය සේවයේ යෙදෙන්නන්ගෙන් සියයට 5කට විතරයි මේ වැඩි කළ බද්ද බලපාන්නේ. හැබැයි, රටට කියන්නේ සමස්ත රාජ්‍ය සේවයටම බදු ගහලා කියලායි. නැහැ. සමස්ත රාජ්‍ය සේවයේ සිටින 14,93,472කින් 14,17,306කට බදු පැනවිලා නැහැ. මේ රටේ වෛද්‍ය ක්ෂේත්‍රයේ 20,000ක් විතර ඉන්නවා. විශේෂඥ වෛද්‍යවරු 2,000ක් විතර ඉන්නවා. අපි පිළිගන්නවා, ඔවුන්ගේ වැටුප රුපියල් 150,000යි, 250,000යි කියලා. මේ අයට රුපියල් 30,000ක, 40,000ක වාගේ බද්දක් වැටිලා තිබෙනවා. ඒක ඒ අයට දරාගන්න අමාරුයි කියා අපි පිළිගන්නවා. හැබැයි, මේ බදු එකතු කරන්නේ නැතිව අපි කොහොමද රට පවත්වාගෙන යන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරායේ සේවකයන් එළියට බැහැලා ඉන්නවා මම දැක්කා. වරායේ ඉන්නවා, සේවකයෝ 10,092ක්. ඒ වරාය සේවකයන් 10,092න් සියයට 47කට මේ බද්ද බලපාන්නේ නැහැ. වරාය සේවකයන් 10,092න් 4,700කට විතරයි මේ බද්ද බලපාන්නේ. ඊළඟට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ගත්තොත්, සේවකයෝ 2,691ක් ඉන්නවා. ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයිනුත් මේ සම්බන්ධයෙන් පාරට බැස්සා. හැබැයි, මේ බද්දට යටත් වෙන්නේ නැහැ, සියයට 20ක්. සියයට 80ක් බද්දට යටත් වෙනවා. ඒ හැම කෙනෙකුම රුපියල් ලක්ෂ 2කට වඩා පඩි ගන්න අය. ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයෝ 20,655ක් ඉන්නවා. ඉන් සියයට 48කට මේ බද්ද බලපාන්නේ නැහැ. සියයට 52කට විතරයි බලපාන්නේ. රුපියල් ලක්ෂ 2කට වඩා පඩි ගන්න සියයට 9ක් විදුලිබල මණ්ඩලයේ ඉන්නවා. ඔබතුමන්ලා කියනවා, මේක හෙණ ගහන අපරාධයක් කියලා. අපි අහනවා, බදු අය නොකර රටක් පවත්වාගෙන යන්නේ කොහොමද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ රටවල් ගණනාවක බදු පනවන ක්‍රම පිළිබඳ විස්තර මා ළඟ තිබෙනවා. සමහර රටවල බද්ද සියයට 47යි, සියයට 45යි, සියයට 42යි. වෙන රටවල පඩිය ගන්නකොට බදු කපලා ඉවරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ බදු වැඩි කරන එක මිනිස්සුන්ට දරාගන්න අමාරුයි. අපි නැහැ කියන්නේ නැහැ. මේ වෙලාවේ ඒ පරණ ක්‍රමය වෙනස් කරලා බදු වැඩි කරපු එක මේ රටේ යම් ප්‍රතිශතයකට අමාරුයි. පසුගිය කාලයේත් මේ ක්‍රමය තිබුණා. හැබැයි, වෘත්තිකයෝ හිටපු ජනාධිපතිතුමා හමුවෙලා කිව්වා, මේ බදු අය කරන සීමාව වැඩි කරන්න කියලා. ඊගොල්ලන් ගිහිල්ලා රුපියල් මිලියන 12 සීමාව රුපියල් මිලියන 30 දක්වා වැඩි කර ගත්තා. වෘත්තිකයෝ ආණ්ඩුව හදන්න උදවු කළාය කියලා රුපියල් ලක්ෂ 120ට සීමා වුණු බද්ද, රුපියල් ලක්ෂ 300 දක්වා වැඩි කර ගත්තා. එම බදු නැවත පනවපු එක තමයි අපි කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සමාගම් ගැන කථා කළොත්, මේ රටේ සමාගම් 105,000ක් තිබෙනවා. ඒ අතරින් පෞද්ගලික සමාගම් 15,069ක් බදු ගෙවනවා. මේ බදු ගෙවන සමාගම් 15,069න් ලැබෙන ආදායමෙන් සියයට 82ක්ම ගෙවන්නේ සමාගම් 343යි. ඒ කියන්නේ මේ රටේ සමාගම් 105,000න්, 343යි හරියට බදු ගෙවන්නේ. අපි තව මොනවාද කථා කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? ලංකාවේ ලොකුම වී මෝල් හිමියාගේ බැංකු ගිණුමට අවුරුද්දකට රුපියල් බිලියන 35ක් එනවා. නමුත්, අවුරුදු 5ක් තිස්සේ ශත 5ක් බදු ගෙවලා නැහැ. ඒ කියන්නේ, ලංකාවේ ලොකුම වී මෝල් හිමියා

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

ශත 5ක් බදු ගෙවලා නැහැ. ඊළඟට, ලංකාවේ තිබෙන ලොකුම supermarket chain එක ගත්තොත්, branches 462ක් තිබෙනවා. නමුත්, 2021 වර්ෂයේ ශත 5ක් බදු ගෙවලා නැහැ. ලංකාවේ තිබෙනවා, විශාල ඉඩම් කැබලි කරන ප්‍රමුඛ පෙළේ සමාගමක්. Galle Face එක වටේම තිබෙන apartments අයිති වෙන්නේ එම සමාගමට. එම සමාගම විසින් මාලදිවයිනේ සහ ඩුබායිවලත් ගොඩනැඟිලි හදනවා. හැබැයි, අවුරුදු 4ක් යනකල් මේ සමාගම ශත 5ක් බදු ගෙවලා නැහැ.

අපේ රටේ තිබෙන, වැඩිපුරම තේ අපනයනය කරන සමාගම ගෙවන බද්ද බලන්න. එම සමාගම යූඑස් ඩොලර් බිලියන 450ක තේ අපනයනය කරනවා. අපේ නිමි ඇඳුම් අපනයනකරුවනුත් ශත 5ක් බදු ගෙවන්නේ නැහැ. අපේ රටට මහා පරිමාණයෙන් සීනි, කිරි පිටි ආනයනය කරන ව්‍යාපාරිකයෝත් බදු ගෙවන්නේ නැහැ. ඒ අයට බදු ලිපිගොනුවක්වත් නැහැ. ඒ නිසා මේ රටේ තිබෙන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව දූෂිතම ආයතනයක් කියලා මම හැම දාම වාගේ කියනවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ මේ සියල්ල නියාමනය කරන ක්‍රමවේදයක් නැහැ. රුපියල් බිලියන 8ක් පමණ වියදම් කරලා RAMIS කියලා පරිගණක පද්ධතියක් ඒකේ හැදුවා. අද වෙනකොට අවුරුදු 8ක් ගතවෙලා තිබෙනවා. නමුත්, ඒ පරිගණක පද්ධතිය වැඩ කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ විශාල වශයෙන් ආදායම් ලබන පුද්ගලයන් ඉන්නවා. ඒ වාගේම අමාරුවෙන් ජීවත් වෙන මිනිස්සු ප්‍රමාණයකුත් ඉන්නවා. අද කොළඹ restaurant එකකට ගිහිල්ලා බලන්න, වාඩි වෙන්න හිස් පුටුවක් තිබෙනවාද කියලා. විශාල ලෙස මුදල් තිබෙන පන්තියකුත් අද ඉන්නවා. ඒ අයට මහා පරිමාණයෙන් සල්ලි තිබෙනවා. නමුත්, ඒ අය ශත 5ක්වත් බදු ගෙවන්නේ නැහැ. බදු එකතු කරන ක්‍රමවේදයක් රට තුළ නැත්නම් මිනිස්සුන්ට මොන බද්ද ගැහුවත් වැඩක් නැහැ.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පසු අපට දෙවැනියට ආදායම් එකතු කරලා දෙන ආයතනය තමයි, Sri Lanka Customs. දවසකට රේගුවට කන්ටේනර් 2,000ක් පමණ පරීක්ෂා කිරීමට එනවා. නමුත්, කන්ටේනර් 5ක්වත් පරීක්ෂා කරන්නේ නැහැ. මේ කන්ටේනර් තුළ සිගරට් එනවා; අරක්කු එනවා; කුඩු එනවා; විවිධ දේවල් එනවා. මේවා පරීක්ෂා කරන්නේ නැහැ. එහි scanning unit එකක් තිබෙනවා. ඒ scanning unit එකේ වැඩ කරන අය අවුරුදු 10ක් තිස්සේ එතැනම ඉන්නවා. හොර බඩු ටික එනකොට scan වෙන එක blur කරලා බඩු ටික පන්නනවා. අද මේවා අල්ලන්න ක්‍රමවේද නැහැ. ඒ නිසා ආණ්ඩුව වැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ මේවා ගැනයි. මිනිස්සු හිතන්නේ තිබෙන මිනිසුන්ගෙන් ගන්නේ නැහැ කියලා. මම කියන්නේ අපට පැහැදිලි බදු ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ කියලා. මොකද, තිබෙන මනුස්සයාගෙන් අපි ගන්න ඕනෑ.

මේ පාර්ලිමේන්තුවේ අපි සියයට 75ක් විතර බදු ගෙවනවා. මේ කථා කරන මමත් අවුරුදු 15ක් තිස්සේ ආදායම් බදු ගෙවනවා. හැමෝම බදු ගෙවනවා. අලුත් බද්ද යටතේ මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් රුපියල් 50,000ක්, 60,000ක් වාගේ මුදලක් කපලා තිබෙනවා. මේවා අපි ගෙවන්න ඕනෑ.

තමන්ගේ වැටුපෙන් අය කරන බද්දට එරෙහිව මහජන බැංකුවේ සේවකයන් එළියට බැස්සා. මහජන බැංකුවේ DGMලා නවදෙනෙක් ඉන්නවා. මේ DGM කෙනෙකුගේ පඩිය රුපියල් 750,000යි. ඒ නිලධාරින්ට බෙන්ස් කාර් අරන් දුන්නා. ඒ බෙන්ස් කාර් ටික lease කරලා අරගෙන බැංකුව lease එක ගෙවනවා. එතකොට පඩිය රුපියල් ලක්ෂ 15යි. ඒ ලක්ෂ 15ට එක්ලක්ෂ ගණනක බද්දක් එනවා. මහජන බැංකුවම වෙනම සමාගමක් හදලා ඒ බද්ද ගෙවනවා. ඉතින්, මහජන බැංකුවේ සේවකයන් එළියට බහින එක අහන්න දෙයක්ද?

මහ බැංකුවේ සේවකයිනුත් පඩියට අදාළ tax එක ගෙව්වේ නැහැ. 2019න් පස්සේ තමයි මහ බැංකුවේ සේවකයිනුත් බදු ගෙවන්න තීරණය කළේ. මහ බැංකුවේ සේවකයන් එළියට බැස්සා ලු, ලංකා බැංකුවේ සේවකයන් එළියට බැස්සා ලු, මහජන බැංකුවේ සේවකයන් එළියට බැස්සා ලු. ඔව්, බැස්සා. ඒ, ඇයි? මේ කිසිම කෙනෙක් මීට පෙර බදු ගෙව්වේ නැහැ. සමහර අයගේ වැටුප රුපියල් ලක්ෂ දෙකයි, තුනයි. සමහර අයට රුපියල් 3,000ක්, 3,500ක් බදු ගහලා තිබෙනවා. බදු අය කරන්නේ නැතිව රටක් පවත්වාගෙන යන්නේ කොහොමද? රට සංවර්ධනය කරන්නේ කොහොමද? මේ රටේ පවුල් ලක්ෂ 68ක් ඉන්නවා. එයින් පවුල් ලක්ෂ 38කට ආණ්ඩුව සහනාධාර දෙනවා. පාරවල් හදන්න ඕනෑ, විදුලිය දෙන්න ඕනෑ. මේ සියලු දේ කරන්න ඕනෑ. අපි පිළිගන්නවා, මේ වෙලාවේ මේ බදු ක්‍රමය ක්‍රියාත්මක කරන එක අමාරුයි කියලා. මම කියන්නේ නැහැ, ඒක හරි කියලා. මේ බදු ක්‍රමය ගෙනාපු වෙලාව පිළිබඳවයි ප්‍රශ්නය තිබෙන්නේ. මම නම් මේ බදු ක්‍රමයට පක්ෂයි. හැබැයි, බදු ක්‍රමය ගෙනාපු වෙලාව වැරැදියි. මොකද, මේ වෙලාවේ මිනිසුන්ට අමාරු තත්ත්වයක් තිබෙන්නේ. හැබැයි, රජයට වෙන විකල්පයකුත් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය ආදායම් කළමනාකරණය කරගන්න රජයට වෙන ක්‍රමයක් නැහැ.

මම ඊයේ නාවලපිටිය රෝහලට ගියා. ඒ වෙලාවේ මම දැක්කා, blood test කරන්න samples ගන්න අවශ්‍ය පොඩි පොඩි බෙහෙත් ද්‍රව්‍ය එම රෝහලේ තිබුණේ නැති බව. ඒ වෙලාවේත් රෝගීන් විශාල සංඛ්‍යාවක් පැමිණ හිටියා. නමුත්, ඒ අයට අවශ්‍ය බෙහෙත් තිබුණේ නැහැ. මේ වෙලාවේ අපට අත්‍යවශ්‍ය බෙහෙත් ටික ගේන්න, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ටික ගේන්න මුදල් නැතිව ඉන්නේ. රාජ්‍ය සේවයේ 14,93,472ක් ඉන්නකොට සියයට 95කට බලනොපාන, සියයට 5කට බලපාන මේ බද්ද වෙනුවෙන් සියලුදෙනා පාරට බහින එක සාධාරණද කියලා මම අහනවා. මේ තිබෙන තත්ත්වය තුළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපට ලබා දෙන මුදල ලැබුණු පසු අපේ ආර්ථිකය යම් තැනකට ගන්න පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරනවා. අපට වුණත් සමහර දේ ගැන පැහැදීමක් නැහැ. හැබැයි, මේ ආර්ථික අර්බුදයත් එක්ක අපට වෙන විකල්පයක් නැහැ. මේ තිබෙන ආර්ථික අර්බුදයෙන් ගොඩ එන්න නම් මේ රටේ ජීවත් වෙන හැම කෙනෙකුටම දායක වෙන්න වෙයි; කැප කිරීම් කරන්න වෙයි; හැම කෙනෙකුටම මේකට සම්බන්ධ වෙන්න වෙයි. ගොඩක් අය හිතාගෙන ඉන්නවා, මේ තත්ත්වය ඇති කළේ ආණ්ඩුව නිසා මේ කටයුත්ත ආණ්ඩුව භාර ගන්න ඕනෑ කියලා. මේ වෙලාවේ රටක් හැටියට අපි කරන්න ඕනෑ රට දාලා යන එක නොවෙයි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හැම කෙනෙක්ම කැප කිරීම් කරන්නේ නැති එකයි ඔබතුමා කිව්වේ. හැම කෙනෙක්ම කැප කිරීම් කරන්නේ නැහැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒක තමයි මම කිව්වේ. ඒ කැප කිරීම හැමෝම කරන්න ඕනෑ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
කරන්න ඕනෑ කිව්වාට කැප කරන්නේ කොහොමද? ඒක වෙන්නේ කොහොමද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ඔබතුමා යෝජනා කරන්න. මේ ආණ්ඩුවෙන් කෙරෙන්නේ නැත්නම් ඔබතුමා ඒ කැප කිරීම් යෝජනා කරන්න. හිටපු ඇමතිතුමනි, අද සියලු රාජ්‍ය ආදායම් කපලා, ඇමතිවරුන්ගේ වරප්‍රසාද කපලා, මේ සියලු දේ කපලා. මමත් ඇමතිවරයෙක් වෙන්න ඕනෑ. ඒත් අපි ඇමතිකම් භාරගෙන නැහැ. ඒ කැප කිරීම් අපි කරලා තිබෙනවා. ඒ නිසා අපි කැප කිරීම් කරමු. ඕනෑ දෙයක් ඔබතුමන්ලා යෝජනා කරන්න. රාජ්‍ය ආදායම් කපලා, අනවශ්‍ය වියදම් කපලා, ඒ සියල්ල කරලා තිබෙනවා. මම සියයට සියයක් ඔබතුමාත් එක්ක එකඟයි. ඒ කැප කිරීම හැම කෙනාම කරන්න ඕනෑ. එහෙම නැතිව, ලොක්කන් විතරක් කැප කිරීම් කරලා සොක්කන්ට ගහලා හරියන්නේ නැහැ. මම ඔබතුමාත් එක්ක සියයට සියයක් එකඟයි, වාසුදේව නානායක්කාර මැතිතුමනි. මේ වෙලාවේ අපි හැමෝම එකට එක්කහු වෙලා ඒ කැප කිරීම කළේ නැත්නම් අපට මේකෙන් ගොඩ එන්න බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ ගන්නේ යම් තීන්දු අම්හිරි තීන්දු වෙන්න පුළුවන්. මගේ එකම තර්කය තමයි, මිලියන 22ක ජනගහනයක් ඉන්න රටක ශත පහක් හෝ ආදායම් බදු ගෙවන්නේ පුද්ගලයන් 30,000යි නම්, අපේ රටේ 105,000ක් වන සමාගම් අතරින් ලියා පදිංචි වෙලා 343යි නම් බදු ගෙවන්නේ, ඒ ආදායමින් සියයට 82ක් කොහාටද යන්නේ? මේ රටේ ප්‍රබල කෝටිපතියෝ ආදායම් බදු ගෙවන්නේ නැත්නම්, බදුවලට පොලු තියලා ඉන්න මිනිස්සුන්ට නීතිය ක්‍රියාත්මක කරන්නේ නැත්නම්, අද අපේ රටේ සාමාන්‍ය නීතිය මොකක්ද, වාසුදේව නානායක්කාර මැතිතුමනි? අර්ජුන් ඇලෝසියස් මිලියන 700ක් බදු ගෙව්වේ නැහැ. ඔහුව උසාවියට ඉදිරිපත් කළාම ශරීර ඇප මත එළියට ආවා. ඔබතුමන්ලා පාර්ලිමේන්තුවේ ඒවා කථා කරන්න. අපරාධ නීතිය ගෙනෙන්න කියන්න. අපි ඔක්කෝම එකට එක්කහු වෙලා ඒකට අත් ඔසවමු. බදු ගෙවන්නේ නැති මිනිස්සු හිරේ දමනවා කියලා නීතියක් ගෙනෙන්න. අද අපේ රටේ බදු ප්‍රතිපත්තිය මොකක්ද? ඒක හරියට, ගැටඹේ යන ගමන් පින් කැටයට කීයක් හරි දාලා යනවා වාගෙයි. ඕනෑම කෙනෙකුට පුළුවන් තමන් කැමැති ගණනක් බදු ගෙවලා ප්‍රශ්නය විසඳා ගන්න. පළමුවෙන්ම හිරේ දමන්න ඕනෑ ආදායම් බදු හදන ප්‍රධාන සමාගම් ටික. අපේ රටේ ආදායම් බදු හදන ප්‍රධාන සමාගම් තිබෙනවා. ඒ අය තමයි මේ වංචා ඔක්කෝම පිටුපස ඉන්නේ. ඒ ගොල්ලෝ තමයි මේ returns ඔක්කෝම හංගා ගන්නේ. ඒ ගොල්ලන් තමයි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට, බදු ගෙවන්නන්ට හොරකම් කරන හැටි කියලා දෙන්නේ. ඒ නිසා මේ බදු ක්‍රමය ක්‍රමවත් වෙන්න ඕනෑ. ඕනෑම රටක රාජ්‍ය බදු ආදායම නැතුව බැහැ. මම ඔබතුමාට කිව්වා සුරාබදු දෙපාර්තමේන්තුව ඇතුළේ සිදු වන වංචා ගැන. ඔවුන් අද ස්ටිකර් එකක් introduce කරලා තිබෙනවා. නමුත්, ඒක ක්‍රියාත්මක කරන්න දෙන්නේ නැහැ. සුරාබදු දෙපාර්තමේන්තුවේ ආදායම බලාගෙන ඉන්දැද්දී වැහිලා ගිහිල්ලා. ශ්‍රී ලංකා රේගුවෙන් - Sri Lanka Customs එකෙන් - මොන තරම් ආදායමක් ගන්න පුළුවන්ද? මම ඔබතුමන්ලාට කිව්වේ ඒකයි. දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව අපේ රටේ රාජ්‍ය ආදායම ගත්තොත්, එය සියයට 8.2යි. ලෝකයේ සියලුම රටවල එය සියයට 15ට එහා ගිහිල්ලා තිබෙනවා. සමහර රටවල සියයට 20යි, 30යි.

මොනවා වුණත්, අම්හිරි වුණත් බදු ගෙවන්න අපි පුරුදු වෙන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි නිදහස් අධ්‍යාපනයෙන් ඉගෙන ගත්ත මිනිස්සු. වෘත්තිකයෝ වෙලා හොඳ තැන්වලට ගිහිල්ලා, ඊට පස්සේ බද්දක් ගැහුවා කියලා රට හැර යනවා නම් ඒක සාධාරණද කියලා මම ඒ වෘත්තිකයන්ගෙන් අහනවා. රට වැටෙන වෙලාවට රට දාලා යන එක නොවෙයි, එතකොට උගතුන්, බුද්ධිමතුන් මෙහි ඉන්න ඕනෑ. එහෙම නොකර රට හැදුණාම ආපහු ලංකාවට එන එක නොවෙයි කළ යුත්තේ. ඕනෑ කෙනෙකුට තරහ වෙන්න පුළුවන්, ඕනෑ කෙනෙකුට දොස් කියන්න පුළුවන්. දුෂ්කර වෙලාවකයි අපි රටක ඉන්න ඕනෑ. මහින්ද මහත්මයා යුද්ධය අවසන් කරපු වෙලාවේ ඔක්කෝම එකට හිටියේ නැහැ. හැබැයි, යුද්ධය අවසන් කළාට පස්සේ අපි එහි ප්‍රතිඵලය දැක්කා. ඒ නිසා යුද්ධයකට එහා ගිය ආර්ථික කඩා වැටීමකට ලක් වෙලා ඉන්න මේ වෙලාවේ දේශපාලන න්‍යාය පත්‍රයෙන් බැහැර වෙලා, අපි ඔක්කෝම එකට එක්කහු වෙලා කටයුතු කරන්න ඕනෑ. අනුර දිසානායක මහත්මයා මේ වෙලාවේ සභාවේ හිටියා නම් මේ කාරණා මම එතුමාගෙන් අහන්නයි හිටියේ. මේවාට එතුමන්ලා උත්තර දෙන්න ඕනෑ. අනුර දිසානායක මහත්මයලා ගමේ ගිහිල්ලා රැස්වීම් පවත්වනවා. මම එතුමාගෙන් අහනවා, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන එතුමාගේ මතය මොකක්ද කියලා. ඒ ගොල්ලන් IMF එකට යනවාද නැද්ද? බදු ගහනවාද නැද්ද? ඔබතුමන්ලා කරන වැඩ පිළිවෙළ මොකක්ද කියන්න. ගමක් ගමක් පාසා ගිහිල්ලා රැස්වීම් තියලා, අරයා හොරා, මෙයා හොරා කියලා බණින එක නොවෙයි කළ යුත්තේ. රට ගොඩ ගන්න වැඩ පිළිවෙළ මොකක්ද කියලා ජනතා විමුක්ති පෙරමුණ කියන්න. මම මීට වඩා කථා කරන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අවසාන වශයෙන් මම කියන්නේ මෙච්චරයි. මේ වේදනාකාරී, තීරණාත්මක වෙලාවේ අම්හිරි තීන්දු ගන්න වෙයි, කැප කිරීම් කරන්න වෙයි. මේ කෙටි කාලය තුළ අපි ඔක්කෝම එකට එක්කහු වෙලා ආර්ථිකය ගොඩ ගන්න කටයුතු කරමු කියන යෝජනාව කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු තිස්ස විතාරණ මැතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.48]

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප රට ඉතාම දරුණු කුමන්ත්‍රණයකට මුහුණ දෙනවා. ඇමෙරිකාවට Diego Garcia යුද කඳවුර නැති වුණාට පසුව ලංකාව SOFA හා MCC ගිවිසුම් ක්‍රියාත්මක කරලා, ඇමෙරිකාවේ හමුදා කඳවුරක් මෙහේ පිහිටුවන්නයි අදහස් කරන්නේ. ඒ තීන්දුව අරගෙන තිබෙනවා. ඒ තීන්දුව ක්‍රියාත්මක කිරීමට රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාත්, ඒ ආණ්ඩුවේ ඇත්ත නායකයා වන බැසිල් රාජපක්ෂ මහත්මයා ඇතුළු ඔක්කෝම එකතු වෙලා මේ කුමන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනවා. මෙහෙම කරනකොට එක පැත්තකින් ජනතාව බඩගින්නේ; භාමතේ. ඒ වාගේම මන්දපෝෂණයෙන් පෙළෙනවා. තෙල්, ගෑස්, ඖෂධ වර්ග වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ පිට රටින් ගෙනෙන්න නොහැකි වනකොට, ලෙඩ්ඩු මැරෙනකොට, මේ ප්‍රශ්න වහන්න තමයි, ජාතික ප්‍රශ්නය විසඳීමේ මුවාවෙන් පක්ෂ නායකයන් කැඳවා meetings දෙකක් පැවැත්වූයේ. Meetings දෙකකින් මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්ද?

එතුමාගේ කථාවෙන් පොරොන්දු වෙලා තිබෙනවා, පෙබරවාරි මාසයේ 04වන දායින් පසු මේ මේ විසඳුම් ඉදිරිපත් කරනවා කියලා. මේක සම්පූර්ණයෙන්ම ප්‍රෝඩාවක්. අපේ රටේ ජනතාව බඩගින්නෙන් ඉන්න වෙලාවේ තිබෙන මුදල් ඔක්කෝම ඒ ප්‍රශ්නය විසඳීම වෙනුවෙන් තමයි යොදවන්න ඕනෑ. එහෙම

[ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා]

නැතුව මේ අනවශ්‍ය ප්‍රශ්නයක් ගෙන ඒමේ අදහස මොකක්ද? ආයෙත් බෙදීමක් අපේ රටේ ඇති කරන්නද හදන්නේ? ජාතිවාදය, ආගම් භේදය මේවා සියල්ලම ඇති කරලා 1983 කළු ජූලියටත් අන්ත තත්ත්වයක් ඇති කරන්නයි හදන්නේ. එතකොට අර බඩගින්නේ ඉන්න ජනතාව කියයි, "ඇමෙරිකාව එක්ක ඕනෑ ගිවිසුමක් අත්සන් කරපන්" කියලා. ඒ කියන්නේ MCC එක, SOFA එක වාගේ ඒවා. "ඒ ගොල්ලන්ගෙන් අපට කෑම ලබා දෙන්න පුළුවන් නම්, අපේ ළමයි මන්දපෝෂණයෙන් බේරාගන්න පුළුවන් නම් ඒ වාගේ ගිවිසුම් ඕනෑ එකකට අත්සන් කරපන්" කියලා ජනතාව කියාවි. අන්න ඒක කරන්න තමයි අද මේවා ක්‍රියාත්මක කරන්නේ. මේ අපරාධය මුළු රටටම හෙළිදරව් කරන්න ඕනෑ. රටේ ජනතාව දැන ගන්න ඕනෑ, මෙන්න මේකයි මේකේ අදහස කියලා. මොකද, මේ ආකාරයට ජාතික ප්‍රශ්නය විසඳන්න පුළුවන් වෙන්නේ නැහැ. මම අවුරුදු 3ක් සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ සභාපති හැටියට කටයුතු කළා. එහිදී රැස්වීම් 127ක් පවත්වා හොඳ විසඳුමක් හදලා තිබෙනවා. ඒ ගැන රනිල් වික්‍රමසිංහ මහත්මයා වචනයක්වත් කියන්නේ නැහැ. ඒ වාගේම යුද්ධයෙන් පස්සේ ඇති වුණු තත්ත්වයට මුහුණ දෙන්න LLRC යෝජනා තිබෙනවා. ඒවා ගැනත් කථා කරන්නේත් නැහැ. එතුමාට ජාතික ප්‍රශ්නය විසඳීමට ඇත්ත වශයෙන්ම වුවමනාවක් තිබුණා නම්, මේවා ගැන කථා කරලා, මේවා පදනම් කරගෙන තමයි එතුමා කටයුතු කරන්න ඕනෑ. නැහැ, මේ බොරුවක් කරන්නේ. මේ අවස්ථාවේදී එතුමා බලන්නේ ආර්ථික හා අනිකුත් පීඩාවලින් ඇඟ බේරා ගන්නයි. ඇඟ බේරා ගෙන, ඒ හරහා අයෙත් අපි අතර භේද ඇති කරමින් ජාති භේද ඇති කරන්නයි කටයුතු කරන්නේ. කලින් ආගම් භේදයකුත් ඇති වුණා. ඒවා තවත් උග්‍ර වෙන තත්ත්වයක් ඇති කරන්නයි මේ කටයුතු කරන්නේ. ඉතින්, මේ වාගේ වැඩ පිළිවෙළක් ඉදිරියට ගෙන යෑම අපි තරයේ ප්‍රතික්ෂේප කරනවා. අපි ලංකා සම සමාජ පක්ෂය හැටියට පැහැදිලිව කියනවා, මේවා නොවෙයි, විසඳුම් කියලා. නියම විසඳුම් සකස් කරලා තිබෙනවා. APRC Report එක තිබෙනවා; LLRC Report එක තිබෙනවා. ඕනෑ නම්, task force එකක් හදලා, ඒ task force එක හරහා කටයුතු කරන්නත් පුළුවන්. දෙමළ ජාතික සන්ධානය පමණයි අපි එක්ක එකඟ නොවුණේ. ඒ ගොල්ලන් රැස්වීම්වලට සහභාගි වුණේ නැහැ; ඒක boycott කළා. නමුත් දැන් ඒ ගොල්ලන් කැඳවලා මේවා පදනම් කරගෙන විසඳුමකට යන්න ඕනෑ. ඒක තමයි කරන්න තිබෙන්නේ. නමුත් ඒවා ඔක්කෝම පැත්තකට දාලා තිබෙනවා. ජාති භේද ප්‍රශ්න දැන් අදින්න කිසිම අවශ්‍යතාවක් නැහැ. දැන් ජාති භේද ප්‍රශ්න මොනවත් නැහැ. මේ වෙලාවේ කරන්න තිබෙන්නේ ජනතාව බඩගින්නෙන් බේරා ගන්න එකයි. ඒ කාර්යය කිරීමට අර මැද මිනිහා ගසා කෑම නැති කරලා දාන්න.

එන්.එම්. පෙරේරා සහෝදරයා මුදල් ඇමති වෙලා හිටපු කාලයේදී මීට වඩා දරුණු ආර්ථික අර්බුදයක් තිබුණා. ඒ ආර්ථික අර්බුදය හේතුවෙන් රන් පවුම් හතළිස්තුනක් වුණු පිට රටින් ගෙන්වපු සීනි ටොන් එකක මිල එක රන් පවුම් හයසියයකට නැග්ගා. නමුත් අවුරුදු දෙකකින් ඒ ආර්ථික අර්බුදයෙන් රට ගොඩ ගත්තා. ඒ විතරක් නොවෙයි, බින්දුවට බැහැලා තිබුණු විදේශ විනිමය සංචිතය ඩොලර් මිලියන හාරදහසකට කිට්ටු ගණනකට නැග්ගුවා. ඒ වාගේම, අය වැය පරතරය නැති කළා පමණක් නොවෙයි, අය වැය වාසිදායක අය වැයක් බවට පත් කළා. ඒවා ඔප්පු කර පෙන්වා තිබෙනවා.

සම සමාජ පක්ෂය හැටියට අපි පැරණි විසඳුම් පමණක් නොවෙයි, අලුත් ක්‍රමත් යෝජනා කරනවා. සහයෝගිතා සංකල්පය තිබෙනවා. සහයෝගිතා සංකල්පය සමාජවාදී විසඳුමක් වුණත්, ධනපති රටවල් කිහිපයක් දැන් එය ක්‍රියාත්මක කරනවා. ඒ කියන්නේ, සේවකයන්ට අයිතිය දීලා, වැඩ පොළවල ඵලදායිතාව වැඩි කරන්න පුළුවන් වෙලා තිබෙනවා. අපේ අල්ලපු රට වන ඉන්දියාවේ කේරළ ප්‍රාන්තයේ ටාටා සහ අනෙකුත් සමාගම්වලට හෙක්ටෙයාර හැටතුන්දහසක් තේ තිබුණා. මෙහේ වතු අයිතිකාරයෝ වාගේ ඒ අයත් කිව්වා, "අපට අලාභයි, පඩි වැඩි කිරීම් කරන්න බැහැ" කියලා. වමේ ආණ්ඩුව මොකද කළේ? ඒ ඉඩම් ආපසු අරගෙන සේවකයන්ට අයිතිය දීලා, පාලක මණ්ඩලයක් හරහා නියම පාලනයක් ඇති කරමින් කටයුතු කළා. දැන් පුදුම වෙනවා, ඵලදායිතාව වැඩි කර තිබෙන ආකාරයට.

අපේ පක්ෂයේ ඉන්න කෘෂිකර්ම කමිටුවේ සාමාජිකයකු - රාජ්‍ය වැවිලි සංස්ථාවේ හිටපු General Manager කෙනකු - සතියකට කේරළයට ගිහිල්ලා බැලුවා, මොනවාද වෙන්නේ කියලා. එතුමා කිව්වා, "පුදුමයි, සේවකයෝ අතරේ අලුත් ගැම්මක් ඇති වෙලා තිබෙනවා" කියලා. ඒ අය තමන්ගේ දෙයක් හැටියට සලකා උදේ හයට වැඩට ආවාම හවස පහ-හය වෙනකල්ම වැඩ කරනවාය කිව්වා. ඵලදායිතාව වැඩි වෙලාය, හොරකම් වැනි දේවල් ඔක්කොම නැවතිලාය කිව්වා. ඒ ප්‍රතිපත්තිය තමයි අද අපේ ලංකාවේ තේ වතුවලටත් පාවිච්චි කරන්න ඕනෑ.

අපේ වෘත්තීය සමිතියත් සම්බන්ධ වෙලා රුපියල් හත්සියයට තිබුණු දෛනික කම්කරු වැටුප අමාරුවෙන් රුපියල් දාහකට නැග්ගුවාට -අවුරුදු පහක්- පෞද්ගලික ධනපතියෝ මොනවාද කර තිබෙන්නේ? කලින් කිලෝග්‍රෑම් දහඅටක්ව තිබුණු quota එක දැන් කිලෝග්‍රෑම් විසිහතරක් කර තිබෙනවා. කිලෝග්‍රෑම් විසිහතරක් ගෙනෙන්න බැරි වුණොත්, අඩු වන හැම කිලෝග්‍රෑම් එකකටම පඩියෙන් කොටසක් අඩු කරනවා. සේවකයෝ සටන් කරලා රුපියල් දාහට වැඩි කර ගත්ත දෛනික වැටුප අන්තිමේදී දැන් ආයෙත් රුපියල් හත්සියයට බැහැලා තිබෙනවා. මේ වාගේ යල් පැන ගිය අදහස් තිබෙන පෞද්ගලික අංශයේ ධනපතියෝ, මේ රජයේ ආයතන පාඩු ලබනවාය කියන එක සම්පූර්ණයෙන්ම අසත්‍යයක්. සේවක අයිතිය දුන්නාට පස්සේ මේ වෙනස ඇති කරන්න පුළුවන්. ස්කැන්ඩිනේවියානු රටවල, ජර්මනියේ ප්‍රාන්ත දෙකක දැන් මේ ක්‍රමය ක්‍රියාත්මක කරනවා. අපේ ඵලදායිතාව වැඩි කරන්න, ආර්ථික අර්බුදයෙන් ගොඩ එන්න ලංකාවේ අපට ඒක කරන්න බැරි ඇයි?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කර ඇති කාලය අවසානයි.

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
මට විනාඩියක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ලංකා සම සමාජ පක්ෂය හැටියට අපි මෙන්න මේ වාගේ විසඳුම් ඉදිරිපත් කරනවා. ඒ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්න කියා අපි යෝජනා කරනවා. කුමන ආණ්ඩුවක් තිබුණත් කමක් නැහැ, දැනට තිබෙන, දිය හැකි විසඳුම් ලබා දීලා ජනතාව මේ පීඩනයෙන් ගොඩ ගන්න කියලා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අ. අරවින්ද් කුමාර් රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු නිමල් පියතිස්ස මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු නිමල් පියතිස්ස මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නිමල් පියතිස්ස මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு நிமல் பியதிஸ்ஸ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. WEERASUMANA WEERASINGHE left the Chair and THE HON. NIMAL PIYATHISSA took the Chair.*

[பி.ப. 3.00]

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා (අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அ. அரவிந்த் குமார் - கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. A. Aravindh Kumar - State Minister of Education)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! நேற்றைய தினம் மாண்புமிகு சனாதிபதி அவர்களால் இந்த அவையில் முன்வைக்கப்பட்ட கொள்கைப் பிரகடன உரை தொடர்பான ஒத்திவைப்பு விவாதத்தில் கலந்துகொள்ள சந்தர்ப் பம் கிடைத்ததையிட்டு நான் பெருமகிழ்ச் சியடைகின்றேன். மாண்புமிகு சனாதிபதியின் அக்கிராசன உரையை உற்றுநோக்கினால், அதில் பல்வேறு விடயங்கள் உள்ளடங்கி யிருப்பதை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது. நான் இந்த அவையில் சனாதிபதிகள் பலரின் கொள்கை விளக்க உரைகளைக் கேட்டிருக்கிறேன். ஆனால், நேற்று எமது சனாதிபதி மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் ஆற்றிய உரையானது, அவற்றிலிருந்து முற்றிலும் மாறுபட்ட ஓர் உரையாகவே காணப்படுகின்றது. எதிர்வரும் 25 வருடங்களுக்கான ஒரு தொலைநோக்குப் பார்வையுடன் அவரின் உரை அமைந்திருந்தது. இதுவரையிலும் எந்தவொரு சனாதிபதியும் இவ்வாறு ஒரு நீண்டகாலத் தொலைநோக்கைக் கருத்திற்கொண்டு, அதற்கான ஒரு களத்தை - அடித்தளத்தை - அமைத்து, அதனூடாக நாட்டின் சுபிட்சத்திற்கான ஒரு திட்டமிடலை மேற்கொண்டதில்லை என்பதை நான் இந்த உயரிய சபையில் விசனத்தோடு பதிவுசெய்ய விரும்பு கின்றேன்.

எதிர்வரும் 25 வருடங்களுக்கான ஒரு தொலைநோக்குத் திட்டத்தை எமது சனாதிபதி அவர்கள் முன்வைத்திருப்பது உண்மையிலேயே வரவேற்கக்கூடிய ஒரு விடயமாகும். எனினும், அதனை அமுல்படுத்துவதில் பல்வேறு தடைகள், சிக்கல்கள், சவால்கள் இருக்கின்றன. அந்தப் பட்டியல் நீண்டுகொண்டே போகின்றது. எது எவ்வாறு இருந்த போதிலும், நேற்று அவர் இந்த அவையில் ஒரு விடயத்தை மிக இலாவகமாகவும் தைரியமாகவும் முன்வைத்ததை நாங்கள் பாராட்டாமல் இருக்க முடியாது. சிங்களவர்கள், வடக்கு - கிழக்கில் வாழும் தமிழர்கள், மலையகத்தில் வாழும் தமிழர்கள், முஸ்லிம்கள் எனப் பல்வேறு சமூகத்தினர் இந்த நாட்டில் வாழ்கின்றார்கள். நாட்டில் வாழுகின்ற அனைத்து மக்களின் பிரச்சினைகளையும் ஒன்றாக இணைத்து, அவற்றுக்கு நல்ல தீர்வுகளை வழங்கவேண்டுமென்ற உள்நோக்கத்தோடு, அவரின் கொள்கை விளக்க உரை அமைந்திருந்தது. அதற்காக நான் அவருக்கு எனது மக்கள் சார்பாக நன்றி கூறக் கடமைப்பட்டிருக்கின்றேன்.

இன்று இந்த நாடு பல்வேறு சிக்கல்களுக்கு முகங் கொடுத்துக் கொண்டிருக்கின்றது என்பது உங்களுக்குத் தெரியும்! விசேடமாக, பொருளாதாரப் பிரச்சினைக்கு இந்த நாடு முகங்கொடுத்துக்கொண்டிருக்கிறது. அதன் விளைவாக பல்வேறு பிரச்சினைகள் தோன்றியிருக்கின்றன. எது எவ்வாறாயினும், அவற்றைச் சவாலாக ஏற்றுக்கொண்டு, முன்னோக்கிச் செல்லவேண்டிய ஒரு காலகட்டத்திலேயே நாங்கள் இருக்கின்றோம். ஆறு மாதங்களுக்கு முன்னர் நாட்டிலிருந்த நிலைமையோடு ஒப்பிடும்போது, தற்பொழுது நாங்கள் ஓரளவிற்கு நல்ல நிலையில் இருக்கின்றோம். அதையிட்டு பெருமூச்சு விடலாம். அத்தகைய நல்ல நிலைமை தற்போது நாட்டில் ஏற்பட்டிருக்கிறது. ஆறு மாதங்களுக்கு முன்னர் நாட்டில் காணப்பட்ட பிரச்சினைகள், குளறுபடிகள், சிக்கல்கள் என்பன போராட்டங்களாக விசுவரூபம் எடுத்தன. 69 இலட்சம் மக்களின் வாக்குகளால் இந்த நாட்டின் சனாதிபதியாகத் தெரிவுசெய்யப்பட்டவர், தனது பதவியை இராஜினாமா செய்யவேண்டிய ஓர் அவலநிலை ஏற்பட்டது. இப்பொழுது, நாங்கள் அதிலிருந்து கொஞ்சம் கொஞ்சமாக மீண்டு வருகிறோம். தற்போதைய பொருளாதாரப் பிரச்சினைக்கு நாங்கள் அனைவரும் பொறுப்புக் கூற வேண்டியவர்களாக இருக்கின்றோம். இந்தப் பிரச்சினைக் குரிய தீர்வைத் தேடாமல், முன்பிருந்த ஆட்சியாளர்கள்தான் இதற்குக் காரணம் என்று வெறுமனே அவர்கள்மீது குற்றம் சுமத்துவது பொருத்தமில்லை என்பதுதான் என்னுடைய நிலைப்பாடு!

இப்பொழுது, பொருட்களுக்கான நீண்ட வரிசைகள் இல்லை. கடந்த வருட ஏப்பிரல், மே, யூன் மாதங்களில் இந்த நாட்டில் முகங்கொடுக்க முடியாத பல்வேறு பிரச்சினைகள் இருந்தன. ஒருபுறம், "மாற்றம் வேண்டும்" என்ற கோஷத்தோடு மக்கள் வீதிக்கு இறங்கிப் போராடினார்கள். மறுபுறம், எரிபொருளுக்காகவும் சமையல் எரிவாயுவுக்காகவும் நீண்ட வரிசைகள் காணப்பட்டன; பல மணித்தியாலங்கள் மின் வெட்டு அமுல்படுத்தப்பட்டது; மக்களிடம் பணம் இல்லாத நிலைமை காணப்பட்டது. இவ்வாறான சவால்மிக்க கால கட்டத்தில் மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் தைரியமாக முன்வந்து, பிரதமர் பதவியைப் பொறுப்பேற்று, சுமுகமான நிலைமைக்கு வித்திட்டார். அதற்காக நாங்கள் அவருக்கு நன்றிகூறக் கடமைப்பட்டிருக்கிறோம். அவர், தனது 25 வருடகால தொலைநோக்குப் பார்வையூடாக நாட்டிலுள்ள பல்வேறு பிரச்சினைகளைத் தீர்ப்பதற்கு வித்திட்டிருக்கிறார்; நல்ல நிலைமை ஏற்படுவதற்கு அடித்தளம் இட்டிருக்கிறார். அவரின் தொலைநோக்குப் பார்வையூடான தீர்வுத் திட்டத்தை நடைமுறைப்படுத்துவதற்கு நாங்கள் அனைவரும் ஒன்றி ணைந்து அவருக்கு ஒத்துழைப்பையும் ஒத்தாசையையும் வழங்கவேண்டிய ஒரு காலகட்டத்திலே இருக்கின்றோம்.

[ගරු අ. අරවින්ද් කුමාර් මහතා]

எங்களுக்கிடையில் கட்சி பேதம் தேவையில்லை; இன, மத, மொழி பேதம் தேவையில்லை. நாங்கள் அனைவரும் "இலங்கையர்கள்" என்ற இடத்திலிருந்து இந்தப் பிரச்சினைக்குத் தீர்வைக் காண்பதற்கான பொறுப்பை ஏற்றுக்கொள்ள வேண்டும். அந்த இடத்தில்தான் நாங்கள் இப்பொழுது இருக்கின்றோம். விசேடமாக, இந்த நாட்டில் இடம்பெற்ற 30 வருடகால யுத்தத்தினால் முழு நாடும் ஸ்தம்பிதமடைந்தது; பல்வேறு பிரச்சினைகளுக்கு நாடு முகங்கொடுத்தது. இப்பொழுது, யுத்தம் முடிவுற்றாலும் மக்களின் பிரச்சினைகள் முடிவுறவில்லை. இன்னும் பல நூற்றுக்கணக்கான ஏக்கர் காணிகளை விடுவிக்கவேண்டிய தேவையிருக்கிறது. பொருளாதாரப் பிரச்சினையைத் தீர்க்கவேண்டிய தேவை இருக்கிறது. மக்களை மீண்டும் அவர்களது காணிகளில், வீடுகளில் குடியமர்த்தவேண்டிய தேவை இருக்கிறது. அவற்றை இப்பொழுது அரசாங்கம் கிரமமாக மேற்கொண்டு வருவதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. அரசாங்கம் நடவடிக்கைகளை மேற்கொள்ள எத்தனிக்கும்போது, இனவாதிகள் அதில் மூக்கை நுழைத்து, முட்டுக்கட்டைகளை ஏற்படுத்தி, தங்களது கைவரிசையைக் காட்டக்கூடிய ஒரு நிலைமையை நாங்கள் இப்பொழுது காணக்கூடியதாக இருக்கின்றது. இவ்வாறான இனவாதிகள் ஓரங்கட்டப்பட வேண்டும். இவ்வாறான இனவாதிகள் காரணமாகவே, இன்று இந்த நாடு இந்த நிலைக்குத் தள்ளப்பட்டிருக்கின்றது என்பதை நான் இந்த உயரிய சபையில் விசனத்தோடு பதிவுசெய்ய விரும்புகின்றேன்.

எம்மிடம் இனவாதம் கிடையாது. இந்த நாட்டிலுள்ள அனைவரும் "இலங்கையர்கள்" என்ற அடிப்படையில், சகோதரத்துவத்தோடு வாழவேண்டும் என்ற நிலைப்பாட்டிலேயே நாங்கள் இருக்கின்றோம். எமது இந்த நிலைப்பாடானது, அனைவரும் ஏற்றுக்கொள்ளக்கூடிய ஒரு நிலைப்பாடு! எந்த மதமோ, எந்த இனமோ, எந்த அரசியல் கட்சியோ பிரிவினைக்கு வித்திடுவதில்லை. எவரும் பிரிவினை வேண்டுமென்று கேட்பதுமில்லை. இந்த நாட்டில் நாங்கள் பகைமையுணர்வுடன் வாழவேண்டுமென்று எவரும் கோருவது மில்லை; சொல்வதுமில்லை. அவ்வாறு கோருபவர்கள்தான் உண்மையிலேயே இனவாதிகள்! தங்களுடைய அரசியல் நோக்கத்திற்காக இவ்வாறு செயற்படுபவர்கள், நிச்சயமாக அரசியலிலிருந்து ஓரங்கட்டப்பட வேண்டும். அவ்வாறு செய்தால் மாத்திரமே, இந்த நாடு உருப்படும் என்பதை நான் இந்த இடத்திலே கூறிக்கொள்ள விரும்புகிறேன். ஆகவே, நாங்கள் அனைவரும் "இலங்கையர்கள்" என்ற அடிப்படையில் கைகோர்த்துச் செயற்படுவோம். அவ்வாறு செயற்படுவதற்கு இந்த நாட்டில் முட்டுக்கட்டையாக இருப்பது பாரபட்சம்! பாரபட்சம் நீக்கப்பட்டால், உண்மையிலேயே இந்த நாட்டில் அனைத்து மக்களும் ஒன்றாக, சந்தோசமாக - மகிழ்ச்சியாக - வாழக்கூடிய நிலைமை ஏற்படும்.

தமிழ் மக்களைப் பொறுத்தளவில், அவர்களுக்கு வட, கிழக்கில் பிரச்சினை இருக்கிறது. அதேநேரத்தில், மலையகத்திலும் பிரச்சினை இருக்கிறது. இவை வித்தியாசமான - வேறுபட்ட - பிரச்சினைகளாகும். இந்தப் பிரச்சினைகளைத் தீர்க்கவேண்டிய தேவையிருக்கிறது. மலையக மக்களின் பிரச்சினையைப் பற்றி நான் இங்கே ஒருசில வார்த்தைகள் கூறவேண்டும். 'பாரபட்சம்' என்பதுதான் எமது முக்கிய பிரச்சினையாக இருக்கிறது. மாண்புமிகு சனாதிபதி அவர்கள் மலையக மக்களின் பிரச்சினைகளைத் தீர்ப்பதற்கு ஓர் ஆணைக்குழுவை நியமிக்க வேண்டுமென்ற நிலைப்பாட்டில் இருக்கிறார்; குழுக்களை அமைக்க வேண்டும் என்ற முடிவை மேற்கொண்டிருக்கிறார். இவை வரவேற்கத்தக்க விடயங்கள்! அதை நான் இல்லையென்று சொல்லவில்லை. ஆணைக் குழுவுக்கு அங்கத்தவர்களாக ஒரு சிலரைச் சிபாரிசு செய்யுமாறு மாண்புமிகு சனாதிபதி அவர்கள் என்னிடம் கேட்டுக் கொண்டதற்கிணங்க, நான் அதனைச் செய்திருக்கின்றேன்.

ஆளும் கட்சிக் குழுக் கூட்டத்தின்போது, நான் மாண்புமிகு சனாதிபதி அவர்களிடம் ஒரு விடயத்தைக் கூறியிருந்தேன். அதாவது, எமது மக்களின் பிரச்சினைகளைத் தீர்ப்பதற்கு அல்லது எமது மக்களைத் தேசிய நீரோட்டத்துக்குள் இணைத்துக்கொள்வதற்கு நீங்கள் ஆணைக்குழு அமைக்கவேண்டிய அவசியம் கிடையாது; குழுக்களை அமைக்கவேண்டிய அவசியம் கிடையாது. பாரபட்சத்தை நீக்கினாலே, எமது மக்கள் இயல்பாக முன்னேறுவார்கள்; தேசிய நீரோட்டத்துக்குள் இணைந்துகொள்வார்கள். ஆகையால், பாரபட்சத்தை நீக்குமாறு நான் அவரிடம் வலியுறுத்திக் கூறியிருந்தேன். இந்த நாட்டிலுள்ள பிரச்சினைகளுக்கு முக்கிய காரணம், பாரபட்சமாகும். பாரபட்சம் நீக்கப்பட்டால், அனைத்து மக்களும் சந்தோசமாக, சகோதரத்துவத்துடன் வாழக்கூடிய ஒரு நல்ல நிலைமை ஏற்படும் என்பதில் எவ்வித சந்தேகத்துக்கும் இடமில்லை. ஆகவே, நாங்கள் அந்த இலக்கை நோக்கிப் போகவேண்டும். மக்கள் மத்தியில் பிளவு கிடையாது; இன விரோதம் கிடையாது; தமிழர், சிங்களவர், முஸ்லிம்கள் என்ற பேதம் கிடையாது. அவர்கள் அனைவரும் ஒன்றாக, சகோதரத்துவத்துடன் வாழ்ந்து கொண்டிருக்கிறார்கள். ஆனால், ஒரு சிலர் அரசியல் நோக்கத்துக்காக, தங்களது சுயநலத்துக் காக மக்களை ஏவிவிடும் செயற்பாட்டில் இறங்கியிருப்பதை நான் வன்மையாகக் கண்டிக்கின்றேன். அதை எந்த வகையிலும் ஏற்றுக்கொள்ள முடியாது என்பதை நான் இந்த உயரிய சபையில் வலியுறுத்திக் கூற விரும்புகின்றேன்.

மாண்புமிகு சனாதிபதி அவர்களின் கொள்கை விளக்க உரை உண்மையிலே பாராட்டத்தக்கது. இந்த நாட்டிலுள்ள அனைத்து மக்களும் "இலங்கையர்கள்" என்ற உணர்வோடு வாழவேண்டும் என்ற நிலையிலிருந்து அவர் செயற்படுவதை நாங்கள் பாராட்ட வேண்டும். அவருக்கு நாங்கள் ஒத்துழைப்பையும் ஒத்தாசையையும் வழங்க வேண்டும். இறுதியாக, நாங்கள் அவரோடு கைகோர்த்து செயற்பட வேண்டும் என்ற விடயத்தை வலியுறுத்தி, வாய்ப்பளித்த அவைத் தலைவர் அவர்களுக்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்!

[3.13 p.m.]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Thank you, Hon. Presiding Member, for the opportunity to say a few words on this Adjournment Motion on the Throne Speech made by the President yesterday in this House. I am saying "Throne Speech" because in the printed document of his Speech, the English version actually states "Throne Speech"; the Sinhala and the Tamil versions do not have it, but the English version states "Throne Speech." Knowing the President as I do, he, probably, would have drafted his Speech in English first and he must have thought that he was actually making a Throne Speech. Those who translated it into Sinhala and Tamil knew better than to

call it anything like that and those titles state "Policy Statement by the Hon. President". But, the English version betrays what the President has in mind or who he thinks he is for him to say "Throne Speech".

In this Speech, the President deals with people who criticize the various acts and policies of the Government and says that when they come into office, they continue with that, that they do not act any differently. He criticizes them quite strongly in his Throne Speech, but I would like to remind him that he is also doing the same thing. In 1996, it is said that the United National Party, at its Convention, resolved to abolish the Executive Presidential System and that was a position they have held onto until now or said to be their official position. In the last Parliament, when we had the Constitutional Assembly, when this issue of Executive Presidency came up, the President, who was Prime Minister then, quite categorically said that that was the UNP's stand, that they were for the abolition of the Executive Presidency. But, now that he is the Executive President, we do not see or hear anything about abolishing the Executive Presidency.

In point of fact, when the Twenty First Amendment to the Constitution was passed, what was presented to the country was that the powers of the Executive President were being curtailed. The Eighteenth Amendment enhanced them; the Twentieth Amendment enhanced them. So, it was said, "We are going back to the Nineteenth Amendment and the powers of the Executive Presidency are being curtailed". But, none of the Executive powers of the President have been curtailed. I said that at the Debate on the Twenty First Amendment also. So, that was a fraud on the people because what was presented to be the Amendment did not achieve that, and the President happily carries on as the Executive President with full Executive powers.

Although the UNP's stated policy is abolition of the Executive Presidency, he has made two Throne Speeches and has not said that he will abolish the Executive Presidency.

There is one matter that I want to deal with in the short time I have today and that is to do with the Tamil national question. In fact, the President has dealt with it quite categorically. He has said the right things except one important thing, which I will come to in a moment. He has dealt with it at pages 13 onwards in the English version of his Speech. There, he has said that the Hon. R. Sampanthan and he came to this House in 1977, that several attempts had been made to resolve the ethnic issue and had not been successful, but, he says, "We wish to succeed this time". But, he does not say how he wishes to succeed, except to say that the several issues he has highlighted will be dealt with, particularly that of land, military-held land. We are not satisfied with what he has said here nor what has happened on the ground. What he has said here is that he will have discussions with the military and we saw that happening in the Jaffna Kachcheri recently when he came over. He was almost at the mercy of the military asking them, almost pleading them, "Are you able to release some more land?" He did not behave like the Executive President.

But, on the other issue of determining forest areas and areas for wildlife, archaeology et cetera - he dealt with the issue of forests there - he says, "We will go back to the 1985 map" and that is most welcome. The only question is, when will he go back to the 1985 map? It must be done immediately. If there is a policy decision taken by the Cabinet - we are told that that is the policy decision of the Cabinet - it must be immediately done. You have the 1985 map. So, you do not need to do anything in between and have to just go back to the 1985 map. It requires just one day. So, we are waiting to see when that is going to happen.

Then, his Speech has just one small paragraph with regard to the Office on Missing Persons. The issue of missing persons is a very serious issue. In our discussions with the President, we have told him that. Even the Report of the LLRC - Lessons Learnt and Reconciliation Commission - your own, the Government's own Commission which was appointed by President Mahinda Rajapaksa soon after the end of the war and which gave its Report on 31st March, 2011, states that many persons surrendered to the security forces in the last few days of the war and that over 3,000 who surrendered as such have gone missing. How can people go missing like that, in their thousands? After establishing an Office on Missing Persons - we supported that legislation - not one single case has been investigated to find out what happened to the persons who surrendered. What happened? It is not enough to say that they are no more. How did it come to that stage? If you surrendered to the security forces, how can you go missing?

Thereafter, he dealt with the issue of devolution of power in his Speech. There are five issues that we identified when we had talks with the Government and I must say that in the Hon. President's Throne Speech, he has dealt with all those five matters. But, with regard to the police powers, he merely says - there is a short, one-sentence paragraph at page 16 of his Speech - that there is no change. We do not understand what that means. Is he saying that there is not going to be any change, that the *status quo* will remain or is he saying that there would not be any change to what is in the Constitution? If there would be no change to what is in the Constitution, then the police powers must be devolved. So, he left it ambiguous, I suspect, deliberately.

The matter I want to end with is that he says "maximum devolution of power within a Unitary State". You cannot have maximum devolution of power within a Unitary State. The President knows that more than anyone else. The President campaigned on the platform of a federal State in 2005 when he contested for Executive Presidency. In the last Parliament, when he was Chairman of the Steering Committee of the Constitutional Assembly, he very specifically said that he stands for a federal State. Now, he has done a summersault and says "within a Unitary State", with a capital "U" and a capital "S", signifying that the scheme of Government will be unitary. And he ends by saying, "I will not allow separation of the country". We are not asking for a separation of the country; we are for a united, undivided, even an indivisible country.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
I am concluding, Sir.

Do not divide the country, but share power in a meaningful way. Maximum devolution of power cannot happen in a unitary model. Therefore, we reject this Throne Speech on that account alone.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අශෝක ප්‍රියන්ත රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.23]

**ගරු අශෝක ප්‍රියන්ත මහතා (ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அசோக்க பிரியந்த - உள்நாட்டலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ashoka Priyantha - State Minister of Home Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සැසිවාරය ආරම්භ කරමින් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනය පිළිබඳ වූ විවාදයට සම්බන්ධ වීමට මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා.

රටේ ඉතාම අසීරු ආර්ථිකයක් හොබවන මොහොතක ඊට ගැළපෙන, වැදගත් වූ ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙනවා. ඒ පිළිබඳ විවාදයට සම්බන්ධ වෙන්න මටත් අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. ජනාධිපතිතුමා ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 12වන පිටුව ඉතා වැදගත් කරුණකින් ආරම්භ කර ඇති ආකාරය මා දුටුවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතුමා එහි කියනවා, "අද ලංකාව ආර්ථික අතින් අසාධ්‍ය ලෙඩෙක්. මාහට පැවරී ඇති වගකීම වන්නේ, මේ ලෙඩාව සුවපත් කිරීමයි. එහෙත්, සමහර දේශපාලන පක්ෂ, සමහර කණ්ඩායම් හා සමහර පුද්ගලයන් මේ මොහොතේ උත්සාහ කරන්නේ ලෙඩාට මීට පෙර වෙදකම් කළ වෛද්‍යවරු පිළිබඳව -දොස්තර මහත්වරු පිළිබඳව- ප්‍රකාශ කිරීමට සහ සොයා බැලීමට" කියලා. ඒ කථාවේ ඉතා වැදගත් කටයුත්තක ආරම්භයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මීට මාස කිහිපයකට පෙර ජනතාවට සිය දෛනික ජීවිතය පවා ගත කළ නොහැකි ලෙස ආර්ථික අපහසුතාවක් තිබුණා. ඒ කාල පරිච්ඡේදය අමතක කරලා අපට ඉදිරියට යන්න බැහැ. එවකට අග්‍රාමාත්‍යවරයා විධියට සිටි ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අපගේ ආශීර්වාදයත් ඇතිව මේ රටේ ජනාධිපතිවරයා හැටියට පත් වුණා. මා හිතනවා, ඒ මොහොතේ මේ රට ගත යුතු හොඳම සහ අපි ගත්තු නිවැරැදි ම ක්‍රියාමාර්ගය එය බව. එම නිසා අපි ඒ තිබුණු ඉතා බැරෑරුම් තත්ත්වයෙන්, භයංකර තත්ත්වයෙන් අත් මිදිලා රටේ ආර්ථිකය, රටේ අනාගතය පිළිබඳව යම් බලාපොරොත්තුවක් තබා ගන්න පුළුවන් තැනක අද ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මාතෘ භූමිය වෙනුවෙන් පක්ෂ, පාට සහ ජාති, ආගම්, කුල භේද සියල්ල කෙටි කාලයකට හෝ පසෙකට දාලා ගරු ජනාධිපතිතුමාගේ රාජසන කථාවත් එක්ක ඇත්තටම සද්භාවයෙන් එකතු වෙලා අභිමානවත්, සැබෑ ශ්‍රී ලාංකිකයෝ වෙන්න අපට පුළුවන් නම් හොඳයි. එහෙම වුණොත් මා හිතනවා, වර්තමානයේ සහ මීට පෙර මේ රට පාලනය කරපු සියලු පාලකයන්ට සහ නිලධාරින්ට සමාජය තුළ ලක්වෙලා තිබෙන දෝෂ දර්ශනයෙන් මිදෙන්න පුළුවන්කම ලැබෙයි කියලා. නමුත්, මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරන මේ මැති ඇමතිවරු ඇතුළු මේ රට පාලනය කරන රාජ්‍ය නිලධාරින්ට එහෙම සැබෑ වුවමනාවක් තවමත් ඇති නොවුණේ ඇයි කියලා මා දන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට එය අකැමැත්තෙන් වුණත් කියන්න වෙනවා.

ගරු ජනාධිපතිතුමා කියපු, වර්තමානයේ අසාධ්‍ය ලෙඩෙක් බවට පත් වී ඇති මේ රටේ ආර්ථිකය සුවපත් කරන්න එතුමා දරන උත්සාහයට උදවු කරන්න අපට බැරි ඇයි? එතුමාට අපි උදවු කළ යුතු නැද්ද? හැබැයි, මේ විවාදයේදී ඉදිරිපත් වූ බොහෝ කථාවලදී මම දැක්කේ, මේ ලෙඩෙට මීට පෙර වෙදකම් කරපු වෛද්‍යවරුන්ව හම ගහමින්, පෙරළමින්, ඔවුන් පිළිබඳව චෝදනා මුඛයෙන් කථා කරන ආකාරයයි.

හැබැයි, ඒ දිහා බලමින් මේ සභාවේ සිටින රාජ්‍ය ඇමතිවරයකු විධියට මම පුදුමයට පත් වුණා, මේ රටේ දැවැන්ත වගකීම් දරපු අය නේද අද මේ විධියට කථා කරන්නේ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් මතක ඇති, අපි මීට මාස කිහිපයකට පෙර පැවැති තත්ත්වය බැලුවොත්, ලංකාවේ කුමන හෝ ඉන්ධන පිරවුම්හලක් ඉදිරියෙන් ගමන් කිරීම පිළිබඳව එදා අපට විශාල ගැටලුකාරී තත්ත්වයක් තිබුණු බව. ඒ වාගේම කිසිදු ඉන්ධන වර්ගයක් ලබා ගැනීමට නොහැකිව ජනතාවට පෝලිම්වලට වෙලා ඉතාම අසීරු තත්ත්වයෙන් ඉන්න වුණා විතරක් නොවෙයි, ඒ තැන් ඉතාම කලහකාරී සහ ගැටුම්කාරී මට්ටමකයි තිබුණේ. හැබැයි, එවකට එම අර්බුදය ගොඩනහපු - මේ රට තුළ එම අර්බුදය නිර්මාණය කරපු- එම වගකීම දරපු ඒ ඇමතිවරයාම -මම නම කියන්න කැමති නැහැ- තමන්ගෙන් ඉටු විය යුතුව තිබුණු වගකීම, යුතුකම තමන් පැහැර හැරපු බව අමතක කරලා එදා මේ රට දැවැන්ත අගාධයකට ඇද දාලා, මේක කරන්න බැහැ කියලා පැනලා ගියා. එදා එහෙම ගිය කෙනා අද මේ සභාවේදී බෙදුම්වාදය පිළිබඳව කථා කරනවා. ගරු ජනාධිපතිතුමා මෙන්ම මමත්, මේ සභාවේ කථා කළ බොහෝ කථිකයිනුත් ඉල්ලීමක් කළා, මේ අසීරු අවස්ථාවේදී ඇති වෙන්නා වූ අභියෝගවලට අපි මුහුණ දෙන්න ඕනෑ කියලා. කියමනක් තිබෙනවා නේ, අභියෝගයට වඩා අපි ශක්තිමත් වෙනවා නම්, අපට එම අභියෝගය ජය ගන්න පුළුවන්කම ලැබෙනවා කියලා.

ගරු ජනාධිපතිතුමාගේ සමස්ත කථාව තුළත්, ඒ හා සම්බන්ධ වුණු මැති ඇමතිවරුන්ගේ කථා තුළත් ඉතාම වැදගත් කාරණාවක් මම දැක්කා. මේ අසීරු අවස්ථාවේ බොහෝ අය රට අතහැර යන්න සූදානම් වෙනවා කියලා එතුමන්ලා සඳහන් කළා. ඒ අය හිතනවා, රට අතහැරලා ගිහිල්ලා, ජීවත් වෙන්න පුළුවන් මට්ටමට මේ රට පත් පත් වුණාම ආපහු එන්න. අපි හැමෝම මේ රට තුළ සිටිමින් මේ අසීරු අභියෝගයට මුහුණ දීලා, අපි ලබා ගත් දැනුම, අත්දැකීම්, මේ මාතෘ භූමියෙන් උරාගත් සාරය නැවත ශක්තියක් බවට පත්කර මේ මාතෘ භූමියට ලබා දීම ඊට වඩා හොඳයි කියා මම හිතනවා. ඒක තමයි මේ මොහොතේ මේ ලක් මව තම දරුවන්ගෙන් ඉල්ලන එකම දේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ රටෙන් නිදහස් අධ්‍යාපනය ලබාගෙන, මේ රටේ තිබෙන නිදහස් වෛද්‍ය පහසුකම් මධ්‍යයේ ඉපදිලා, මේ රටේම තිබෙන සම්පත්වලින් පෝෂණය වෙලා කරදඬු උස් මහත් වුණාට පස්සේ වෛද්‍යවරයකු හෝ වෙනත් වෘත්තිකයකු හෝ ඉංජිනේරු

අංශයක ප්‍රධානියකු හෝ වුණාම පිට රට යන්න හරිම පහසුයි. ඒ අයට පිට රටවලින් හොඳ ඉල්ලුමකුත් තිබෙනවා තමයි. හැබැයි, මේ මාතෘ භූමිය එතැනට ගොඩ නැඟෙද්දී මේ රටේ දුක් විඳින ආදරණීය ජනතාවගේ බදු මුදල්වලින් විවිධ ක්ෂේත්‍ර, විවිධ අංශ වෙනුවෙන් වියදම් කරපු මුදල කොපමණදැයි කියා ඔබතුමන්ලාට, මට ගණනය කළ හැකිද? ඒ ගැන අපි හැමෝම හිතන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නව බදු ප්‍රතිපත්තිය පිළිබඳව වර්තමානයේ සමාජය තුළ දැවැන්ත කතිකාවක් ගොඩනැඟුණා. ඔබතුමාත් දන්නවා වාගේම ඔබතුමාත් එකඟ වෙයි, විශේෂයෙන්ම පරිපාලන ක්ෂේත්‍රයේ සේවය කරන ප්‍රාදේශීය ලේකම්වරයකු වුණාම, මහ දිසාපතිවරයකු වුණාම, සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ඇතුළත්ව දිස්ත්‍රික්කය පුරා දැවැන්ත කාර්ය භාරයක නියැළෙන්න වෙනවා කියන එකට. මගේ අමාත්‍යාංශය, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයයි. එහි අමාත්‍යතුමා වන ගරු අග්‍රාමාත්‍යතුමා ඊයේ ගරු ජනාධිපතිතුමාත් එක්ක මේ පිළිබඳව කථා කළා. එම නිලධාරින්ට රාජකාරි සඳහා ගමන් කරන්න වාහනයක්, ඒ සඳහා යම් ඉන්ධන ප්‍රමාණයක් අවශ්‍යයි. ඒ වාගේම, අපේ දිස්ත්‍රික්කයේ තිබෙන වනාතවිල්ලුව, කරුවලගස්වැව, කල්පිටිය වාගේ ප්‍රදේශවලට පිටස්තර ප්‍රදේශයකින් යම් පරිපාලන නිලධාරියකු පැමිණියාම ඔහුට විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඔහු වෙනුවෙන් නිල නිවාසයකුත් අවශ්‍යයි. මේ බදු ප්‍රතිපත්තිය තුළ නිල වාහනයට, නිල වාහනයට අවශ්‍ය ඉන්ධනවලට, නිල නිවසට සහ මූල්‍යමය වශයෙන් එකතු නොවන බොහෝ පහසුකම්වලට බදු එකතු කිරීමක් සිද්ධ වුණා. අපි ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් විධියට පරිපාලන නිලධාරින්ට මූල්‍ය නොවන අයුරින් ලබා දෙන පහසුකම් වෙනුවෙන් ඊයේ බදු සංශෝධනයක් සිදු කිරීම පිළිබඳව ගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා ප්‍රමුඛ නිලධාරින්ට මම ස්තුතිවන්ත වෙනවා. ඒ අනුව, ග්‍රාමීයව සහ බිම් මට්ටමින් ආර්ථිකයට පණක් දෙන මහ දිසාපතිතුමන්ලා, ප්‍රාදේශීය ලේකම්තුමන්ලා ඇතුළු පරිපාලන ක්ෂේත්‍රයේ නිලධාරින්ට තම වැඩ කටයුතු බාධාවකින් තොරව කරගෙන යන ලෙස මම ගෞරවයෙන් මතක් කරනවා. මොකද, දැන් ඔබ වෙනුවෙන් මේ රජය, එහෙම නැත්නම් මේ රාජ්‍ය යන්ත්‍රණය යම් කිසි පියවරක් පිටුපසට අරගෙන, ඒ අමාරු කර්තව්‍යය ඉටු කිරීම සඳහා ඔබට පණක්, සහයෝගයක් දීලා තිබෙනවා. එම නිසා අපි හැමෝගේම කාර්ය භාරය විය යුත්තේ, අභිමානවත් ශ්‍රී ලාංකික පුරවැසියකු නිර්මාණය කරලා, කැමැත්තෙන් බදු ගෙවලා මේ මව්බිමේ අනාගතය සාර්ථක කරන්න අත්වැල් බැඳ ගැනීමයි.

ගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ තිබෙන මෙන්න මේ කාරණයට කවුරුවත් කැමැති නැද්ද? එහි සඳහන් වෙනවා, දූෂණය මැඩලීමට පනතක්, එහෙම නැත්නම් දූෂණය, වංචාව මැඩලීම සඳහා පනතක් ගේනවා, ඒ තුළින් හොරකම් කළ වත්කම් නැවත රජයට පවරා ගන්නා බව. අපට එකතු වෙලා ඒ වෙනුවෙන් අත්වැල් බැඳගන්න බැරි ඇයි?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජනාධිපතිතුමා රාජාසන කථාව පටන් ගන්න මේ ගරු සභාවට එන අවස්ථාවේ දී, ඉතාම ඉහළ වගකීම් දරපු, වගකීම් දරන, සම්භාවනීය විද්වත් මැති ඇමතිවරු කිහිප දෙනෙක් පුංචි ළමයි වාගේ උසුළු විසුළු කරලා සභාවෙන් නික්ම ගිය ආකාරය මම දැක්කා. ඒ වාගේම අපි 75වන නිදහස් උත්සවය සමරන අවස්ථාවේදී, වගකීම් දරපු, වගකීම් දරන උගත්, වියත් කණ්ඩායම් ඒ උත්සවය වර්ජනය කරලා, ඒකේ ගෞරවය, අභිමානය නැති කරන්න කටයුතු කළා. ඒ ඇයි? පාර්ලිමේන්තුවේ කාර්ය භාරය තුළදී වාගේම, ජාතික උත්සවයකදී අපට බෙදෙන්නේ නැතිව එකතු වෙන්න බැරි ඇයි කියන ප්‍රශ්නය මේ උත්තරීතර සභාවේ දී මම ඉතාම ඕනෑකමින් අහනවා. මැතිවරණයක් එන කාලයක දී, බලයක් ගන්න ඕනෑ කාලයක දී, හැමෝගෙම ප්‍රතිපත්ති ප්‍රකාශන ඉදිරිපත් කරන අවස්ථාවක දී අපි බෙදෙමු; වෙන් වෙමු.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මගේ කථාව අවසන් කරන අවස්ථාවේ දී මම එක ඉල්ලීමක් කරනවා. අපි බෙදිලා, වෙන් වෙලා, විනාශ වෙලා, කුජීත වෙච්ච කාලය අවසන් කරමු. අපි එකතු වෙලා මේ මව්බිම ගොඩ ගන්න, යළිත් මව්බිමට පණක් දීලා සමාජය ඉල්ලන සැබෑ වෙනස ඇති කරන්න සියලු දෙනාම අත්වැල් බැඳ ගනිමු. මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිය හා ගෞරවය පුද කරමින් මම නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.35]

**ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජනාධිපතිතුමා නවවන පාර්ලිමේන්තුවේ සිව්වන සැසිවාරය විවෘත කිරීමේ දී ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශය විවාදයට ලක් කරන මොහොතයි මේ. ගරු ජනාධිපතිතුමා කිව්වා, බදු ක්‍රමය නවීකරණය කරන්න ඕනෑ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම මේ රටේ බදු ක්‍රමය ඉතිහාසයේ ඉඳලා යම් යම් වෙනස් කිරීම්වලට ලක් වුණු බව අපි පිළිගන්නවා. තවමත් ඒ බදු ක්‍රමය මෙරටේ නිෂ්පාදන ක්‍රියාවලියට, ඒ වාගේම මෙරටේ ජාතික ධනය ඉහළ දැමීම සඳහා වන ධනාත්මක පැත්තට, නැත්නම් රටේ ජනතාවට සුබසාධනය ඉටු කරන, ඒ වාගේම මුදල් අවශ්‍යතාවට කොයි තරම් දුරට සෑහෙනවාද කියන එක පිළිබඳ ලොකු විවාදයක් තිබෙන වෙලාවක තමයි අපි මේ සාකච්ඡාවට අවතීර්ණ වන්නේ.

අපි දන්නවා, බදු ක්‍රමය තුළින් එක පැත්තකින් රටේ ජනතාවට සාධාරණත්වය ඇති කරන බව; තව පැත්තකින් රජයට අවශ්‍ය මුදල් ලබා දෙන බව. රටකට වෙසෙසින්ම අවශ්‍ය වන ප්‍රධානතම මූල්‍ය විචල්‍යයක් තමයි "බදු ආදායම" කියන්නේ. නමුත්, බදු ආදායම අය කර ගන්නා විට රටේ මහජනතාවට පණිවුඩයක් ලබා දෙන්න ඕනෑ. "මේ බදු මුදල භාවිත කරලා ඔබගේ සුබසාධනය ඉතාම ක්‍රමානුකූලව, විචක්ෂණශීලීව ඉහළ දානවා" කියන එක රටේ මහජනතාවට දැනෙන්න තිබෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ ක්‍රියාත්මක කළ බදු යෝජනාවලින්, දැවැන්ත විධියට ඉහළ දාපු බදු යෝජනාවලින් මහ ජනතාව පීඩනයකට ලක් වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අපි මන්ත්‍රීවරු විධියට පාර්ලිමේන්තුවට පිවිසෙන්නේ දීමනාවලින් යැපෙන්න නොවෙයි. අපි බොහෝ දෙනා මේ පාර්ලිමේන්තුවෙන් ලැබෙන දීමනාව, වැටුපක් විධියට සලකන්නේ නැහැ. අපේ වැටුප් විස්තර පත්‍රිකාවේ සඳහන් කරලා තිබෙනවා, මේ ලබා දෙන මුදල දීමනාවක් කියලා. රංජිත් සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමා පෙරේදා කිව්වා, පසුගිය කාලයේ රුපියල් ලක්ෂයකට වඩා වැටුප් ලබන රාජ්‍ය සේවකයන්ගෙන් බදු

[ගරු නිතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා]

අය කිරීම නිසා රාජ්‍ය සේවකයා කබලෙන් ලිපට වැටුණා වාගේ තත්ත්වයට පත් වෙලා තිබෙනවා කියලා. ඒ නිසා මූල්‍ය නොවන ප්‍රතිපාදන සම්බන්ධයෙන් සහනයක් ලබා දෙන්න ඕනෑය, ඒ අනුව මුළු දීමනාවම වැටුපත් සමඟ ඇතුළත්ව බදු අය කරපු ප්‍රතිපත්තියෙන් ඉවත් වෙලා, මූලික වැටුප පදනම් කරගෙන සියයට දොළහමාරක බදු ප්‍රතිපත්තියකට පමණක් යනවා කියලා එතුමා කිව්වා. ඒ අනුව රුපියල් ලක්ෂයකට වඩා වැඩියෙන් වැටුප් ලබන රාජ්‍ය සේවකයාට යම් සහනයක් සැලසෙනවා කියලාත් එතුමා කිව්වා.

නමුත්, මේක අමාත්‍යවරුන්, මන්ත්‍රීවරුන්, ආයතන සභාපතිවරුන් වාගේ අයට සාධාරණ නැහැ කියලායි මම කියන්නේ. ඒ කියන්නේ, වැටුප් වෙනුවට මේ දීමනා පමණක් ලබන අය මේකෙදී ශුන්‍ය බද්දකටයි යටත් වෙන්නේ. ඒ නිසා රාජ්‍ය සේවකයාට මේ දුන්න සහනය, සහනයක් නොවෙයි කියලා මම කියනවා. අනෙක් පැත්තෙන්, අමාත්‍ය මණ්ඩලය, මන්ත්‍රී මණ්ඩලය සහ සභාපතිවරුන්ට දීමනා පමණයි ලැබෙන්නේ. ඒ නිසා අපි කැමැති නැහැ, මෙවැනි ප්‍රතිපත්තියක් හරහා රටේ මහ ජනතාව පීඩනයට ලක් කරන්න. විශේෂයෙන් මේකේදී මන්ත්‍රීවරුන්ට, ඒ වාගේම අමාත්‍ය මණ්ඩලයට චෝදනාවක් එල්ල වෙනවා. මමත් බදු ගෙවලා තිබෙනවා. මේ වතාවේ ලබා දෙන දීමනාවෙන් රුපියල් 75,606.72ක් ගෙවන්න මට සිද්ධ වෙනවා. රංජිත් සියඹලාපිටිය රාජ්‍ය අමාත්‍යවරයා කියන සහනය, අප මතු කරන චෝදනාවක් එක්ක සසඳා බලලා, රාජ්‍ය සේවකයාට සැබෑ සහනයක් ලබා දෙන්න කියන ඉල්ලීමයි අපි කරන්නේ. මෙතැනදී, දීමනා පමණක් ලබන කෙනාට අයථා වරප්‍රසාදයක් ලැබෙනවා කියන කාරණයයි අපි මතු කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජනාධිපතිතුමා කියනවා, "ලංකාවේ තමයි, අඩුම සෘජු බදු ප්‍රමාණයක් අය කරන්නේ. රටේ වක්‍ර බදු ප්‍රතිශතය ඉහළයි. ඒක සියයට 79යි. සෘජු බදු ප්‍රමාණය සියයට 21යි" කියලා. මේ නිසා රට ඉතාම අවාසනාවන්ත තැනකයි තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ වෙලාවේ දැවැන්ත පිස්කල් ප්‍රතිපත්තිවලට, දැවැන්ත මූල්‍ය ප්‍රතිපත්තිවලට ගියොත්, මේ ලෙඩා මරණයට පත් වෙන්න පුළුවන්. අපේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කරනවා, ජනාධිපතිතුමා කියපු කථාවක්, "මේ සැත්කමෙන් මේ රෝගියා බේරගන්න උත්සාහ කරනවා" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සැත්කමෙන් රෝගියා මරණයට පත් වෙන්න පුළුවන්. අද වෙනකොට සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවාට වෙන්නට ඕනෑ කඩා වැටීම සිදුවෙලා අවසානයි. ඒ නිසා, සියයට 33ක පොලී අනුපාතයකට, සියයට 36ක බදු අනුපාතයකට යටත් කරලා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවා තවදුරටත් මේ බදු ප්‍රතිපත්තිය හරහා විනාශ කරන්න එපා කියලායි අපි කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය අවස්ථාවේදී ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට උපදෙස් ලබා දුන්න, එතුමා ළඟින් හිටපු කණ්ඩායම කියපු කරුණු කාරණා පිළිගෙන, රාජ්‍ය පාලනය ඉතාම විචක්ෂණශීලීව ගෙන යයිද කියලා අපිට ලොකු ප්‍රශ්නයක් තිබුණා. එදා කාබනික ගොවිතැන සඳහා මෙන්ම රටේ අනුගමනය කරපු මූල්‍ය ප්‍රතිපත්තිය සහ රාජ්‍ය පාලනයේ විනිවිදභාවය පිළිබඳව මතු කරපු කාරණා ගණනාවක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම වත්මන් ජනාධිපතිතුමාටත් මේ උපදෙස් දෙන අය, උපදෙස් දෙන්නේ පෙර සේම වැරදි අතටද කියලා අපට ප්‍රශ්නයක් මතු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කිව්වා, "සාගි නගර්වල වැලි කැණීමක් සිද්ධ වෙනවා. සජ්ජන ද සිල්වලා, මංජුල හේවගේලා වැලි කැණීම හරහා දැවැන්ත අපරාධයක් කරනවා" කියලා. ඒ වාගේම මධ්‍යම පරිසර අධිකාරියේ හිටපු සභාපති සිරිපාල අමරසිංහලා නකල්ස් රක්ෂිතය විනාශ කරනවා කියලා අපි කිව්වා. නමුත්, පසුගිය පාලනයේදී මේවා ගණන් ගත්තේ නැහැ. ජෝසප් ස්ටාලින් විරුද්ධ මතයක හිටපු මිනිහෙක්. ඔහු කිව්වා, "අවස්ථා තුනකදී අපි වැටුප් ගන්න සූදානම්. මේක ගොඩින් බේරා ගනිමු; appointment එකක් දෙන්න" කියලා. නමුත් ඒ සඳහා කාරුණික වුණේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙබඳු උද්ධච්ච මනසින් කටයුතු කරපු ආකාරයට වත්මනෙත් කටයුතු කරනවා. මේ ඉන්ධන ප්‍රශ්නයට QR code එකක් දීලා වැරැදි උපදෙස් මතයි යන්නේ. "අද පෝලිම් නැහැ. අපි සන්තෝෂ වෙනවා, QR code එක නිසා අද යම් ප්‍රමාණයකට තෙල් ලැබෙනවා" කියලා සෑහීමකට පත්වෙනවා ඇති. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ඇත්ත උත්තරය නොවෙයි.

අපි කංචන විජේසේකර අමාත්‍යවරයාට කිව්වා, "දැන් මාස ගණනක් වෙනවා. කරුණාකරලා මේකට සාධාරණ, විකල්ප විසඳුම්වලට යන්න" කියලා. උදාහරණයක් විධියට ගත්තොත්, අද ත්‍රිරෝද රථ දාහතරලක්ෂයක් තිබෙනවා. මේ ත්‍රිරෝද රථ සඳහා දකුණු කොරියාවෙන් සුනිත්‍ය බලශක්ති අධිකාරියට සූර්ය බලයෙන් ක්‍රියා කළ හැකි බැටරියක් හඳුන්වා දී තිබෙනවා. මේවා rocket science නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දකුණු කොරියාවේ ත්‍රිරෝද රථ solar power භාවිත කරන තත්ත්වයට වෙනස් කළා නම්, ලංකාවේ ඒක කරන්න බැරි ඇයි? එහෙම වුණා නම්, ඒ ත්‍රිරෝද රථ ලක්ෂ 14ත් ඉන්ධන පෝලිමෙන් ඉවත් වෙනවා නේද? ඒක නේද තිබෙන දීර්ඝකාලීන උත්තරය? එහෙම නැතිව QR ක්‍රමයද, මේකට තිබෙන දීර්ඝකාලීන උත්තරය? මම කංචන විජේසේකර අමාත්‍යවරයාට කිව්වා, NERD ආයතනය තමන්ගේ විෂය පථය තුළ නැත්නම් අඩු ගණනේ එය තමන්ගේ විෂය පථයට ඇතුළත් කරගැනීම සඳහා ගැසට් කර ගන්න ක්‍රියා කරන්න කියලා. මේ NERD ආයතනය ගෑස් සම්බන්ධයෙන් විකල්පයක් හදලා තිබෙනවා. මේවාට රජයෙන් සල්ලි වෙන් කර තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

NERD ආයතනයෙන් ලබා දී තිබෙන අලුත්ම තාක්ෂණය නිසා අපට පුළුවන් වෙන්න ඕනෑ, ගෑස් භාවිත කරන ගෘහිණිය ඒ ගෑස් පෝලිමෙන් ඉවත් කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක නේද කරන්න ඕනෑ? QR ක්‍රමයත් එක්ක ප්‍රශ්නයට විසඳුමක් ලබා දීම කල් දමන එකද, එහෙම නැත්නම් මේකට දිගුකාලීන උත්තරයක් ලබාදෙන එකද අපි කරන්න ඕනෑ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නකල්ස් රක්ෂිතය ගැන අලුත් නීති ගෙනෙනවා කියනවා. ඒ ගැන අපට සන්තෝෂයි. අපි මධ්‍යම පරිසර අධිකාරිය සමඟ එක් වෙලා නඩු 52ක් දැම්මා. වර්තමාන පාලනය යටතේ අදත් කටයුතු කරන්නේ, ඒ නඩු සමථයකට පත් කරලා නකල්ස් රක්ෂිතයේ සිදු කරන වන විනාශය දිගින් දිගටම ගෙනියන්නයි.

හක්කිඳ දූපත් කියන්නේ මහනුවර දිස්ත්‍රික්කයේ අතිශය වැදගත් පාරිසරික සම්පතක්. මේ දූපත් වටා ඇති මහවැලි ගඟ දෙපැත්තේ "The Escape" සහ "Why Not" කියන හෝටල් හදලා ගඟ විනාශ කරනවා. මධ්‍යම පරිසර අධිකාරිය මේ වනකොට නිදාගෙන ඉන්නවා, ඒ ගැන හොයන්නේවත් නැහැ. හැමදාමත් වාගේ ජනාධිපතිතුමා කියනවා, "පරිසරය රකිනවා, නකල්ස් රක්ෂිතය රකිනවා" කියලා.

අද අලි-මිනිස් ගැටුම නිසා මහනුවර දිස්ත්‍රික්කයේ මිනිපේ, උඩුදුම්බර, තෙල්දෙණිය ප්‍රදේශවල ගොවියා ඇතුළු අපේ මිනිස්සු විශාල වශයෙන් පීඩා විඳිනවා. වන සතුන්ගෙන් සිදු වන උවදුර කථා පවත්වමින් කල් මරන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා කරුණාකරලා ඔය කථා

සාප්පු නතර කරලා කීර්ති බණ්ඩාරපුර හදන්න යෝජනා කරපු ඒ අලි සංරක්ෂණ කලාපය හදලා රටේ දිස්ත්‍රික්ක 25න්, 19ක තිබෙන මේ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයේ දේපළ උපරිමයෙන් පරිහරණය කරනවා කියලා රාජාසන කථාවේදී ජනාධිපතිවරයා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන" නමින් වැඩසටහනක් තිබුණා. මා කළ යෝජනාවක් අනුව අපේ හේවාහැට ආසනයේ අලි වසුරුවලින් කඩදාසි නිෂ්පාදනය කරන ගම්මානයක් අපි හැදුවා. ඒ ගම්මානයේ හදන ඒ කඩදාසිවලින් තමයි අදත් රාජ්‍ය සුබ පැතුම්පත ලබා දුන්නේ. අග්‍රාමාත්‍යතුමා හේවාහැටට ගිහිල්ලා ඒ ප්‍රදේශයේ සංචාරය කරලා ඒ ගමේ මිනිස්සුන්ගේ අලුත් කර්මාන්තය ගැන වැදගත් කථාවක් කරලා ආවා. නමුත් ඒ කර්මාන්තය හඳුන්වා දුන්න අපට ආරාධනාවක් කරන්න, කථා කරන්න අග්‍රාමාත්‍යතුමා කාරුණික නොවීම පිළිබඳව අපි පුදුම වන්නේ නැහැ. නමුත්, මම කියන්නේ මේකයි. මේ වාගේම ගම්මානයක් පේරාදෙණියේ ගන්නෝරුව ආශ්‍රිතව හදන්න මේ වෙනකොට අපි යෝජනා කර තිබෙනවා. අපි යෝජනා කළා, ඉවත දමා තිබෙන බස්රථ නවීකරණය කරලා ගන්නෝරුවේ දියත උයනක් හදන්න කියලා. එතැන බැම් හදලා තිබෙනවා. ඩිපෝවේ බස් ටික වෙනමම තිබෙනවා. මම කියන්නේ කරුණාකරලා නිෂ්පාදන ආර්ථිකයකට අදාළ මේ වැඩවලට පණ දෙන්න කියායි. එහෙම නැතුව ජනාධිපතිතුමා හතර පස් සැරයක් ඇවිල්ලා මෙතැන කථා විතරක් කිව්වාට ඒවා යථාර්ථයක් වන්නේ නැහැ. ඒ නිසා අපි ජනාධිපතිතුමාගෙන් ඉල්ලනවා, කරුණාකරලා ඔය වචන ක්‍රියාවට නඟන්න කියලා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චාමර සම්පත් දසනායක රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.47]

**ගරු චාමර සම්පත් දසනායක මහතා (ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க - ஆரம்பக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Chamara Sampath Dasanayake - State Minister of Primary Industries)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමාගේ රාජාසන කථාව, ජනප්‍රිය වෙන්න හිතාගෙන කරපු කථාවක් නොවෙයි කියා එතුමා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසයට ගියොත්, ඔබතුමාත් දන්නවා, 2001 දී තිබුණේ චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව බව. අපි 2001 පාර්ලිමේන්තු මැතිවරණයෙන් පැරදුණත්, එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කළත්, අපි 2002 අවුරුද්දේ ඒ ආණ්ඩුව විසිරෙව්වා.

ඒ ආණ්ඩුව, විසුරුවන්න කලින් රජයේ සේවකයන්ගේ වැටුප් සියයට 50කින් වැඩි කළා. ඇමෙරිකාවේ පෙන්ටගනයට බෝම්බ ප්‍රහාර එල්ල කර ලෝකයේ අර්බුදයක් තිබ්බ්ච වෙලාවක තමයි - 2002 දී- රනිල් වික්‍රමසිංහ මහත්මයා මේ රටේ අගමැති ලෙස පත්වුණේ. අපි එදා එතුමාට විරුද්ධව කටයුතු කරපු උදවිය. හැබැයි, 2002දීත් එතුමා මේ රට නඟාසිටුවන්න කටයුතු කරගෙන ආවා. ඒ වෙනකොට මේ රටේ රාජ්‍ය සේවකයෝ හිටියේ ලක්ෂ 7යි. දැන් ලක්ෂ 16යි. 2002 ඉඳලා 2022 වෙනකොට අවුරුදු 20ක් ගත වෙලා තිබෙනවා. ඒ අවුරුදු 20ට රාජ්‍ය සේවය ලක්ෂ 9කින් වැඩි වෙලා තිබෙනවා. ඒ වෙලාවේත් එතුමා චක්‍රලේඛ ගෙනැල්ලා රට වැටුණු තැනින් නැගිට්ටවාගෙන එනකොට අපිම තමයි වැරැද්ද කළේ. 2004දී ජනමාධ්‍ය අමාත්‍යාංශය ඇතුළු තවත් අමාත්‍යාංශ කිහිපයක් බලෙන් අරගෙන ඒ ආණ්ඩුව වෙනස් කළේත් අපිම තමයි. මම දන්න විධියට ඒ කාලයේත් එතුමාගේ පක්ෂයෙන්ම එතුමාට දැඩි ප්‍රහාර එල්ල කළා, "අවුරුදු ගණනකට පස්සේ ගත්ත ආණ්ඩුවෙන් අපට යමක් වුණේ නැහැ, රජයේ රැකියාවක් දුන්නේ නැහැ" කියලා. ඒක අපි පිළිගන්න ඕනෑ. නමුත්, එතුමා එදාත් තීන්දු ගත්තේ ජනප්‍රිය වෙන්න නොවෙයි, රට හදන්නයි. අදත් එතුමා කටයුතු කරන්නේ, ජනප්‍රිය නොවී මේ රට වැටිලා තිබෙන තැනින් ගොඩ ගන්න අවශ්‍ය තීන්දු ගන්නයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමනි,** රාජාසන කථාවට විරුද්ධව විපක්ෂයේ කණ්ඩායමක් ඊයේ 'හූ' කියලා සභාවෙන් එළියට ගියා. තව කණ්ඩායමක් මේ සභාව වර්ජනය කළා. මේ වෙනකොට විපක්ෂයේ කිසිම කෙනෙක් සභාවේ නැහැ. විපක්ෂ නායකවරයා දැන් ඉන්නේ බදුල්ල දිස්ත්‍රික්කයේ. එතුමා උදේ වරුවේ සිටියේ මඩොල්සිම ප්‍රදේශයේ. අද ද්‍රවිඩ ජනතාව වැඩ කරන දිනයක්. වතු කම්කරුවන් වැඩිම පිරිසක් ඉන්නේ මඩොල්සිම ප්‍රදේශයේ. අද උදේ 9.00ට මඩොල්සිම ප්‍රදේශයේ ද්‍රවිඩ වතු කම්කරුවන්ගේ රැස්වීමක් තිබුණා. විපක්ෂ නායකතුමා ඒ රැස්වීමට එනකම් ඒ අය බලා ගෙන හිටියා. හැබැයි, විපක්ෂ නායකතුමා මඟින් හරවලා ගිහිල්ලා තිබෙනවා. දැන් වතු කම්කරුවෝ ඔක්කෝම එකතු වෙලා ඒ ස්ටේජ් එක කුඩු කරන්න හදනවා කියලා මට ආරංචි වුණා. මොකද, විපක්ෂ නායකතුමා එතැනට ගියේ නැති නිසා.

මේ වෙලාවේ මේ ගොල්ලන් පළාත් පාලන මැතිවරණයක් බදා ගෙන ඉන්නවා. පළාත් පාලන මැතිවරණය ජනාධිපතිවරණයක් බවට පත් කරන්නයි ඔවුන් හදන්නේ. අනුර කුමාර මහත්තයා එක වේදිකාවක ඉඳගෙන සජිත් ප්‍රේමදාස මහත්තයාට බණිනවා. තව පැත්තකින් අනුර කුමාර මහත්තයාට සජිත් ප්‍රේමදාස මහත්තයා බණිනවා. මේ දෙන්නාම මුහුද හත් ගව්වක් තියෙද්දි අමුඩ ගහනවා. ඒ ගොල්ලන් හිතනවා, පළාත් පාලන මැතිවරණයෙන් පස්සේ ඒ දෙන්නාගෙන් කාට හරි ජනාධිපති වෙන්න පුළුවන් වේවි කියලා. අනුර කුමාර ද, සජිත් ප්‍රේමදාස ද දිනන්නේ කියලා හිත-හිතා, ජනාධිපති සූට් මහගෙන මේ දවස්වල ඒ දෙන්නා තරගෙට දුවනවා.

මම එක කාරණයක් කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඇතුළු අපි ඔක්කෝම -හැටනව ලක්ෂයක්- එකතු වෙලා මීට පෙර ජනාධිපති කෙනෙක් පත් කළා. අවුරුදු දෙකයි ගත වුණේ, ඒ හැටනව ලක්ෂයක් ඡන්ද ගත්ත ජනාධිපතිතුමා දැන් ඉන්නේ මිරිහානේ ගෙදර. හැබැයි, එක ඡන්දයක්වත් නැතුව අවුරුද්දකට පස්සේ බෝනස් එකෙන් ආපු රනිල් වික්‍රමසිංහ මහත්තයා දැන් රටේ ජනාධිපති බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා තව මාසයකින් මේ රටේ මොනවාද වෙන්නේ කියලා අපි කාටවත් කියන්න බැහැ. තව අවුරුද්දකින් මේ රටේ මොනවාද වෙන්නේ කියලා අපි කාටවත් තීරණය කරන්න බැහැ. නමුත්, අද සජිත් ප්‍රේමදාසයි, අනුර කුමාරයි හිතාගෙන ඉන්නේ, මුහුද හත් ගව්වක් තියෙද්දි අමුඩ ගහන්නේ, "හෙට මම ජනාධිපති" කියලා සිතමින්. ඒ දෙන්නා දෙපැත්තට වෙලා මේ පළාත් පාලන මැතිවරණයෙන් රට වෙනස් කරන්න පුළුවන් කියලා හිතාගෙන ගමනක් යනවා.

මේ වෙලාවේ රටේ දේශපාලනය කරන්න ඕනෑ බව ඇත්ත. හැබැයි, දේශපාලනය කරන්න කලින් රට ගැන හිතලා වැඩ කරන්න ඕනෑ වෙලාවක් මේක. විපක්ෂය කල්පනා කරන්න ඕනෑ අද ආණ්ඩුව හෝ, ජනාධිපති හෝ මේ රට ගොඩ ගැනීම සඳහා කර ගෙන යන වැඩ පිළිවෙළට සහාය දීමට ඔවුන්ගේ යෝජනාත් ගේන්න. මේ ආණ්ඩුව කර ගෙන යන වැඩ පිළිවෙළට සහාය දීම

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

සඳහා, මෙන්න මේ විධියට මේ වැඩ පිළිවෙළ කර ගෙන යන්න කියලා විපක්ෂයෙන් කිසිම යෝජනාවක් ගේන්න කෙනෙක් නැහැ. විපක්ෂ නායකතුමා ඇතුළු කණ්ඩායම මොකක්ද කරන යෝජනාව? මේ රට වැටිලා තිබෙන තත්ත්වයෙන් ගොඩ ගන්න අපි මෙන්න මේ විධියට කරන්න ඕනෑ කියලා ආණ්ඩුවට, ජනාධිපතිවරයාට කිසිම යෝජනාවක් එතුමන්ලා ඉදිරිපත් කරන්නේ නැහැ. වේදිකාවක්-වේදිකාවක් ගානේ ලක්ෂ ගණන් වියදම් කර ගෙන, මහා ලොකු සංගීත ප්‍රසංග පවත්වමින් දෙන්නා තරගෙට posters සහ cut-outs ගහගෙන යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ මෙච්චර මූල්‍ය අර්බුදයක් තිබෙද්දීත් මැතිවරණය සඳහා වැඩිම මුදලක් වියදම් කරන අපේක්ෂකයෝ වෙලා ඉන්නේ අනුර කුමාර මහත්මයායි, සජිත් ප්‍රේමදාස මහත්මයායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමන්ලා මේ වැඩේ කරගෙන යන්නේ අද ඊයේ ඉඳන් නොවෙයි, මාස හයක් තිස්සේ ඉඳන්. ඉන්ධන අර්බුද, අර අර්බුද, මේ අර්බුද අස්සේත් රැස්වීම් සඳහා බස්වලට වැඩිම මුදලක් ගෙවා තිබෙන්නේත් මේ දෙගොල්ලන්මයි. ලංකා ගමනාගමන මණ්ඩලයෙන්, පෞද්ගලික අංශයෙන් අහලා බලන්න, බස් එකකට අය කරන ගණන් ගැන. රුපියල් 25,000යි, 50,000යි. අද මඩොල්සිම රැස්වීමට බස් 50කට වඩා අරගෙන ගිහින් තිබෙනවා. තව පොඩ්ඩකින් වැලිමඩ රැස්වීමක් තිබෙනවා. ඒකටත් බස් 50ක් විතර අරගෙන ගිහින් තිබෙනවා. ඊයේ බණ්ඩාරවෙල රැස්වීමක් තිබිලා තියෙනවා. ඒකටත් බස් 50ක් විතර අරගෙන ගිහින් තිබෙනවා. මේක, මේ දෙගොල්ලන්ම බස් අරගෙන ගිහින් තරගයට කරන කාර්යයක් බවට පත් වෙලා තිබෙනවා. නමුත්, ඒ සමහර අය ඉන්ධන ගැන, QR code එක ගැන කථා කරනවා. මේ දවස්වල වැඩිම ප්‍රමාණයක් බස් අරගෙන ගිහින් රැස්වීම් තියන්නේ සහ cut-outs ගහන්නේ අනුර දිසානායකයි, සජිත් ප්‍රේමදාසයි. මා හිතන විධියට, දැන් stage එකක් ගහන්න ලක්ෂ 10කට, 20කට වැඩි මුදලක් වියදම් වෙනවා. ඒ මදිවාට සංගීත ප්‍රසංගත් පවත්වනවා. මේ මැතිවරණය වෙනුවෙන් වැඩිම මුදලක් වියදම් කරන්නේ මේ අපේක්ෂකයෝ දෙන්නායි. මැතිවරණයක් ගැන හිතන්නවත් බැරි වෙලාවක, රටේ මිනිසුන් දුක් විඳින වෙලාවක ආණ්ඩුවට දොස් කිය කියා විපක්ෂය කොහොමද මෙහෙම කරන්නේ? මේ විධියට වියදම් කරන්න, විපක්ෂයට කොහෙන්ද මුදල්? සාමාන්‍යයෙන් එක නායකයෙකු යන රැස්වීමකට රුපියල් මිලියන 10කට වඩා වියදම් කරනවා. මේ නායකයෝ දෙන්නා මේ වනකොට එක ආසනයකට දෙපාරක් විතර ගිහින් තිබෙනවා. මේ රට අර්බුදයට වැටිලා තිබෙන මේ වෙලාවේත් ඒ දෙන්නා එක ආසනයකට දෙපාරක් විතර ගිහින් රැස්වීම් තියනවා.

කවුරු මොනවා කිව්වත්, මීට මාස 6කට කලින් රට වැටිලා තිබුණු තැනින් ගොඩ ගන්න මොන තරම් අමාරු වුණාද? මේ රට භාරගන්න කියා ආරාධනා කළාට ඔය කිසිම නායකයෙක් මේ රට භාරගත්තේ නැහැ. මූලාසනයේ සිටින ගරු මන්ත්‍රීතුමාත් ඒ ගැන දන්නවා. අපි ඒ වෙලාවේ මාදිවෙල මන්ත්‍රී නිවාස භූමියේ ගෙයක් ගෙයක් ගානේ ගිහිල්ලා කථා කරලා ඇහුවා, කවුද මේක භාරගන්න එන්නේ, කවුද මේ රටේ අගමැති වෙන්න එන්නේ කියලා. අපි කිව්වා, "මේ රට භාර අරගෙන කරන කෙනෙකුට අපි සහයෝගය දෙමු. මේක කරන කෙනාට අපි උදවු කරමු" කියලා. හැබැයි, කිසිම කෙනෙක් ඒ වගකීම භාරගත්තේ නැහැ. නමුත්, රනිල් වික්‍රමසිංහ මහත්මයා ඒ වගකීම භාරගත්තා.

ඊයේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් "හූ" කියලා සභාවෙන් නැඟිටලා ගියා. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව හදන්න වාගේම ඒ ආණ්ඩුව පෙරළන්නත් මූලික වෙලා කටයුතු කළ අය තමයි ඒ නැඟිටලා ගියේ. ඒ අය තමයි, ගෝඨාභය රාජපක්ෂ මහත්මයා එතැනට පත් කරන්න මුලින්ම අඩිතාලම දමපු අය. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා, මහින්ද රාජපක්ෂ මැතිතුමා හදපු ආණ්ඩුව විනාශ කළ ඒ අයම තමයි, ඊයේ "හූ" කියලා නැඟිටලා ගියේ. ඒ අයට මේ වගකීමෙන් බේරෙන්න බැහැ. සමහර අය නැඟිටලා අපට කියනවා, අපි බැසිල් රාජපක්ෂගේ ඔඩොක්කුවේ ඉන්න අය කියලා. අපි කාගේවත් ඔඩොක්කුවක නැහැ. හැබැයි, අපි එතුමන්ලාට කියනවා, එතුමන්ලා තවමත් නෙළුම් මාවතේ සාමාජිකයන් බව, එතුමන්ලා තවමත් පොහොට්ටුවේ සාමාජිකයන් බව. නෙළුම් මාවතේ සාමාජිකයන්, පොහොට්ටුවේ සාමාජිකයන් වන ඒ අයම තමයි ඊයේ ජනාධිපතිතුමා ප්‍රතිපත්ති ප්‍රකාශය -රාජාසන කථාව- ඉදිරිපත් කරන්න හදද්දී "හූ" කියලා නැඟිටලා ගියේ. මේ වෙලාවේ මා කියන්න ඕනෑ, අප ඒ වෙලාවේ කළේ මේ රට හදන්න පටන්ගත් නායකයාට -එතුමා කවුරු වුණත්, මොන පක්ෂයේ නායකයා වුණත් අපට කමක් නැහැ- රටේ ඇති වුණු ගැටලුවට, ප්‍රශ්නයට පිළිතුරු සොයන්න සහය වීම මිස කොයි පක්ෂයක්වත් නඟාසිටුවන්න කටයුතු කිරීම නොවෙයි කියන එක. අප ඒ වෙලාවේ කළේ, රටේ ඇති වුණු අර්බුදයට මුහුණ දෙන වැඩ පිළිවෙළට සහාය දීමයි. ඒ නිසා තමයි අද පාසල් දරුවන්ට මේ ගැලරියට එන්න පුළුවන් වෙලා තිබෙන්නේ. ඒ කාලයේ මේ ගැලරියේ එක් කෙනෙක්වත් හිටියේ නැහැ. අද මේ ගැලරියේ වැඩියෙන්ම ඉන්නේ පාසල් ළමයි. පාසල් ළමයි මේ ගැලරියේ ඉන්නේ ඇයි? පාසල් ළමයින්ට මේ ගැලරියට එන්න පුළුවන් වුණේ කොහොමද? ඒ, මේ රටේ තෙල් අර්බුදය දැන් නැති හින්දා; මේ රටේ ඇති වෙච්ච ප්‍රශ්න, ගැටලු සියල්ල දැන් නැති හින්දා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති පුටුවේ වාඩි වුණු හින්දා තමයි මේ තත්ත්වය උදා වුණේ. ඒකට සහයෝගය දුන්නේ අපි. පක්ෂ, පාට භේදයක් නැතිව ආණ්ඩුව පාර්ශ්වයේ වාඩි වෙලා ඉන්න අප සියලුදෙනා එතුමාට සහයෝගය දුන්නේ රට ගැන හිතලා මිස වෙනත් දෙයක් ගැන හිතලා නොවෙයි කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ. ඔබ වහන්සේට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.57]

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමා ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනය -රාජාසන කථාව- පිළිබඳ විවාදය පැවැත්වෙන අවස්ථාවේ අදහස් පළ කිරීමට ලැබීම ගැන සතුටු වෙනවා. මා මුලින්ම කියන්න ඕනෑ, එතුමා සාමාන්‍යයෙන් ප්‍රකට කුමකටද කියලා. එතුමා ප්‍රකට, රටේ ආර්ථිකය ගොඩ ගන්න පුළුවන් නායකයෙකු විධියටයි. එවැනි මතයක් තිබෙනවා. නමුත්, ඊයේ එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඇහුවාට පසුව තේරුණා, මේ ලෝකය පිළිබඳව එතුමාට තිබෙන දැනුම ගැන. 1977දී හිතපු විධියටමයි එතුමා තවමත් කල්පනා කරන්නේ.

අද මේ රට ගොඩ ගන්න නම් කළ යුත්තේ මොකක්ද? රටේ සම්පත් මත, ස්වශක්තිය මත මිනිසුන් නැඟිටුවීමෙන්, මිනිසුන්ගේ විශ්වාසය ගොඩ නැඟීමෙන් තමයි මේ රට ගොඩනඟන්න පුළුවන් වන්නේ. එතුමාගේ කථාව තුළ තිබෙන්නේ අන්තර්ජාතිකව, IMF එකෙන්, ලෝක බැංකුවෙන් සහාය ලබා ගන්න පුළුවන් කියන එකයි.

මම මුලින්ම ගරු ජනාධිපතිතුමා සඳහන් කළ කරුණු කිහිපයක් කියන්න කැමැතියි. එතුමා එක තැනක කියනවා, IMF එකේ විශ්වාසය දිනාගන්නේ නැතිව කිසි ලෙසකින්වත් මේ රට දියුණු කරන්න බැහැ කියලා. ඒ සම්බන්ධයෙන් මම එතුමාට දීර්ඝව විස්තර කරන්න යන්නේ නැහැ, මට ලැබී තිබෙන කාලය කෙටි නිසා. IMF එක රටවල් කීයක් ගොඩදාලා තිබෙනවා ද, IMF එකෙන් සහාය ගත්ත රටවල ප්‍රශ්න විසඳිලා ද කියා වෙනම සාකච්ඡාවක් කරන්න ඕනෑ.

මම ගරු ජනාධිපතිතුමාට කියන්න කැමැතියි, ලෝක බැංකුවට සහ IMF එකට 1985, 2000, 2005 කාලවල තිබිච්ච තත්ත්වය 2020 වනකොට නැති බව. මොකද, අද ලෝක ජාත්‍යන්තර ආයතන හැසිරෙන්නේ වෙනස් විධියකටයි. අද ලෝකයේ ජාත්‍යන්තර බලය, ආර්ථික බලය, මූල්‍ය බලය, දේශපාලන බලය, යුධ බලය පවා එක්සත් ජනපදයේ සිට ආසියාව කරා මාරු වෙමින් තිබෙනවා. එම නිසා එතුමා කියන විධියට IMF එකත් එක්ක කථාබස් කරලා අපේ රටේ මූල්‍ය ගනුදෙනුව බේරාගන්න chance එකක් ගන්න බැහැ. එහෙම බැරි වෙන්න හේතුව තමයි, එතුමාගේ කාලයේම වාණිජ ණය විශාල ප්‍රමාණයක් අරගෙන තිබීම. සියයට 1ක, සියයට 2ක පොලියට ගන්න ඕනෑ ණය එතුමා අරගෙන තිබෙන්නේ සියයට 8ක පොලියටයි. අතිදැවැන්ත කළු කඩවලින් ණය අරගෙන අද වන විට මේ රට විශාල ණය අගාධයකට දාලා තිබෙනවා. එතුමාගේ ප්‍රතිපත්තියට අනුව මා කියන්නට ඕනෑ, තවත් ණය ගන්නා ක්‍රමයක් ගැන සිතනවා මිස, ස්වශක්තිය මත මේ රට අවදි කරන වැඩ පිළිවෙළක් එතුමාගේ කථාවේ අපට දකින්නට ලැබෙන්නේ නැති බව.

මේ රටේ ඉඩම් පිළිබඳ ප්‍රශ්නය ගැනත් එතුමා කිව්වා. ඒ ගැන මම විශේෂයෙන්ම කථා කරන්න ඕනෑ. මේ රටේ ඉඩම් ඒ ඒ පළාත් සංවර්ධනය කිරීමේදී ජනතාවට ලබා දීම සම්බන්ධයෙන් අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. උතුරේ ගොවි ජනතාවට ඉඩම් ලබා දීලා දැවැන්ත සංවර්ධනයක් කරා රට මෙහෙයවනවා නම් අපි ඒකට එකඟයි. නමුත්, ඉඩම් බලතල පළාත් සභාවලට දෙනවා කියන්නේ ඊට වඩා වෙනස් ස්ථාවරයක්. අපි උදාහරණයක් විධියට ගනිමු, මධ්‍යම පළාතේ මහනුවර සහ නුවරඑළිය දිස්ත්‍රික්ක. තමන්ට ඕනෑ විධියට සංවර්ධන කටයුතු කරන්න පුළුවන්, ඉඩම් කොමිෂන් සභාව හරහා තමන්ට අවශ්‍ය විධියට ඉඩම් පරිහරණය කරලා තීන්දු ගන්න පුළුවන් කියලා ඒ පළාතේ මහ ඇමතිවරයා තීරණය කළොත් මොකක්ද වෙන්නේ? රටේම අනාගතය, රටේම වතුර ටික, රටේම හුස්ම, රටේම විදුලිය පදනම් වන්නේ මධ්‍යම කඳුකරය මතයි. එම නිසා ඒ පළාතේ සංවර්ධනය පිළිබඳව ඒ පළාතට විතරක් තීරණය කරන්න බැහැ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ වෙසෙන මිනිසුන්ගේ ජීවිත තීරණය කරන්නේත්, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වෙසෙන මිනිසුන්ගේ ජීවිත තීරණය කරන්නේත් මධ්‍යම කඳුකරය හරහා ගලා හැලෙන මහා ගංගාවලින්. ඒ වාගේම, අප අවුරුද්ද පුරා සපයන සමස්ත විදුලියෙන් තුනෙන් එකක් නිපදවන්නේ ජල විදුලියෙන්.

උතුරු, නැඟෙනහිර තත්ත්වය මීට වඩා ගොඩක් සංවේදියි. උතුරු හා නැඟෙනහිර පළාත්වලට ඉඩම් බලතල දීමක් ගැන කියමින් එතුමා කියනවා, එය ප්‍රජාතන්ත්‍රවාදියි කියලා. මම කියන්න කැමැතියි, එය ප්‍රජාතන්ත්‍රවාදී නැති බව. 1977 ආණ්ඩුව බලයට පත් වුණේ සාමාන්‍ය කේවල ඡන්ද ක්‍රමයට අනුවයි. ඒ මහ මැතිවරණයෙන් හයෙන් පහක බලයක් ලබා ගත්තා. ඒ හයෙන් පහක බලය 1982දී තවත් අවුරුදු 5කට දීර්ඝ කළා. එහෙම නම්, 1982 ඉඳලා ඊළඟට ආ පාර්ලිමේන්තුව ඡන්දයක් නොතියපු, පරණ ව්‍යවස්ථාවෙන් ආ හයෙන් පහක බලයක් සහිත වුවක්. එදා ඡන්දය තිබ්බා නම් ස්ථිරවම හයෙන් පහක බලයක් නොවෙයි, යන්තම් සියයට 51ක් ගන්න පුළුවන් වෙයි. අනුපාත ක්‍රමය යටතේ ගියවර පැවැති මහ මැතිවරණයෙන් හැරෙන්න අනෙක් බොහෝ වෙලාවට මන්ත්‍රී ධුර 113ක් ගන්න හැම ආණ්ඩුවකටම අමාරු වුණු බව අපි දන්නවා. එවැනි වාතාවරණයක් යටතේ ඉඩම් බලතල කියන එක ඒ අදාළ පළාතට දුන්නාම ඇති වන ප්‍රශ්නය මොකක්ද? විශේෂයෙන්ම මා එම කාරණය කිව්වේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන කියන්න ඕනෑ නිසායි. ජනාධිපතිතුමා ප්‍රජාතන්ත්‍රවාදය ගැන කරුණු ගොඩක් කථා කරනවා. 1982දී ජනමත විචාරණයක් පවත්වා කරපු වැඩේ හරි කියලා එතුමාට කියන්න පුළුවන් ද? 1983 කළුජූලිය ඇති කළේ ආණ්ඩුව ද, නැද්ද? උතුරු, නැඟෙනහිර ජනතාව නියෝජනය කරන දෙමළ මන්ත්‍රීවරු අද මෙතැන මේවා සම්බන්ධයෙන් ගොඩක් කථා කළා. අපි මෙහිදී බලන්න ඕනෑ මේ ප්‍රශ්නය ඇති වුණේ කොහොමද කියලායි. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා දන්නවා, එදා ඊශ්‍රායලය සමඟ යුද සම්බන්ධකම් ඇතිකර ගැනීම ගැන. සෝවියට්-ඉන්දියා කලාපය එකට හිටියේ. ඉන්දියාව එල්ටීටීඊ සාමාජිකයන්ට ආයුධ දුන්නා; පුහුණුව දුන්නා. ඇයි ඒ? ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ කන මිරිකීම සඳහා. ඇයි ඒ? කලාපයේ මහ බලවතා නොසලකා කටයුතු කිරීම නිසා තමයි යුද ආයුධ දීලා, සල්ලි දීලා, අවසානයේ 50,000ක ඉන්දියානු හමුදාවක් ගෙනැල්ලා ඉන්දු-ලංකා ගිවිසුමට බලහත්කාරයෙන් අත්සන් කළේ. එතුමා කිව්වා එයින් පසුව ප්‍රශ්නය විසඳෙනවා කියලා. එදා ජේ.ආර්. ජයවර්ධන මහත්මයා කිව්වා, "දැන් ගිවිසුම අත්සන් කරලා ඉවරයි, තව ටිකකින් තුවක්කු ටික දර මිටි වාගේ බාර දෙනවා, යුද්ධය ඉවරයි, සාමය ඇති වුණා" කියලා. සාමය ඇති වුණා ද?

පළාත් සභා තිබුණා. පළාත් සභා බලතල දෙන්න ඕනෑ නම් 2015-2020 කාල වකවානුව තුළ රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ඒ දේවල් කරන්න තිබුණා. මොකද, අග්‍රාමාත්‍යවරයා හැටියට එදා එතුමාට තමයි ආණ්ඩුවේ බහුතර බලය තිබුණේ. එදා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා නොව එතුමා තමයි ආර්ථිකය සම්පූර්ණයෙන් මෙහෙය වූයේ. මම අහන්න කැමැතියි, එතුමා එදා පොලිස් බලතල දෙන්න, ඉඩම් බලතල දෙන්න කථා කළා ද කියලා. එතුමා ඊටත් එහාට ගිහිල්ලා කියනවා, පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදය ගැන. කෙන්යාවේ වාගේ පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදී කරන නීති ගේනවා ලු. ඊට පස්සේ එතුමාම කියනවා, "තමා දිහා බලා තමාගේම අත්දැකීමෙන් කටයුතු කරන්න" කියලා. මම ජනාධිපතිතුමාට කියනවා, "ඔබතුමා කටයුතු කළ ආකාරය දිහා ඔබතුමාම බලන්න" කියලා. 2010දී ඔබතුමාගේ පක්ෂයෙන් ජනාධිපතිවරණ අපේක්ෂකයෙක් තෝරන්න හැදුවා. ඔබතුමා ඒකට ඉඩ දුන්නේ නැහැ.

පක්ෂයේ බහුතර කැමැත්ත තිබුණේ කරු ජයසූරිය මැතිතුමාට. ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා එයට ඉඩ දුන්නේ නැහැ. 2015දී ඒ සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් ගෙනෙන්න ඔබතුමා කටයුතු කළා. එහෙම කළේ ඔබතුමා පත් කරපු විධායක, ඒකාධිපති පක්ෂ ව්‍යවස්ථාවට අනුව. ඔබතුමා පක්ෂය ප්‍රජාතන්ත්‍රවාදී කළා නම්, කවදාවත් ඔබතුමාට පක්ෂ නායකත්වයේ ඉන්න බැහැ. ඔබතුමාම කණ්ණාඩිය ළඟට ගිහිල්ලා මුහුණ දිහා බලලා අහන්න, "ඔබතුමා ප්‍රජාතන්ත්‍රවාදී ද?" කියලා. ඔබතුමා ප්‍රජාතන්ත්‍රවාදී නැහැ. ඔබතුමා පක්ෂයට ප්‍රජාතන්ත්‍රවාදී නැහැ. එහෙම කෙනෙක් කියනවා, කෙන්යාවේ වාගේ පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදයට නීති ගෙනෙනවා කියලා. ඒක විහිළුවක් නේද, ජනාධිපතිතුමනි?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ දේවල් කියන්නේ එතුමාගේ කථාවල තිබෙන මහා රැවටිල්ල පෙන්වන්නයි. උතුර හා නැඟෙනහිරට බලතල දෙනවා කියන කථාව ඉන්දියාවේ කථාවකුත් නොවෙයි. එතුමා හිතනවා, මෙන්න මෙහෙම. කැනඩාවේ ජීවත් වෙන සමහර අය ලණුවක් දීලා තිබෙනවා, ඩයස්පෝරාවට සල්ලි ගොඩක් තිබෙනවා කියලා. ඒකත් බොරුවක්. ඩයස්පෝරාවට එහෙම සල්ලියක්වත්, එහෙම

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි]

සංවිධාන ශක්තියත්වත් නැහැ. ඒක පළමුවැනි කාරණය. දෙවැනි කාරණය මෙයයි. එතුමාට ජනාධිපතිවරණය ඉක්මනින් පවත්වන්න ඕනෑ. එතුමාගේ උපාය මාර්ගය ජනතාව තේරුම් ගන්න. එතුමාගේ උපාය මාර්ගය තමයි, පොදුජන පෙරමුණේ යම්කිසි පිරිසකුත් එකතු කරගෙන එතුමාගේ පක්ෂයෙන් ජනාධිපතිවරණයට ඉදිරිපත් වීම; ඒ වාගේම මේ කාලය තුළ යම් ආකාරයකින් පක්ෂය ශක්තිමත් කර ගැනීම; පුළුවන් තරම් සජිත් ප්‍රේමදාස මහත්මයාගේ පක්ෂයෙනුයි, වෙනත් පක්ෂවලිනුයි මන්ත්‍රීවරුන් අරගෙන ඇමතිකම් කීපයක් දීලා තමන්ගේ පැත්තට ගැනීම. එහෙම කරලා ඊළඟ අවුරුද්දේ -2024 අවුරුද්දේ- මුල ජනාධිපතිවරණය ජයග්‍රහණය කර ගන්නයි එතුමා කල්පනා කරන්නේ. එහෙම නැතුව, උතුරු-නැඟෙනහිරට බලතල දෙන සද්භාවයක් එතුමාට නැහැ.

එතුමා කියනවා, ජාතික සභාවක් පිහිටෙව්වා ලු. ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා ජාතික සභාවක් පිහිටවූවා නම් ඔබතුමා ඒ සභාවට අනුව ප්‍රජාතන්ත්‍රිකව තීරණය ගන්න ඕනෑ. ඔබතුමාගේ ඇමති මණ්ඩලය පත් කරද්දී, ප්‍රතිපත්තිමය තීරණ ගනිද්දී, අර්බුදයට විසඳුමක් සොයද්දී ඔබතුමා සාකච්ඡාවක් කරන්න ඕනෑ. ඔබතුමා කළේ, ව්‍යාජ විධියට අපට අන්දවන, අපට සැරසිල්ලක් හැටියට තියාගෙන 'මෙහෙම සාකච්ඡාවක් තිබෙනවා' කියලා තානාපති කාර්යාල රවට්ටන්න කටයුතු කරපු එක. එක්සත් ජනපදය වේවා, යුරෝපය වේවා, චීනය වේවා මේ හැම කෙනෙකුම දන්නවා, ඔබතුමාගේ ක්‍රියා කලාපය ගැන. ඒක නිසා ඔබතුමාට රටේ ජනතාවගේ ජන මතය විතරක් නොවෙයි, අන්තර් ජාතිකවත් කිසිම පිළිගැනීමක් නැහැ. ඒක ඔබතුමා පිළිගන්න ඕනෑ. එහෙම රටක ජනාධිපතිවරයෙකුට අත්තනෝමතිකව තීරණ ගන්න බැහැ.

ඔබතුමා ඉඩම් බලතල දීම ගැන කිව්වා. පළාත් සභා ඡන්දය පවත්වා මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගන්නා තෙක් පළාත් සභාව දැන් අක්‍රියවයි තිබෙන්නේ. ජනාධිපතිවරයා පත් කරන ආණ්ඩුකාරවරයෙකුට තමයි ඉඩම් බලතල දෙන්න පුළුවන්. පළාත් සභාව දැනට ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එහෙම නම් පළාත් සභා මැතිවරණය මුලින් තියන්න ඕනෑ නේ. මේ අස්සේ පළාත් සභා මැතිවරණය තිබෙන එක ද කරන්න ඕනෑ?

ඊළඟට අපි කථා කරන්න ඕනෑ වැදගත් කාරණය මෙයයි. ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා තිබුණු පළාත් සභාවත් නැති කරලා, ඒ මැතිවරණයත් කල් දාලා ඉඩම් බලතලයි, පොලිස් බලතලයි දෙන්න කථා කරනවා. ජේ.ආර්. ජයවර්ධනවත්, වෙනත් කවුරුවත් පොලිස් බලතල දීම කළේ නැහැ. ඔබතුමා බලයේ සිටි අවුරුදු පහේ ඒක කරන්න තිබුණා. එහෙම නම් ඔබතුමාට ඒක කරලා පෙන්වන්න තිබුණා. ඔබතුමා කරපු වැඩෙන් අනවශ්‍ය ප්‍රශ්නයක් ඇති වෙලා දෙමළ ජනතාව හා අපි අතර තිබෙන මිත්‍රත්වය නැති වෙන තත්ත්වයක් ඇති වෙනවා. මම දෙමළ ජාතික සන්ධානයට කියන්න කැමැතියි, මේ කුමන්ත්‍රණයට අහුවෙන්න එපා කියලා. දෙමළ ජනතාවත්, අපත් රටක් විධියට වැටිලා ඉන්නේ අන්ත අසරණ තත්ත්වයකට. පාසල් ළමයින්ගේ තත්ත්වය අන්තිමයි. දුප්පත් ඉස්කෝලවල, විශේෂයෙන්ම නාගරික ප්‍රදේශවල තත්ත්වය අන්තිමයි.

අපි සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාටත් කියලා, පාසල්වල වෘත්තිය අධ්‍යාපනය ලබා දීලා, ඒ දරුවන්ට දිවා ආහාරයක් ලබා දෙන වැඩ පිළිවෙළක් ආරම්භ කළා. අධ්‍යාපන ඇමතිතුමාත් අපට ඒ සඳහා ශක්තිය ලබා දුන්නා. අපි ඒක කළේ, රජයේ සල්ලිවලින් නොවෙයි. ඉෂාර නානායක්කාර මැතිතුමාගේ එල්ඕසී ආයතනය තමයි ඒකට සම්පූර්ණයෙන් මුදල් දුන්නේ. අපි ඒ වාගේ ව්‍යාපෘති කරගෙන යනවා. ගරු ජනාධිපතිතුමනි, එහෙම කිසිම වැඩකට ඔබතුමා කිසිම අවධානයක් යොමු කරලා නැහැ. ඔබතුමා කෘෂි කර්මාන්තය ගැන ලොකු දේවල් කථා කරනවා. තාක්ෂණය ගැන කථා කරනවා. අපි ඒක පිළිගන්නවා. සමහර අය පොහොර සම්බන්ධ කාරණයේ දී ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට වාගේම මටත් බණිනවා. ඒවා සම්පූර්ණ බොරු. ඒ සම්බන්ධයෙන් තීරණ ගන්න 43ක කණ්ඩායමක් පත් කළා. බැසිල් රාජපක්ෂ මහත්මයා තමයි සභාපති. මම ඒකේ සාමාජිකයකුවත් නොවෙයි. මාව එක දවසක්වත් කැඳවලා නැහැ. අපි කාබනික පොහොර භාවිතය වෙනුවෙන් පෙනී සිටි බව ඇත්ත. අදත් විසඳුම ඒක බව අපි පිළිගන්නවා. හැබැයි, පැය 24න් ඒක කරන්න බැහැ. ගරු ජනාධිපතිතුමනි, ඔබතුමාට කෘෂි කර්මාන්ත ප්‍රශ්නය විසඳන්න පුළුවන් වන්නේ, පෝෂණ ප්‍රශ්නය විසඳන්න පුළුවන් වන්නේ හාල් නිෂ්පාදනය වැඩි කිරීමෙන් විතරක් නොවෙයි. ඒක අත්‍යවශ්‍ය දෙයක් බව අපි පිළිගන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු ස්වාමීන් වහන්ස.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)"
මම ඉක්මනින් අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ජනාධිපතිතුමනි, මම අවසාන වශයෙන් ඔබතුමාට මේ කාරණයත් කියන්න ඕනෑ. වදුරන්ගේ, රිළවුන්ගේ ප්‍රශ්නයවත් ඔබතුමාට විසඳා ගන්න අදහසක් නැහැ. ඔබතුමා සංවේදී නැහැ. රට ගැන ඔබතුමාට තේරුමක් නැහැ. ඔබතුමා මේ පොළව අඳුරන්නේ නැහැ. ඔබතුමා ටයි-කෝට් දාගෙන සීත කාමරයේ ඉඳගෙන ඔබතුමා වාගේම කල්ලියක් එකතු කරගෙන සාකච්ඡා කරනවා. ගේමක් ගහලා රටේ ජනතාව ගොනාට අන්දන්න පුළුවන් කියලා ඔබතුමා හිතනවා. ඔබතුමාට මේ රටේ ජනතාව ගොනාට අන්දන්න බැහැ. ඔබතුමාට පොලිස් බලතල, ඉඩම් බලතල දීමට අපි කිසිසේත්ම ඉඩ තියන්නේ නැහැ. ඒ සඳහා අපට කළ හැකි හැම දෙයක්ම අපි කරනවා. ඒ විතරක් නොවෙයි, ඔබතුමා මේ න්‍යාය පත්‍රය ඉස්සරහට අරගෙන ගියොත් අපි ඔබතුමාට කියනවා ජාතික සභාව කැඳවලා නිසි ප්‍රතිපත්තියකට එන සාකච්ඡාවක් පටන් ගන්න කියලා. ඒ සාකච්ඡාව ඇතුළේ රට හදන වැඩ පිළිවෙළකට එන්න අපි සූදානම්. ඔබතුමා එළවලා දාලා රට අරාජික කරන්න අපි කැමති නැහැ. අපි කැමැතියි, මේ රට අරාජික තත්ත්වයෙන් ගොඩ ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න තව ගොඩක් දේවල් තිබුණත් මට ලැබුණේ විනාඩි 10ක කාලයක් නිසා මගේ කථාවේ ඉතිරි කොටස මම **සභාගත*** කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලසන්ත අලගියවන්න රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[අ.භා. 4.07]

**ගරු ලසන්ත අලගියවන්න මහතා (ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - போக்குவரத்து இராஜாங்க அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - State Minister of Transport)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නවවැනි පාර්ලිමේන්තුවේ හතරවැනි සැසිවාරය විවෘත කරමින් ගරු ජනාධිපතිතුමා ඊයේ මේ පාර්ලිමේන්තුවේ දී කරන ලද ප්‍රකාශනයේ සඳහන් කරුණු පිළිබඳව අපගේ ප්‍රසාදය පළ කරන අතර, එම කරුණු ඉදිරියට ක්‍රියාත්මක කිරීම සඳහා සම්පූර්ණ ක්‍රියාකාරී සහයෝගය හා දායකත්වය ලබාදීම අප විසින් ඉටු කළ යුතු කාර්යයක් බව මා මුලින්ම සඳහන් කරන්න කැමැතියි. එම ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කිරීම පිළිබඳවත්, ගරු ජනාධිපතිතුමා තේරීම පිළිබඳවත් විවිධ විවේචන, විවිධාකාරයේ අදහස් හා යෝජනා අපේ රට තුළ කථාබහ වුණා. ඊයේ පැවැත්වූ රාජාසන කථාව පිළිබඳව පෙරේදා සහ පළමුදා විපක්ෂයේ ඇතැම් දේශපාලන පක්ෂ මේ රට හමුවේ කිව්වේ, රාජාසන කථාව තුළින් බලය බෙදා දීම පිළිබඳව යෝජනා කරලා, ඊට පස්සේ ඒ සම්බන්ධයෙන් කල් තැබීමේ විවාදයක් ඉල්ලලා, ඒ කල් තැබීමේ විවාදය පිළිබඳව ඡන්ද විමසීමක් කරලා, බලය බෙදීම පිළිබඳව යෝජනා ක්‍රියාත්මක කිරීමට තමයි මේ හදන්නේ කියලා. නමුත්, එහෙම දෙයක්ද සිද්ධ වුණේ? එහෙම දෙයක්ද සිද්ධ වෙන්නේ? සිද්ධ වුණෙත්, සිද්ධ වෙන්නෙත් එහෙම දෙයක් නොවෙයි.

අපි පාර්ලිමේන්තුවට තේරී පත්වෙලා, දිවුරුම් දෙන විට අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීමට තමයි දිවුරුම් දෙන්නේ. ඒ අනුව හිටපු ජනාධිපතිතුමා ඉවත්වීමෙන් අනතුරුව වර්තමාන ජනාධිපතිතුමා පත්වීමත්, ඊයේ රාජාසන කථාව විධියට ජනාධිපතිතුමාගේ ප්‍රකාශනය ඉදිරිපත් කිරීමත්, අපේ රටේ පවතින නීති රීති අනුව; මේ පාර්ලිමේන්තුවම විසින් හදන ලද නීති අනුව කටයුතු කිරීමක් විනා, ඊට පරිබාහිරව සිදු වුණු කටයුත්තක් නොවෙයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සිදු වන කටයුතු පිළිබඳ විවේචන කිරීම කොහෙත්ම ප්‍රායෝගිකව නොවන බවයි මා විශ්වාස කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය සම්ප්‍රදායානුකූලව මේ රාජාසන කථාවෙත් කිසිදු ආකාරයක හොඳ දෙයක් දැක්කේ නැහැ; දකින්නේත් නැහැ. ආණ්ඩු පක්ෂයත් සම්ප්‍රදායානුකූලව රාජාසන කථාවේ තිබෙන කරුණු කාරණා පිළිබඳව, ප්‍රතිපත්ති පිළිබඳව සුබවාදීව කථා කළා. යම් යම් අවස්ථාවලදී පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 225දෙනා කණ්ඩායම් දෙකකට බෙදුණා. සියලු දෙනා ඒක රාශි විය යුතුව තිබුණත්, පසු ගිය කාලයේ ජනාධිපතිවරයා තෝරා ගන්නා අවස්ථාවේ දී පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 134දෙනෙකු එක පැත්තකටත්, අසූ දෙකක් තව පැත්තකටත් විධියට කණ්ඩායම් දෙකකට බෙදුණා. වර්තමාන ජනාධිපතිතුමාට සහයෝගය ලබා දීපු අය ආණ්ඩුවක් පිහිටුවා ගෙන, තිබෙන අභියෝග ජය ගැනීම සඳහා අද කටයුතු කරමින් සිටිනවා.

අද විපක්ෂයට මොකක්ද වෙලා තිබෙන්නේ? අද ඒ අසූදෙදෙනාගේ එකමුතුභාවයට, ක්‍රියාකලාපයට මොකක්ද වෙලා තිබෙන්නේ? ඊයේ අපි මේ පාර්ලිමේන්තුවේදී දැක්කේ මොකක්ද? සජබයේ, ඒ සන්ධානයේ සිටින ඇතැම් නායකයෝ ඊයේ මේ සභාවට ආවා, ඇතැම් අය ආවේ නැහැ. ඒ වාගේම තවත් එක පක්ෂයක් නියෝජනය කරන මන්ත්‍රීවරු පිරිසක් මෙතැනට ඇවිල්ලා 'හූ' කියා එළියට ගියා. දෙමළ සන්ධානයේ මන්ත්‍රීවරු සභා ගර්භය තුළ රැඳී සිටියා. ඒ වාගේම විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු අද ඇවිල්ලා මේ විවාදයට සම්බන්ධ වෙනවා. තවත් කණ්ඩායමක් ඊයේ ආවේත් නැහැ, අද ආවේත් නැහැ. ඒ අය පැමිණීමෙන් වැළකී තිබෙනවා. මෙවැනි තත්ත්වයක් තමයි විපක්ෂයේ එකමුතුකම සම්බන්ධව අවසානයේ ඉතුරු වෙලා තිබෙන්නේ. මුළු පාර්ලිමේන්තුවම ඒක රාශි විය යුතුව තිබෙන අවස්ථාවක් මේ පවතින්නේ. නමුත්, විපක්ෂය තුළ අවසානයේ ඉතුරු වෙලා තිබෙන්නේ මම මුලින් සඳහන් කළ ආකාරයේ තත්ත්වයක්.

අද රටේ සිදුවෙන දේවල් පිළිබඳව විපක්ෂයේ මතය මොකක්ද? දැන් මූලසුනේ සිටින අපේ ගරු මන්ත්‍රීතුමා ජාතික නිදහස් පෙරමුණේ ගරු මන්ත්‍රීවරයෙක්. එතුමා අද මේ සභාවේ කථා කරන්න කලින් කථා කළේ වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා. එතුමා කිව්වේ මොකක්ද? දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන කොට එදා විපක්ෂයේ සිටි ඩිව් ගුණසේකර මැතිතුමා ඒකට පක්ෂව අත ඔසවපු බව කිව්වා. ඒ වාගේම දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට තවත් ඒක රාශි කිරීම් සිදු කරන්නත් ඒ අය කැමැතියි කිව්වා. නමුත්, නිමල් පියතිස්ස මන්ත්‍රීතුමා ඊට හාත්පසින්ම වෙනස් කරුණක් තමයි සඳහන් කළේ. අද තිබෙන ප්‍රශ්නය මෙන්න මේකයි. අද අප සියලුදෙනා එකතු විය යුතු අවස්ථාවක් පවතින්නේ. නමුත්, අද වන විට විපක්ෂයේ, ඒ සන්ධානයේ සිටින අයටවත් අඩුම තරමේ එක මතයකට, එක වැඩ පිළිවෙළකට එන්න පුළුවන්කමක් ලැබී නැහැ. මේක තමයි ඇත්ත කථාව.

2022 වසරේ පැවැති අරගළය නිසා රට අරාජික වුණු කාල සීමාවක් තිබුණා. මිලියන 22කට ආසන්න රටේ සමස්ත ජනතාව ඒ කාලයේදී දුක් වින්දා; රට අක්‍රිය වුණා. අපි කොරෝනා වසංගතයට මුහුණ දීලා, ඉන්ධන අර්බුදයකට මුහුණ දීලා, ඊට පසුව තවත් අර්බුද ගණනාවකට මුහුණ දුන්නා. ඒ නිසා රට දැවැන්ත විධියට අරාජික තත්ත්වයකට ගමන් කළා. අපි දැක්කා, ඒ කාල සීමාව තුළදී රටේ ජනතාව කිසිදු දේශපාලන පක්ෂයක් නොපිළිගත් බව. එවක රට පැවැතුණේ අරාජික වෙලා, ආර්ථිකය බිඳ වැටිලා. ඒ වෙලාවේ අපට ඩොලර් තිබුණේත් නැහැ. ඒ වෙලාවේදී අපේ රටේ නීතිඥ සංගමය, වෘත්තීයවේදීන්ගේ සංගම්, ත්‍රෛනිකායික මහනායක ස්වාමීන් වහන්සේලා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, තවත් පක්ෂ 11කින් සැදුම්ලත් ඒ සන්ධානය, අනිකුත් දේශපාලන පක්ෂ, වෘත්තීය සමිති, ඒ වාගේම තවත් පුද්ගලයන්, වෛද්‍යවරුන්ගේ සංගම්, ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය, ව්‍යාපාරික සංගම්, Ceylon Chamber of Commerce වැනි ආයතන රටේ දේශපාලන පක්ෂ අබිබවා ගිහිල්ලා ඒ ඇති වුණු අරාජික තත්ත්වයෙන් ගොඩ ඒම සඳහා යෝජනා ඉදිරිපත් කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් මම මේ සෑම කණ්ඩායමක් එක්කම කථා කළා. ඒ අවස්ථාවලදී ඒ අය ඔවුන්ගේ යෝජනා ඉදිරිපත් කළා. එදා ඒ ඉදිරිපත් කළ යෝජනාවල ප්‍රධාන කරුණු විධියට තිබුණේ මොනවාද? එදා කිව්වේ, මේ ප්‍රශ්න විසඳීම සඳහා සර්ව පාක්ෂික ආණ්ඩුවක් පිහිටුවිය යුතුය කියන එකයි. ඒ වාගේම රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා බදු අය කරගත යුතු බවත් කිව්වා.

ඒ වාගේම IMF එකට යා යුතු බවත් කිව්වා. එදා රට අරාජික තත්ත්වයෙන් ගොඩගැනීම සඳහා සියලුම සිවිල් සංවිධාන, වෘත්තීයවේදීන්ගේ සංවිධාන සහ ප්‍රධාන නීතිඥවරුන්ගේ සංවිධාන විසින් ඉදිරිපත් කරපු යෝජනාවල එම ප්‍රධාන කරුණු ටික ඇතුළත් කරලා තිබෙනවා. ඊයේ ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් සඳහන් වෙනවා, ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය විසින් ඉදිරිපත් කරපු යෝජනාවලියේ තිබුණු කරුණු ටිකක්. දේශපාලන පක්ෂ සහ සිවිල් සංවිධානවලින් සියයට 90ක්ම අද කියන්නේ මොකක්ද? ඒ අය අද කියනවා, මේ බදු ප්‍රතිපත්තිය වැරැදියි, IMF එකට යාම පිළිබඳව ප්‍රශ්න තිබෙනවා කියලා. රජයක් විධියට අපි පිළිගන්නවා, මේ බදු ප්‍රතිපත්තිය

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

නිසාත්, රටේ ඇති වුණු අරාජික තත්ත්වය නිසාත් ගැටලු මතුව තිබෙන බව. අද අපේ රටේ පමණක් නොවෙයි, අනෙක් රටවල පවතින උද්ධමනකාරී තත්ත්වය බලන්න. ඒ වාගේම ජීවන වියදම පිළිබඳව ඇති වී තිබෙන තත්ත්වය බලන්න. මම පෙරේදා දැක්කා, එංගලන්තයේ ගුරුවරුන් පාරට බැහැලා වැඩි පඩි ඉල්ලන ආකාරය. අද ශීඝ්‍ර ලෙස ජීවන වියදම වැඩි වෙලා, උද්ධමනය වැඩි වෙලා ඒ වාගේ දියුණු රටවල් පවා දැඩි ආර්ථික ප්‍රශ්නවලට මුහුණ දීලා තිබෙනවා.

අපේ රටේ ජනතාව අද ජීවත් වෙන්නේ අමාරුවෙන්. ඒ සම්බන්ධව කිසිම වාදයක් නැහැ. අද බොහෝ පිරිස් ෆාමසියකට ගිහිල්ලා ගන්නේ වෛද්‍යවරයා ලියලා දෙන බෙහෙත් ප්‍රමාණය නොවෙයි. බෙහෙත් පැකට් එකක් ගන්න අවශ්‍ය වුණත්, බෙහෙත් පෙති දෙක-තුනක් අරගෙන යන අවස්ථා අද දකින්න තිබෙනවා. එවැනි ප්‍රශ්න අද තිබෙනවා. විධායක ශ්‍රේණියේ නිලධාරින් තමන්ගේ වැටුපට සරිලන පරිදි බැංකු ණය අරගෙන ආරම්භ කරපු විවිධ ආර්ථික සැලසුම් සියල්ලම අද අක්‍රිය වෙලා තිබෙනවා. ව්‍යාපාරිකයන් ගත්තත් එහෙමයි. ඒ අයගේ ව්‍යාපාර කඩා වැටිලා තිබෙන නිසා අද ඔවුන්ට නොයෙක් ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. අපි මේවා ගැන දන්නේ නැතුව නොවෙයි. අපි මේවා ගැන දන්නවා. හැබැයි, අපි නිහතමානීව මේ තත්ත්වය පිළිගන්න ඕනෑ. රටේ පැවැති අරාජික තත්ත්වය හා අද පවතින තත්ත්වය සංසන්දනය කරන කොට යම්කිසි ආකාරයක ප්‍රගතියක් රට හමුවේ අත්පත් කර ගැනීමට අද අපට පුළුවන්කමක් ලැබී තිබෙනවා. අද උදේ වෙළඳ ඇමතිතුමා ජීවන වියදම පිළිබඳව කථා කළා මම අහගෙන හිටියා. එදා අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල පැවැතියේ කොහොමද, අද අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල පවතින්නේ කොහොමද කියන කාරණය පිළිබඳව එතුමා කරුණු පැහැදිලි කළා. එවැනි තත්ත්වයන් පිළිබඳවත් ප්‍රගතියක් අත්පත් කර ගන්න අද අපට පුළුවන් වෙලා තිබෙනවා. එම නිසා අපි මේ වැඩ පිළිවෙළ තවත් ශක්තිමත් කර ගත යුතුයි. ගරු ජනාධිපතිතුමාටත්, ජනාධිපති ලේකම්තුමාටත්, වගකිව යුතු අංශවල සිටින අනෙකුත් නිලධාරින්ටත් මා යෝජනාවක් කරන්න කැමැතියි. ගරු ජනාධිපතිතුමා මේ සභා ගර්භය තුළට ඇවිල්ලා මූලාසනයේ ඉඳගෙන එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන යෝජනා ගණනාවක් ඉදිරිපත් කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා මට කථා කරන්න වෙලාව දුන්නා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි ඉතිහාසයේ අය වැය කථා අහලා තිබෙනවා. රාජාසන කථා අහලා තිබෙනවා. නිදහස් උත්සවයේදී රාජ්‍ය නායකයා කරන කථා අහලා තිබෙනවා. නමුත්, මම එක දෙයක් කියන්න කැමැතියි. ඒ කථාවලදී සඳහන් කරපු කාරණාවලින්, සිදු වුණු දේවල් සහ කරපු දේවල් තිබෙනවා. නමුත්, ඒ කථාවල සඳහන් කාරණාවලින් සිදු වුණු දේවල් සහ කරපු දේවලට වඩා සිදු නොවුණු දේවල්, කරපු නැති දේවල් වැඩියි කියන එකයි, ඒ කථා අධ්‍යයනය කිරීමේදී අපට අවබෝධ වෙලා තිබෙන්නේ.

දේශපාලන පක්ෂවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම, විධායක ජනාධිපති ක්‍රමය සහ මැතිවරණ ක්‍රමය කියන කාරණා පිළිබඳව විධායක ජනාධිපති ක්‍රමය ආරම්භ වුණු දවසට පහුවදා ඉඳලාම, නව මනාප මැතිවරණ ක්‍රමය හඳුන්වා දීපු දවසට පහුවදා ඉඳලාම සෑම මැතිවරණයකදීම සියලු දේශපාලන පක්ෂ මේ රට හමුවේ පොරොන්දු ලබා දුන්නා, මේ යෝජනා ක්‍රියාවට නංවලා, නීති-රීති ගෙනැල්ලා, වර්තමානයට ගැළපෙන පරිදි මැතිවරණ ක්‍රමය සංශෝධනය කරනවා කියලා. ඒ නිසා නැවත රාජාසන කථාවක් කිරීමට පෙර හෝ නැවත ජාතිය අමතා කථාවක් කිරීමට පෙර මේ ඉදිරිපත් කරපු යෝජනා ක්‍රියාවට නැංවීම සඳහා වැඩ පිළිවෙළක් වහාම ක්‍රියාත්මක කළ යුතු බවයි අපි යෝජනා කරන්නේ. එහෙම නොවුණොත් මේ රාජාසන කථාව හුදෙක්ම කථාවකට පමණක් සීමා වෙනවා. එවැනි තත්ත්වයකට මේ රාජාසන කථාව පත් කරන්න එපා කියා සියලුම වග කිව යුත්තන්ට අපි මේ අවස්ථාවේදී මතක් කර දෙන්න ඕනෑ. අණපනත් ගොඩක් හඳුන්වා දීමට පියවර ගන්නවාය කියා මේ රාජාසන කථාව තුළ යෝජනා කර තිබෙනවා. ඒ වාගේම විවිධ කමිටු පත් කිරීමටත් යෝජනා කර තිබෙනවා. විවිධ ආකාරයේ ආර්ථික වැඩ පිළිවෙළ යෝජනා කර තිබෙනවා. එම නිසා මේ ඉදිරිපත් කරපු සියලු කරුණු අදාළ අමාත්‍යාංශවලට යොමු කර, ඒවා ක්‍රියාවට නැංවීම සඳහා ඉලක්ක ලබා දීලා, ඒවා ක්‍රියාත්මක කිරීම ඉතා සුදුසු බවයි මා මේ අවස්ථාවේදී යෝජනා කරන්නේ.

මා කලිනුත් සඳහන් කරපු ආකාරයට, ජනතාව අද වෙනකොට මුහුණ දීලා තිබෙන දැවැන්ත ආර්ථික, සමාජයීය අර්බුදයෙන් ගොඩ ගැනීම සඳහා සියලුදෙනා ඒක රාශි වෙලා කටයුතු කිරීමේ වගකීම අද අපිට පැවරී තිබෙනවා. දේශපාලනඥයා කෙරෙහි ජනතා විශ්වාසයක් නැහැ. ජනතාව ඔවුන්ට වෛර කරනවා; ප්‍රතික්ෂේප කරනවා. මොකක්ද ඒකට හේතුව? වංචා, දූෂණ කර තිබෙන නිසා, විනය විරෝධී ආකාරයට හැසිරිලා තිබෙන නිසා තමයි ජනතාව දේශපාලනඥයන් ප්‍රතික්ෂේප කරන්නේ. ඒ කාරණා දෙකම ඇත්ත. විනයගරුකව හැසිරෙන්නේ නැති වුණාම, වංචා, දූෂණ, හොරකම් කළාම ජනතාව දේශපාලනඥයා ප්‍රතික්ෂේප කරනවා.

තවත් ප්‍රධාන හේතුවක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ආණ්ඩුවේ ඉන්න කොට එක මතයක්, එක එක දේශපාලන පක්ෂ සන්ධානගත වුණොත් ඒ දේශපාලන පක්ෂ අතර තවත් මතයක් තිබෙන්නේ. විපක්ෂයට ගියොත් තවත් දෙයක් කියනවා. ඒ ආණ්ඩුවේම ඉඳලා හොඳ දේවල්වලට දායක වුණා කියනවා. ඒ වාගේම ඒ ආණ්ඩුවේ නරක දේවල් හින්දා තමයි අපි අයින් වෙලා, විපක්ෂයට ගියේ කියනවා. ඒක තමයි ඇත්ත කථාව. නමුත්, පක්ෂ වෙනස් කළා කිව්වත්, ආණ්ඩුවේ නරක දේවල් හින්දා විපක්ෂයට ගියා කිව්වත් ජනතාව දේශපාලනඥයන් විශ්වාස කරන්නේ නැහැ.

අපි ඒක අවබෝධ කර ගන්න ඕනෑ. පසුගිය මැතිවරණයට ඉදිරිපත් වෙලා අපි දිගටම ආණ්ඩුවේ හිටියා. ඒක පිළිගත යුතුයි. ඒ ආණ්ඩුවෙන් සිදු වුණු අඩු පාඩුකම්වලට, වැරැදිවලට අපත් යම්කිසි ආකාරයක කොටස්කරුවන් වෙනවා. ඒක අපට බැහැර කරන්න පුළුවන්කමක් නැහැ. නමුත් දැන් එතුමන්ලා හිතනවා විපක්ෂයට ගිහිල්ලා ඒවා විවේචනය කළාම ඒවායේ කොටස්කරුවෙක් නොවෙයි කියලා. මා මිත්‍ර නාලක ගොඩහේවා හිටපු ඇමතිතුමා තමයි වියත් මඟේ සාමාජිකයෙක් විධියට ඒ ආණ්ඩුවේ සියලුම රාජ්‍ය ආයතනවලට සභාපතිවරු, අධ්‍යක්ෂවරු තේරීම් කමිටුවේ සභාපති වශයෙන් කටයුතු කළේ. මේක තමයි ඇත්ත කථාව. මට මේ වාගේ නම් ගණනාවක් කියන්න පුළුවන්. ඊළඟට, අපේ හිතවත්, අපි ගරු කරන, හිටපු වගකිව යුතු ඇමතිවරයෙක් තමයි ජී.එල්. පීරිස් මැතිතුමා. එතුමා එදා ආණ්ඩුවේ ඉන්නකොට පළාත් සභා මැතිවරණය පිළිබඳව

මොකක්ද කිව්වේ? මේ වාගේ උදාහරණ ගණනාවක් අපට කියන්න පුළුවන්. අද අපේ රටේ ජනතාව දේශපාලනඥයන්ව ප්‍රතික්ෂේප කරන්න, පිළිකුල් කරන්න වංචාව, දූෂණය වැනි තත්ත්වයන් වාගේම මෙන්න මේ ආකාරයෙන් දෙබිඩි පිළිවෙත් අනුව ප්‍රකාශ සිදු කිරීමත් ප්‍රධාන හේතුවක් වෙලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේත් සමහර දේශපාලනඥයෝ ඉන්නවා සියලුම නායකයන්ට බැණලා තිබෙනවා, සියලුම නායකයෝ ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. එහෙම කරන්න හොඳ නැහැ. ඒවා නොකළ යුතු වැඩ. දේශපාලනඥයෝ විධියට අපි අනිවාර්යයෙන්ම වගකීමක් ඇතිව කථා කරන්න ඕනෑ; ක්‍රියා කරන්න ඕනෑ; කටයුතු කරන්න ඕනෑ. මේක අද බොහොම සුලබව දකින දර්ශනයක්. අපි දන්නවා, මාධ්‍ය සාකච්ඡාවලට ගියාම, සමහර මාධ්‍ය නාළිකා එතුමන්ලා කලින් කියපුවා දාලා අහනවා, මොකක්ද ඔබතුමා දැන් මේකට කියන්නේ කියලා. ඉතින්, මේවාට දෙන උත්තර දිහා බලපුවාම ජනතාව මොනවාද හිතන්නේ? අපි දැනගන්න ඕනෑ ඉස්සෙල්ලාම කට පරිස්සම් කර ගන්න. කට පරිස්සම් කර ගෙන අනිවාර්යයෙන්ම අපි ක්‍රියාව, කථාව විනයගරුකව සිදු කළ යුතුයි. දේශපාලනඥයා සහ දේශපාලනය පිරිහීම සඳහා අද මේක ප්‍රධාන හේතුවක් බවට පත් වෙලා තිබෙනවා.

ඊළඟට පළාත් පාලන මැතිවරණය පිළිබඳව කථා කළොත්, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂවලට අද මේ මැතිවරණය ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. දේශපාලන පක්ෂ ඒ සඳහා නාම යෝජනා ඉදිරිපත් කළා. පළාත් පාලන මැතිවරණයට නාම යෝජනා ඉදිරිපත් කිරීමේදී ගමකින් අපේක්ෂකයෙක් ඉදිරිපත් කරන්න ඕනෑ. දේශපාලන පක්ෂ තිස් ගණනක් නාම යෝජනා ඉදිරිපත් කරලා තිබුණා. ස්වාධීන කණ්ඩායම් පනස් ගණනක් නාම යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ lists අරගෙන බලන්න. එක් පළාත් පාලන ආයතනයක් වෙනුවෙන් ගම් දෙක තුනකින් අපේක්ෂකයන් කණ්ඩායමක් හොයලා නාම යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. මම දැක්කා, එක් දේශපාලන පක්ෂයක් මාවනැල්ලේ කෙනෙක් දාලා තිබුණා අත්තනගල්ලට. මේ දේශපාලන පක්ෂවලට අපේක්ෂකයෝත් නැහැ, ඡන්දය ඉල්ලන්න. නමුත් මාධ්‍ය සාකච්ඡාවලට ඇවිල්ලා කියන්නේ මොනවාද? මාධ්‍ය සාකච්ඡාවලදී කියන්නේ, "මැතිවරණය ඕනෑ, අපි දිනනවා" කියලා. ඡන්ද හොයන්න ඉස්සරවෙලා අපේක්ෂකයෝ හොයාගෙන ඉන්න ඕනෑ. නමුත් ජනතාව ඉදිරියට ඇවිල්ලා කියන්නේ, "මැතිවරණය ඕනෑ, මැතිවරණය ප්‍රජාතන්ත්‍රවාදී දෙයක්" කියලා. ඒක ඇත්ත. ඒක අපි පිළිගන්නවා. මම නම් රජයට යෝජනා කරන්නේ මැතිවරණය පැවැත්විය යුතුයි කියලායි. මේ මැතිවරණය පැවැත්වුවායින් පසු විශේෂයෙන්ම ඔය කාගේ කාගේත් නියම තත්ත්වය පිළිබඳව තක්සේරුවක් ලබා ගන්න අපට පුළුවන්කමක් ලැබෙයි. මම දැක්කා ඊයේ කියනවා, සියයට 85ක් ම ඡන්ද තිබෙන්නේ ආණ්ඩුවට විපක්ෂව කියලා.

ඒ සියයට 85 තිබුණාය කියලා මොකක්ද රටට සිද්ධ වෙන්නේ? ජනතාවට සිද්ධ වෙන්නේ මොකක්ද? ඒ සියයට 85ම එකතු වෙනවාද? අඩුම තරමේ මෙතැනදී එකතු වුණාද? රාජාසන කථාව පවත්වන අවස්ථාවට සහභාගි වෙන්න කට්ටියක් ආවේම නැහැ, කට්ටියක් ආවා, කට්ටියක් ඇවිත් කථා කරනවා. ඉතින් සියයට 85 කෝ? මේ බෙදීම බැලුවාම සියයට 10යි, 15යි තැන් තැන්වල තිබෙන්නේ. එතකොට රටක් හදන්න පුළුවන්ද? එක්කෙනෙක් කියනවා, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඕනෑ කියලා. එක්කෙනෙක් කියනවා, දහතුන්වන ව්‍යවස්ථා සංශෝධනය එපා කියලා. එක්කෙනෙක් කියනවා, IMF යන්න කියලා. එක්කෙනෙක් කියනවා, IMF යන්න එපා කියලා. එතකොට සියයට 85 කෝ? මෙන්න මේකයි අද ඇත්ත තත්ත්වය. ඒ නිසා මේ වෙලාවේ රට මුහුණ පා තිබෙන මේ තත්ත්වයෙන් ගොඩ ගැනීම සඳහා අපි සියලු දෙනා අවංකව, සැබෑ ලෙස කටයුතු කරන්න ඕනෑ. ඒ වාගේම ජනතාව විඳින දුක් සැබෑ ලෙස අවබෝධ කරගෙන දේශපාලන පක්ෂ භේද සියල්ලක්ම අමතක කරලා අපි ඒක රාශි වෙලා මේ ප්‍රශ්නය නිරාකරණය කර ගැනීම සඳහා කටයුතු කිරීමයි කළ යුත්තේ. ඒකයි මගේ පෞද්ගලික අදහස; යෝජනාව. ඒ යෝජනාව ඔබ සියලුදෙනාටත් මම ඉදිරිපත් කරනවා. මේ රට ගොඩ ගැනීම සඳහා එකතු වෙලා කටයුතු කිරීමට සියලු දෙනාට ශක්තිය, ධෛර්යය ලැබේවා කියා මම ප්‍රාර්ථනා කරනවා. අවසාන වශයෙන්, අතිගරු ජනාධිපතිතුමාගේ මේ ප්‍රතිපත්ති ප්‍රකාශය පිළිබඳ ප්‍රසාදය පළ කරමින්, එහි සඳහන් කරුණු ක්‍රියාවට නැංවීම සඳහා අපේ සම්පූර්ණ ක්‍රියාකාරී දායකත්වය ලබා දෙන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මෙම විවාදය හෙට දින දක්වා කල් තබනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 4.34ට, 2023 පෙබරවාරි 10වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி.ப. 4.34 மணிக்கு பாராளுமன்றம், 2023 பெப்ருவரி 10, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 4.34 p.m. until 9.30. a.m. on Friday, 10th February, 2023.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.